
# කේතුමතී



www.sinhalaelib

එඩ්වඩ් මල්ලවආරච්චි

WWW.SINHALAELIBRARY.COM 1

# 01

සහන් නැවත කොළඹ යාමට සූදානම් වූයේ සමන්තා අක්කා එවූ පණිවුඩයක් අනුව ය.

"කොළඹ ගියාට කමක් නෑ ඔය උපවාස, පිකට්න්වලට හෙම සම්බන්ධ වෙනවා හෙම නෙමෙ. ගිය වෙලේ ඉඳන් මම ඉන්නේ හිතේ ගින්දරෙන්."

සහන් අම්මාගේ කතාවට පිළිතුරක් දුන්නේ නැත. අම්මා හිතන්නේ තමා මේ උද්ඝෝෂණ ව්‍යාපාරවලට සම්බන්ධ වන්නේ විනෝදයට කියා ය. දුක් මහන්සි වී ඉගෙන ගත්තත් ජීවත් වීම සඳහා රැකියාවක් සොයා ගැනීම අද සෑහෙන ප්‍රශ්නයකි.

මහින්ද දැන් ට්‍රැක්ටර් රියදුරෙක් වශයෙන් වැඩ කරයි. හෙතෙම සහන්ගේ සමීප මිතුරෙකි. වැකන්ඩියේ තවතා තිබූ මහින්දගේ ට්‍රැක්ටරයේ නැගී ඔහුට ටවුමට යන්ට ලැබුණි. කොළඹ බලා දිවෙන පෞද්ගලික බස් රිය වෙලාවට ආවේ ය. සහන් බස් රථයට පිවිස දෑස් පියා ගත්තේ ය.

ඉකුත් වර කොළඹ ආවේ රැකියා විරහිත උපාධිධාරීන්ගේ උද්ඝෝෂණයක් සඳහා ය. මේ රටේ ජාතික සම්පතක් වන උගතුන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුම් සඳහා ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වේ.



දශක තුන හතරක් තිස්සේ නිසි විසඳුමක් නැතිකම තරුණයන්ගේ නැගී සිටීමට ද එක් හේතුවක් විය. පිටකොටුව දුම්රියපොළ, සොයිසා වටරවුම වැනි ප්‍රසිද්ධ ස්ථානවල ජනබල මෙහෙයුම් උපවාස යනාදිය මගින් පාලක පක්ෂයට කරුණු කීවේ අද ඊයේ නොවේ. එදා උපාධිධාරීන් මහ මඟට බැස විරෝධතා දැක්වූ පරිදි අද ඔවුන්ගේ දරුවන් ද සටන් වැද සිටිති. සහන් විරුද්ධ පක්ෂය සමඟ ද එක් වී සටන් කළ ද ඉන් පලක් නොවුණි.

බසයේ අසුන්ගෙන දෑස් පියාගෙන සිටියත් සහන් වෙත නින්දක් නොලැබුණේ සිතේ වූ නොසන්සුන්කම නිසා ය.

උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාලයට නොගොස් ගමට වී සිටියා නම් මීට වඩා හොඳ යැයි සහන්ට වරෙක සිතෙයි. ගමේ මහා විද්‍යාලයේ උගත් පොඩි බණ්ඩා පාසල් නොගොස් කට්ටි පැන්නේ ය. ඔහුට සාමාන්‍ය තරමක කිරි පට්ටියක් ඇත. දෙනුන්ගෙන් දොවා ගන්නා කිරි ඒ සඳහා වූ මධ්‍යස්ථානවලට දී හොඳ මිලක් ලබා ගනී. පරණ වෑන් රියක් ද දැන් ඔහුට ඇත. තරමක දේපළක් ඇති තැනකින් ඔහු විවාහ වී සිටියි. ඔහුගේ බිරිඳ බැලූ බැල්මට එතරම් ලස්සන නැත. නිවසේ වැඩ සියල්ලට ම බිරිඳ බණ්ඩාරට සහාය වෙයි. හරකුන්ට තණකොළ දීම, ප්‍රන්නාක්කු දීම හා බුරුල්ලේ එල්ලී කිරි දෙවීම කරන්නේ ද බිසෝ මැණිකේ විසිනි.

මේ ගෙදර වැඩවලට අමතරව ඇය පිට පිටම දරුවන් දෙදෙනෙක් ද බිහි කර ඇත. අද දරුවන් බිහිකිරීම කායික අවශ්‍යතාවයකට වඩා ජාතික අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. පුංචි බණ්ඩා හා බිසෝ මැණිකේ කොන්ටම් නොපු. හිලින පෙති වැනි වාරණ පිළිගත් බවක් පෙනෙන්ට නැත. මේ ගමන එද්දිත් බිසෝ මැණිකේ ඉණට දකුණත තබා අම්මාරුවෙන් ඇවිදිමින් සිටියේ නැවත වරක් ගැබ් ගෙන සිටි හෙයිනි. ජීවිතය පිළිබඳව මීට වඩා හරවත්ව කතා කළ යුතු දෙයක් නැත. ඔවුන් ඉගෙන නොගත්තත් දරුවන් ලැබ යහපත් ජීවිත ගත කරති.

සහන් සමඟ සා. පෙළ පන්තියේ සිට පෙම්වත් වෙලී සිටි

WWW.SINHALAELIBRARY.COM 2

නිර්මලී දුන් වෙනත් අයෙක් සමඟ දීග ගොස් ය. එසේ වූයේ යෞවනය පිළිබඳව වූ පලුද්දක් නිසා නොවේ. ඒ වෙන් වූ අවසන් දිනයේ ඇය හැඬූ හැටි සහන්ට අද මෙන් මතක ය. ඇත්තටම ජීවත්වීමේ මඟක් තිබුණි නම් දෙමාපියන්ට විරුද්ධව හෝ දැඩි තීරණයක් ගත හැකිව තිබුණි. දුක් කරදරයක් නැතිව දෙමාපියන් සෙවණේ හැදුණු වැඩුණු යුවතියකට වේදනාවක් දිය යුතු නැත. ඇයට වෙනත් විවාහයක් කිරීමට ඉඩ හැර ඔහු කලක් ගමෙන් පිටව කොළඹට වී සිටියේ එහෙයිනි.

තවම ඉතිරිව පවතින්නේ යටත් විජිත යුගයේ අධ්‍යාපනයේ වූ නටබුන් ය. මේවා නැතිකර මේ සහශ්‍රයට ගැළපෙන අධ්‍යාපනයක් සකස් කළ යුතු බව පරාජයට පත්ව සිටින විට හැම විරුද්ධ පක්ෂයක් ම පවසති. සටන් ජයගත් පසු හැම දෙනාම කසාය බිව්ව ගොලුවන් මෙන් සිටිති.

කොළඹ නගරව සිටි කාලයේ ඉගෙනීමට අදාළ රැකියාවක් සොයා ගැනීමට ගත් උත්සාහය අසාර්ථක වුණි. ඒ දිනවල පොඩි අක්කාගේ නිවසේ නතර වී සිටි නිසා කෑම බීම ප්‍රශ්නයක් නොතිබුණි. තමා අක්කාටත් බරක් බව හැඟී ගිය හෙයින් ඔහු එක කලක් ගමට වී සිටියේ ය.

මේ හදිසියෙන් ම අක්කා කොළඹ එන්ට කීවේ ඇයි දැයි සිතා ගැනීම අපහසු වුණි. සැමියා, අක්කා අතහැර දමා සිටින හෙයින් ඇගේ දුක සැප සොයා බැලීමට ද ඔහුට සිදුව ඇත.

සහන් අක්කාගේ නිවසට යන විට රෑ බෝ වී තිබුණි. ගේට්ටුව ළඟට වී ඇය මඟ බලා සිටියේ තම පැමිණීම බව ඔහු දනී.

"එන්න මල්ලි ඇතුළට" ඇය පහත් හඬින් කීවාය. මුහුණ නියඟයට ඉරි තැලුණු දිය සොරොව්වක් මෙනි.

"ඇයි මේ හදිසියේ එන්න කීවේ?"

"පොඩි කරදරයක් වුණා මල්ලි. මූණ හෝදගෙන එන්නකෝ. මම තේ එකක් හදාගෙන එන්නම්."



සහන් නාන කාමරයට වැදී දිය නා ගත්තේ ගමන් වෙහෙස පහව යාමටය. කොට කලිසමකින් හා අත් නැති කමිසයකින් සැරසුණු ඔහු එළියට ආවේ ය.

අක්කා දුන් උණු තේ කෝප්පය අතට ගත් සහන් පුටුවේ ඉඳගත්තේ ය.

"දැන් මොකක්ද ප්‍රශ්නය" ඔහු සොයුරිය දෙස බලා ඇසුවේය.

"අනේ මල්ලියේ සේදරට වෙන රස්සාවක් හම්බ වුණා කියලා යන්න හදනවා."

"ඉතින් හරි වැඩක්නේ. වැන් එකට වෙන ඩ්‍රයිවර් කෙනෙක් හොයා ගන්න කල් ඉන්න කියන්න බැරිද?"

"මේක නම් ඔෆිස් හයර් එකක්නේ. වෙලාවට වාහනේ නොගියොත් ගෑනු ටික මගේ ඔළුව කයි. ඊටත් වඩා අර මනුස්සයා මට ඉතිරි කරලා ගියේ මේච්චරයි. මේක නැති වුණොත් මට ජීවත් වෙන්න විදිහක් නෑ."

ඇය කතා කළේ හැඬුම් මුසුවය.

සහන් මඳ වේලාවක් කල්පනා කළේ ය.

"ඩ්‍රයිවර් කෙනෙක් හොයා ගන්න කල් මල්ලිට මේ ඔෆිස් හයර් එක කරලා දෙන්න බැරිද?"

"කවුරු හරි හොයා ගන්න කල් මම කරලා දෙන්නම්. ඒත් මම යන රූට් එක දන්නේ නෑනෙ."

"ඔයාට යන පාර බලාගන්ට මම දවසක් දෙකක් එන්නම්."

අක්කාගේ ඉල්ලීමට පිටුපෑමට සහන්ට පුළුවන් වූයේ නැත. සැමියා වෙනත් විවාහයක් කරගෙන යාමෙන් පසු ඇයට ඉතිරි වූයේ මෙම ආදායම් මාර්ගය පමණි. උසස් රැකියාවක් කරන වැදගත් පවුල්වල කාන්තාවන් යන මේ වාහනය පිළිබඳ විශ්වාසයක් සෑමටම ඇත. රියදුරා ද වැදගත් දක්ෂ අයෙක් විය යුතුමය.

WWW.SINHALAELIBRARY.COM3

සහන් පසුදින පාන්දර පිබිදුණේ අක්කාගේ හඬිනි. මුහුණ සෝදා සූදානම්ව එනවිට අක්කා රථයට දුම් අල්ලමින් සිටිනු සහන් දුටුවේ ය.

පෞද්ගලික අංශයේ සේවය කරන කාන්තාවන් දොළොස් දෙනෙක් පමණ මේ ගමනට අයත් ය. බොරැල්ල, රක්ෂණ සංස්ථාව, කොම්පඤ්ඤවීදිය, පිටටු බම්බුව, පත්‍ර කාර්යාල දෙකක් හා කොල්ලුපිටියේ පිහිටි එක් අමාත්‍යාංශයක් මේ ගමනට අයත් බව අක්කා පැවසූ හැටි ඔහුට මතකය. ගමන ඇරඹුමේ අක්කා ඉදිරිපස ටයර්වලට තබන ලද දෙහි පොඩිකර ඇස්වහ දුරු කරමිනි.

ප්‍රථම නැනැත්තිය ගැනීමට නියමිතව තිබුණේ බතලවත්තෙනි.

"දැන් අපි ඉස්සෙල්ලම ගන්නේ මේ ගර්ල්වයි. අන්තිමට කොල්ලුපිටියෙන් බස්සවන්නෙත් මේ ගර්ල්මයි."

අක්කා කීවා ය. රථය කිලෝ මීටර් කාලක් පමණ ඇතින් පිහිටි ගේට්ටුවක් අසල නතර කළේ සමන්තාගේ උපදෙස් පරිදිය.

"මෙන්න මේ ගේට්ටුව ගාව නතර කළාම හරි. ගොහිටියොත් හෝන් එක තුන් සැරයක් ගහන්න. නොහිටියොත් යන්න."

"අක්කා මේ ගමනේ දී මට මල්ලි කියන්ඩ එපා."

"හරි වැඩක්නෙ. ඔයා මගේ මල්ලිනෙ."

"ඔයා සද්ද නැතිව ඉන්නකෝ."

මල්ලිගේ යෝජනාවේ මොනවා හෝ දෙයක් ඇතැයි සිතුණු නිසා ඇය නිහඬ වූවා ය.

"හැබැයි මේ වාහනේ යන්නේ ලෝක අහංකාර ගෑනු. හරියට දිව්‍ය ලෝකේ ඉඳලා බැහැපු සුරංගනාවියෝ වගේලු තියෙන අහංකාරකම. නෝනා, මිස්, මැඩම් කියලා කතා කරනවට කැමතියි කියලා කලින් හිටපු ඩ්‍රයිවර් කිව්වා."

සහන් මාවත අයිනට කර රථය නතර කළේ ය.



"ඇයි මට කලින් මේ බවක් කිව්වෙ නැත්තේ. මට බෑ ගෑනුන්ට මිස්, මැඩම් කියන්න. වෑන් එක ගානට එලවන්නම් එච්චරයි."

"නෑ.. නෑ.. කියන්ඩ කියනවා නෙවෙයි. වෑන් එකේ ගෑනු ඒ වගේලු."

"ඒක මිසක්."

"ඔහොම නතර කරන්න. අර ඉන්නේ කෙල්ල."

මනාව හැඩගැසුණ වයස විස්සක පමණ තරුණියක් පහත් කරගත් හිසින් යුතුව රථය දෙසට එනු සහන් දුටුවේ ය. රථය වැඩූ නොබෝ වේලාවකින් මිහිරි සුවඳ විලවුන් වර්ගයක සුවඳ ඔහුගේ නැහැයට දැනුණි. සෙන්ට් නාලා වගේ. ඉන්පසු මාවත අසල දෙමහල් මන්දිරයක් ඉදිරිපිට රථය නතර කිරීමට සමන්තාගෙන් උපදෙස් ලැබුණි. දෙතොල්වල මිනෑවටත් වඩා ලිප්ස්ටික් තවරා ගත් අවුරුදු හතලිස් පහක පමණ තරබාරු කාන්තාවක් සෙමින් සෙමින් පැමිණ වෑන් රියේ අසුන් ගත්තාය. ඊළඟ පිරිස රථයට නැග්ගේ ලිලී මාවතෙනි. ශාන්ති මාවත, රොබට් ගුණවර්ධන මාවත වෙද්දී සියලුම අසුන් පිරී තිබුණි.

සහන් වේගයෙන් රථය පැදවූයේ පිරිස නියමිත වේලාවට කාර්යාලවලට ගෙන යාම සිය යුතුකම වූ හෙයිනි. පිරිස අදාළ තැන්වලින් බස්සවා අවසානයට ගියේ මුලින්ම පැමිණි නැනැත්තියගේ කාර්යාලයටය.

"දැන් ඔය බැහැලා ගිය එකී තමයි මේකෙ ඉන්න ආඩම්බර කෙල්ල. ඔහොම හිටියට කෝටිපති කෙල්ලෙක්ලු. වැඩිම ආඩම්බර ලස්සන නිසයි. ඇමැතියෙකුගේ දුවෙක්."

"ඔයත් අක්කා, ජාතියෙ ගතිය පානවා. ඒ කෙල්ල ලස්සන නිසා ඔයා ඊර්ෂියයි." සහන් සිනාසුණේ ය.

WWW.SINHALAELIBRARY.COM 4

"මෙයාගෙ විස්තර සේදර ආවහම අහන්ඩකෝ" සමන්තා සිනා මුසුව කීවාය.

"අක්කා... මට අනුන්ගේ විස්තර දැන ගන්න ඕනෑ නෑ. ඔයාගේ හයර් එක ගානට කරලා දෙන්නම්. දැන් ඊළඟට මොකද කරන්නේ...?"

"වාහනේ මෙතන තියාගෙන ඉන්න කොට සමහර දාට හයර් එනවලු. මේක ඒසී වෑන් එකක් නිසා වැඩ තියෙනවලු. වැඩක් නොතිබුණොත් ටිකක් වෙලා ඉඳලා මල්ලි එන්න. ඔයා ඇවිදින් නාලා කාලා රෙස්ට් එකක් අරන් යන්න."

අක්කා කොල්ලුපිටිය දෙසට පියවර මනින හැටි ඔහු බලා සිටියේ දුකින් යුතුවය. ඇය කොතරම් නිරවුල් ජීවිතයක් ගත කළ අයෙක් ද? ඇය ජීවානන්ද හා විවාහ වූයේ ආදරයක ප්‍රතිඵලයක් වශයෙනි. දරුවන් දෙදෙනෙක් ලද පසු ඔවුනට ආර්ථික අපහසුකම් ඇති බව දැන ගත්තේ ඉඳහිට මෙහි ආ ගිය හෙයිනි. ජීවානන්ද රැකියාවෙන් වසර දෙකක නිවාඩු ගෙන විදේශ ගත වූයේ මේ ප්‍රශ්නවලින් ගොඩ ඒම සඳහා ය. බැංකු ණයක් ගෙන අඩක් සාදා තිබූ නිවස සම්පූර්ණ කර ගත්තේ රට ගොස් උපයා ගත් මුදලෙනි.

විදේශ ගතවූවාට පසු එක් වරක් ජීවානන්ද ලංකාවට පැමිණියා මතකය. ජීවානන්ද මෙම වෑන් රිය මිල දී ගත්තේ සමන්තාගේ නමට ය. එම ගමනින් පසු හෙතෙම යළි ලංකාවට ආවේ නැත.

ජීවානන්ද වෙනත් විවාහයක් කරගෙන ජපානයේ පදිංචිව සිටින බැව් විශ්වාස කටයුතු මගකින් දැනගත් පසු අක්කා බොහෝ කලක් හඬා වැලපුණු හැටි සහන්ට මතකය. දැන් ඒවා අයිති අතීතයටය. ඉන් පසු ඇය හැම උපක්‍රමයක් ම යෙදුවේ දරුවන් දෙදෙනා ආරක්ෂා කර ගැනීමට ය. සහන් හැම වෙලේම පොඩි අක්කාට උදව් කරන්ට එන්නේ ඇය තනි වී සිටින හෙයිනි.

සහන් කල්පනා ලොවින් මිදුණේ කිසිවෙක් රථයේ වීදුරුවට කිසිවෙක් තට්ටු කරන හඬ ඇසීමෙනි.



## 02

කල්පනා ලොවින් මිදුණු සහන් රථයේ වීදුරුව පහත් කළේ ය. පිටත සිටියේ පනස් විය ඉක්ම වූ යුරෝපීය ඇඳුමින් සැරසී සිටි තැනැත්තෙකි. ටයි පටිය බැඳීම නිසා තරමක තරුණ බවක් පෙනුණත් ඉඳුණු කොණ්ඩය ඩයි කර ඇති නිසා මහලු බව පන්නා දැමීමට නොහැකි වී තිබුණි. සහන් දෙස බලා සිනාසෙද්දී කටට තුවන් දත් කිහිපයක් අඩු බව පැහැදිලිව පෙනුණි.

"මේක සේදර ඩ්‍රයිවර් වැඩ කළ වාහනේ නේද?" හෙතෙම වැදගත්කම විහිදා දක්වමින් ඇසුවේ ය.

"ඔව් සර්, මේක සේදර වැඩ කළ වාහනේ තමා. මොනවද කෙරෙන්ඩ ඕනෑ."

"සේදර අපේ විශ්වාසවන්ත කෙනෙක්. අපේ ඔෆිස් එකේ සෙමිනාස්වලට හෙම යන්නෙ මේ වාහනේ තමයි."

"සේදර අංකල්ට වෙන රස්සාවක් හම්බ වෙලා ගියා. මමයි දැන් මේ වාහනේ වැඩ කරන්නෙ. ප්‍රශ්නයක් නෑ සර්ල කරගෙන ගිය විදියට වැඩ කරන්නම්."

"හා... එහෙම නම් හොඳයි."

WWW.SINHALAELIBRARY.COM 5

ඔහු සාක්කුවට අත දමා ගමන සඳහා අත්තිකාරම් මුදල දුන්නේය.

''අපට දන් බේරුවල හොටෙල් එකකට යන්ට ඕනෑ. තව මගින් කෙනෙක් ගන්ට ඕනෑ. හරියට 2.30 ට සෙමිනා එක ඉවරයි. ඒ වෙලාවට අපිව ගන්ට ඕනෑ.''

ඔහු රථයට පිවිසෙමින් කීවේ ය.

''සර් කොහේ ගියත් කමක් නෑ. හරියට හතරට මම කොල්ලුපිටියෙ ඉන්න ඕනෑ. මේක ඔෆිස් හයර් කරන වෑන් එකක්.''

''හරි හරි, අපි යන්නෙත් රාජකාරි ගමනක්. ඔෆිස් ඇරෙන වෙලාවට අපිත් ඉන්න ඕනෑ.''

ඔහු නියම රාජ්‍ය සේවයට කැපවුණු රාජ්‍ය සේවකයෙක් මෙන් කතා කළේ ය. රථය නතර කිරීමට අවසර ලැබුණේ එක්තරා බැංකුවක් අසල ය. මඳ වේලාවකට පසු අභ්‍යන්තරයෙන් තරුණ කාන්තාවක් රථයට පිවිසෙන හැටි ඔහු දුටුවේ ය. ඒ ළඟට ආවේ රථය වෙන් කර ගැනීමට පැමිණි නැනාත්තා ය.

''එහෙම නම් යමු.''

සහන් නිහඬව රථය ධාවනය කළේ ය. මඳ දුරක් ගිය පසු නිලධාරියා සහන් ඇමතුවේ ය.

''ඔන්න ඔය හෝල්ට් එක ගාව නතර කරමු.''

හෙතෙම යෝජනා කළේ ය. රථය බස් නැවතුම අසල නතර කළ නොබෝ වේලාවකින් අත් දිග කබායකින් හා එම වර්ණයේ ම කොට සායකින් සැරසුණු අවුරුදු විසිපහක පමණ තරුණ කාන්තාවක් රථය අසලට ආවා ය.

''උදේනි කම් ඉන්'' හෙතෙම කාන්තාව ඇමතූ [illegible] වේලාවකින් ඇය විදුලියක් මෙන් රථයට ගොඩ වූවා ය. එම කාන්තාව මොනවා හෝ කතා කරනු ඔහුට ඇසුණි.



''බය වෙන්න එපා. සේදර වෙන රස්සාවකට ගිහින්. මේ ඩ්‍රයිවර්ට කියලයි ගිහින් තියෙන්නෙ.''

රථය ඉදිරියට ඇදී යයි. පරිසරයේ පවතින්නේ නිහඬ බවකි. මේ ඒකාකාරී බව පහව යාම සඳහා හෙතෙම ගුවන් විදුලි යන්ත්‍රය ක්‍රියාත්මක කළේ ය. ඉන් මිදී ආවේ විරහ ගීතයකි. සහන්ගේ සිතට සිහින් සතුටක් ගලා ආවේ ප්‍රථම දිනයේ දී ම වාසියක් ලැබීම පිළිබඳව ය.

එහෙත් යළි සිතට දුකක් පිවිසුණේ තමා ගත කරන ජීවිතය සිහි වීමෙනි.

අදාළ හෝටලය වෙත ඒමට ප්‍රමාද වූයේ සුලබව දක්නට ලැබෙන බස් අනතුරක් නිසා ය. සැවොම රථයෙන් බටහ.

''ඩ්‍රයිවර් හරියට දෙකට මෙතන ඉන්න ඕනෑ.''

ඔළුවට යකා නැග්ගේ තමා ඒ නමින් හැඳින්වීම පිළිබඳව ය. එහෙත් ඒ ගැන දුක් වීමේ තේරුමක් නැත.

පිරිස ගිය පසු වෑන් රිය රථ ගාලට දමා තුදුරින් වූ හෝටලයට ගොස් රොටියක් හා කිරි කෝප්පයක් බිවේ ය. යළි වෑන් රියට පැමිණ අසුන පහත් කර එහි දිග ඇදුනේ ය.

මීට ඉහත රටේ උගතුන්ට විශේෂ ගෞරවයක් ආදරයක් තිබුණි. අද එසේ නොවේ. අධ්‍යාපනය කදබල ලෙස හැල්ලුවට පත්ව ඇත.

''උගත මනා ශිල්පයමයි මතු රැකෙනා'' යන උපදේශ පාඨ බැහැර කිරීමට සිදුව ඇත. දෙමාපියන් දරුවන්ට කොපමණ අධ්‍යාපනය ලබා දුන්නත් ඉන් ඵලයක් නැති බව අද පසක්ව පවතී. උසස් අධ්‍යාපනය ලබන තරුණ පරපුරට තහනම් බොහෝ දේ ඇත. උගතුන්ට ආදරය වහකදුරු මෙන් තිත්ත ය. ඉගෙනීම [illegible] දේශපාලනඥයන් පසුපස ගොස් රැකියා සිගා කෑමට සිදුව ඇත. ඉඩම් උකස් කර විශ්වවිද්‍යාලයට ගිය දුව එන්නේ උපාධියක් ඇතිවය. දෙමාපියන්ගෙන් මිදී ගත කරන නිදහස් දිවියේ

WWW.SINHALAELIBRARY.COM 6

දී ඇති කරගත් ප්‍රේමය සඵල කර ගැනීමට ඇයට නොපුළුවන. පෙම්වතාට රැකියාවක් නැත. ගෙදර සිටිය දී වයස් ගත වීම වැළැක්විය නොහැක. දුව කාට හෝ විවාහ කර දෙන්නේ ඇස් අඳක පියා ගන්ට ප්‍රථම දරු මුනුබුරන් දැකීම සඳහා ය.

සම්මන්ත්‍රණය සඳහා ගිය පිරිස එනු දුටු යළි ඔහුගේ කල්පනාව බිඳුණි. ඔහුගේ නෙත එකවරම ගියේ වෑන් රිය දෙසට එන තැනැත්තිය වෙත ය. මැය උදෙන්ම ගත් බතලවත්තේ තරුණිය බැව් ඔහුට තේරුම් යාමට ගත වූයේ මොහොතකි. මේ ගමනට ආවේ ඇය බැව් ඔහු දැන සිටියේ නැත. සැවොම අසුන් ගත් පසු රථය සෙමින් ඉදිරියට ඇදී ගියේ ය. නියමිත වේලාවටත් ප්‍රථම කාර්යාලයට පැමිණීමට හැකි වීම පිළිබඳව සැවොම සතුටු වූහ. මුදලට අමතරව සන්තෝසමක් ද ඔහුට ලැබුණි.

සහන් රථ ගාලට ගොස් වේලාව එනතෙක් විවේක ගත්තේ ය.

පහතෙම නියමිත වේලාවට රථය රැගෙන තරුණිය සේවය කළ කාර්යාලය අසලට ගියේ ය.

තරුණිය තවත් අයෙක් හා ඉදිරියට එමින් සිටිනු ඔහු දුටුවේ ය. ඔහු ඇයට කිසිවක් පහදා දීමට වෙර දරමින් සිටින බව ඔහුට පෙනේ. වෙනිමකින් හා විශේටයකින් සැරසී අව කන්නාඩිය හිසේ පැළඳ සිටි තැනැත්තා තරුණියට බාධා කරන බැව් ඔහු දුටුවේ ය. මෙය දෙදෙනා අතර පැටළුණු පෙම් කතාවක් විය හැක. ඒවා පෞද්ගලික ප්‍රශ්න ය. ආදරය ඒක පාර්ශ්වීය කටයුත්තක් නොවේ. එය අහඹු සිදුවීමක් ද නොවේ. එය ඔවුනොවුන් පූර්ව ආත්මභාවවල පතා ගත් පරිදි සිදුවන්නකි. සැප විඳින්නට හෝ දුක් විඳින්නට හෝ දෙදෙනෙක් එක් වන්නේ පින් මහිමය නිසා ය. නිර්මලී තමාට අහිමි වන්ට ඇත්තේ ඊට වඩා ක්‍රියාත්මක සමාජ අසාධාරණයක් නිසා ය. එසේ නොවී නම් තමා වැනි රැකියා විරහිත උපාධිධරයකුට තැනින් තැන අතපාන්ට සිදු වන්නේ නැත. පෙම් යුවල දෙස බලා සිටි ඔහු වෑන් රියේ නළාව කීපවරක් ශබ්ද කළේ ය. දෙදෙනාගේ ප්‍රශ්න නිසා ගමන ආරම්භ කිරීමට ප්‍රමාද වුවහොත් එය වේලාවට නිවෙස් බලා ගමන් කිරීමට සිටින පිරිසට කරදරයකි.



"මිස් පරක්කුයි නගින්ඩ" ඔහු වෑන් රිය තරුණිය අසළට ළං කරමින් කීවේ ය.

අව් කන්නාඩිය හිසේ පැළඳ සිටි තරුණයා සහන් අසලට ආවේ ය.

"තව විනාඩි පහක් ඉන්නවා. මට මෙයා එක්ක කතාවක් තියෙනවා."

"ඒවා හෙට තියා ගන්ඩ. මිස් නගිනවා නම් නගින්ඩ. මට යන්ඩ ඕනෑ."

සහන් තරුණයාට අවධානය යොමු නොකරමින් කීවේ ය.

"නාකියා කවදාවත් මට ඡාති දාලා නෑ. අඩෝ උඹ කවුද?"

තරුණයා රියැදුරු අසුනේ සිටි සහන්ගේ මුහුණ හරහා පහරක් ගැසුවේ ය. බලාපොරොත්තු නොවූ පරිදි වැදුණු එම පහරින් සහන් අන්දමන්ද වී ගියේ ය. පහර නාසයට වැදීම නිසා ලේ මතුවන්ට ගතවූයේ මොහොතකි. ජීවිතයේ කිසිවකුගෙන් පහරක් කා නැති සහන්ට මෙය වේදනාවට වඩා ආත්ම ගෞරවය පිළිබඳව වූ ප්‍රශ්නයකි. රථයේ දොර විවෘත කර ඉන් පැනීමට සහන්ට ගත වූයේ මොහොතකි. විශාල පිරිසක් බලා සිටිය දී ම සහන් තමාට පහර දුන් තැනැත්තාට පහර දුන්නේ ය. සහන් සිය කෝපය පහවන තෙක් ඔහුට පහර දුන්නේ ය. තරුණයා බේරා ගැනීමට අවට සිටි පිරිස ගත් උත්සාහය නිසා සටන අවසන් වුණි. තරුණිය දෑස් අයා තමා දෙස බලා සිටිනු සහන් දුටුවේ ය.

"වෑන් එකට නගිනවා ද නැද්ද?"

සහන් තරුණිය දෙස බලා ඇසුවේ ය. ඒ දෙනෙත් හරියට එක එල්ලේ තමා දෙස යොමු වී තිබූ හැටි.

WWW.SINHALAELIBRARY.COM 7

දුන් මෙහි පැවතුණේ කුඩා යුද්ධයකි. පහර කෑ තැනැත්තා අභියෝග කරමින් යන්ට ගියේ ය. සහන් දෙස එක එල්ලේ බලා

සිටි තරුණිය වෑන් රියේ ඉදිරිපස දොර විවෘත කර ඔහු අසලින් අසුන් ගන්නා ය.

''ලේ එනවා'' ඇය සහන් දෙස බලා සිය ලේන්සුව පාමින් කීවා ය. ර'ථය මාවතේ අයිනට කර නතර කළ සහන් ලේන්සුව වතුරෙන් තෙමා නාසයට තද කර මඳ වේලාවක් සිටියේ ය. මීට වඩා යහපත් ප්‍රතිචාරයක් ඔහු තරුණිය වෙතින් බලාපොරොත්තු වුණි. මේ අනතුර සිදුවූයේ අනවශ්‍ය කතාවකට මැදිහත් වීම නිසා ය. අඩු වශයෙන් සිය කනගාටුව ප්‍රකාශ කිරීමවත් සිදුවෙතැයි ඔහු සිතුවේ ය.

ඒ ළඟ මගියා ගැනීමට එන තෙක් ඇය තමා හා කතා කරාවී යැයි සිතූ මුත් ඇය මුනිවත රැකීම සිත කම්පාවට පත් කරනු සුළු විය.

වෑන් සේවය ඇරඹූ දින සිට මගීන් අසුන් ගත්තේ ඔවුනට පුරුදු අසුන්වල ය. බතලවත්තෙන් නගින අහංකාර තරුණිය අසුන් ගත්තේ පිටුපස අසුනෙහි ය. ඇය මේ ගමනට එක්වූයේ මෑතක නිසා කිසිවෙක් සමඟ සම්බන්ධකමක් නැත. මැය මෙහි ගමන් කරන සෙසු මගීන්ට වඩා ධනවත් යුවතියක් බව සැළ ය. එක්තරා දේශපාලන බලවතකුගේ දියණියක් වන ඇය දෙපාර්තමේන්තුවක උසස් තිලයක් දරන්නියක බව සැමෝම දනිති. ඇය අහංකාරව සිටින්නේ ඇගේ රූපශ්‍රීයාව නිසා යැයි හැඟෙන නිසා කිසිවෙක් ඇය හා කතාවට යන්නේ නැත.

ආපසු එන ගමනේ දී ඉඳ ගන්නා අසුනේ වෙනස කාගේත් සැලකිල්ලට හේතු වී තිබුණි.

''වෙනදා අන්තිම සීට් එකේ ඉඳ ගන්න කෙනා අද මොකද ඉස්සරහට ගිහින්''

කවුදෝ කියනු ඔහුට ඇසුණි.



# 03

මෙම කතාවට සැමෝම එකවර සිනාසෙනු සහන්ට ඇසුණි. ඔහු සැමට ම හොරෙන් යුවතිය දෙස බැලුවේ ය. මෙම සරදමට තමාත් සම්බන්ධ බව හැඟී ගියේ ඉන් පසුව ය.

''අනේ කාට හරි සෙනක් වෙනවා නම් හොඳා''

පිරිස යළි සිනාසෙනු ඇසේ.

''අර නාකි මනුස්සයා ඉන්නකල් ඉස්සරහට ආවෙ නෑ.''

''හැබැයි කොල්ලුපිටියෙ දී කවදාහරි බඩ පිරෙන්ඩ කයි'' ඒ හඬ නැඟුණේ මේ වාහනයේ ගමන් ගන්නා එක ම පිරිමියාගෙනි.

කොල්ලුපිටියේ දී අද සිදුවන්ට ඇත්තේ අහඹු සිදුවීමක් නොවේ. මොවුන් සෑහෙන කලක සිට දන්නා හඳුනන පෙම් යුවලක් විය යුතුය. අනුන්ගේ ප්‍රශ්නවලට මැදිහත් වීමෙන් තමා අතින් සිදුව ඇත්තේ බරපතළ වරදකැයි ඔහුට සිතුණි. එහෙත් මෙය ඔවුන්ගේ ප්‍රශ්නවලට මැදිහත්වීමට යාමක් නොවේ. ගෙනෙම් තමාට පහර නොදුන්නා නම් මෙවැනි තත්ත්වයක් උදා වන්නේ නැත. ඔහුට හැඟුණේ තමාට පහර දීම නිසා උපන් ක්ෂණික කෝපය නිසා ය. ඒ හැර පළිගැනුමේ චේතනාවක් පැහැදිලිවම සිතේ නැත.

WWW.SINHALAELIBRARY.COM 8

ඔතලවත්තේ පිහිටි ඇගේ නිවස අසලින් පිහිටි නියමිත ස්ථානයේ ඔහු රථය නතර කළේ ය. සිදු වූ දෙයට ඇය කිසියම් වචනයක් පවසාවි යැයි ඔහු උදක්ම සිතා සිටියේ ය. කිසිදු වචනයක් නොදොඩා රථයෙන් බැස පහත් කරගත් හිසින් යුතුව නිවස දෙසට යන තරුණිය දුටු ඔහුගේ සිතේ කෝපයක් ඇති වුණි. ඇයට කතා කර ලේන්සුව දීමට සිතුණු මුත් ඒ වන විට වත්ත මැද පිහිටි නිවස දෙසට පියවර මනිනු දුටු නිසා නිහඬව සිටියේ ය. රථයේ සිට බලන විට වත්ත මැද පිහිටි විශාල නිවස දිස් වෙයි. දෙපස කාර්යාල කාමර දෙකක් පුළුල් පෝටිකෝවක් සහිත වූ මෙනිවස අධිසියවසකට වඩා පැරණි වූවකැයි ඔහුට සිතුණි. පසෙක ගරාජයක් හා රියදුරන්ට නවාතැන් ගැනීම සඳහා වෙනම ඉදිකර තිබූ නිවසකි. කලක් මෙය සෞභාග්‍යයෙන් සපිරි ප්‍රාසාදයක්ව තිබූ බවට කිසිදු සැකයක් නැත. එහෙත් අද ජරාවාසව ඇති බවක් ඇතට පෙනුණි.

සහන් නිවසට යන විට තරමක් ප්‍රමාද වී තිබුණි. කාමරයට ගොස් ඇඳුම් මුදවා කෙටි විවේකයක් ගෙන දිය නා ගත්තේ ය. අක්කා තේ කෝප්පයක් රැගෙන කාමරය තුළට ආවේ ගමනේ ප්‍රගතිය දැන ගැනීමට ය.

"මම කෑමත් තියාගෙන බලන් හිටියා. ඇයි මල්ලි ආවෙ නැත්තේ...?"

"පොඩි හයර් එකක් වැදුණා. පොඩිත් නෑ තරමක් ලොකුයි."

ඔහු ඇඳෙන් නැගිට කමිස සාක්කුවෙන් මුදල් ගෙන සොහුරියට පෑවේ ය.

"මට එපා. ඒක මල්ලි වියදමට තියා ගන්න." සමන්තා කීවාය.

"ඔයා තියා ගන්න."

මුදල් දුටු සැණින් ඇ දෑස් ලොකු කර ගත්තා ය.

"කවදාවත් මට සේදර මෙච්චර සල්ලි ගෙනැත් දීලා නැ දෙවියනේ... සේදර මට කොච්චර වංචා කරලා ඇද්ද?"



"ඒ ගැන කතා කරලා වැඩක් නෑ. මේ රස්සාවෙ හැටි එහෙම තමා. රාජ්‍ය ආයතන හැම එකකම එහෙමයි. ඉස්සර පගාව ගන්න බයයි. අද ඕනෑම වැඩක් කරවා ගන්න කෙළින්ම ගාන කතා කරනවා."

"අනේ මව මල්ලි. මෙහෙ ට්‍රාන්සර් පෝම්ට් ටික ගන්න කෙළින් ම මගෙන් ගාන ඉල්ලුවා. ඒක නොදුන්නොත් රස්තියාදු කරනවනෙ. ගාන දුන්නා."

"පගාව දෙන්න එපා. එතකොට මුන් තවත් හරස් වෙනවා."

"අපි ඉස්සර හිතුවෙ පගාව ගන්නෙ පිරිමි විතරයි කියලා. දැන් ගෑනුත් වැඩේ කරලා දෙන්න පගාව කටින් ඉල්ලනවා. මේ ඉඩමේ ඔප්පුවෙ වැඩකට මම කච්චේරියට ගියා. සබ්ජෙක්ට් එක කළේ ගෑනියෙක්. සල්ලි අතට ගන්නෙ නෑ. ඉල්ලපු ගාන මම ලාච්චුවට දැම්මා. හැන්දෑවෙ ඔප්පුව අතේ."

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි. මේ සාමාන්‍ය සුළු දේවල් පමණි. උද්ධමනය හා ඊට සාපේක්ෂව ලැබෙන වැටුප නිසා හැමදෙනා ම දිළින්දන් බවට පත්ව ඇත. සොරකමට පෙළඹෙන්නේ නැති බැරිකම නිසා ය. එය හොරකමට සාධාරණ හේතුවක් නොවේ. පොඩි එකා කාර්යාල කාර්ය සහායක මට්ටමේ සොරකම් කරද්දී මහා එවුන් මහා වංචා කරති.

සහන්, අක්කා දුන් තේ කෝප්පය පානය කළේ ය. ඇගේ සිතට අමතර ශක්තියක් ලැබුණේ අනපේක්ෂිත මුදලක් ලැබුණු හෙයිනි. පැහැදිලිව ම මෙම මුදල සම්මා ආජීව නොවේ. ආර්ථික විද්‍යා මූලධර්මයන්හි ඇත්තේ මුදල විනා මුදල උපයා ගන්නා ක්‍රමය නොවේ. දැනට ලංකාවේ ඇති තානායම්, නිවාඩු නිකේතන හෝටලල්වලට පිවිසෙද්දී විවාහ සහතිකය විමසන්නේ නැත. මොන බාලිකා විද්‍යාලයේ ද මොන පන්තියේ ද යන්න විමසීමට වුවමනාවක් නැත. මේ හෝටල්වල කළමනාකාරීත්වය මෙවැනි ප්‍රශ්න ඇසුවොත් ඒවා නොපැවැත්වීමට හැක්කේ භාවනා පන්ති පමණි. අද ක්‍රියාත්මක ආර්ථිකය මෙයයි.

WWW.SINHALAELIBRARY.COM 9

අක්කා කතා කළේ සහන් කාමරය තුළට වී දිගු කල්පනාවකට මැදිව සිටින විට ය.

"මල්ලි නිදාගන්ඩ එපා. තව ටිකකින් කමු. අන්න අර කලින් හිටපු ඩ්‍රයිවර් සේදර ඇවිදින්."

"මට ඒ මනුස්සයා එක්ක කතා කරන්ට දෙයක් නැහැනෙ අක්කා. මේ මට කියන්න බැරි වුණා. අර කතාව සේදරගෙන් හෙම අහන්ඩ එපා. මිනිස්සු තේරුම් ගත්තම ඇති." සහන් කීවේ ය.

"සේදර ඇවිදින් ඉන්නේ වෙනත් වැඩකට. ඡන්දෙට වැඩ කරන්න අපේ වාහනේ ඉල්ලනවා."

ඔහු නිහඬව කාමරයෙන් පිටතට ආවේ ය.

අද මැතිවරණයකට ඉදිරිපත් වීමට විවිධ වර්ගයේ වාහන නැතිව බැරි ය. නියෝජිතයකුට හැම වර්ගයකම වාහන අනිවාර්යයෙන් ම තිබිය යුතුය. අපේක්ෂකයාගේ තරාතිරම පෙනෙන්නේ ඔහු පසුපස යන වාහන කන්දරාව අනුව ය. ලෑන්ඩ්කෲසර්, පැජරෝ, මොන්ටෝරියා, වෝල්වෝ මේ මැතිවරණ ඉතිහාසයේ සමාරම්භක අපේක්ෂකයන් රැසකි. ඩී. බී. ජයතිලක ශ්‍රීමතාණන් දෙවරක් ම කැලණිය අසුනෙන් පාර්ලිමේන්තුවට ආවේ නිතරගයෙනි. අපට නැවත ඒ පාර්ලිමේන්තු සදාචාරයක් නිර්මාණය කළ නොහැක. ප්‍රජාතන්ත්‍රවාදය කිනම් අයුරකින් ඉදිරියට ගොස් ව්‍යාජ වී ඇත්දැයි සිතිය නොහැකි තරම් ය. ඔහු නිහඬව සොයුරිය සමඟින් එළියට ආවේ ය. කලක් අක්කාගේ වැන් රියේ රියැදුරා ලෙස සේවය කළ සේදර, සහන් හොඳින් හඳුනයි. දන්නා කලක සිට ඔහු නිර්ධන පන්තිය පිළිබඳ හැඟීමෙන් කතා කරමින් පෙළපාලිවල සටන් පාඨ කිවූ අයෙකි. අද පමණක් නොව එදා සිට ම පාර්ලිමේන්තුවේ උසස් තනතුරු දරූ අය පිනුම් ගැසූහ. එය ප්‍රජාතන්ත්‍රීය අයිතියක් නම් සේදරත් එසේ කළාට කිසිදු වරදක් නැත. අද නිර්ධන පන්තිය සොයා ගැනීම සෑහෙන ප්‍රශ්නයක්ව පවතී. සේදර හැඳ සිටියේ එක්තරා පක්ෂයක් නියෝජනය වන වර්ණයක් සහිත කමිසයකිනි.



"දැන් බැහැලා වැඩ වගේ."

සහන් සිනාසුණේ ය.

"ඔ... යර්ස්. මම වැඩ කරද්දිම දිනාන්ඩ ඉස්සර බොස්ට කිව්වා. ආවා විතරයි දුන්නා. මොකද අපි ජීවිත පරිත්‍යාගයෙන් වැඩ කළ අය."

ඔහු ඉදිරිපස දත් ඇන්ද දිවෙන් පද්දා සිනාසුණේ ය.

සහන් ඒ පිළිබඳව කිසිවක් පැවසුවේ නැත.

"සමන්තා නෝනා කියන්ඩ ඇතිනෙ. අපි සෙනසුරාදා ඉරිදා වැඩ කරමු. ෆුල්ටෑන්ක් ගහල ගානක් අරන් දෙන්නම්. ට්‍රාන්ස්පෝට් වැඩේ කරන්නෙ මමයි."

සමන්තා සොයුරා දෙස බැලුවා ය. කිසිම සැකයක් නැතිව සේදර මෙම ඡන්ද ව්‍යාපාරයෙන් පාක්ෂිකයන් රවටා ගානක් වංචා කරගනු ඇත. මිට ඉහත සේදරගේ වැඩවලට බව පවසා වාහනය ඉල්ලා ගත්තත් ඉන් කරන්ට ඇත්තේ කුමක් දැයි දැන් ඇයට වැටහෙයි.

"ඡන්ද වැඩවලට වාහන දුන්නාම කැඩෙනව. සීට් උඩ නැගලා වැන් එකට ගහ ගහ යන්නෙ" සමන්තා කීවා ය.

"මම නෙමේ වාහනේ ඉල්ල ගන්ඩ කිව්වෙ. අතට ලැබුණ දේ කටට දා ගන්නවා මිසක් අහකට දා ගන්ඩ එපා. සහන් මහත්තයලාට පින නෑ."

සහන්ගේ සිතට අමනාපයක් පිවිසුනේ තමා පිළිබඳව බාහිර පුද්ගලයෙක් කතා කිරීම පිළිබඳව ය.

"අපි විප්ලව කරනකොට, අපි පෙළපාලි යනකොට මහත්තයල ඉපදිලා නෑ. ඇත්ත සමාජවාදීන් දක්කෙ අපියි. මාසෙකට සැරයක් ඇවිදින් පිකටින් එකක් කරලා සටන් දිනන්ට බෑ. ඒ කාලෙ ගියා බොස්."

WWW.SINHALAELIBRARY.COM 10

සේදර පවසන්නේ සත්‍යයක් වුව ද මීට එහා කළ හැකි දෙයක් නැත. අද සිටින මේ වෘත්තිකයන්ට තදබල දේශපාලන දර්ශනයක්, න්‍යායක් නැත. වරින් වර පක්ෂ මාරු කිරීමට ඇති මානසිකත්වයක් හැරුණ විට කවුරුත් එක පන්තියක මිනිසුන් ය.

''අක්කා වාහනේ දෙන්න බැහැයි කියන නිසා වෙන තැනකින් එකක් හොයා ගන්න.''

''අයියෝ ඒවා සිම්පල් වැඩ. මම ආවෙ නව පොඩි වැඩකට. ඒක මෙතන කතා කරන්ඩ බෑ. අපි එළියට යමු.''

ඔහු සහන් සමඟ මිදුල දෙසට ගියේ ය. පරිසරය තුළ තරමක නිහඬ බවක් ඇත. හුදුරින් වූ මාවතේ විරී ලාම්පු දැල්වෙමින් පවතී.

''අද කොල්ලුපිටියේ දී මොනාව හරි කේස් එකක් ඇහුනද?''

ඔහු තාප්පයට මුවා වී සුළඟ වළකා ඉස්තරම්ම වර්ගයේ රට දුම්වැටියක් දල්වා ගනිමින් ඇසුවේ ය. සහන් එකවරම පිළිතුරක් දුන්නේ නැත.

''ඇයි මේ වගේ කේස් එකකට අහන්නෙ නැතිව අත දැම්මෙ. උන් පාතාලෙට සම්බන්ධ කුඩුකාරයො. උන්ට මෙහෙ කරන්ට බැරි දෙයක් නෑ.''

''රජේක් වුණත් මට විරුද්ධව අත ඉස්සුවොත් මම අත හරින්නෙ නැහැ.''

''ඒකෙනා ගෑනු පිස්සෙක්. දෙන්නට දෙන්නා අඳුනනවා. ඒ දෙන්නාගෙ ප්‍රශ්න ඒ අයට විසඳ ගන්න ඉඩ දීලා අත දැම්මෙ ඇයි?''

හෙතෙම කම්පාවට පත්වූයේ අවංකව ම ය.

''නෑ සේදර මම මුකුත් දන්නෙ නෑ. යන්ඩ පරක්කු වෙන හින්දා මම ඒ ගර්ලට කතා කළා. මම දන්නෙ නෑ ගෙණි ගහගන්නැතෙ මට ගැහුවා. මාත් දුන්නා.''



''ගුල් ඉස්පෝරි මට අහින් බ්‍රැයිවර්ලා කිව්වා. මැන්ට දුන්න එකට නම් මක්කොම කැමතියි. හැබැයි සර් උන් මිනීමරුවෝ.''

''ඒත් ඉතින් කරන්ඩ දෙයක් නෑ.''

''සර් ඒ කෙල්ල අඳුනනවද?''

''කොහොමද අංකල් මම අඳුනන්නෙ. අදනෙ දැක්කෙ.''

''මේකත් දේශපාලන පත්වීමක්.''

''කොහොමද අංකල් දන්නෙ...?''

''ඒ කතාවලින් වැඩක් නෑ. සර් මීට පස්සෙ කෙල්ලගෙ කේස් එකට අත දාන්ඩ එපා. ඒ කුඩ්ඩා මිනීමරුවෙක්. පිස්සෙක්. කොයි වෙලාවෙ හරි ඔය කෙල්ලව උස්සාගෙන යනවා. දෙන්නා නැදෑයෝ.''

''මම නැති වෙලාවක එහෙම දෙයක් කළොත් කරන්ඩ දෙයක් නෑ. මම ඉන්දෙද්දි නම් මගෙ වෙලාවෙ ඇතුළත අත තියන්ඩ දෙන්නෙ නෑ.''

''කිව්ව දේ අහන්ඩ ඔය අහිංසක කෝනගෙ වාහනෙත් කඩා දමාවි. බෝම්බයක් ගහයි.''

WWW.SINHALAELIBRARY.COM 11

# 04

පරිසරයේ තරමක නිහඬ බවක් පැතිර තිබුණි. ඒ නිහඬ බව ඉදිරියේ නිවස අසල නතර කරන ලද වාහනයක ශබ්ද විකාශන යන්ත්‍රයකින් බිඳී ආ හඬිනි. ඉන් නගර සභාවට තරග කරන අපේක්ෂිකාවකගේ පුරසාරම් කියනු ඇසේ. අද පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, නගර සභා ප්‍රාදේශීය සභාවල කාන්තා නියෝජනය අඩු ය. කාන්තාවගේ ගෞරවය ආරක්ෂා කිරීමට නම් නීතිගතයෙන් අවශ්‍ය කාන්තා ප්‍රතිශතය ලබා දීමට ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුය. හොඳ පවුල් ජීවිත ගත කරන බුද්ධිමත් කාන්තාවන් මේ තුච්ඡ මැරවර බලු පොරයට දමා ඔවුන් බාල්දු නොකළ යුතුය. සේදර මඳ සිනාවෙන් යුතුව ප්‍රචාරයට සවන් දුන්නේ ය.

''සල්ලි තියෙනවා නම් ඕනෑ කෙනෙකුට උස්සන්න පුළුවන්. ඒ තරම බඩඩ.''

හෙතෙම සමස්ත කාන්තා පරපුරම හැල්ලුවට පත් කළේ ය.

''සේදර එහෙම කතා කළ එක වැරදියි. දේශපාලනය, දර්ශනය කොයි දේ වුණත් හැම ගෑනියෙකුටම ආත්ම ගෞරවයක් තියෙනවා. තමුසෙක ගෑනිට බඩඩ කිව්වොත්...''

ඔහු මඳ වෙලාවක් නිහඬව සිටියේ ය. දේශපාල[illegible] තත්ත්වය එකිනෙකාට ගරහා ගැනීමයි.



''අපි පක්ෂ දේශපාලනය කරන කොට එකිනෙකාට බැණ ගන්නවා. පාර්ලිමේන්තු ගියාම තේ පාටි දානවා. අරක්කු පාටි දානවා.''

''ගෑනුන්ට විරුද්ධව කතා කරනවාට සර් කැමති නෑ.''

''ඇයි එහෙම කිව්වෙ...?''

ඡන්ද ප්‍රචාරක රථය බාල වර්ගයේ සින්දුවක් ප්‍රචාරය කරමින් යනවා ඇසුණි.

''කොල්ලුපිටියේ කෙල්ල ලස්සනයි. ඒකිට ලොකු ලොකු අය ට්‍රයි කරනවා.''

''ඉතින් මට මොකද?''

''සර් ගහපු කොල්ලා ලොකු පවුලක එකෙක්. දේශපාලන බලය තියෙනවා. ඔය ගෑනියට දහයක් පහළොවක් විතර ඉන්නවා.''

''මම ගැහුවෙ මට ගහපු හින්දයි. මට කවුරුත් එකයි.''

''බතලවත්තෙන් බහින සුදු කෙල්ලගෙ කේස් එකනෙ. ඒ දෙන්නා අතර ලොකු ප්‍රොබ්ලම් එකක් තියෙනවා. සර් මේකට අත දමන්ට එපා. ඒකා පළිගන්න එකෙක්. මෙතන ඉන්න ඩ්‍රයිවර්ලත් බයෙන් ඉන්නෙ.''

සේදර ගිය පසු ඔහු මිදුලට වී මඳ වෙලාවක් සිටියේ ය. අහස පැහැදිලි ය. සුදු සඳ එළිය දසත පැතිර ඇත. සෙමින් වලාවකට යට වූ සඳ යළි සිය අණසක පතුරමින් සිටී. හමන සුළඟ තරමක සිසිල් බවින් යුතුය.

එම යුවතියට සහාය වූයේ ඇය සැබවින්ම ප්‍රශ්නයකට මැදිව සිටි හෙයිනි. ගැහැනියක මෙලෙස විඳවීම සදාචාරාත්මක නැත. කාමරයට පිවිස ඇඳේ වැතිරුණ ද එකවරම ඔහුට නින්ද ළඟා වූයේ නැත.

පසුදින පිබිදුනේ අක්කාගේ හඬිනි. මුහුණ සෝදා ගත් ඔහු අක්කා දුන් තේ කෝප්පය පානය කර නිමවා වැන් රථයේ

WWW.SINHALAELIBRARY.COM 12

තෙල්. වතුර බැලුවේ ය. නිවස තුළ සිට පැමිණි අත්කා රථයට කහ දියර ඉස ටයර්වලට දෙහි ගෙඩි තැබුවා ය.

සහන් හරියට නියමිත වෙලාවට බතලවත්තට ගියේ ය. ඇය තමා පිළිබඳව කෙසේ සිතාවිද?

තමාට පහර දුන් මොහොතේ ඇය කෑ ගැසූ හැටි මතකය. තමා මේ හැම දෙයක්ම කළේ සද්භාවයෙනි. ඇය නිසා තමා පහර කෑම පිළිබඳව බෙහෙවින් දුකට පත්ව ඇති බව කීමට වෙනත් සාක්ෂි අවශ්‍ය නැත. නාසයෙන් ගැලූ ලේ පිස ගැනීමට ඇය තමාට අත් ලේන්සුවක් දුන් හැටි මතකය. අද ඇය තමා අසලින් ඉඳ ගැනීමට අනිවාර්යයෙන්ම එනු ඇත. බතලවත්ත නිවස ඉදිරිපිට ගේට්ටුව අසල රථය නතර කළත් කිසිවෙක් නොසිටීම නිසා සිතේ අමනාපයක් ඇති වුණි. ඇයට නියමිතව තිබුණේ තමා එන තෙක් ගේට්ටුව අසල රැඳී සිටීමට ය.

ඔහු වෑන් රියේ සිට නිවස දෙස බලා නළාව ශබ්ද කළේ ය. මඳ වේලාවකට පසුව අවුරුදු හැට පනක පමණ තරබාරු කාන්තාවක් ගාටමින් ගේට්ටුව අසලට එනු දුටුවේ ය.

"දුව ගමනක් ගියා. අද එන්නෙ නෑ."

ඔහු නිහඬව රථය පාරට ගත්තේ ය.

රථය මඟීන්ගෙන් පිරී ගිය පසු තමාව සරදමට ලක්වන හැටි ඔහුට තේරුම් ගියේ ය.

"රියේ නම් ජොලියට ගියා. අද එපා වෙලා වගෙ." ගමන නිමා වන තෙක් විහිළු කළත් ඔහු ඒ පිළිබඳව කිසිදු නැකිමක් කළේ නැත.

ඔහු සියල්ල ඇරලා රථය නියමිත තැන නතර කළේ ය.

වැඩි වේලාවක් යාමට ප්‍රථම පදික වේදිකාවේ හා පිට්ටනියේ නතර කර සිටි වෑන් රථවල රියදුරන් ඔහු වෙත ළඟා වූහ.



"රියේ වැඩේ නම් නියමයි. හැබැයි මල්ලි පරෙස්සමෙන්" අයෙක් කීවේ ය.

සහන් එකවර කිසිවක් කීවේ නැත.

"ඕකට ලොකු ගැන්සියක් ඉන්නවා. කොයි වෙලේ හරි ගේම දෙයි. ඇයි අහන්නෙ නැතිව අත දැම්මෙ."

මේ කාගේත් පොදු අදහස විය.

"හැබැයි නියම කරාටි පාරවල්. ඔක්කොම වැදුනෙ යටි බඩට. මෙලහට පත්තු බඳිනවා ඇති."

ඔවුහු සිනාසෙන්නට වූහ.

සහන් ඔවුන් සමග මේ පිළිබඳව වැඩි කතාවකට ගියේ නැත. තම සිතේ පෞද්ගලිකවම එම තැනැත්තා පිළිබඳ වෛරයක් හෝ අමනාපයක් නැත. ඇතැම් විට ඔවුන් මෙසේ පවසන්නේ ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න නිසා විය හැක.

සහන් පසුදින සිය සේවය ඇරඹුවේ තරමක උනන්දුවකින් යුතුවය. උදෑසනින්ම සූදානම් වූ හෙතෙම ප්‍රථමයෙන් පුවතිය සිටින බතලවත්තේ නිවසට ගියේ ය. මෙච්චර දෙයක් වෙලත් මගෙන් සමාව ඉල්ලන්න බැරිව ගියා. මොකද්ද මෙච්චර ආඩම්බර වෙන්න හේතුව. ඔහු නිවස ඉදිරිපිට ගේට්ටුව අසල රථය නතර කළේ ය. ඇය පෙනෙන තෙක් මානයක නොවීම නිසා සිතේ ඇති වූයේ තරමක කෝපයකි.

ගේට්ටුව අසල නොසිටීම නිසා තරමක අමනාපයක් සිතේ ඇති වුණි. රථයේ නළාව ශබ්ද කොට නොබෝ වේලාවකින් මහා හැඩරුවින් යුත් කාන්තාවක් නිවස දෙස සිට එනු ඔහු දුටුවේ ය.

"අද දුවට සනීප නෑ."

ඔහු නිහඬව රථය හරවා මාවතට ගත්තේ ය. දින දෙකක් ම නොපැමිණීමට හේතුවක් තිබිය යුතුය. ඇතැම් විට ඇය රැකියාවට

WWW.SINHALAELIBRARY.COM 13

නො එන්නේ කොල්ලුපිටියේ වූ ප්‍රශ්නය නිසා විය යුතුය.

මෙම වෑන් රථයේ ගමන් ගන්නා මගීන් පිළිබඳව එතරම් වැටහීමක්, අවබෝධයක් ඔහුට නැත. ඒ පිළිබඳව සෙවීම ද තේරුමක් නැත. නිවෙස් අසලින් නගින පිරිස ඒ නියමිත ස්ථානවලින් බැස යති.

කොල්ලුපිටියේ සේවය කරන තරුණිය නැති නිසා ගමනාන්තය තෙක් යාමට ඔහුට අවශ්‍ය නොවුණි.

අද හෙටම රියදුරෙක් ඒමට නියමිත ය. ඔහු පැමිණි පසු මෙම වගකීම පවරා නිදහස් විය හැක.

රියදුරෙක් ලෙස සේවය කිරීමට අවකාශ ඕනෑ තරම් ඇත. එසේ කිරීමට අවශ්‍ය නම් මෙතරම් දුක් විඳින්නට සිදුවන්නේ නැත. එකට විශ්වවිද්‍යාලයෙන් පිට වූ දහස් ගණනකට රැකියා නැත. බොහෝ දෙනෙක් ගම්වලට ගොස් ජීවත් වෙති. මේ තත්ත්වය වත්මන් රටේ වටිනාම සම්පත බව කලින් කලට පත්වන පාලකයන්ට නොතේරීම කනගාටුදායකය. ගමට යාමට බැරි ලජ්ජාව නිසා ඇතැමුන් අගනුවර කුඩා රැකියාවල නිරත වෙති. උදේ වරුවේ වැඩක් නැති නිසා ඔහු දේවාල පාරේ බෝඩිමට ගියේ ය.

ශ්‍රද්ධා, ජයනි ආවමත් කොළඹ නතරව සිටිති. ඒ වන විට ඔවුන් ගමනක් යාමට සූදානමින් සිටියහ.

''ඔා... හරි ගිහින් වගේ.''

ශ්‍රද්ධා වෑන් රථය අසලට එමින් ඇසුවා ය.

''අපිට හොඳයි. ජේන්නෙ නැද්ද මගේ හැටි.''

''මට සහන්වත් මතක් වුණා. පත්තරේ වේකන්සි වගයක් තිබුණා.''

''වැඩක් නෑ. ඒවා අපිට ලැබෙන්නෙ නෑ.''



ජයනි කීවා ය.

''අනවශ්‍ය දේ කතා කරන්නෙ ඇයි? ආයෙත් විරෝධතා උද්ඝෝෂණයක් 10 දා තියෙනවා.''

''මාව මිනිහෙකුට දෙන්න ගෙදර කුමන්ත්‍රණයක් තියෙනවා,'' ජයනි කීවා ය.

''එහෙම නම් ළමයි හදන මැෂිමකට ළඟදී වැඩ තිටිවි.''

ඔවුහු එකවර සිනාසුනහ.

''අනුන්තරාට හැම අවුරුද්දේම ළමයෙක්.''

''උන් ඒ දේ කරමින් සතුටු වෙනවා. අපිට ඒකත් නෑ.'' ශ්‍රද්ධා කීවා ය.

සියල්ලෝ ම යළි එක්ව සිනා සුණෝ ය.

''හුඟ කාලෙකට පස්සෙ අද හුඟාක් හිනා වුණා. ඔය යන්නද නැගිටිමේ...?''

''හැන්දෑවට කට්ටිය එකතු කරගෙන යන්ට එපායැ. උන් හැම එකාම මට සයිස් එක දානවා.''

''දේශපාලන විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිධාරියෙක් කියලා කවුරුත් දන්නෙ නැතිව ඇති.''

''මේ සහන් ඇප්ලිකේෂන් එකට උත්තරයක් ආවොත්... නෑ අපි විරෝධතා රැළිය දවසේ කතා කරමු.''

WWW.SINHALAELIBRARY.COM 14

## 05

ශ්‍රද්ධා විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබද්දී තමා සමඟ සමීප හිතවත් කමක් පැවැත්වූ යුවතියකි. ඇගේ ජීවිතය බෙහෙවින් විවෘත ය. ගම්බද මහා විද්‍යාලයකින් මෙහි පැමිණි ඇය අනික් තරුණියන්ට වඩා වෙනස් ය. ජීවිතය විනිවිද දකින වෙනස් දැනුමක් ඇය වෙත තිබුණි. පොදුවේ ස්ත්‍රියක් ප්‍රශ්නයක් දෙස බැලීමේ දී පිරිමියෙකුට වඩා වෙනස් ය.

වන්නියේ ගම්මානවල මිනිසුන් අත් විඳින දුක්ඛ දෝමනස්සයන් පිළිබඳව විමලරත්න කුමාරගම කවියා මැවූ චිත්‍රය අද වෙනස් ය. විසි වසරක් තිස්සේ ගැමියන් අනවරතයෙන් විඳි දුක් දොම්නස් දකින්නට විමලරත්න කුමාරගම කවියා සිටියා නම් කොටි හපුවා, තනි අලියාගේ හඬට වඩා නිබඳ අසෙන වෙඩි හඬ පිළිබඳව ලියනු ඇත.

ශ්‍රද්ධා තනිව සිටිය දී ලියන කවි සහන්ට දෙයි. ඒවායින් කියැවෙන්නේ අපි ජීවිතයේ දී අත්විඳින පීඩාවන් ය.

මේ තුළ ගැහැනියගේ සොඳුරු යෞවනය පිළිබඳව සොඳුරු අපේක්ෂාවන් නැතිවා නොවේ. පිරිමියෙකුගේ උණුසුමේ සිරවීමට ගැහැනියට විවෘත අයිතියක් ඇත. පිරිමියෙකුගේ කායික ආශ්වාදයක්



ලබන්නට, කය රිදවා දරුවෙක් බිහි කරන්නට, දරුවෙකුට උකුල යහනක් කරන්නට ඇති ස්වභාවික අයිතීන් අද ඈතින් ඈතට යයි.

ඉක්මනින් පිපී සුවඳ හමන ගැහැනිය නමැති කුසුම හරියටම ඒ යුගයේදීම නෙළාගත යුතුය. වර්තමානයේ දෙමාපියන්ට තම ගැහැනු දරුවා ගේ ජීවිතයේ ලස්සන අවස්ථාවන් නියම අයුරින් දකින්නට ලැබෙන්නේ කලාතුරකිනි.

සුදුසු වියේ දී පති කුලයට යැවීම අද සිහිනයකි. විවාහ ආර්ථිකය මත ආදරයට ලංසුවක් වැටී ඇත. "දෑවැද්ද නැති විවාහ විරලය" ශ්‍රද්ධා මේ වේදනා දරා සිටින යුගයේ තවත් යුවතියකි.

ඇය තමා හා සංවාදයේ යෙදී අහිංසක සතුටක් ලබන බවත් ඔහු දනී.

සහන් යුවතිය සේවය කරන කොල්ලුපිටියේ පිහිටි කාර්යාලයට ගියේ ඇගේ පැමිණීම අපේක්ෂාවෙනි. ඇය ප්‍රසිද්ධව සිටියේ අහංකාර තරුණියක් ලෙස ය. ඇය කිසිවෙක් සමඟ කතා බහ කරනවා සහන් දැක නැත. රථයට පිවිසි සැනින් පොතක් හෝ සඟරාවක් බැලීම ඇගේ සිරිත වෙයි. එහි ඇති වරදක් නැත. මෙසේ සිටින්නේ ඇගේ අහංකාරකම නිසා යැයි පොදු අදහසක් කා අතරත් ඇත. රථයේ ගමන් කරන අනිත් මගීන් එකිනෙකාගේ කේලාම් කියනු ඇසේ. මැය එසේ නොවේ. ගැහැනියක් සිය අභිමානය අනිවාර්යයෙන්ම ආරක්ෂා කර ගත යුතුය.

ඇය පෙම් හබයක පැටලී ඇති බව ප්‍රසිද්ධ රහසකි. ආදරයට කාටත් සම්බාධක පැනවිය නොහැක. ඒවා ඔවුන්ගේ පෞද්ගලික ප්‍රශ්න වෙයි. එම තැනැත්තා තමාට පහර නොදුන්නා නම් මෙපමණ කරදරයක් ඇතිවන්නේ නැත. මැය සැබවින්ම අහංකාර තරුණියකි. තමා කළ උපකාරය අඩු වශයෙන් අගේ කර කතා කළ හැකිව තිබුණි.

කිසියම් මොහොතක තමාට මැර ප්‍රහාරයක් එල්ල වන බව ඔහු පැහැදිලිවම දැන සිටියේය. ඒ සඳහා විශේෂ සූදානමක් තිබුණේ නැත.

WWW.SINHALAELIBRARY.COM 15

වේලාව හතරයි තිහයි. ඇය තවම නැත. හරියටම වේලාවට පැමිණීම පුරුද්දක් වුවද තවත් වැඩිපුර වේලාවක් බැලීමට ඔහුට පුළුවන. ඒත් තවම නැත. සමහරවිට ඇය වෙනත් තැනකට ගියා වන්නට පුළුවන.

අවුරුදු උත්සව ළඟා වෙමින් පවතින නිසා කලින්ම මාසේ කුලිය එකතු කර ගත යුතුය. කල්පනාවේ මැදි වී සිටි ඔහුගේ නෙත් එකවරම යොමු වූයේ කාර්යාලය දෙසින් එන යුවතිය දෙසටය. සැබැවින්ම ඇය ලස්සන ය. පහත් කරගත් හිසින් යුතුව රථය දෙසට එන ඇගේ රුව සිත සසල කිරීමට හේතුවුණේ තියුණු ලෙස රුව මතුව තිබූ හෙයිනි.

වෙනදා ඇය ගමන් කරන්නට ඇත්තේ පසුපස අසුනක බව වෑන් රියේ ගමන් කරන අයගේ කතාවෙන් කියැවුණි. ප්‍රථම දිනයේ දී ම රථයේ ඉදිරිපස අසුනට පැමිණ ඉඳ ගත්තේ ආරක්ෂාව සඳහා ය. මෙවැනි ප්‍රශ්නයක් ඇති වූ බව කිසිවෙක් නොදනිති. යුවතිය පැමිණ ඔහු අසල අසුන් ගත්තා ය. රථය ඉදිරියට ඇදී යයි.

ඇය පසු වුණේ කියපත් මුවැත්තියක ලෙසිනි. වැඩි වේලාවක් යන්නට පෙර වෑන් රිය මගීන්ගෙන් පිරී ගියේ ය. යුවතිය ඉදිරිපස අසුනේ අසුන් ගැනීම පිළිබඳව සැමෝම සිනාසෙන්නට වූහ. වැඩකට නැති ඕපාදූප දොඩන එවුන්ට මෙය නැවුම් සිදුවීමක් වුණි.

''හොඳයි, හොඳයි... ආසනය නිතරගයෙන් අයිති කරගෙන.''

ඔවුහු එකවරම සිනාසෙන්නට වූහ. යුවතිය නෑසුනාක් මෙන් සඟරාවට යොමු වූ දෙනෙතින් යුතුව පසුවූවා ය.

නැවත නැවතත් සිනාසෙන්නට වෙන විට එය සහන්ගේ සිතට තරමක කරදරයක් වුණි. ඉකුත් දිනවල සිදු වූ කිසිවක් මේ පිරිසේ කිසිවෙක් නොදත්හ. ඇය පැටලී සිටින්නේ ලෙහෙසියෙන් විසඳිය හැකි ප්‍රශ්නයක නොවේ. බම්බලපිටියේ රියදුරන් පැවසුවේ ඇගේ පෙම්වතා පාතාලයට සම්බන්ධ මැරයෙක් බව ය. සමහර විට ඇය ඔහුට බලාපොරොත්තු දී මඟහැරීමට සූදානම් වනවා විය

WWW.SINHALAELIBRARY.COM 16



හැක. එසේ වුවත් මේ පරිද්දෙන් ගැහැනියක මඟ තොටේ දී අඩන්තේට්ටම් කළ යුතු නැත. ඇය දුන් නමට ද ප්‍රශ්නයක් වී ඇත.

රථය ඉදිරියට ඇදෙද්දී එහි සිටි එකම පිරිමියා සහන්ට කතා කළේ ය.

''යාළුවා... ඔන්න ඔය ගේට්ටුවෙන් ඇතුළට දාන්ඩ.''

''හෝටලය ඇතුළට ද?''

''ඔව්, ඇතුළට දාන්න.''

ඔහු නාගරාසන්න ජපන් හෝටලයක් තුළට රථය ධාවනය කර ඉදිරිපස ගෙවුයෙන් නතර කළේ ය.

සැමෝම ඉන් බැස්සේ සතුටිනි. සමහරවිට මෙය ඔවුන්ගේ ප්‍රිය සාදයක් විය යුතුය. අවුරුදු උත්සවය අත ළඟ නිසා බොහෝ දෙනෙක් සාප්පු සවාරි ගොස් ඇති බව ඔහු දුටුවේ රථය තුළට ගෙනා නෑගි භාණ්ඩ දකීමෙනි.

එම ජපන් හෝටලයේ එළිමහන් භූමිය අතිශයින් රමණීය ලෙස සූදානම් කර තිබුණි. රථයෙන් නොබැස්සේ ඔහු ළඟ අසුන් ගෙන සිටි පංචලි පමණි.

''බහින්නෙ නැද්ද?''

ඇය හිස වනා පිළිතුරු දුන්නා ය.

''මිස්ට ඔයත් වාහනේ තියලා එන්න.''

''බොහොම ස්තූතියි. මම මෙහෙම ඉන්නම්.''

''එහෙම බෑ. මේක අවුරුදු පාටියක්. සේදර ඉන්න කාලේ ඉඳල දෙන එකක්. වාහනේ පාක් කරලා එන්න.''

''මම එන්නම ඕනද? මං වගේ ඩ්‍රයිවර් කෙනෙක් මේ උත්සවයට ගැළපෙන එකක් නෑ. සර්ල කාල බීලා සන්තෝස වෙලා එන්න.'' සහන් කීවේ ය.

එම නැනැත්තා සහන් දෙස බලා සිටියේ ය. මොහු හොඳ අයෙක් බව තේරුම් ගත්තේ මෙම යුවතිය ගේ ප්‍රශ්නයට මැදිව සිටි හෙයිනි.

"ඔය මිස් එක්ක එන්න."

තරුණයා යමින් කීවේ ය.

පංචලි කතාවට සවන් දුන්නා විනා පිළිතුරක් දුන්නේ නැත. අද මේ පිරිස එන්න ඇත්තේ කලින් සූදානම්වය. ඒ බවක් නොදන කාගේවත් උත්සවයකට පැමිණිය නොහැක.

"අර කට්ටිය කතා කරනවා."

"මට බෑ. මාව පාරට ගිහින් දාන්න. මම ගෙදර යන්නම්."

"ඒක කරන්න බෑ. තනියම ගෙදර යැව්වොත් අගේට හිටිවි."

"ඇයි මට මොනවා වෙයිද?"

ඇය කතා කළේ තරමක නොසරුප් ලෙස ය.

"මොනවා වෙන්නද කියලා බලාගන්ට තිබුණා. ඒ කතාවෙන් වැඩක් නෑ..."

"මට ගෙදර යන්ට ඕනෑ."

"තනියම නම් අරින්න බෑ."

ඇය හිස ඔසවා තරුණයා දෙස බැලුවා ය. ඔහු කවරෙකු වුවද හොඳ ගතිගුණ ඇත්තෙකි. එසේ වුවත් කලින් සූදානම් නොවූ උත්සවයකට යාමට නොපුළුවන.

"මම ගෙදරට ඇරලවලා එන්නද?"

පංචලි මොහොතක් කල්පනා කළා ය. එපමණ දුරක් ගොස් ආපසු එනවිට බොහෝ වේලාවක් හා ඉන්ධන ද වැය [illegible] උත්සවය නිම වන තෙක් රථයට වී සිටීමට ඇය අදහස් කළා ය.



"මම වාහනේට වෙලා ඉන්නම්. ගිහින් එන්න."

තවදුරටත් බල කිරීමට පුළුවන් කමක් නැත. මේ සාදයට යාමට තමාට ද කිසි ඕනෑකමක් නැත. රියැදුරෙක් වන තමාට මෙවන් උත්සවයකට සහභාගි වීමට අවශ්‍යතාවයක් නැත.

"සහන් ඉක්මනට එන්න. අපිට ඉක්මනට යන්න ඕනෑ."

"මං නැතුවාට ප්‍රශ්නයක් නෑ."

"මේ අවුරුදු පාටිය සහන්ටයි. වාහනේ යන ඔක්කොම සල්ලි දාලා පාටියක් දෙනවා. ඒක දෙන්නේ ඔයාටයි. යමු... යමු. අපිටත් පරක්කු වෙනවා."

තරුණිය සහන්ගේ උරට තට්ටු කරමින් කීවාය.

"මේක මට අයිති දෙයක් නොවෙයි. ඒ හින්දා මේක සේදරට දෙන්න."

"දැන් ඔයානේ අපිට වැඩ කරන්නේ. එන්න මිස් යන්න."

"මට හිසේ කැක්කුමයි වගේ. මම මෙහෙම ඉන්නම්."

යුවතිය උත්සවය සියුම් ලෙස මග හැරියාය.

උත්සවයේ නිමිත්ත දැනගත් පසු එය මග හැරීමට පුළුවන්කමක් සහන්ට තිබුණේ නැත. ප්‍රශ්න කරදර බාධක තිබුණත් මිනිසුන්ගේ හොඳ ගතිගුණ ද ඇත. සහන් මේ වැන් රියේ ගමන් කරන පිරිස පිළිබඳව හදාරා නැත. කරන කටයුත්ත ටික දිනකට හෝ කරනවා හැර දිග පළල මැනීමට ඔහු කැමති වූයේ නැත. සමහර විට මේ කටයුත්ත කාලයක් තිස්සේ පවත්වාගෙන ආ දෙයකි. සහන් හෝටලයේ එළිමහනේ වූ අසුනක අසුන් ගත්තේය.

"මිස්ට ජයසිංහ පංචලි එන්න බැහැයි කිව්වද?"

"හිස කකියනවා කියලා වැන් එකේ ඉන්නවා කිව්වා."

WWW.SINHALAELIBRARY.COM 17

''එයා පොඩි මිනිස්සුන්ගෙ උත්සවවලට එන්නෙ නෑ. එහෙම නම් මේ ශෝර්ට් ඊට්ස් ගෙනිහින් දෙන්න.''

සරෝජා කීවා ය.

''අනේ මට නම් බෑ.''

සැමවාම ඇය වෙත රසකැවිලි ගෙන යාම ප්‍රතික්ෂේප කළහ.

''දැන් සහන්ට කිව්වු වෙලාවෙ ඉන්නෙ. සහන්ම ගිහින් දෙන්න.''

කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් මෙය තමා වෙනුවෙන් සූදානම් කරන ලද යෝජනාවක් නිසා ඇය වෙත රසකැවිලි ගෙන යාමට අයිතියත් ඇතැයි සහන්ට සිතුණි. රසකැවිලි බඳුනක තබා අයිස් කෝපි වීදුරුවකුත් සමඟ රැගෙන යාමට ඔහු සූදානම් විය.

''අපි කතා කළොත් එන එකක් නෑ. හැබැයි සහන් දෙන දෙයක් කයි.''

''ඇයි..... සහන් ගැලවුම් කාරයාගෙ.''

ඔහු නිහඬව රසකැවිලි බන්දේසිය රැගෙන රථය අසලට ගියේ ය.

''ආ... මේක ගන්න.''

ඇය සහන් දෙස බලා සිටියා ය. මෙහි සිටින කිසිවෙකුට මෙවන් මිත්‍රත්වයක් තිබුණේ නැත.

''මට එපා.'' ඇය පහත් හඬින් කීවා ය.

''මොකක්ද මේ උත්සවය?''

''මේ වෑන් එකේ යන කට්ටිය එක් වෙලා වෑන් එකේ ඩ්‍රයිවර්ට පාටියක් දෙනවා.''

''ඒ අය දෙන තෑග්ගට මගෙන් සල්ලි ගන්නෙ නැති නිසා



මට පාටියට එක් වෙන්න බෑ.''

කරකියා ගත හැකි දෙයක් නැතිව ඔහු මඳ වෙලාවක් නිහඬව සිටියේ ය. එය අභිමානය පිළිබඳ වූ ප්‍රශ්නයකි. ගෙනා කෑම නැවත රැගත් ඔහු ආපසු යන්නට හැරුණේ ය.

''ඔහොම ඉන්න.''

ඇය රථයේ දොර විවෘත කර ඉන් බැස්සා ය.

''නොකැමැත්ත අම්මාපද?''

''නෑ... නෑ... ඒක මට බලපාන තදබල ප්‍රශ්නයක් නොවේ. කෑවත් එකයි, නැතත් එකයි.''

ඔහු මඳ සිනාවකින් යුතුව කීවේ ය.

''මේක අභිමානය පිළිබඳ ප්‍රශ්නයක් නම් නොබිව්වට කමක් නෑ. ඇත්තටම මේ තෑග්ග මට අයිති එකක් නොවේ. දවස් දෙක තුනක් වෑන් එක එලෙව්වට කෙනෙකුට මේ තෑග්ග අයිති නෑ.''

අපූර්ව කතා කියන තරුණයා දෙස ඇය එක එල්ලේ බලා සිටියා ය. මෙවර පැමිණ සිටින්නේ අනුන්ගේ කේලාම් නොසොයන වැඩියෙන් කතා නොකරන බුද්ධිමතෙකැයි තේරුම් ගැනීමට පෙරවදනක් අවශ්‍ය නොවුණි.

''මං මස් මාළු කන්නේ නෑ කියල කියන්න.''

ඇය සහන්ට ඇසෙන සේ කීවා ය.

WWW.SINHALAELIBRARY.COM 18

## 06

තේ පානයෙන් පසු සැම දෙනා ම එක්ව පිරිනැමූ තිළිණය සතුටින් පිළිගත්තේ ය.

"මේ තෑග්ගටත්, මේ තේ පැන් සංග්‍රහයටත් ස්තූතියි. ඒත් මේ තෑග්ග මට අයිති එකක් නෙමේ කියලයි මම හිතන්නේ."

"මේ සංග්‍රහය අපි හැමෝටම කරනවා."

"මම අරක්කු බොන්නෙ නෑ."

"කමක් නෑ, තමුන් කැමැති කෙනෙකුට තෑග්ගෙන් තෑග්ග කියලා දෙන්න."

පිරිමියා කීවේ ය. සැවොම සතුටු වූයේ ඔහු ගේ කතාව පිළිබඳව ය.

"තෑග්ගක් විදිහට මත්පැන් බෝතලයක් දීම වැරදියි කියලයි මම නම් හිතන්නේ."

රැස්ව සිටි සැවොම එම කතාව අනුමත කළහ.

"එහෙම නම් මම බෝතලය ගන්නම්."

ජයසිංහ මහතා වරද පිළිගනිමින් කීවේ ය. කාගේත් කතාබහට ලක් වූයේ මෙම තරුණියාගේ හැසිරීම පිළිබඳව ය. කලින් සිටි



වියදුරාට වඩා මොහු උගත් අයෙක් බව සැවොම පිළිගත්හ.

ගමන ඇරඹුණි. පංචලී පිළිබඳව එතරම් පැහැදීමක් පිරිස අතර තිබූ බවක් නොපෙනේ. සමහර විට ඇය සාදයට එක් නොවන්නට ඇත්තේ ඇය තෑග්ග දීමට සහභාගි කර නොගැනීම නිසා විය යුතුය. අවසන් මගියා බැස්සේ ලිලී මාවතෙහි. බතලවත්තට යන තෙක් වුව ද ඔවුනතර කතාවක් වූයේ නැත. ගේට්ටුව විවෘතව තිබූ නිසා වත්ත අභ්‍යන්තරය දක්වා රථය ධාවනය කරගෙන ගියේ ය. වාහනයකුදු නො දෙඩූ ඇය රථයෙන් බැස නිවස දෙසට ගියා ය.

ඔසරියකින් සැරසුණු අවුරුදු හතලිස් පහක පමණ කාන්තාවක් අතින් සංඥා කරමින් ඉදිරියට එනු දුටු සහන් රථය ධාවනය නො කර නතර කරගෙන සිටියේ ය.

"පොඩ්ඩක් ඔහොම ඉන්න. මේ පොඩි උදව්වක් ඉල්ලන්නයි කතා කළේ."

තරුණිය මවට තුදුරින් සිටින හැටි සහන් දුටුවේ ය.

"සිකුරාදා පාන්දරම කතරගම යන්න සූදානම් කරගෙනයි ඉන්නෙ. වාහනේ හරි ද?" ඇය මඳ සිනාවකින් යුතුව ඇසුවා ය.

"ඉතින් නෝනා එහෙම ගමනක් යනවා නම් කලින් කියන්ට ඕනැනේ."

"ඇයි මම පංචලී අත පණිවුඩයක් එව්වෙ. ඇයි දූව කිව්වෙ නැද්ද?"

"මේ කියනකල් මම කිසි දෙයක් දන්නෙ නෑ."

"මෙහෙමත් ළමයි. ඇයි ළමයෝ කිව්වෙ නැත්තෙ...?"

"දූත් ඉතින් අම්මා කිව්වනෙ. කැමතිද නැද්ද කියලා විතරක් අහගන්න."

මේ ළමයා කවදත් දුෂ්ඨයි. කෙනෙකුගෙන් වැඩක් [illegible] කරවා ගන්න දන්නෙ නෑ. ඇය පිළිතුරක් නොදී ඉවත බලා සිටියා ය.

WWW.SINHALAELIBRARY.COM 19

''මේ දරුවට අපලයි. මේ ගෙවෙන්නේ ඒරාෂ්ටක අපලයක්. කතරගමට බාරයක් වෙන්නයි යන්නෙ.''

ඔහුගේ සිතට දුකක් පිවිසුණේ මවගේ කතාව ඇසීමෙනි. මැය දුෂ්ඨ තරුණියක් බව නම් ඔහු දන සිටියේ ය.

''අපේ නෑදෑයින්ට වාහන තියෙනවා. ඒ අය නිදහසේ යන්න කැමතියි. සල්ලි කීය වුණත් කමක් නෑ අපිට හොඳ විශ්වාස කෙනෙක් ඕනෑ. එනවද?''

සහන් නිවසට ගියේ ගමන යාමට පොරොන්දු වීමෙන් පසුව ය. මෙතරම් දුර ගමනක් කිසිදාක ගොස් තිබුණේ නැත. එය ප්‍රතික්ෂේප නොකළේ යුවතිය පිළිබඳව උපන් අනුකම්පාව නිසා ය. පැහැදිලිවම ඇයට මොනවා හෝ අපල වැනි දෙයක් ඇතැයි ඔහුට සිතුණි. නිවසට පැමිණ ලැබුණු පාර්සලය මේසය මත තැබුවේ ය.

''මොනවද මල්ලි මේ ගෙනාවේ...?''

''මම ගෙනාවෙ නෑ. වෑන් එකේ යන කට්ටිය සල්ලි එකතු කරලා මට තෑග්ගක් දුන්නා.''

''හානේ... සේදර මේ වගේ තෑගි කොච්චර ගන්න ඇද්ද?''

''ඒ විතරක් නෙමෙ හොඳ අරක්කු බෝතලයකුත් හම්බ වුණා. මම ඒක ආපහු දීලා ආවා.''

''අනේ මල්ලියේ මේ මිනිහ කොච්චර හොරකම් කරලද? දැන් මොනවා කරන්නද? මල්ලි අපි අනිද්දා කැලණි පන්සල් යමු ද?''

''ඕනෑ නම් හෙට යමු. අනිද්දා මට කතරගමට හයර් එකක් වැදුණා.''

''එපා මල්ලියො ඔයා ඒ වගේ වැඩ බාර ගන්න. ඔයා වගේ උගත් ළමයෙකුට කියලා මේ වැඩ කරවා ගන්න බව දන්නවා නම් අම්මා මට බණීවි. ඇයි බාර ගත්තෙ...?''

''පිට කෙනෙක් නෙමෙ අපි එක්ක උදේ යන ළමයෙකුට අපලයි කියලා අම්මා කිව්වා.''



''අපි ලඟදී ඩ්‍රයිවර් කෙනෙක් ගන්නවනේ. එතකොට යන්න කියන්න.''

''පව් අක්කා මේ ළමයට අපලයිලු. එක දිගට අසනීප කරදර ඇවිදින්...''

''කවුද කට්ටිය...?''

''අර බතලවත්තෙ ගෙදර කට්ටියක්.''

''බලාගෙන ඔය ගෙදර අහංකාර කෙල්ලෙක් ඉන්නවා.''

''අපිට ඒ අයගෙන් වැඩක් නෑ. කවුරු හරි වාහනේ ඉල්ලුවොත් අපි දෙන්න ඕනෑ.''

ඔහු කාමරයට ගොස් ඇඳුම් මුදවා මඳ වේලාවක් සිටියේ ය. දිවා සමයේ සිදු වූ දෑ කිසිසේත් අමතක කළ නොහැක. මේ අහංකාරකම සැබැවින් ම ඇයට හිමි වූවකි. පොදුවේ අකැමැති වුවත් ඇගේ ඇතැම් හැසිරීම් සිත අවදි කරන සුළු විය. හමු වූ යුගය තුළ වචන කීපයක් හෝ කතා කළේ අද ය. තමා නිසා හැසිරීමේ මෘදු බවක් මතුව තිබුණි. ආඩම්බරකම දාන්න තැනක් නෑ.

පසු දින පිබිදුනේ අක්කා ගේ හඬිනි. වෙනදා මෙන් නොව ඇඳුම් හැඳ සූදානම් වීමට ගත්තේ කෙටි කාලයකි.

''මල්ලි අද උදෙන්ම.''

''ටිකක් කලින් යනවා.''

''අර ට්‍රිප් එක යනවද?''

''ඔව් අක්කා මම පොරොන්දු වුණානේ. අද වෑන් එක සර්විස් එකට දානවා.''

අක්කා දුන් තේ වීදුරුව පානය කළ ඔහු රථයෙන් ගමන ඇරඹුවේ ය. බතලවත්තේ ගේට්ටුව අසල නතර කළ ඔහු රථයේ නළාව නාද කළේ ය.

එක් වරකට වඩා නළාව හඬ වන්නේ නැත. ඇය පෙනෙන තෙක් මානයක නැත. කාන්තාව නිවස තුළ සිට අත වනනු දුටු පසු

WWW.SINHALAELIBRARY.COM 20

සිතේ තරමක කෝපයක් ඇති වුණි. නිවස ළඟට ගොස් මගින් ගැනීමට තමා බැඳී නැත. සමහර විට ඇය කතා කරන්නට ඇත්තේ පසු දිනට යෙදී ඇති ගමන ගැන කතා කිරීමට විය යුතු ය. ඔහු නිහඬව නිවස ඉදිරියට රථය ගෙන ගියේ ය.

''ගමන හරි නේද?''

ඔහු පිළිතුරක් දුන්නේ නැත. ඔහුගේ නෙත යොමු වූයේ රුක්අත්තන මලක පැහැයෙන් සැරසී එන ඇය වෙත ය.

''ඔව් හරි.''

''එහෙම නම් මෙන්න මේ ගෑස් සිලින්ඩරය දමාගෙන යමු. හවසට එනකොට ගේන්න ඕනෑ.''

''මොකද අම්මේ මේ කරදර කරන්නෙ. මේ වෑන් එකේ ගෑස් සිලින්ඩර් දාගෙන යන්ඩ බෑ.

''නෑ මම කිව්වෙ පියරත්නලාගෙ කඩෙන් තියලා හැන්දෑවට ගේන්න කියලයි. නැතින්ම ඕවා හැන්දෑවට කරන්න අමතක වෙනවා.''

''කිව්ව දේ අහන්න. ශ්‍රී විලර් එකකට කතා කරලා ගෑස් එක ගෙන්න ගන්න. නැතිනම් මම හවසට එනවනෙ.''

ඇය වෑන් රියට පිවිසෙමින් කීවා ය.

''මම හවසට ගෙනැත් දෙන්නම්.'' ඔහු අවසාන තීන්දුව දුන්නේය.

රථය මාවතට ගත් සැනින් නිකුත් වූ සුවඳ නැහැයට දැනුණි. වාහනයේ ගමන් කරන ගැහැනු සිනාසෙන බව දැන සිටියත් ඇය ඒ කිසිවක් මැයිම නොකරන බව ඔහු පැහැදිලිවම දැන සිටියේ ය. මෙච්චර ආඩම්බර වන්ට හේතුව මොකක්ද?

අද ඇය වෙනදාට වඩා පැහැපත් ය. උදෙන්ම දිය නා ඇති බවක් පෙනේ. අසුන් ගත් සැනින් ඇය පොතක් අතට ගත්තා ය. මෙහි ගමන් කරන පිරිස පිළිබඳව අධ්‍යයනයක යෙදීමට ඕනෑකමක්



සහන්ට නැත. පොදුවේ කවුරුත් හොඳ මිනිසුන් බව හැඟේ.

කොල්ලුපිටියට යන තෙක් ඇය සිටියේ පොතට යොමුවූ දෙනෙතින් යුතුව ය. කොල්ලුපිටියේ රථය නතර කළ ද ඇය ඉන් නො බැස මඳ වේලාවක් නහඬව සිටියා ය. බෑගය විවෘත කළ ඇ මුදල් නෝට්ටු කීපයක් ඔහු වෙත දිගු කළා ය.

''ආ... මෙන් සල්ලි.''

''මේ සල්ලි මොටද?

ඔහු ඇය දෙස නොබලාම ඇසුවේ ය.

''වාහනේ සර්විස් කරන්ට ඕනෑ නේද?''

''ඒවට සල්ලි තියෙනවා.''

පිළිතුරක් නොදුන් ඇ අසුන මත මුදල් තබා යන්ට ගියා ය. මඳ වේලාවක් සිටි ඔහු යළි ගමන ඇරැඹුවේ ය.

ගරාජය දෙසට යමින් සිටිය දී ගිනි අව්වේ පාරේ ගමන් කරන රුව ඈතට හඳුනා ගත්තේ ය. ඔහු ශිෂ්‍ය සංගමයේ එකට සටන් පාඨ කියූ උපවාස, පා ගමන් ගිය අසේල හඳුනා ගැනීමට ගත වූයේ මොහොතකි. සහන් අසේල ගේ ඇඟට රථය කපා නතර කළේ ය. අසේල ඉවතට පැන්නේ කෝපයෙන් යුතුව බැව් ඔහු දනී.

''ශාස්ත්‍රවේදී රත්ගම අසේල''

සහන් කෑ ගැසුවේ ය. අසේල සහන් හඳුනා ගත්තේ ය. එහෙත් වික්ෂිප්ත බව විවෘතව මුහුණේ නතරව තිබුණි.

''තද වුණා කියන්නෙ ලෙල්ලටම තද වුණා. ඉතින් කොහොමෙයි.''

අසේල සහන් ගේ අත අල්වා සිනාසුණේ ය.

''ඇතුළට නැගපං....''

සහන් ඔහුට ආරාධනා කළේ ය. අසේල නිහඬව රථයට පිවිසුනි.

WWW.SINHALAELIBRARY.COM 21

"මම උඹව හම්බ වෙන්නෙ කොහොමෙයි කියලා දහ අතේ හිතුවා."

"තවම පූර්වාරාම පන්සලේ බණ මඩුවෙද?"

"ඔව්, සහන් පන්සල නැතිනම් මැරිච්ච නැන්වල ගසුන් පැළ වෙලා. ටියුෂන් පාරක් දාලා බණ මඩුවෙ නිදා ගන්නවා. මෙහෙ පන්සල්වලට එච්චර දාන ලැබෙන්නෙ නෑ. ලැබුණු දවසට මටත් හම්බ වෙනවා."

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

"මොනවද ඉකෝන් ද උගන්වන්නෙ.? උඹට සෙකන්ඩ් අපර් එකක් තියෙනවා නේද?"

"අපි අවුරුදු හතරක් කළේ කාලය කා දැම්මක් විතරයි. ලංකාවට ආර්ථික විද්‍යා විෂයන් අවශ්‍ය නෑ. හිච්චි අයියා වගේ දූලක් අරගෙන මුදු ගියා නම් ඉවරයි."

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි. පැහැදිලිවම විචෘත ආර්ථිකය හරහා ඕනෑම මුදලාලි කෙනෙකුට මේ විද්‍යාව ඉගැන්වීමට පුළුවන. අද හැම දෙයක්ම බාල වෙලා.

"දැන් ශ්‍රද්ධා කොහොමෙයි?" අසේල අම්හිරි අතීතයෙන් වෙන් වීමට සිතුවේ ය.

"ගමේ යන්න බැරි නිසා ශ්‍රද්ධා මොකද්ද රස්සාවක් කරනවා."

"මට දවසක් ශ්‍රද්ධා බැංකුවේදී හම්බ වුණා. මගේ පපුව හෝස් ගාලා පත්තු වුණා. අතේ තිබ්බච වළල්ල උකස් තියන්න ඇවිදින්."

"මම ළඟදි හම්බ වෙන්න ගියා. කන්පෙති දෙක ම හිස්. කැම්පස් එකේ රූ රැජිණ නේද කියලා හිතුණා. ඔහු පහත් හඬින් කීවේ ය.



# 07

ශ්‍රද්ධා හැම වසරකම රූවැත්තිය ලෙස සම්මාන ලැබුවා ය. හැම කලාවක්ම ඇය වෙත උපතින් පිහිටා තිබුණි. හැම කටයුත්තක දී ම නායකත්වය ගෙන කටයුතු කිරීමේ හැකියාවක් ඇයට තිබුණි.

"ශ්‍රද්ධාගේ කන්පෙති හිස්වෙලා තියෙනවා දැක්කාම මගෙ පපුව හෝස් ගාලා පත්තු වුණා."

"මේ අපි ලබා උපන් හැටි කියලා නිකං ඉන්ට බෑ."

"අපි මේ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ බව ඇත්ත. ඉස්සර වගේ මේ වගේ කටයුත්තකට ජනතා සහාය නෑ."

"හැම එකාම ගාන කපාගෙන අයින් වෙනවා. දැන් ලබන මාසෙ 10 රැස් වෙනවනේ. එදාට කතා කරමු. මම මේ හදිසි ගමනක් යන ගමන්."

"කොහොමද මචං අක්කා එහෙම...?"

"අරූ මචං අක්කට පොල්ල තියලා පැන්නා. උඹ කේස් එක දන්න හින්දා කියන්නෙ."

"දෙකක් නෑ පොඩි සයිස් කෙල්ලෙක් තියාගෙන යන්ට ඇති. ලංකාවට කවදහරි ආවොත් මට කියපං. මට ගහන්ට බෑ. අපේ කොල්ලො ලා දමල දෙන්නම්."

WWW.SINHALAELIBRARY.COM 22

"එපා හින්දනේ මචං ගියේ. අක්කත් හිත හදාගෙන ඉන්නෙ. ඩ්‍රයිවරයා ගිහින්. ඒ නිසා ටික දවසක් වැඩ කරනවා."

"හරි... නිවාඩුවට හමුවෙමු."

සහන් මිතුරාගෙන් සමුගෙන ගරාජයට ගියේය. සහන් රථය පෙරැදන තෙක් දිගු කල්පනාවක ගැලී සිටියේය. රියදුරෙක් ලැබුණු වහාම ගමට යා යුතුය. අප්පච්චි ජීවත්ව සිටිය දී එක කුඹුරක්වත් බදු නොදී වගා කළ හැටි සහන්ට මතකය. ගොවිතැන් කිරීමෙන් ලද ආදායමෙන් ජීවත් වූ අප්පච්චිට කාටවත් අතපාන්ට අවශ්‍ය වූයේ නැත. වඩාත් දුක් සහගත සිදුවීම වූයේ අක්කාට දෑවැද්දට දුන් ඉඩම සැමියා පිටස්තරයෙකුට විකිණීමය.

පහුගිය යුගයේ සිටියේ ගොවිතැන් කටයුතුවල යෙදීමය. ඒ සඳහා ඉක්මනින් යා යුතුය. මෙම කනරගම ගමනින් අක්කාට මුදලක් ලබාදිය යුතුය.

හැන්ඩ් ෆෝනය නාද වුණි.

"කවුද?"

"මම පංචලී."

ඔහු පිළිතුරක් නොදී සිටියේය. පංචලීගේ කටහඬ හඳුනා ගත් මුත් ඔහු පිළිතුරක් දුන්නේ නැත.

"මම පංචලී. ඔහැලවන්නෙ."

"ඔව් ඉතින්. ඇයි කතා කළේ..."

"අපි හෙට පාන්දරින් යනවා."

"ඔව් ඉතින්.. මම වෙලාවට එනවනෙ. ඊට කලින් ඇවිදින් ඉන්ටද කියන්නෙ...?"

"එහෙම ආවොත් හොඳයි. එතකොට බඩු ටික දාගන්ට පුළුවන්නෙ."

"ලොරියක ගෙනියන්ට බඩු නැනෙ. උදේට ඒවට ගන්ට පුළුවන්."

WWW.SINHALAELIBRARY.COM 23



"මම ඒක කියන්ට නෙමෙ කතා කළේ. හෙට ගෙනියන්ට බඩු ටිකක් ගන්ට තියෙනවා. දැන් එන්ට පුළුවන්ද?"

පංචලීට සහන්ගෙන් නිසි පිළිතුරක් ලැබුණේ නැත. ඔහුගේ හැසිරීම කලින් සිටි රියදුරා මෙන් නොවේ. හමු වූ ප්‍රථම දිනයේදීම ඔහු කුමන අයෙක් දැයි දැන ගත්තාය.

මංජුල තමාට දුරින් නෑයෙක් වුවෙකි. කොළඹ විද්‍යාලවල ඉගෙනුම ලැබ අධ්‍යාපනය කඩාකප්පල් කරගත් මංජුල පාතාලයට සම්බන්ධව සිටින බැව් ඇය දැන සිටියාය.

එවැනි මැරවරයෙකුට දුවන්ට පහර දුන් හැටි. ආඩම්බර කාරයෙක්. මේ වගේ එකෙකුගෙන් ලේසියෙන් ගැලවීමට නොපුළුවන. මංජුල පිළිබඳව නොදන්වුවහොත් එය බලවත් වරදකි. යළිත් වරක් ඇමතුමක් ගත්තාය. ඇමතුම ඔහු පිළි නොගන්නා විට සිතේ කෝපයක් ඇති වෙයි. දිවා විවේකයේ දී ගමනට අවශ්‍ය දේවල් එක්කර ගත යුතුය. වෑන් රිය මූලස්ථාන ගොඩනැගිල්ල අසල නතර කර තිබෙනු ඈ දුටුවාය. මෙච්චර එකේ ආව කියන්ට බැරිද? සිතේ නැඟුණු අමනාපය ඇය ආයාසයෙන් දරාගෙන රථ ගාල අසල නතර කර තිබූ වෑන් රියට ගියාය.

"කොහාටද යන්ට ඕනෑ."

"ඔහොම ඉස්සරහට යමු."

"මෙහෙම ඉස්සරහට ගියොත් තාප්පෙ හැප්පෙයි. මොනවද කරන්ට ඕනෑ කිව්වොත් ලේසියි."

"ගෑස් ගන්ට තියෙනවා. පූජා භාණ්ඩ ගන්ට තියෙනවා. තව මට ඇඳුම් වගයක් ගන්ට තියෙනවා."

තම සුපුරුදු අසුනේ ඉඳගත් පසු ඔහු රථය කරකවා පාරට ගත්තේය. ඉගිල්ලෙන්ටයි හදන්නෙ. සමහර විට පරක්කු ඇති. ඔහු ප්‍රථමයෙන්ම ගියේ සුපිරි වෙළෙඳ සැලකටය.

"බඩු අරන් ඉවර වෙලා කතා කරන්ට."

ඇය හිස වනා කතාව පිළිගෙන වෙළෙඳ සැල වෙත ගියාය.

පංචලි ඉහළ මාලයට ගොස් කාන්තා ඇඳුම් තෝරමින් සිටියදී කවුරුන් හෝ තමා අසල ගැවසෙන බැව් හැඟී ගියේය. මෙවැනි සිදුවීම් තමාට ඕනෑ තරම් විඳින්නට ඇත. ගැහැනුන්ට උපතින්ම හිමිවන අතවරවල මාර්තු අට වෙනිදා පමණක් උද්ඝෝෂණය කිරීමේ තේරුමක් නැත. තමා ළඟ සැරිසරන්නේ කවුදැයි ඔහුට නොදනෙන්නට ඇය පරීක්ෂා කර බැලුවාය. මංජුල සිනාමුසු මුහුණින් තමා දෙස බලා සිටියත් ඇයගේ මුහුණේ සිනාවක් නැත.

''අද බොඩි ගාඩ් ආවේ නැද්ද?''

පංචලි පිළිතුරක් නොදී නිහඬව සිටියාය. මෙතරම් දවසක් නාවේ සහන් දුන් පහරට පින්සිද්ධ වන්නටය.

''කරුණාකරලා මට මගේ පාඩුවේ ඉන්ට දෙන්න. මම කිව්වනෙ.''

''ඔයාට ඕනෑ විදිහට වැඩ කරන්ට දෙන්ට බෑ. නැන්දලා, මාමලා ඔක්කොම මට කැමතියි.''

''මට කරදර කරන්ට එපා.''

ඔහු ඕනෑවට වඩා ඇයට ළං වී සිටියේය. පැමිණි කාරණය අමතක කර දැමූ ඇය පහත මාලයට ගියාය. පංචලි කඩිනමින් ගියත් බලාපොරොත්තු කඩවුණි. වෑන් රිය රථගාලේ නොදැකීම නිසා ඇගේ සිතේ ඇතිවූයේ අමනාපයකි.

''කොහේද ඔෆිස් ද යන්නේ...?''

ඇය පිළිතුරක් දුන්නේ නැත.

''ඉන්න මම ගිහින් දාන්නම්.''

''ප්ලීස් කරදර කරන්ට එපා.''

වෑන් රිය පිවිසෙනු දුටු ඇගේ සිතේ බිය නැති වුණි. ඇය අනුව මංජුල රථය අසලට ගියේය.



මංජුල ඇයට රථයට පිවිසීමට ඉඩ නොදී හරස්කර සිටියේය. ඔහුගේ නෙත යොමුව තිබුණේ රථයේ අසුන්ගෙන සිටින සහන් වෙතය. ඔහු අද කිසි කතාවක් නැතිව සිටින විට නෙහෙනම යමක් සිතා ගන්නේය. අද ඔහු තමා හා පැටලෙන්ට නොඑන්නේ තමා පිළිබඳව දැනගෙන යන අභිමානය සිතේ ඇති වුණි.

''කෝ මට යන්ට දෙන්න.''

''දන්නවනේ නැටි.''

''සහන් අපි යමු.''

''යන්ට දෙන්නෙ නෑ. මංජුල පාර හරස් කරමින් කීවේය.

''ඒ මිස්ටර්... මේ මිස්ට වාහනේට නගින්ට ඉඩ දෙන්ට.''

''ඉඩ දෙන්න... අපේ පෞද්ගලික ප්‍රශ්නවලට සම්බන්ධ වෙන්ට එපා. මගේ හැටි ආරංචි ඇතිනේ.''

''අනුන්ගේ පෞද්ගලික ප්‍රශ්න මට වැඩක් නෑ. මේ ඉන්නේ මගේ පැසෙන්ජර් කෙනෙක්. එන්ට ඉඩ දෙනවද නැද්ද?''

ඔහු රථයෙන් බසිමින් ඇසුවේය.

''සහන්, ඔයා මේකට පැටලෙන්ට එපා. මේක අපේ පෞද්ගලික ප්‍රශ්නයක්. ඔයා ඇතුළට යන්ට.''

තම වාහනයේ ගමන් කරන මගියෙකුගේ ආරක්ෂාව සැපයීම තම යුතුකමකි. ඔහුට අවශ්‍යව ඇත්තේ තමාගෙන් පළි ගැනීමට බැව් සහන් දනී.

දීර්ඝ සාකච්ඡාවකින් පසු ඇය පැමිණ රථයේ අසුන් ගත්තාය.

''යමු...''

ඇය පහත් හඬින් කීවාය.

''පලතුරු ගන්න තැනක් නැද්ද?''

ඔහු නිහඬව රථය ඉදිරියට ගමන් කළේය. සහන් ඇයව වෙනත්

WWW.SINHALAELIBRARY.COM 24

කුඩා කඩ පෙළකට කැඳවාගෙන ගියේය. පූජාවට අවශ්‍ය පලතුරු, රසකැවිලි මෙවන් තැනකින් ලාභයට ලබා ගැනීමට හැකිවීම ගැන ඇය සතුටු වූවාය.

"ගෑස් එක දමා ගන්ට ඕනෑ."

"ඒක ගේ ගාව තැනකින් ගමු. රෙදි ගන්ට ගියා නේද?"

"කොඩි ටිකක් මහගන්ට ඕනෑ. මේ බාරයක් තියෙනවා. දූන් ඒවට වෙලා නෑ."

පිටකොටුවේ තොග වෙළෙඳ සැල්වල ඇත්තේ ජනාකීර්ණ වූ පටු මාවත්වලය. ඇය ඔහු අනුව ගමන් කළේ විශ්වාසයෙන් යුතුවය. අතරමං වුවහොත් පාර සෙවීමට පුළුවන් කමක් නැත.

අවසානයේ ඔහු ඇය කැඳවාගෙන ගියේ රසකැවිලි කඩයකටය. ඔහු චතුර ලෙස දෙමළ භාෂාවෙන් කතා කළේය.

"දොඩම් බොනවද? ෆලූඩා බොනවද?"

"කැමති දෙයක්. ඕනෑ දෙයක් කනවා, බොනවා."

කිසිවක් පැවසූ නොබෝ වේලාවකින් සේවකයා මස්කට්, පැණි වළලු වැනි ප්‍රණීත රස කැවිලි ගෙනාවේය. රසකැවිල්ල මෙන්ම පානය ද ප්‍රණීතය. මුදල් ගෙව්වේ සහන් විසිනි.

"මගේ වැඩකට ඇවිදින් ඇයි සල්ලි ගෙව්වේ...?"

ඔහු පිළිතුරක් නොදී අසුනින් නැගිට ආවේය.

"මේ සල්ලි ගන්ට."

ඔහු පිළිතුරක් නොදී කඩයෙන් පිටතට ආවේය.

ඔහු රථගාලට ගොස් රථය රැගෙන ආවේය. ඔහු ඉක්මනින් රථය රැගෙන ඇයව කාර්යාලයට ගොස් ඇරලුවේය. ඒ යනෙන අතර ඔහු කිසිවිටෙක ඇය හා වචනයක් දෙඩුවේ නැත. ඇය ද කතා කළේ අවශ්‍ය දේකට පමණි.



කුලී රථගාලට පැමිණි පසු කාර්යාල පහසුකම් සලසන රියදුරන් සහන් වටා රොක් වූහ.

"මල්ලී, මදාවියගෙ ගැන්සිය අද ආවා."

සහන් සිනාමුසු මුහුණින් සිටියා විනා පිළිතුරක් දුන්නේ නැත.

"උන් ඇමැති ආරක්ෂක කණ්ඩායමක කට්ටිය. අපි මේ ගෙවල්වලටත් ගිහින් බයේ ඉන්නේ. මල්ලී පරිස්සමින්."

"ගණින් ගන්ට එපා. යක්කු හිතන තරම් කළු නෑ. තේ රවුමක් දාමු. මා ගානෙ."

සහන් යාබද පෙට්ටි කඩයකට ගොස් රියදුරු පිරිසට තේ ඇනවුම් කළේය.

"නානා ඔය එළවළු මාලු රොටී ගන්න."

"එපා මලයා. තව ටික වෙලාවකින් දවල්ට කනවනෙ. තෑන්ක්ස්."

සැවොම සාකච්ඡා කළේ ඇමැති ආරක්ෂකයාට ඉගැන්වූ පාඩම පිළිබඳවය.

"මල්ලි පරිස්සමෙන්. ඔය කැල්ල තද අහංකාරයි. කොහොම හරි ඇමැතියාට තද නෑකමක් තියෙනවා."

"ඇමතියා සයිඩ් එකේ තියාගෙන ඉන්න ගෑනිගෙ දුවෙක්ද දන්නෙ නෑ. මොනවා වුණත් මේ කෙල්ලට ආණ්ඩුවේ සපෝර්ට් එක තියෙනවා."

"අපිට ඒවා ප්‍රශ්න නෙමෙ අයියා. මගෙ පැසෙන්ජර්ව ආරක්ෂා කිරීම මගේ ඩියුටිය."

"ඒ වුණාට ඕකා කුණකටුවා වගේ එකෙක්. පරිස්සම් වීම කෝකටත් හොඳයි."

ඔවුහු බොහෝ වේලාවක් කතා කරමින් සිටියේ ඇමති ආරක්ෂක නිලධාරියා පිළිබඳවය.

WWW.SINHALAELIBRARY.COM 25

# 08

මල්ලී නිවසට පැමිණීම ප්‍රමාදවීම පිළිබඳව සමන්තා තරමක් බිය වූවාය. මල්ලී පහර දී ඇත්තේ කැබිනට් ඇමතිවරයෙකුගේ නෑදෑයෙකුට බව දැන ගත් මොහොතේ සිටම ඇය පසුවන්නේ බියෙන් යුතුවය. පුවත්පත් දුන්විමක් දැමුවහොත් විවිධ පළාත්වලින් අයදුම්පත් එයි. රියදුරන් වැඩි දෙනෙක් එන්නේ නේවාසිකව වැඩ කිරීමටය. හොර මැරකම් තිබුණත් සේදර විශ්වාසවන්තව කටයුතු කළේය. මේ වාහනයෙන් තමාට වඩා ආදායම හොයාගෙන ඇත්තේ සේදරය. පොරොන්දු මුදල් කිසිදාක වංචා කර නැත. ඔහු උදයට පැමිණ හවසට යයි. කාමරයක් තිබුණත් පිටස්තර පිරිමියෙකුට නවාතැන් දීමට පුළුවන් කමක් නැත.

රථය එන්නට පිවිසෙනු ඇසුණු පසු සිතේ බිය තුරුන් වුණි.

''මොනවද මේ උස්සගෙන එන්නේ...?''

''විශේෂ දෙයක් ගෙනාවෙ නෑ. පිටකොටුවෙ ගියා. නිකන් ඉන්න ගමන් ගත්තා.''

''මොනවද මේ රතු රෙදි වගයක්.''

''අනේ අක්කා, මෙන්න මේ රෙදිවලින් කොඩි ටිකක් මහනවද?''



''මල්ලී අපිටත් කොඩි වැලක් දාන්ට පුළුවන්ද?''

''ඒකටත් එක්ක තමා ගෙනාවෙ.''

''ලොකු දෙයක්.''

අක්කා සතුටට පත් වුණි.

''යන්ට දවසයි, එන්ට දවසයි අවස් දෙකකට එන්ට වෙන්නෙ නෑ. සඳුදා ඔෆිස් හයර් එකට යනවා.''

''සීතලේට අඳින්න ටීෂර්ට් එකකුත් දැම්මා. මල්ලී ඇවිදින් කෑම කන්න.''

කාමරය තුළට ගිය ඔහු ප්‍රථමයෙන්ම කළේ ගමනට අවශ්‍ය ඇඳුම් සකස් කර ගැනීමය. ඉන් පසු ඔහු නාන කාමරයට ගොස් දිය නා ගත්තේය.

මේ දිනවල පසුවන්නේ සිත් තැවුලෙන් යුතුවය. තරුණ ලස්සන ගැහැනියෙක් වූ අක්කාට සිදුව ඇති විපත අඩුවෙන් තක්සේරු කළ නොහැක. මෙම ගමන නිසා අක්කාට වාසියක් ලැබේ. මෙම ගමනට සේදර ගියා නම් එය ලාභ ලබා ගන්නා තත්ත්වයට පත් කර ගන්නවා ඇත. ඇඳුම් මාරු කරගෙන එනවිට අක්කා කොඩි වැල් සකස් කරමින් සිටියාය.

''අක්කා දැන් හයර් එක හරිනෙ. මේ හයර් එක යන්න පුළුවන්ද කියලා සේදරගෙන් අහන්නද?''

''මල්ලිට අමාරු නම් කතා කරලා බාර දෙන්න. හේ.. කලින් කිව්වා නම් තමා හොඳ.''

''සේදර මේ වෙලාවට කරට් කැඩෙන්ට ගහලා නිදි ඇති.''

''ඉන්නකෝ... මම හයර් ගෙදරට කතා කරලා බලන්නම්කෝ...''

අක්කා කොඩි මැසීම නවතා දුරකථනයෙන් චන්දනා ගමන යාමට කතා කරගත් නිවසේ අයට කතා කළේය.

''මිස් මේ හයර් එකට වෙන කෙනෙක් අල්ලලා දෙන්නද?''

''ඇයි අපි ඒ ළමයවනෙ කතා කරගන්නෙ..''

''ළමයගෙ ඇඟ රස්නෙයි වගේ.''

''ඉන්නකො මම අපේ දුව එක්ක කතා කරන්නම්. එයානෙ මේ පංගරාර්තු කළේ.''

මඳ වේලාවකට පසු අක්කා කතාව ආරම්භ කළාය.

''ඔව් මිස්... ඔව් මිස්.. ඔව් මිස්. මගේ තමා වාහනේ.''

''අසනීපයක් වෙන්ට විදිහක් නෑනෙ. අද දවල් මා එක්ක හිටියනෙ.''

''ඔව් ඉතින් ලෙඩවල හැටි එහෙම තමා. නෑ.. නෑ.. හයර් එකට මොකවත් වෙන්නෙ නෑ. අපි කලින් වැඩ කරපු අන්කල්ව එවන්නම්.''

''නෑ.. නෑ.. එයා එක්ක අපි යන්නෙ නෑ. අරක්කු බීලා වාහනේ කොහේ හරි හප්පලා තියෙයි. කෝ මල්ලි.''

තමා නැති බව පවසන මෙන් අතින් දන්වා සිටියාය.

''මල්ලි දූන් හිටියා. පොඩ්ඩක් ළඟට ගිහින් එන්ට ගියා.''

''මට එයාගෙ හෑන්ඩ් ෆෝන් නම්බරේ දෙන්න.''

අක්කා නම් සෙලියුලර්යේ අංකය දෙන හඬ ඔහුට ඇසුණි.

''හරි ලෝ කාරියෙක්. මම කිව්වෙ. බතල වන්නෙ කෙල්ල නේද?''

සමන්තා සිනාසෙමින් කීවාය.

සහන් කාමරයට ගිය නොබෝ වේලාවකින් ෆෝනය නාද වුණි.

''ඇයි ට්‍රිප් එක යන්ට කැමති නැද්ද?''



''නෑ.. නෑ.. ට්‍රිප් එක යනවා. වෙන ඩ්‍රයිවර් කෙනෙක් එවන්නද කියලා ඇහුවෙ.''

''ඒ වගේ අරක්කු බොන මිනිස්සු එක්ක ගමන් යන්ට අපි කැමති නෑ. විශ්වාසයෙන් ගමන යන්ට බැරි නම් සනීප වුණාම අපි යමු. ගමන නතර කරමු.''

''යොදා ගත්ත ගමනට බාධා ඇති කරගන්ට එපා. මම එන්නම්.''

''ඉතින් තවත් මේ ඇහැරගෙන ඉන්නේ මොකද? ගිහින් නිදාගන්ට. මොකද දූන් කරන්නෙ...?''

''මීට පෙට ගෙනියන්න කොඩි වැලක් ඕනැ කිව්වනෙ. අක්කා එක්ක කොඩි මහනවා. හරි.. මම උදේ එන්නම්.''

පංචලිට එය කාර්ය බහුල රාත්‍රියක් විය. මේ ගමන යන්නේ අම්මාගේ බලවත් ඉල්ලීම නිසාය. කිසි දෙයක් පවසා ඇගේ සිතට වේදනාවක් දීමට සිතෙන්නේ නැත. ඇය හැම දුකක්ම උසුලා දරා සිටින්නියකි.

මෙම ගමනට අප්පච්චිගෙන් වාහනයක් ඉල්ලා යැව්වා නම් වාහනයක් හෝ මුදල් එවනු ඇත. අම්මාගේ වැරදුනු යොවුන් විය ගැන කතා කිරීමට නොපුළුවන.

මේ කතරගම ගමන සංවිධානය කළේ අම්මා තමා වෙනුවෙන් වූ භාරයක් ඔප්පු කිරීමටය. මෙම ගමන පිළිබඳව මංජුල දැනගතහොත් එය නතර කිරීමට සිදුවනු ඇත. ඉගෙනීම කඩාකප්පල් කරගත් මෙම මැරයා ටිකකට හෝ මෙල්ල වූයේ සහන්ට පමණි. කවමැත දෙඩුවත් ඔහුට සහන්ගේ කිව්වුවටවත් ඒමට පුළුවන් කමක් නැත. මංජුල ඉදිරිපත් නොවුණත් ඔහුට සහාය වීමට මැරවරයන් පිරිසක් ඇත.

සහන් මෙම ගමනට ඒමට අකැමැති වූයේ ඇයි දැයි සිතිය නොහැක. සේදර වැනි බෙබද්දෙක් සමඟ යනවාට වඩා ගමන නොගොස් සිටීම මැනවැයි ඇය සිතුවාය. ඊටත් වඩා මෙම ගමනේදී

WWW.SINHALAELIBRARY.COM 27

ආත්තම්මා බැලීමට යාම අම්මාගේ එක අදහසක් විය. සේදර ගියහොත් පවුලේ තොරතුරු පිට යාමට ද ඉඩ ඇත. අම්මා මෙම ගමනට සහන්ගේ වෑන් රිය යොදා ගන්ට කීවේ එබැවිනි. සහන්ගේ හොඳ ගති ගුණ ඈ නිරීක්ෂණය කළාය.

බාරය ඔප්පු කිරීමට කොඩි වැලක් මැසීමේ ඕනෑකමක් තිබුණි. එය කිරීමට නොහැකි වුණි. තමාගේ අවශ්‍යතාවය සපුරාලීමට සහතම අනාරාධනයෙන් ඉදිරිපත් වීම පිළිබඳව සතුටක් ඇති වුණි. රෙදිවලට වියදම් වෙනවනෙ. සමහරවිට අක්කා විකුණන්ට කොඩි මහනවද දන්නෙ නෑ. ඔහුගෙන් කොඩි මිලදී ගැනීමට ඈ අදහස් කළාය. දින තුනකට අවශ්‍ය ඇඳුම් බෑගයට දමා ගත්තාය. ඇඳේ වැතිර දෑස් පියා ගත්තේ කෙටි අස්වැසිල්ලක් ලබමිනි. ලද්දේ සුවපහසු නින්දකි.

මර්ලෝනුව නාද වන හඬින් පංචලි පිබිදුනාය. දිවා ආහාරය සූදානම් කර බඳුන්වලට දමා ගත්තාය.

"දුව ඩ්‍රැයිවර්ට කෝල් එකක් දුන්නද?"

"දුන් එයි."

"දුව... මේ කොල්ලා අපේ ගමේ දේවල් මෙහෙ ඇවිදින් කියයිද?"

"මම ඒ කොල්ලා දන්නෙ නෑ. ඒකා අපේ ඩ්‍රැයිවර් කියලා විතරයි දන්නෙ."

"මට බය ඔය විස්තර දන ගනියි කියලයි."

"අපි ගමේ වැඩි වෙලාවක් ඉන්නෙ නෑනෙ. ගිය ගමන් ආවිච්ච අරන් එන එකනෙ."

"අන්න වාහනේ ආවා. දුව ගෑස් එකත් දාගන්ට."

ඈ දුවගොස් දොර විවෘත කර ඉදිරිපස විදුලි පහන් දැල්වූවාය.



සහන් වෑන් රිය පෝටිකෝව ඉදිරිපස නතර කර රථයෙන් බැස ආවේය.

"ගෙනියන්න තියෙන්නේ මොනවද?"

"එන්න ඇතුළට. නෑ... නෑ... සපත්තු ගලවන්ට ඕනෑ නෑ."

සහන් නිහඬව ගෙමැද තිබූ බෑග් රැගෙන රථයට ගෙන ගියේය. පංචලි ද බෑග් ගෙන යාමට සහාය වූවාය.

"එපා මිස් මම දාන්නම්."

"ප්‍රශ්නයක් නෑ. මම උදව් කරන්නම්."

"ඔක්කොම දේවල් ගත්තද බලන්න ඕනෑ."

"කෑම, වතුර ඔක්කොම හරි. ගෑස් සිලින්ඩරේ දාගන්න ඕනෑ. ඒක තනියම උස්සන්ට බෑ. දෙන්නම අල්ලමුද?"

"දවස් තුනක් ඉන්න මෙච්චර ලොකු එකක් කර ගහගෙන යන්ට ඕනෑද? පොඩි එකක් නැද්ද?"

"පොඩි ගෑස් එකක් නෑනෙ."

"මේක දාගෙන ගියාම වාහනෙත් ඇහිරෙනවා. යමු.. අපේ අක්කා ගාව පොඩි එකක් තියෙනවා. මගදී දමා ගමමු."

ගෙහිමි කාන්තාව පැමිණි පසු ගමන ආරම්භ කළේය. සහන් අක්කාගේ නිවසට ගොස් ගෑස් සිලින්ඩරය රැගෙන ආවේය.

පංචලි සහන් රථයෙන් බැස යන අයුරු බලා සිටියාය. ඔහු කෙනෙකුට හෘදයාංගමව උපකාර කිරීමට කැමති පුද්ගලයෙක් බව දනී. රථය ඉදිරියට ඇදෙද්දී රථය තුළ නිහඬව බවක් ඇති වුණි. මඳ දුරක් ගිය පසු සෙත් පිරිත් කැසට්ය ක්‍රියාත්මක කළේය.

"දුව, ඔය ඩ්‍රැයිවර් ළමයට තේ එකක් දුන්නෙ නැද්ද?"

"ෆ්ලාස් එකේ තියෙනවා අම්මා."

WWW.SINHALAELIBRARY.COM 28

''ඕනැ නෑ නෝනා... මම තේ බීලා ආවෙ.''

''ඒ වුණාට ඒ ළමයට නොදුන්න එක වැරදියි.''

''මට විතරක් බණින්නෙ මොකද අම්මට තිබුණෙ නැද්ද?''

''හරි... හරි... දැන් ඔය කතාව වැඩක් නෑ. තේ එකක් ඕනැ නම් බොන්න පුළුවන්.''

සෙමින් උදා අඳුර වියැකී යනු පෙනේ. තාමත් ඇසෙන්නේ සෙත් පිරිත් සජ්ඣායනය පමණි. මාවත ප්‍රාණවත්ව ඇත. ඔහුගේ නෙත යාන්තමින් තමා අසල සිටින රුවැත්තිය වෙත යොමු වුණේ මාර්ග තදබදය නිසා රථය නතර කළ මොහොතකය. ඩෙනිම්කින් හා ටීෂර්ට්යකින් සැරසී සිටි රුවැත්තිය දෙස බැලුවේය. එකවරම ඇගේ නෙත් ඔහුට අසුවුණි.

''අසනීපයි කිව්වෙ... දැන් සනීපද?''

පිළිතුරක් නැත.

ගමන ආරම්භ වුණි. ජනප්‍රිය හින්දුස්ථානි ගීතයක අනුවාදනයක් ප්‍රචාරය වෙමින් තිබුණි. ඩෙනිම්කින් හා ඉස්ක්‍රිනියකින් සැරසී සිටි නිසා ඔහුගේ කඩවසම් පිරිමිකම මතුව තිබුණි. උදා හිරු රැස් නිල්වන් සයුරට වැටී ඇත. කුඩු පෙන මතට උදා හිරු රැස් පතිත වී විචිත්‍රව බබලයි.

''පංචි... ඔය ළමයට බොන්ට දෙයක් දෙන්නෙ නැද්ද?''

''දෙන්නම් අම්මා දෙන්නම්. දැන් කෑමට නතර කරනවනෙ''

''ඔය ළමයට බොන්ට දෙයක් නොදුන්නොත් නිදිමත හැදෙයි.''

''පොඩ්ඩක් ඉන්ට... බෝතලේකට සුප්පුවක් ගහලා දෙන්නම්.''

ඇය කතා කළේ කෝපයෙනි. කොච්චර තරහ ආවත් දෙමාපියන්ට එවැනි කතා පැවසිය යුතු නැත. එහෙත් සහන්ට ඒ ගැන මැදිහත් වීමට කිසිසේත් පුළුවන්කමක් නැත.



ඔහු රථය ආපන ශාලාවක් අසල නතර කළේය.

''තේ බොන්වද?''

පංචලි ඔහු දෙස කෙලින් බැලුවාය.

''අම්මා එන්න තේ බොන්න.''

''දුව... මිනිස්සු මාව අඳුනනවා. මට වෙජිටබල් සැන්ඩ්විච් පෙති දෙකක් ගේන්න. මම ඉන්නම්.''

''අම්මාට ටොයිලට් පැත්තෙ යන්න ඕනැද?''

''මට ගෙදර යනකල් ඉන්න පුළුවන්. ඕනැ නම් දුව ගිහින් එන්න.''

පංචලි මව දෙස මොහොතක් බලා සිටියාය. ඇය ඇමැතිවරයාගේ සුරූපී අනියම් බිරිඳ බව රටම දන්නා කරුණකි. ඉකුත් යුගයේ සිනමා පුවත්පත් සැරසූ අම්මා රූප රාජිණියක ලෙස කිරුළ පැළඳ සිටියාය. එක්තරා අවස්ථාවක තමාට ජීවිතයේ සිදු වූ අත්වැරැද්දක් නිසා ඇය දුකට පත්ව සිටී.

අම්මා කැමති අයුරින් ජීවත් වීමට ඉඩ දීම තම යුතුකම බව ඇය සිතුවාය.

''දුව... ඩ්‍රයිවර්ට තේ වතුර අරන් දෙන්න. නිදිමත වෙයි.''

''අම්මා, ඒකා අමුතුම එකෙක්.''

''ඩ්‍රයිවර් එක්ක ඉඳලා හිටලා කතා කරන්න. නැත්නම් නින්ද යයි.''

''ඒ ඩ්‍රයිවර් කතා කරනවට කැමති නෑ.''

පංචලි හෝටලයට යන විට සහන් කෑම පිඟානක් කමින් සිටිනු දුටු සැනින් සිතේ ඇති වූයේ කෝපයකි. කිසිම ආචාරශීලී බවක් නැතිව තනියම කෑම කන තැනැත්තා දෙස මොහොතක් බලා සිටියාය.

WWW.SINHALAELIBRARY.COM 29

මෙම ගමන තුළ දී රියදුරාට කෑම සැපයීම තම යුතුකමකි. කවුන්ටරයට ගොස් අම්මාට හා තමාට අවශ්‍ය කෑම ඇනවුම් කළාය.

''මිස් කේක් එකකුත් දම්මා.''

''එහෙනම් අර මේසෙ කෑම කන කෙනාගෙ කෑමවලට සල්ලි ගන්ට එපා. තව එයා ඉල්ලන දෙයක් දෙන්න.''

''එයා කෑමවලට සල්ලි ගෙව්වා.''

අම්මාට කෑම ගෙන ගොස් දී ඇය තේ පානය කළාය. මේකා අමුතු ජාතියේ එකෙක්. තමා තේ පානය කරනතෙක් සහන් තමාට නුදුරින් සිටින හැටි ඈ දුටුවාය.



# 09

රථය ඉදිරියට ඇදී යයි. පිරිත් අවසන් වූ පසු ප්‍රචාරය වුණේ දේශාභිමාණී ගී පෙළකි. වෙන ගීතයක් දමන මෙන් ඉල්ලා සිටීමට පුළුවන් කමක් නැත. ඔහු අනිත් පිරිමින්ට වඩා වෙනස් තැනැත්තෙකි.

උදේට කෑවේ සිය වියදමෙනි. ඔහු විසින් තම අභිමානයට පහර ගැසුවේය යන සිතුවිල්ල කිසිසේත් සිතින් බැහැර වූයේ නැත.

''දුව, අපි අම්මව ගන්නේ කීයට ද?''

''ආත්තම්මව ලෑස්ති කර ගන්නේ මොටද අම්මා, ආත්තම්මට මෙච්චර දුරක් යන්ට පුළුවන්ද?''

''දුව, අපට කරදරයක් වෙයි තමා. ඒ වුණත් මේක ලොකු පිනක්. අම්මට කවදාවත් මේ වගේ ගමනක් යන්ට වෙන එකක් නෑ.''

''කොහොමද අම්මා රෝද පුටුවක දාගෙන ඔච්චර දුර ආත්තම්මව එක්ක යන්නේ. මට නම් ප්‍රශ්නයක් නෑ. මේක ආත්තම්මට කරදරයක්.''

''අපිට මේ වගේ අවස්ථාවක් ආයෙ ලැබෙන එකක් නෑ. අම්මා වෙනුවෙන් මට කිසි දෙයක් කරන්ට ලැබුණේ නෑ. මේ ගමනවත් එක්ක යමු.''

"හා... හරි... හරි.. අපි එනවා කියලා ලෑස්ති වෙලා ඉන්ට කියන්න. ආ.. මෙන්න කතා කරන්ට."

සහන් රථය ධාවනය කළේ පරීක්ෂාකාරීවය. ඔහු ඕනෑකමින් සවන් දුන්නා විනා ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වූයේ නැත. රථය තුළ පැවැති නිහඬතාවය බිඳී ගියේ සහන් ඇතුළත් කළ නව ගීත කැසටයේ හඬිනි.

සුනාමියෙන් සිදු වූ විපතින් දහස් සංඛ්‍යාත මිනිසුන්ට ජීවිත අහිමි වුණි. ඒ මිය ගිය මිනිසුන් නැවත ආවේ නැත. ගෙවල් දොරවල් නැවත සැදුණත් සිදු වූ විපත යළි සකස් කිරීමට නොහැකි වුණි.

"ඔතනින් වමට හරවන්න."

සහන් රථයේ වේගය අඩු කර ඇගේ උපදෙස් අනුව ගම්මානය දෙසට ගියේය. ප්‍රධාන මාවතින් හැරී කිලෝමීටර් දෙක තුනක් පමණ ගිය පසු සුන්දර වෙල් යායක් දිස් වුණි. සැබෙවින්ම එය ලස්සන ගම්මානයකි.

"දකුණට හරවන්න."

පංචලි කීවාය.

පරිසරය නිල් පැහැයෙන් යුතුය. මඳ දුරක් ගිය පසු යකඩ ගේට්ටුවක් දමන ලද ගේට්ටුවක් අසල රථය නතර කිරීමට ඇගෙන් උපදෙස් ලැබුණි. ඉන් පසු රථයෙන් බැස ගිය තරුණිය ගේට්ටුව විවෘත කර එන්න මැද වූ වික්ටෝරියානු සම්ප්‍රදායට සාදන ලද නිවස දෙසට දුව ගියාය. සහන් රථය නතර කළේය.

"එන්න ළමයෝ... මේක තමා අපේ ගේ."

"මැඩම් යන්න."

කාන්තාව නිවස දෙසට ගිය පසු ඔහු වෑන් රියෙන් බැස අතේ හිරි ඇරියේය. එය අක්කර දහයක් පමණ විශාල වූ පොල් ඉඩමකි. ඉඩම කෙළවරේ වෙල්යාය තිබුණි.

WWW.SINHALAELIBRARY.COM 31



"ළමයෝ... එන්න ඇතුළට."

"නෑ නෝනා... මෙහෙම හොඳා"

ඔහු රථයට හේත්තු වී කීවේය.

"මහන්සි ඇතිනේ. තේ එකක් බොමු."

"නෑ අවශ්‍ය නෑ. මම වතුර එකක් බිව්වා. ස්තූතියි. මම වැඩිය තේ බොන්නෙ නෑ."

නිවස තුළ සිටි පංචලි ඇතුළේ සිට බෑග් කීපයක් රැගෙන එනු දුටු සහන් ඉදිරියට දුව ආවේය.

"දෙන්න මිස්.. මම ගෙනියන්නම්."

"නෑ.. නෑ.. අවශ්‍ය නෑ. මට ගෙනියන්න පුළුවන්."

"නෑ.. නෑ.. ඒක මගේ ඩියුටිය."

"එහාට වෙන්න. ඔයාගේ ඩියුටිය වාහනේ එලවන එක විතරයි. මේවා අපි ගෙනියන්නම්."

ඔහු බලා සිටියේ මේ හිතුවක්කාර කෙල්ලගේ ක්‍රියා කලාපය දෙසය. ඇය පාර්සල් ගෙනැවිත් රථයට දමීමේ ඔහුගේ සහායක් නැතිවය.

"ළමයෝ... එමු තේ එකක් බොන්න."

තව දුරටත් එය ප්‍රතික්ෂේප කිරීමට නොහැකි නිසා ඔහු ඉස්තෝප්පුවට ගියේය. ඉස්තෝප්පුවේ සිටින කල පුළුල් සාලය පෙනෙයි. සුදු සාරියකින් සැරසී රෝද පුටුවක ඉඳගෙන සිටි අවුරුදු 70 ක පමණ කාන්තාවක් සිනා මුසු මුහුණින් සහන්ව පිළිගත්තාය.

"ඔහොම දිගටම යන්න ළමයෝ. තෑම් මේසේ උඩ ඇති."

මෙම මහලු කාන්තාවගේ ආගන්තුක සත්කාරය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන් කමක් ඔහුට නොතිබුණි. පුළුල් විසිත්ත කාමරය මැදින් [illegible]ම කාමරය දෙසට ගියේය. සාලයේ වූ කළුවර කැබිනෙට්ටුවක් මත තිබූ ගැහැනියකගේ ඡායාරූපය දුක

මොහොතකට නතර වුණි. මීට දශක දෙකකට ඉහත පුවත්පත් මාසික සඟරා සැරසූ රුවැත්තිය යාන්තමින් මතකය. මැය තමා සමඟ රථයේ පැමිණි කාන්තාව බව තේරුම් ගියේ පසුවය.

"ළමයෝ, බෙදන්න කෙනෙක් නෑ. තියෙන දෙයක් කන්න."

ඒ නිහතමානී ගැමිකම ඔහු අගය කළේය. එය විස්සකට, තිහකට එකවර අනුන් ගත හැකි දුවැන්ත කෑම මේසයකි. සව්දොදොල්, ආස්මී, පැණි වළලු වැනි රසකැවිලි මේසය මත තිබුණි. පංචලී මේසය ළඟින් එහා මෙහා ගියා විනා ඔහුට තේ පානය සඳහා ආරාධනා කළේ නැත.

මැදිවියේ වූ සේවිකාවක් තේ කෝප්පයක් සාදාගෙන එනු දුටු ඔහු ඇගෙන් ඉල්ලා ගෙන තේ පානය කරමින් සාලයේ ඡායාරූප නැරඹුවේය.

"ඔය ඉන්නේ මගේ මිනිබිරී... දුන් ඔය ගියේ."

මහලු කාන්තාව පංචලී හඳුන්වා දෙමින් කීවාය.

"ඇයි ආස්මී, සව්දොදොල් කෑවේ නැත්තේ. කඩෙන් ගෙනාවෙ නෑ. මේ දුව එනවා කිව්ව නිසා හැදුවා."

"මට පැණිරස අගුණයි. පණු අමාරුව හැදෙනවා."

පංචලී ආත්තම්මාට රවමින් ගියාය.

"උනා, එහෙම නම් උඹ දොර වහගෙන හිටපන්. අපි යනවා. නවරත්නලාගේ මෝලට වී ටිකක් කොටන්න දුන්නා. ඒක ගෙනැත් තියපං."

"ආත්තම්මා යමු"

පංචලී ආත්තම්මාගේ රෝද පුටුව තල්ලු කරගෙන යමින් කීවාය.

අනෝමා වැන් රිය අසලට වී සිටියේ අම්මාව [illegible] නංවා ගැනීමටය.



"කෝ ආත්තම්මා අපි වාහනේට නග්ගන්නම්."

"ටිකක් කරන්ට අමාරුයි. මම දුවට කිව්වෙ ඒකයි. මම ගියාම ඔගොල්ලන්ට කරදරයි."

"අම්මා අපිට කරදරයක් වෙන්නේ කොහොමද? එහෙම නම් අම්මා චූටි කාලේ අපිව වඩාගෙන ගිහින් තියෙන්නේ. අපි ගැන කරදර වෙලා තියෙන්නේ."

"මම වගේ ලෙඩ ගෑනියෙක් ඔයාලට කරදර වෙයි."

"මිස් අපි ටිකක් ඉක්මන් කළොත් හොඳා"

සහන් කීවේය.

ආත්තම්මා තරමක් වැඩුණු ගැහැනියෙක් නිසා පංචලීට හා මට වන වත්සලා ඇය රථයට නැංවීම තරමක අසීරු කරුණක් වුණි.

"කෝ පොඩ්ඩක් එහාට වෙන්න."

සහන් ඔවුනතරට ආවේය.

"මිස් මේ රෝද පුටුව පොඩ්ඩකට අල්ල ගන්න.'

සහන් එකවරම සිය ශක්තිමත් දෑතට පංචලීගේ ආත්තම්මා ඔසවා රථය තුළින් තැබුවේය.

"අනේ මගේ පුතාට යෝධ බල, යෝධ ශක්තිය ලැබෙන්න ඕනෑ."

ඇය සහන්ට සෙත් පතමින් කීවේය.

පංචලීගේ සිතේ සිහින් සතුටක් දැනුණේ ඔහු පැමිණ මැදිහත් වීම නිසාය.

රථය ඉදිරියට යද්දී ඔහු වෙනත් කැසට්යක් රෙකෝඩරයට දැම්මේය. එය උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීත එකතුවකින් ගන්නා ලද ගීතයකි.

WWW.SINHALAELIBRARY.COM 32

''ළමයෝ... ඔය සින්දුව පොඩ්ඩක් වැඩි කරනවද?''

''අම්මා කැමති සින්දුවක්. අම්මා මේක රාගයක් නේද?''

''මේක 'මේඝමල්හාර රාගය''

ආත්තම්මා පැවසුවේය.

ආත්තම්මා සංගීත ගුරුවරියක් ලෙස සේවය කර ඇති නිසා සංගීතය පිළිබඳ පුළුල අවබෝධයක් ඇතිව සිටියාය. ඊළඟට ප්‍රචාරය වුණේ වෙනත් රාගයක ගීයකි. ශාංකරා භරණම්, භෛරවි වැනි රාග ඇසුරෙන් ද ගීත නිර්මාණය වී තිබුණි.

''මැඩම් එහෙම නම් සින්දුවක් කියන්නකෝ...''

''අනේ අම්මා කියන්වකෝ...''

වත්සලා යෝජනා කළාය.

උදාසීන ගතියක් නැම දෙනා වෙතම තිබුණි. ඔහුගේ ප්‍රියතාවය අනිත් අයට වඩා වෙනස්ය. සහන් ප්‍රිය කළ ගීතවලට ආත්තම්මා සතුටු වීම නිසා රථය තුළ සිටින සැවොම සතුටු වූහ. බටහිර ගීතයක් කනේ ගසාගෙන ගිය පංචලි මෙම කණ්ඩායමට මැදිහත් වූයේ නැත.

දිවා ආහාරය සඳහා කාලය පැමිණ ඇත. විශ්වවිද්‍යාලයේ ඉගෙනීම ලැබූ මිතුරන් කිහිප දෙනෙක් මේ මග දෙපස ඇත. මෙවන් ගමන් යද්දී ප්‍රණීතම කෑම පිසින කෑම කඩ කීපයක් ඔහු දන සිටියේය. තමා මේ අයගේ හිතවතෙක් නොවේ. කෑම ප්‍රශ්නය තමා විසඳා ගැනීමට ඔහු අදහස් කළේය. රථය හෙවණක නතර කළ හෙතෙම මාවත අසල වූ බොජුන්හලට ගොස් කෑම මිලදී ගෙන ආවේය.

''සහන් කොහේද ගියේ...?''

පංචලිගේ මව ඇසුවාය.

''පොඩි වැඩකට ගියා නේන්නා ඇයි...?''

''පොඩි වැඩකට නොවේ අම්මා ඔය ගියේ කෑම ගේන්නයි.''

පංචලි කීවාය.



''ඇයි ළමයෝ ඔය ළමයටත් එක්කනේ කෑම ගෙනාවේ. අපි කෑම කටක් දෙන්ට බැරි මිනිස්සු කියලා හිතුවද?''

වත්සලා මැතිනිය කීවාය.

ඔහු සිනාවකින් මුව සරසා ගත්තා විනා කිසිවක් පැවසුවේ නැත.

''ආත්තම්මට බෙහෙත් බොන්නත් ඕනෑනේ. කෑම කමුද?''

''ළමයෝ... හොඳ තැනක කෑමට නතර කරන්න.''

අරුණගේ පවුලේ නෑයින් වැඩි දෙනෙකුම සුනාමියෙන් ජීවිත අහිමි වුණි. අරුණ බේරුණේ එදා කොළඹ සිටි බැවිනි. පවුලේ අය බේරුණේ නිවසේ විසිටීම නිසාය. හෙතෙම ගේට්ටුව ඇර අරුණිගේ නිවස ඉදිරිපිට රථය නතර කළේය.

කොට කලිසමකින් හා ටීෂර්ටයකින් සැරසී සිටි යුවතිය සහන් දුක ඉදිරියට ආවේය.

''සහන් අයියා.''

''කෝ අරුණ...?''

''ඔන්න ඊයේ ඉඳන් වාහනේ ගලවගෙන දඟලනවා.''

සහන් නිවසේ වම් පස වූ ගරාජයට ගියේය.

''කොහොමද සහා. ආෆ්ටර් ඒ ලෝන්ග් ටයිම්''

''ඔව්, මම මේ දවස්වල අක්කාට පොඩි සෙපෝර්ට් එකක් දෙනවා. ඩ්‍රයිවරයා ගිහින්. වෙනින් කෙනෙක් එනකල් වැඩ.''

ඔහු තත්පර කීපයක් ඇතුළත සියලු විස්තර කීවේය.

''ඔව්, මේකී හෙන සයිස්. මේ කාලය ඇතුළත කැම්පස් වෝක්ස් හෙම දෙන්ට එපා. හරිද?''

''මොනවද ඕනෑ. හිටපං කෑම ටිකක් උයන්නම්.''

WWW.SINHALAELIBRARY.COM 33

''උයන්ට ඕනෑ නෑ. අපි මූද හරියේ ඉඳන් කෑම ටික කන්නම්.''

"මුද ගාවට ඕනැ නම් පලයං. ගේ ඇතුළේ ඉඳන් කමු."

ඔහු මජං පිසිමින් මිදුලට ආවේය. ඒ එන විට පංචලි හා මව රථයෙන් බැස කතා කරමින් සිටින හැටි සහන් දුටුවේය.

"මැඩම්, ඕනැ නම් ගෙට ගිහින් කන්ට පුළුවන්."

"නෑ.. නෑ.. අපිට එළියේ හොඳා. යමු මුහුද ගාවට."

"එහෙනම් ලොකු මැඩම්."

"අනේ දරුවෝ මාත් එනවා."

සහන් මිතුරාගේ සහාය ඇතිව මිලිනා වීරසේකර මැතිණිය සයුර අසලට ගෙන ගියේය. දිවා ආහාරය වෙනුවෙන් වැඩි වේලාවක් වැය නොකිරීමට තීරණය කර තිබුණ ද මේ සුන්දර පරිසරයේ තරමක් වේලා රැඳී සිටීමට සිදු වුණි.

වෙනත් තැනක සිටියා නම් කාන්තාවන්ගේ අවශ්‍යතා පහසුවෙන් කිරීමට ලැබෙන්නේ නැත.

"මේකි හෙන සයිස් කෑල්ලක් නේද? ගණින් ගන්ට එපා."

"පිස්සුද? තඹ සතේකට ගණන් ගන්නෙ නෑ. ඇමතියෙකුගේ පුයිවෙට් සෙකුටරි කෙනෙක් වගේ. මුන්ට දාහක් ප්‍රශ්න. පරක්කු වුණා මචං."

"අනිද්දා එහෙරන්. මම කෑම ලෑස්ති කරනවා."

"මුන්ට දෙනවට වඩා හොඳයි බලු කපුටන්ට දානයක් දෙනවා."

"හැබැයි මම මෙන්න මෙහෙම දෙයක් හිතනවා. ශුද්ධාට වඩා මේ කෙල්ල උඹට ෆිට්."

ගමනට සූදානම්ව පැමිණි පංචලි රථයේ නළාව හඬවනු ඇසී මිතුරාගෙන් සමුගෙන දුව ගියේය.

කතාවට ගියාම කෙල්ලෝ වගේ. එතන පැළ වෙනවා. ඇය තමාටම කියා ගත්තාය.



# 10

කතරගමට යන විට සවස් වී තිබුණි. ඔවුහු සෙල්ලකතරගම පාරේ කලින් වෙන් කරන ලද සංචාරක බංගලාවක නතර වුණි. සහන් රථයේ බඩු බාහිරාදිය සංචාරක බංගලාවේ තැබුවේය. ගෑස් සිලින්ඩරය හා කුකරය කුස්සියෙන් ගොස් තැබුවේය.

"අම්මා, මට තේ එකක් බොන්ට ඕනෑ."

"කෑම උයන කෙනෙක් දෙනවා කියලා පොරොන්දු වුණාට තවම නැහැනේ. ඉන්න තේ එකක් මම හදන්නම්."

මෙම කටයුතුවල පිටුපසින් සිටින්නේ වෙනත් පුද්ගලයෙකි.

බොහෝ කටයුතුවලදී පංචලි හැල්ලුවට පත්ව සිටින හේතුවක් ඇත. කොහේ ගියත් උපතේ වරදින් තමා දුක් විඳින බව ඇය දනී. මුළු සමාජය කෙරෙහිම බැඳගත් බද්ධ වෛරයක් ඇගේ සිතේ ඇත.

සහන් දුර ගමනින් මඩ වැදී තිබුණු රථය පිරිසිදු කළේය. එළියේ පයිප්පයෙන් ඇඟ සෝදා පිරිසිදුව වෙනින් ඇඳුමක් හැඳ ගත් සහන් නිවාසය දෙසට ගියේය.

"නෝනා හැන්දෑවට පන්සල් යනවා නේද?"

"ඔව්... ඔව් යනවා."

WWW.SINHALAELIBRARY.COM 34

පංචලි වෙනින් ඇඳුමකින් සූදානම්ව සංචාරක බංගලාවේ වේවැල් පුටුවක අසුන් ගෙන සිටිනු ඔහු දුටුවේය.

"අම්මා ඇවිදින් තේ බොන්න කියන්න."

"ආ... එන්න සහන් තේ හැදුවා."

"මැඩම්, මම තේ බොන්නෙ නෑ."

"සහන්වත් එක්කයි හැදුවේ."

"ඕන් නෑ මැඩම්. මම දැන් වඩුමට යනවා. ගිහින් ඩීසල් ටිකකුත් ගහගෙන එන්නම්."

"ඔය බොරු. පැට්‍රල් ෂෙඩ් කවුරුවත් උස්සගෙන යන්නෙ නෑ. තේ බොන්න කියන්න."

ඈ සැරෙන් කීවාය.

"මම විනාඩි පහෙන් එන්නම්."

"යද්දි ඩීසල් ගහමු."

සැඳෑ වරුවේ ඔවුහු පන්සල් යාමට සූදානම්ව සිටියහ. තේ කෝප්පයක් පානය කළේ ඉන් මිදී සිටීමට නොහැකි බැවිනි. පන්සල් යාමට ආවේ සුදු සායකින් හා හැට්ටයකින් සැරසීය. පෙරවරුවේ සිටියාට වඩා අමුතු උස්සන බවක් තිබුණි.

මින්නණියට රථයට නැංවීමට සහාය වූයේ සහන්ය. වාහනය රථ ගාලේ නතර කර සැමවොම විහාරය දෙසට ගමන් කළහ. පංචලි හදිසියෙන් මුණ ගැසුණු මිතුරියක් හා කතා කරමින් සිටින නිසා ආත්තම්මා අපහසුවට පත්ව සිටින බව සහන්ට හැඟුණි.

"මිස්, මම මැඩම්ව එක්කරගෙන යන්නම්."

ඔහු පංචලි වෙතින් ආත්තම්මාව ගෙන ඉදිරියට ගියේය. එසේ වුවද ඔහු පංචලි සිය පරීක්ෂාවෙන් අතහැරියේ නැත.



"යමු..."

ඔහු කෙටියෙන් කීවේය.

ඇය ආපසු හැරී සහන් දෙස බැලුවාය. ඔහු තමා වෙත පතුරුවා ඇති ආධිපත්‍ය මෙවන් මොහොතක පවා ඉවත් කර නැත.

"කෙල්ලේ, මම අප්පච්චිට කියලා බලන්නම්. ඔයා ඇප්ලිකේෂන් දාන්න. එන්න බැරි නම් මගේ නමට මිනිස්ට්‍රියට එවන්න."

"හා... හා යමු ළමයෝ. මට මල් ටිකක් පූජා කරන්ට බැරි වෙයි."

"පන්සල ගාවට ඇවිදින් වදින්න බැරි වෙන්නෙ නැහැ. අපි බලමු."

"අවුරුදු ගාණකින් කිරි වෙහෙරට ආවෙ නෑ."

ඈ දැන් බැඳ,සුදෝ සුදුව බබලන චෛත්‍ය රාජයා දෙස බලා කීවාය.

මඳ වේලාවකට පසු වත්සලා මැතිනිය හා පංචලි මල් වට්ටි රැගෙන මිලිනා මැතිනිය දෙසට එනු සහන් දුටුවේය.

"එහෙමනම් අම්මේ මේ මල් වට්ටිවලට අත ගහන්න."

"පින්සිද්ධ වෙච්චාවෙ. පින්සිද්ධ වෙච්චාවෙ. ගිහින් පූජා කරලා එන්න. මම මෙතෙන්ට වෙලා පන්සිල් ගන්නම්."

මහලු කාන්තාව කතා කළේ දුකින් යුතුවය.

"මැඩම්ට උඩ මළුවට යන්න ඕනැද?"

"යන්න නම් ඕනෙ දරුවෝ. මම හුගාක් පව් කරලද කොහේද යන්නෙ."

ඇය කතා කළේ හැඬුම් මුසුවය.

WWW.SINHALAELIBRARY.COM 35

ඔව මෙහි ආවේ තම අපලයාට බාර වීම සඳහාය. අපල නැතැයි යන්න කිසි අයුරකින් පිළිගත නොහැක. පංචලීගේ ඇතැම් ප්‍රශ්න ජීවිතය හා බැඳි ඒවාය. බුදුන් වැඳ දෙවියන්ට පූජාවක් පැවැත්වීමට නියමිතය.

ආත්තම්මා චෛත්‍ය රාජයාට වඳින හැටි දුටු සැනින් ඈ පුදුම වූවාය. ඇවිදින්ට බැරි ඇය ආවේ කොහොමද?

"ආත්තම්මා, ඔයා මේ කොහොමද ආවෙ...?"

"යෝධ බල ලැබෙන්න ඕනෑ. අර දරුවා මාව දෑතට වඩාගෙන මෙතෙන්ට ගෙනාවා."

ඇය කතා කළේ තෙත් වූ දෑසින් යුතුවය.

"අර කොලුවා බය නැතිව හිටගෙන ඉන්ට කිව්වා. වැටුණොත් මාව අල්ලන්නම් කිව්වා."

"අනේ... අම්මා, මේ බලන්න ආත්තම්මා හිටගෙන ඉන්නවා."

"මේ ඉන්නේ මට උදව් කරපු පුතා."

ඇය තුටුරින් සිටි සහන්ව පෙන්වමින් කීවාය.

රෝද පුටුවේ ගමන් කිරීමට පටන් ගෙන සෑහෙන කලෙකි. ඇතැම් අවස්ථාවල නැගී සිටියත් වැඩි දුරක් ඇය ගමන් කළේ නැත. රෝද පුටුව පසෙක තැබූ ඔහු තමා ඔසවාගෙන වැලි මළුවට ගෙනා හැටි සිහිවෙයි. සැවොම සතුටු වූයේ ආත්තම්මා ඇවිදීම පිළිබඳවය.

පංචලීගේ සිතේ සතුටක් ඇතිවුණේ ආත්තම්මා මෙසේ සතුටින් පසුවීම පිළිබඳවය. මේ හැම මොහොතකම ආත්තම්මාට ආරක්ෂාව සපයමින් ඔහු ළඟට වී සිටියේය. වන්දනාව සඳහා ඇය සෑහෙන වේලාවක් ගත කළාය. වන්දනාව අවසන් වූ පසු ඔහු මහලු කාන්තාව පහළට ඔසවාගෙන ආවේය. යළි ගමන ආරම්භ වුණි.



ඔහු මැතිනියගේ අත් කරත්තය තල්ලු කරගෙන ගියේය. වෙනදා නැති සතුටක් මිලිනා මහත්මියට දැනේ. අශ්චර්ය බෝධියක් ඇති කතරගම කිරි වෙහෙර බෝරජුන් අභියස නැගී සිටීමට ලැබීම ආශ්චර්යයකි.

ඔහු නිහඬව රෝද පුටුව තල්ලු කරගෙන ගියේය. පංචලිට අද ප්‍රීතිමත් දිනයකි. වන්දනාවේ පිරිස අතර දන්නා හඳුනන පිරිස් සිටීම ප්‍රීතියට හේතුවකි.

සහන් තුටුරින් ගලන මැණික් නදිය අසලට ඇය කැඳවාගෙන ගියේය. හැඳෑ අඳුර අවට පැතිර ගොස්ය. මැණික් ගඟ තුටුරින් දල්වා ඇති විදුලි පහන්වල එළිය ජලයට වැටී ඇත. රථවාහන කලබලයෙන් මිදුන පසු පරිසරයේ ඇති වූයේ නිහඬ බවකි.

"මැඩම්ට මහන්සිද?"

"අනේ දරුවෝ... මට දැන් මහන්සි නෑ. ඇත්තමයි මට සනීපයි."

ඇය සතුටින් සිනාසුනාය.

"මැඩම්ට පොඩි අමාරුවක් තියෙන්ට ඇති. නමුත් හිතේ ලෙඩක් තිබිලා තියෙනවා."

"ඔව් ළමයෝ හරි. හිතේ ලෙඩක් තියෙනවා තමා. ඉස්සර හැමතැනම ඇවිද්ද මම දැන් වැටුමට යන්නෙ පැන්ෂන් ගන්ට විතරයි."

"මේ මාලඹේ ගෙදරට ආව නම් ඉවරයිනෙ. පැන්ෂන් එක එහෙට හරවා ගන්ට පුළුවන්."

මේ කොලුවා යමක් තේරුම් බේරුම් ඇති කෙනෙක් බව මිලිනා වීරසේකර මහත්මියට තේරුම් ගියාය. එහෙත් පවුලකට සිදුව ඇති නැස්පැත්තිය පිටස්තර දන හැඳුනුම්කමක් නැති තරුණයෙක් හා පැවසිය නොහැක. ධනයෙන් බලයෙන් උපක්‍රම මගින් තම දුවගේ ජීවිතය විනාශ කළ ඔහු රජයේ කැබිනට් ඇමැතිවරයෙක් මෙන් ජීවත් වෙයි. කොයි රජය ආවත් පක්ෂ මාරු

WWW.SINHALAELIBRARY.COM 36

කර බලයේ රැඳී සිටින ඔහුට පාතාලයේ මැර බලය ද හිමිය. මුළු රටම මෙය දන්නා කරුණකි. වේදිකාව, සිනමාව, රූපවාහිනිය යන මාධ්‍යයන්හි ජනප්‍රිය චරිතයක් වූ ඇය ඒ මැරයාගේ අනියම් බිරිඳ ලෙස ජීවත් වෙයි. මෙතරම් අසාධාරණ කමක් සිදු කර දූව වෙත නවම බලය පතුරුවාගෙන සිටී. නිල උත්සව, විදේශගත සංචාර, පාර්ලිමේන්තු කටයුතුවලට විවාහක බිරිඳ කැඳවාගෙන ගියත් රහසිගත ලෙස ඔහු ජීවත් වන්නේ දූව සමගිනි.

මෙම අසාධාරණකමට එරෙහිව නැගී සිටීමට තරම් ශක්තියක් අම්මාට නොවීය. වසර විස්සක් තිස්සේ මේ ගෙවන ජීවිතයෙන් ඇය දහස්වර මැරී මැරී ඉපදෙයි. පංචලිට දැන් දහනව වසරකි. පොඩි දූවටත් වඩා ඇය හැඩරුවින් යුතුය. මොන දේ තිබුණත් සිතේ සතුටක් නැත. මේ රියදුරු ළමයා පැවසුවාක් මෙන් හැමටම හේතු වී ඇත්තේ හිතේ කරදරය.

බංගලාවට එනවිට කෑම පිළියෙල වෙමින් තිබුණි. හැන්දෑවේ දිය නෑමට ඔහු අදහස් කළේය.

"අම්මා... මම නාන්ට ගඟට යන්වද?"

"අනේට හිටී."

"මෙතන නාන තැනක් තියෙනවනෙ අම්මා."

"හැන්දෑවට කිඹුල්ලු එළියට එනවා."

සහන් කීවේය.

පංචලි කිසිවක් කීවේ නැත. ඔහු කතා කරන්නේ තමා ආරක්ෂා කිරීම වෙනුවෙනි. නාන කාමරයට වැදී මුහුණ සෝදා ගත් ඈ වෙනින් ඇඳුමකට පිවිසුනාය.

ගඟට ගොස් දිය නාගත් ඔහු ආපසු වෑන් රථයට වී හාන්සි වී සිටියේය. පංචලි අත් නැති ගවුමකින් සැරසී ඉදිරිපස [illegible] කණුව යටට වී බලා සිටිනු ඔහු දුටුවේය. එකවරම ප්‍රභූ ආරක්ෂක



රථයක් පැමිණෙනු දුටු ඔහු එදෙස බලා සිටියේය. ඉන් මොහොතකට පසු වෙඩි නොවදින වර්ගයේ BMW රථයක් බංගලාව ඉදිරිපස නතර කළේය. දොර විවෘත වූ නොබෝ වේලාවකින් ඇතුළේ සිටි තැනැත්තා බැස්සේය. ආරක්ෂක නිලධාරීන් පිරිවරාගෙන ඔහු ඇතුළට ගියේය. ආරක්ෂක පිරිස සහන් සිටින රථය පරීක්ෂා කළහ.

"අයිසෙ ගන්නවා වාහනේ අහකට."

එක් අයෙක් සැරෙන් කීවේය.

"කොහේ යන්නද? මම ආවේ ඔහේට කලින්."

"මැරෙන්ඩ ආසද?"

එක් අයෙක් පිස්තෝලය හිසට තදකරමින් අවිනීතව කෑගැසුවේය.

"ගන්නව හලෝ අහකට අත."

ඔහු සියුම් ලෙස අත ඉවත් කළේය.

"වැඩකාරයෙක්ද?"

ඇමැති ආරක්ෂකයන් සහන්ට පහර දීමට සූදානම් වූහ.

"නවත්වනවා ඕක."

කිසිවෙක් උස් හඬින් කෑගසනු ඇසිණි.

"මේ මගේ කෙනෙක්. එයා ආවෙ මා එක්ක. ගිහින් වැඩක් බලා ගන්නවා."

"මිස් අපිට ඒ බවක් කිව්වෙ නෑනෙ."

"සහන් එන්න, ඇවිදින් නිදා ගන්න."

"නෑ මිස්... මම වාහනේ නිදා ගන්නම්."

"සහන්ටත් කාමරයක් තියෙනවා. එන්න නිදාගන්න."

"නෑ මිස් මේ බූරුවෝ මගේ වාහනයට මොනවා හරි කරයි. මම වාහනේ නිදා ගන්නම්."

WWW.SINHALAELIBRARY.COM 37

"එහෙම වෙන එකක් නෑ. මම පොරොන්දු වෙන්නම්."

ඇය කතා කළේ වගකීමෙන් යුතුවය.

"එහෙම නම් ඇවිදින් කන්න."

"ඇමැති තුමා කෑවෙ නෑ නේද? මම පස්සෙ කන්නම්."

"ඒගොල්ලො කනකොට එළි වෙයි. දැන් ඔය මොනවද බොන්න හදන්නෙ. ඒක කොයි වෙලාවෙ ඉවර වෙයිද දන්නෙ නෑ."

ඔහු පිළිතුරක් නොදී සිටියේය.

"අන්න ආත්තම්මා කතා කරනවා."

ඔහුට ආත්තම්මා ගේ වචනය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන් වූයේ නැත. දෙදෙනා අතර අමුතුම බැඳීමක් ඇති බව ඇය තේරුම්ගෙන සිටියාය. මේ ආශ්චර්ය සිදුවීම වූයේ සහන් නිසාය. වසර ගණනාවක් රෝද පුටුවේ ගමන් කළ ආත්තම්මාට නැගී සිටීමට ශක්තිය ලැබුණේ සහන් නිසාය.

"අද අමුත්තෝ ඇවිදින් ඉන්නවනේ මිස්. ඊටත් වඩා..."

"ඔව් මම දන්නවා හේතුව. මංජුල ඇවිදින් ඉන්න හින්දා නේද?"

"මම ආවොත් අනවශ්‍ය ප්‍රශ්න ඇතිවෙයි මිස්. අමනාපයක් නෑ... පුළුවන් නම් මට කෑම එකක් එවන්න. නැතිනම් කමක් නෑ."

පංචලි එකළුල්ලේ සහන් දෙස බලා සිටියාය. තාත්තා සමඟ පැමිණි ව්‍යාපාරිකයන් ආරක්ෂක නිලධාරීන්ගේ ආරක්ෂාව ඇතිව මිවිත පානය කරනු පෙනේ. මෙවන් මොහොතක ප්‍රශ්න ඇති නොකිරීමට ඔහු සිතන්නට ඇත. කොහේදෝ නැති දුකක් ඇයගේ සිතට පිවිසුණි.



# 11

පුර පොහෝ දිනයේ පැවැත්වෙන සීල ව්‍යාපාරයට දහස් සංඛ්‍යාත පිරිසක් රැස්ව සිටියහ. සහන් සිල් සමාදම් වීමට සිරි මිලිනා මාතාවට රථයේ අසුන් ගැනීමට සහාය වුණි.

"මැඩම්, සිල් ගන්ට තව ඉන්නවද?"

"දුව සිල් ගන්නවා."

සහන් රෝද පුටුව තම රථය තුළට දැම්මේය. කිසිවෙක් අඳුරේ පැමිණ රථයේ අසුන් ගන්නා හැටි ඔහු දුටුවේය.

සිරි වෙහෙරේ සීල ව්‍යාපාරය සඳහා සහභාගි වූ පිරිස අතර පංචලි සිටි බවක් ඔහු දැන සිටියේ නැත. සහන් සිතුවේ පංචලි ඇමැතිවරයා සමඟ බැහැරක යන්ට ඇතැයි කියාය.

ආපසු බංගලාවට පැමිණි ඔහු කෙටි විවේකයක් ගත්තේය. ඉකුත් දින රාත්‍රියේ ආරක්ෂක නිලධාරීන් අතින් තමාට වෙන්ට තිබූ කරදරය නැතිව ගියේ පංචලිගේ මැදිහත්වීම නිසාය.

නාද වූ හැන්ඩ් ෆෝනය ඔහු කන තබා ගත්තේය.

"මල්ලි, අක්කා කතා කරන්නෙ."

WWW.SINHALAELIBRARY.COM 38

"කතා කරන්ට වෙලාවක් තිබුණෙ නෑ. දැන් ඉන්නෙ කිරි වෙහෙර ළඟ."

"අර මූසල කෙල්ල එක්ක කතාවට යන්ට එපා. දෙන දෙයක් කන්නවත් එපා."

"පුළුවන් තරම් කට් එක ගැහුවා. බේරෙන්න බැරිව ගියා. බතලවත්තෙ ලොකු නෝනගෙ අම්මා ඉන්නෙ අකුරැස්සෙ."

ගමනෙදි හමු වූ කාන්තාව පිළිබඳව ඔහුගේ සිතේ ඇත්තේ ගෞරවයකි. තමා නිසා ඇය සතුටට පත්ව ඇති බවක් ඔහුට හැඟෙයි.

"ඔය ගැනු හරි අහංකාරයි. තමුන් ගිය ගමන කරගෙන ආවම ඇති."

"අහංකාරයි කිව්වෙ කවුද? මට නම් ඒ බවක් පේන්න නෑ."

"මල්ලි හයර් එක ගිය බවට ගෙදරට ආරංචි වෙලා ආවා. බතලවත්තෙ ඉන්න නෝනගෙ අම්මලාට කුඹුරු ඉඩකඩම් තියෙනවලු."

"ගෙදර වගේ මම හතර මායිම් බලන්ට ගියේ නෑ. ඒ වුණත් හොඳට දේපොළ තියෙන වැදගත් මිනිස්සු."

"ගෙදරට කිව්වා නම් ඔය ගමන එනවා කිව්වා."

"දන්නවද වැඩක්... ඇමතියත් ආවා."

"ඔය බතලවත්තෙ ඉන්නෙ ඇමතියගෙ හොර ගෑනි. කලින් රූප රාජිණියක්. ඉස්සර චිත්‍රපටි, නාට්‍ය, සිනමා සඟරාවල හිටියා. ඇත්තටම ඒ ගෑනි ලස්සනයි. ඇමතියා ඒ ගෑනිව අනාථ කළා."

"මට ඒවා ඕන්නෑ. මම ආවෙ හයර් එකක්."

ඔහු අක්කාගෙ උපතින් හිමි දුර්වලකම් හඳුනයි. ඇතැම් ඒවා ගැහැනුන් අතර පවතින අඩුපාඩුකම්ය.

මේ පිරිස එන්ට ඇත්තේ කතරගම දෙවියන්ගෙන් පිහිටක්



පැතීමට විය යුතුය. අද මිනිසුන්ට ඇති ප්‍රශ්නවල ස්වභාවය බැරෑරුම්ය. ජීවත්වීම අපහසුය. සාමාන්‍ය මධ්‍යම පන්තිකයන් පමණක් නොව ධනපතීන් පවා අද ශාස්ත්‍රකරුවන්, තත්කාල බලන්නන්, පේනකාරියන්, හමුවීමට පල්ලි, දේවාල, කෝවිල්වලට යති. මිනිසුන් සිතන්නේ අදෘශ්‍යමාන බලවේගයකින් හෝ ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්නටය. තෙල් මිල වැඩි වීම, ඩොලරය බාල්දු වීම, උද්ධමනය වැනි හේතු මේ අවපාතයට හේතු වී ඇත. ජනතාව සහන සොයා යන්නේ එබැවිනි.

මල් මිලදී ගැනීමට තවත් දුරක් යා යුතුය. කතරගම සිටින වෙළෙන්දන්, දුකට පත්ව සරණ සොයා එන පිරිස සූරා කෑමට සූදානමින් සිටිති. යම් ප්‍රමාණයක ලාභයක් ලබා ගන්නාට වරදක් නැත. දෙවියන් විසින් කප්පුවන්ට ද යම් කිසි දවසක දඬුවම් දෙනු ඇත. සහන් දේවාලයට නොගියේ තමාට දෙවියන්ගෙන් පෞද්ගලිකව ලැබිය යුතු දෙයක් නැති බැවිනි. පහන් දල්වමින් සිටිය දී තමාට නුදුරින් සිටි තැනැත්තිය ඔහු හඳුනා ගත්තේය. සිල් රෙද්දකින් සැරසී මල් පූජා කරන තරුණිය එකවරම හඳුනා ගැනීමට පහසු වූයේ නැත. බතලවත්තේ සිට විවිධ විලාසිතාවන්ගෙන් සැරසී කාර්යාලයට යන තරුණිය මෙවන් ඇඳුමකින් සැරසී සිටිනවා ඔහු දැක තිබුණේ නැත. සිල් රෙද්දෙන් සැරසී සිටින විට අමුතුම උපශාන්ත බවක් පෙනේ.

පංචලි සෙමින් සහන් වෙත ආවාය.

"වන්දනා කරලා ඉවරද?"

"ඉවරයි... කෝ ලොකු නෝනා..?"

"ආත්තම්මා සිල් සමාදන් වෙලා ඉවරයි."

"ඒක තමා ආවෙ. එහෙනම් යමු."

ඔහු නිහඬව ඇගේ ආත්තම්මා සිටි තැන සොයා ගියේය. උපශාන්ත පෙනුමෙන් යුතු මහලු කාන්තාව සහන් දැක සිනාසුණාය.

"මේ ළමයා වන්දනා කරලා එන්න."

"මම මල් පූජා කළා."

ඔහු රෝද පුටුව දිගහරිමින් කීවේය.

පෙවරුවේ සිට භාවනා, ධර්ම සාකච්ඡා වැනි ආගමික කටයුතුවලට සහභාගි වූ නිසා ඇගේ සිතට ලොකු සහනයක් ලැබී තිබුණි. සම වියේ උපාසිකාවන්ගේ හමුව ප්‍රීති ජනක එකක් වී තිබුණි.

"එහෙම නම් ඔක්කෝටම කිව්වා. අපි යනවා."

මැතිනිය දැන් එක්කොට සැමගෙන්ම සමුගත්තාය.

"මැරෙන්න කලින් ටිච්ච දකින්ට ලැබීම සතුටුයි."

ආචාර්ය මණ්ඩලයේ එකට සේවය කළ අයෙක් පැවසීය.

"ඇත්තටම සතුටුදායක හමුවීමක් තමා. කවුද මේ මුනුබුරාද?"

ගුරුවරියක් ඇසුවාය.

මෙච්චර උදව් කළ තැනැත්තාට මුනුබුරා කීමේ ඇති කිසි වරදක් නැත.

"ඔව්, මගේ මුනුබුරෙක් තමා. මේ පුතා හින්දා තමා මම ඊයේ නැගිටලා හිටගත්තේ."

සැමෝම ශක්තිමත් පිරිමියා දෙස බලා සිටියහ. හෙතෙම උපාසිකාව් ඔසවා රෝද පුටුව මත තැබුවේය.

"නෝනා, දැන් ඉතින් පුටුවෙ යන්ට ඕනැ නෑ. අපි පුටුව අල්ලගෙන ඇවිදිමු."

"මට පුළුවන්ද දරුවා..."

"බැරි වුණොත් මම ඉන්නවනෙ."



ඔවුහු නිහඬව ඉදිරියට ගමන් කළහ. තමා අසලින් ගමන් කරන තැනැත්තිය හෙතෙම හඳුනා ගත්තාය.

"පොඩි දුව, මේ බලන්නකො මට ඇවිදින්න කියනවා."

"ඉතින් හොඳයිනෙ."

"මේ දරුවා හින්දා තමයි මට ඇවිදින්ට පුළුවන් වුණේ."

සහන් ඇමැතිවරයා පිටව යන තෙක් බංගලාවට යන ගමන ප්‍රමාද කළේය. හෙතෙම වෘත්තීය දේශපාලනඥයෙක් ලෙස පක්ෂ මාරු කරමින් බලයට පත්වීමේ රසය දත් අයෙකි. ඔහුට නොකළ හැකි දෙයක් නැත. විවාහක බිරිඳ හා දරුවන් සමඟ ඇමැති නිල නිවාසයක ජීවත්වන බව ප්‍රසිද්ධ කරුණකි. එහෙත් ඔහු අනියම් භාර්යාව සමඟ ජීවත් වන බව ප්‍රසිද්ධ රහසකි.

මෙම වියේ පසුවන වෙනත් යුවතියන් වෙතින් දිස්වන ප්‍රීතිමත් බව ජවයක් ඇය වෙත නොවුණි. සමහරවිට එසේ සිදුවන්ට ඇත්තේ කිසියම් කලකිරීමක් නිසා විය හැක.

වත්සලා මැතිනිය ප්‍රීති වූයේ සෑහෙන කලකින් අම්මා සතුටින් සිටීම පිළිබඳවය. සිරි වෙහෙර වන්දනාවේ ගිය දිනයේ අම්මාට දෙපා වාරුවෙන් නැගී සිටීමට හැකිවීම පිළිබඳව ඇය පුදුම වූවාය. තාත්තා මිය යාමෙන් පසුව අම්මා හොඳටම දුර්වලව ගියේය. ඇතැම් විට තාත්තාගේ මරණයටත් මුල්වන්ට ඇත්තේ තමා බව දනී.

පළාතේ වැදගත් පුද්ගලයෙක්ව සිටි පියාට පොඩි දුවට මුහුණ දීමට සිදු වූ අභාග්‍යසම්පන්න සිදුවීම දරා ගැනීමට අපහසු වන්නට ඇත. ඔහු මිය ගියේ හෘදයාබාධයකිනි.

අම්මා ගුරුවරියක් ලෙස ගමේ පාසලේ සේවය කිරීමට නොහැකි වූ නිසා දුෂ්කර පළාතකට මාරුවීමක් ගෙන ගියාය. ඇමතිවරයා සතු ධනය, බලය ඉදිරියේ තමා අසරණ වූ හැටි මතකය. [illegible]යේ මහා දුර ගමනක් යා හැකිව තිබූ රූ රැජිණියගේ ජීවිතය නතර වුණි. ගැබ් ගැනීමෙන් පසු ඇයට ගම හැරදා ඒමට

WWW.SINHALAELIBRARY.COM 40

සිදුවුණි. මැරවර බලය නිසා ඇයට ඇමැතිගේ අනියම් බිරිඳ ලෙස ජීවත් වීමට සිදු වුණි.

නීත්‍යානුකූල නොවුණත් ඔහු හා බැඳි අයිතිවාසිකම් ඇත. තමාට දූත් සම්පතක් ලෙස ඉතිරිව සිටින්නේ පංචලි දූව පමණි. පංචලි බොහෝ විට ජීවත් වන්නේ කිසිවෙක් පිළිබඳ තදබල විශ්වාසයක් නැතිවය. තමා වරදක් කර ඇති ගැහැනියක් බව ඇය ඇතැම් අවස්ථාවල චෝදනා කළ හැටි මතකය. මුකුත් කළ නොහැකි තමා තවත් එක්තරා ගැහැනියක් බව ඇය තේරුම් ගෙන ඇත. පංචලි තමා දකින සාමාන්‍ය තරුණියක් මෙන් නොවේ. යොවනියක් ලෙස ඇය පරිපූර්ණය. තමාටත් වඩා කැපී පෙනෙන රුවැත්තියක් වුවද දන්නා තරමින් කිසිම ප්‍රේම සම්බන්ධයක් දූවට නැත. මේ පිළිබඳව වූ කිසිම උනන්දුවක් නැත. සමහරවිට ඇගේ සිතේ කලකිරීමක් ඇතිව තිබෙන බවක් පෙනේ.

ඇමැති තුමා පැමිණියත් ඔහුට මුහුණ නොදෙන හිතුවක්කාර කමක් ඇයට ඇත. වරදක් සිදුවී ඇද්ද නැද්ද යන්න දූත් කතා කිරීමේ තේරුමක් නැත. ඇමැතිවරයා වෙන කා ඉදිරියේ බලය පැතිරුවත් කිසිවෙකුට මෙල්ල නොවන ජවයක් පංචලිට තිබුණි. නීත්‍යානුකූල නොවුණත් ඔහු තම පියා බැව් ඇය දනී. ඇය ආදරයක, ප්‍රේමයක නොපැටලෙන්නට වග බලා ගත්තේ එනිසා බැව් වීරසේකර මැතිනිය දනී. සැමියාගේ අමාත්‍යාංශයේ රැකියාවක් කරන්නේ ඔහුගේ බලවත් ඉල්ලීම නිසාය. පියා වුවද පංචලි ඔහුව හැඟීමෙන් පිළිගන්නේ නැති බව ඇය දනී. ඇය තදබල ලෙස ආගම් දහමට ලැදිව සිටින හැටි. පංචලි කිසි දින විවාහ නොවන බව පැවසීමට තරම් මුරණ්ඩු වී ඇත.



12

ගමන ආරම්භ කළේ හිමිදිරියෙනි. ඔවුනතර ඇතිවුණේ නිහඬ බවකි. පාන්දර සෙත් පිරිත් සජ්ඣායනය ඇසේ. කවුරුත් සිටින්නේ සතුටින් යුතුවය. පංචලි මාවත දෙස බලා සිටියා විනා වචනයකුදු දෙඩුවේ නැත. ඉකුත් දින දෙක තුළ තම සිතට මොනවා හෝ දෙයක් සිදුව ඇති බවක් දුනේ.

''ලොකු නෝනා... උදේට තේ බොනවද?''

''අම්මා, බඩගිනිද කියලා අහනවා.''

''අපි ඉඳගෙන යන එකනෙ. වාහනේ එළවන ළමයාට බඩගිනි ඇති. කොහේ හරි නතර කරන්න කියන්න.''

ආත්තම්මා කීවාය.

ආත්තම්මා සැබෙවින්ම කාරුණික කාන්තාවකි. කාට ආදරේ කළත් ආත්තම්මා අමනාපව සිටින්නේ කාන්තා සමගින් පමණක් බව පංචලි දනී. සහන් ගැහැනියකගේ සිත දිනාගත් අපූරුව. යළි රථය තුළ නිශ්ශබ්දතාවයක් ඇති වුණි. ගසල් ගීතයක් රෙකෝඩරයෙන් [illegible]. හෙතෙම නිකමටවත් මුහුණ දෙස බලා සිනා නොවෙන අමුතු තැනැත්තියකි.

WWW.SINHALAELIBRARY.COM 41

වැඩි ජනාකීර්ණ නැති සාමාන්‍ය භෝජන ශාලාවක් අසල තේ පානය කිරීමට රථය නතර කළේය. ඇය රථයෙන් බැස අවට සිරි නරඹන්නට පටන් ගත්තාය.

ඔහු නිහඬව තේ පානය කළේය. ඇය තේ පානය කළේ ආත්තම්මාගේ ඉල්ලීම නිසාය. තාත්තාගේ පැමිණීම නිසා ඇය කෝපයට පත්ව සිටියාය.

"ළමයෝ... බේදාගෙන කන්න. දුව ඔය සහන්ට කතා කරන්න."

"ආත්තම්මා කෑනුගහා ඉන්න. ඕනෑනම් කන්නෙ නැතෑ."

"එහෙම කියන්න එපා දුව. ඒ ළමයා අපිට කොච්චර උදව් කරනවද?"

"ආත්තම්මා කියන්නේ කෑම කවන්න කියලද?"

"ලොකු දුව ඇයි මේ විදිහට දරුවෝ හදන්නෙ. ඇයි මේ විදිහට දුෂ්ඨ වෙන්න...?"

ඇය කම්පා වෙමින් කීවාය. මේ වැරදි වැඩවලට ජානමය හේතූන් මුල් වී ඇති බව ඇය දනී. ඒ දුෂ්ඨ පුද්ගලයාගේ දරුවා වෙන ද එවැනි ගතිපැවතුම් ඇතිවීම පුදුමයක් නොවේ. මෙහිදී ප්‍රශ්න ඇති නොකිරීමට වගබලා ගත්තේ ගිය ගමනේ ආශ්වාදය නැති කිරීමට අකැමැති වූ හෙයිනි. තේ පානයෙන් පසු යළි ගමන ආරම්භ වුණි. ගමනේ සෑහෙන දුරක් ගිය පසු ආත්තම්මා කතා කරන හඬ පංචලීට ඇසුණි.

"සහන් ළමයෝ... කම්මැලිකම යන්නත් එක්ක සින්දුවක් කියමු."

ඔහු සිනාවකින් මුව සරසා ගත්තා විනා කිසිවක් පැවසුවේ නැත. හෙමෙනුම ආත්තම්මා ආරම්භ කළ ගීතයට සහාය දෙන හැටි ඈ අසා සිටියාය. ආත්තම්මා වෘත්තීය සංගීත ගුරුවරියකි. ඇගේ වැඩිපුර කැමැත්ත තිබුණේ රාගධාරී සංගීතය වෙතය. ආත්තම්මා



ගැයූ හැම ගීතයක්ම ගැයීමට සහන් මැනවින් දැන සිටියේය. ආත්තම්මා මෙතරම් සතුටින් සිටි කාලයක් ඇයට මතක නැත.

සහන් ප්‍රධාන මාවතින් ආත්තම්මාගේ ගමේ ගෙදරට රථය හැරෙව්වේය. නිවස දෙසට හැරවූ වෙලේ සිට ආත්තම්මා සිටියේ දුකින් යුතුවය. පංචලී සෙමින් රථයෙන් බැස ගොඩ වත්තට පිවිසෙන ගේට්ටුව විවෘත කළාය. නිවස අසලට පැමිණි පසු පංචලී දොර විවෘත කර ආත්තම්මාට බැසීමට ආධාර කළාය.

"නෝනා රෝද පුටුව..."

නිවසේ මෙහෙකාරිය රථය අසලට එමින් ඇසුවාය.

"එපා... මම පයින් එන්නම්."

"මොනවා... ලොකු නෝනට පයින් එන්න පුළුවන්. කතරගම දෙවි හාමුදුරුවන්ගේ පිහිටයි."

"නෝනා... අපි දන්ම පිටත් වෙමු."

"එකපාරටම යන්ට බැහැනේ සහන්."

"ළමයිනේ එමු. කිතුල් හකුරු කෑල්ලක් කාලා තේ එකක් බීලා යමු."

"තේ එකක් බොන්න වෙන වෙලාවක එන්නම්. මට හෙට හයර් එකට ලෑස්ති වෙන්ට ඕනෑ."

"ඔව් අම්මේ... අපි ඉක්මනට යන්ට ඕනෑ. පොඩි දුවට උදේ බෝඩ් මීටින් එකකට යන්ට තියෙනවා."

"ආත්තම්මා ඩොක්ටර්ට පෙන්වන්න තියෙන දවසට එන්නම්."

"ආත්තම්මා මොහොතක් කල්පනා කළාය.

"ඔය දුව... අම්මාව ඒකනායක මහත්තයට පෙන්වන දවසට ඇස් දෙකත් පෙන්වන්ට ඕනෑ."

WWW.SINHALAELIBRARY.COM 42

''සහන් ළමයෝ කවුද හොඳ දොස්තර කෙනෙක් වැනල් කරන්ට ඕනෑ.''

''දැන් අලුත් ඩොක්ටර්ස්ලා ඉන්නවා. වාරියපොල මහත්තයාට පෙන්වමු.''

''අම්මා... එහෙමනම් ගිහින් එන්නම්.''

වත්සලා මහත්මිය කීවාය.

නිවසේ මෙහෙකාරිය අමාරුවෙන් ඔසවාගෙන පැමිණි බෑගයක් රථයට දැම්මාය.

''චන්ද්‍රා අපිට වී ටිකක් කොටා ගන්ට පුළුවන්. තව හාල් ටිකක් දමමු. දුව හාල් ටිකක් සහන්ටත් දෙන්න.''

වෙන්ව යාමට ප්‍රථම සහන් සැමටම ආදර්ශමත් වෙමින් මිලිනා මැතිනියගේ දෙපා වැඳ සමු ගත්තේය. වැදූ දුව ලෙස හෝ මිනිබිරිය ලෙස මෙවන් සමුගැන්මක් කිසිදාක සිදුව නැත. සහන්ගේ මේ ක්‍රියාවෙන් ඔවුන් අපහසුතාවයට පත්ව ඇත. මිලිනා මහත්මියගේ දෙනෙත් කඳුළෙන් තෙත්වන හැටි සහන් දුටුවේය.

යුතුකම් ලොවට හඬගා කිව යුතු නැත.

''තෙරුවන් සරණයි..''

ඇය සහන්ගේ හිස පිරිමදිමින් කීවාය.

වෑන් රිය ඔහලවත්තට එනවිට හොඳටම අඳුර වැටී තිබුණි. රථය වත්තට පිවිසි සැණින් පංචලි ඉන් බැස නිවස තුළට ගියාය.

සහන් රථයේ තිබූ බඩු බාහිරාදිය බිමින් තැබුවේය. මිලිනා මැතිනියගේ නිවසින් ගෙනා හාල්, ගෑස් සිලින්ඩරය, ඇඳුම් බෑග් ඔසවා ගොස් ඉස්තෝප්පුවේ තැබුවේය.

''සහන්, මේ ගෑස් සිලින්ඩරේ ඇතුළට අල්ලමුද?''

ඔහු නිහඬව ගෑස් සිලින්ඩරය ඔසවාගෙන ගොස් කුස්සියේ



උදුනට සවි කර ආවේය. සැටිය මත වැතිර සිටින යුවතිය දුටු මුත් ඔහු ඉවත හැරී ආවේය. වෑන් රිය සෝදා ඩීසල් ගසා හෙට ගමනට සූදානම් කළ යුතුය.

''හෝනා... එහෙනම් මම යනවා.''

''හා... හා යන්ට එපා. පොඩ්ඩක් ඉන්න. මේ සල්ලි අරන් යන්න.''

''ප්‍රශ්නයක් නෑ පස්සෙ ගන්ට පුළුවන්.''

''අම්මා...''

නිවස තුළ සිට පංචලි කතා කරන හඬ ඇසුණි. දුව ගේ ආරාධනයෙන් නිවසට ගිය ඈ මුදල් රැගෙන ආවාය.

''මෙන්න හයර් එකේ සල්ලි.''

''අම්මා අර හාල්...''

පංචලි දොරට හේත්තු වී කීවාය.

''ආ... ඔව්. අම්මා සහන්ට හාල් මල්ලක් දෙන්ට කිව්වා.''

ඈ සිනාමුසු මුහුණින් යුතුව කීවාය.

''මට හාල් අවශ්‍ය නෑ.''

''නොගත්තොත් අම්මා තරහ වෙයි. හරි ළමයෙක්නේ... මේ කාලෙ හාල්, පොල් එපයි කියන්නේ කවුද? අම්මට ගිහින් දෙන්න.''

''මගේ අම්මලා මෙහෙ නෑ.''

''අම්මා, අක්කට ගිහින් දෙන්න කියන්න.''

පංචලි දොරට හේත්තු වී කීවාය.

ඔහු පිළිතුරක් නොදී සිටියේය.

''සහන් තව පොඩි උදව්වක් ඕනෑ.''

WWW.SINHALAELIBRARY.COM 43

"මොකක්ද මැඩම්..."

"අම්මාව අයි ඉස්පෙෂලිස්ට් කෙනෙක්ට පෙන්වන්න තියෙනවා. වෙලාවක ගිහින් එක්ක එන්ට පුළුවන්ද?"

"සතියේ දිනවල නම් බෑ. වීක් එන්ඩ් එකේ නම් සමහර වෙලාවට පුළුවන් වෙයි. බලමුකෝ... එහෙනම් මැඩම් මම යනවා."

"එතකොට මේ හාල්...?"

"එපා නම් අල්ලලා එළියට විසි කරන්න අම්මා. අපිට නෙවෙයිනෙ දුන්නෙ. අන්තිමට අපිට ආත්තම්මාගෙන් බැණුම් අහන්ට වෙයි."

"ඔව් ඒක නම් ඇත්ත."

ඔහු නිහඬව පසෙක වූ හාල් බෑගය රථයට දමාගෙන නිවස බලා ගියේය.

සහන් නිවසට යන විට හොඳටම රෑ බෝවී තිබුණි. අක්කා දුව ආවේ සතුටින් යුතුවය.

"මගෙ පපුවෙ ගින්දර පත්තු වෙලයි හිටියෙ. ඇයි පරක්කු වුණේ...?"

"මේ නෝනගෙ අම්මලාගෙ ගෙදරත් ගියානෙ."

ඔහු පාර්සල් නිවස තුළට ගෙනියමින් කීවේය.

"මරු හාලක් හම්බ වෙලා තියෙන්නෙ. කොහෙන්ද මල්ලි ගත්තෙ...?"

"නෝනගෙ අම්මා දුන්නා." සහන් කීවේය.

"අනේ අම්මේ මල්ලියේ කලින්නුත් එක එක දේවල් හම්බ වෙනවා ඇති. ඒක අල්පෙනෙත්තියක් ඔය සේදර අපට දුන්නෙ නෑ."



අක්කා මුදල් ගෙන ගණන් බලනවා සහන් දුටුවේය.

"අක්කා ඇයි සල්ලි මදිද?"

"මදි නෙමෙ වැඩියෙන් තියෙනවා. මම හිතන්නේ මල්ලිට ටිප් එකක් දීලා වගේ. ඒක ඔයා ගන්න."

"මට ඕනෑ නෑ කාගෙවත් සල්ලි. කෝ දෙන්න මම ආපහු ගිහින් දෙන්නම්."

"අපරාදෙ... ඒක මල්ලි තියාගන්ට."

"මට ඕනෑ නෑ."

ඔහු මුදල් ගෙන කාමරයට ගියේය. දුර ගමනක යෙදුණත් ඔහුට එතරම් වෙහෙසක් දැනුණේ නැත. නාන කාමරයට වැදී දිය නා ගත් ඔහු කොට්ටය ඇඳ විට්ටමට තබා හේත්තු වුණේය.

දැස් පියා ගත් පසු තවමත් පසුවන්නේ රථයේ යැයි ඔහුට දැනේ. දින තුනක් තමා සමඟ ගැවසුන රූමතිය මතකට නැගෙයි. සිත කිසියම් අයුරකින් කැළඹී ඇති බවක් දැනේ. සමහර විට එසේ වන්ට ඇත්තේ ගැහැනියක් සමඟ දින කීපයක් සිටීම නිසා ඇති වූ වෙනස නිසා විය හැක. දෙනෙත් දෙතොල් පෙනී කැපී පෙනෙන තියුණු අඟ පසඟ පිරිමියෙකුගේ සිත ඇද බැඳ තබා ගැනීමට ජප කළ මන්ත්‍රයක් වැනිය. කාන්තිමත් ජවි වර්ණයක් ඇයට හිමිය. කොච්චර ලස්සන වුණත් ඇයගේ සැබෑ සුන්දරකම මතුව නැත. ඇය පසුවන්නේ මොන යම් හේතුවක් නිසා හෝ නොසතුටින් යුතුව බැව් ඔහුට සිතුණි. ඇගේ පවුලේ ප්‍රශ්න රටම දන්නා කරුණකි. ඇතැම්විට ඇය දුකට පත්ව සිටින්නේ මේ නිසා විය යුතුය. තමා හඳුනා ගත් කාලය තුළ කිසිදාක තමා සමඟ කුළුපගව කතා කර නැත. ඇයට නොයෙක් පෞද්ගලික ප්‍රශ්න තිබුණත් එයින් ඔහුට ප්‍රශ්නයක් වූයේ නැත. දින දෙක තුනක් ඇය සමඟ ගැවසීම නිසා තම සිතට නුරුවී ඇති බවක් දැනේ. සමහරවිට ඇය තමා දුප්ප‍ත් පියෙකුගේ දුවෙක් වීම පිළිබඳව දුක්වනවා විය හැක.

රාත්‍රී ආහාරය වශයෙන් ඉදිආප්ප කිහිපයක් කෑමට ගත් ඔහු කලින්ම නිදාගත්තේ පසු දින දින චරියාව ආරම්භ කිරීමට ඇති හෙයිනි. ඇඳට වැටුණු සැණින් නින්ද ලඟා වූයේ නැත. තද නින්දට පිවිසි නොබෝ වේලාවකින් අක්කාගේ හඬ ඇසුණි.

''මල්ලි. ඔයාට කෝල් එකක්.''

''මේ මහ රෑ මොන කෝල් ද? මම නිදියි කියන්න.''

''හදිස්සියක් කියලා බතලවත්තේ ගෙදරින් කතා කරනවා. මොකද බලන්න.''

ඔහු බෑණ වදිමින් ඇමතුම ගත්තේය.

''හලෝ...''

''ආ.. සහන්.. මම මේ බතලවත්තේ ගෙදරින් පංචලිගෙ අම්මා.''

''ඇයි නෝනා මොකද මහ රෑ...?''

''දුවට සනීප නෑ. සහන් ගිය වෙලේ ඉඳන් වමනෙ දානවා. නිකන් ෆිට් එක වගේ හැදුණා. මොකද කරන්නේ...?''

''දන්න ෆැමිලි ඩොක්ටර් කෙනෙක් නැද්ද?''

ඇය මඳ වේලාවක් නිහඬව සිටියාය.

''අපි එහෙනම් ප්‍රයිවෙට් හොස්පිට්ල් එක්කට යමු.''

''මිස් ලෑස්ති වෙන්න. මම එන්නම්.''

සහන් යාන්තමින් වතුර ටිකක් මුහුණේ අතුල්ලා නිදිමත පලවා හැර කලිසමකට පිවිස රථයට දුව ගියේය. වමනය යන්ට හේතුව කුමක්ද? සමහරවිට නොහෙට්වුව නිසා රෝගාතුර විය හැක. කොතරම් ප්‍රශ්න තිබුණත් මෙවන් මොහොතක නොගොස් බැරිය. බතලවත්තට යන්ට ගතවූයේ විනාඩි කීපයකි. මාවත් මිනිසුන්ගෙන් හිස්ය. මැදියම් රැයේ කිසිම නිවසක විදුලි පහනක් නැත. මාවතෙන් ඔබ්බෙහි පිහිටි වීරසේකර නිවසේ පමණක් මලානික විදුලි පහනක් දැල්වෙමින්

WWW.SINHALAELIBRARY.COM 45



තිබුණි. ඔහු රථය මිදුලේ නවතා කඩිනමින් නිවස දෙසට ගියේය.

''මොකද වුණේ...?''

''කතා කරන්ට වෙලාවක් නෑ. එන්න ඇතුළට.''

හෙතෙම ඉක්මනින් පංචලිගේ කාමරයට ගියේය. ඒ වන විට ඇය සැහැල්ලු ටීෂර්ටයක් හා ත්‍රි කුවාටර් කලිසමකින් සැරසී සිටියාය. මුණින්තලාව ඇඳේ වැතිර සිටි හැනැත්තිය සිටියේ හොඳටම දුර්වලවය.

''මම යනකොට අගේට හිටියනේ. දොර ගාවටත් ඇවිදින් කතා කළා.''

ඔව්.. ගියා විතරයි වගේ. අම්මේ මට වමනෙ යන්ට එනවා කිව්වා. මට තනියම උස්සන්ට බෑ. පොඩ්ඩක් අල්ලමු.''

''නෝනා ගිහින් වෑන් එකේ දොර ඇරලා ඉඳගන්ට. මම අරගෙන එන්නම්. කොට්ටෙකුත් ගන්න.''

සහන් පහත් වී ඇය ශක්තිමත් දෑතට ඔසවා ගත්තේය.

# 13

පංචලි පිබිදුනේ හිසේ තදබල වේදනාවක් පවතිද්දී ය. තමා සිටින්නේ කොහේදැයි ඇයට එකවරම තේරුම් ගියේ නැත. ඉදිරියේ තබා ඇති සේලයින් බෝතලය දෙස බලා සිටිය දී තමා සිටින්නේ රෝහලක බව ඇයට සිතුණි. තමාට තුදුරින් සිටි මව සෙමින් හිස පිරිමදිනවා ඇයට දැනුණි. සිදු වූ දේවල් කිසිවක් මතක තිබුණේ නැත.

"තිබහයි..."

අම්මා හැන්දෙන් දොඩම් යුෂ බිඳක් මුවට දමනවා දැනුණි.

"තව ටිකක් බොන්න."

"වැඩියෙන් දෙන්න එපා කියලා ඩොක්ටර් කිව්වා."

ඇය දොඩම් හැන්ද පානය කර මොහොතක් දෑස් පියා ගත්තාය. ඉකුත් දින සිදු වූ දේවල් මතකයට නැඟුණේ සෙමිනි.

"අම්මා... මම ඔෆිස් යන්නේ කොහොමද?"

"අපි සනීප වුණාම යමුකෝ. දැන් දුවට කොහොමද?"

"අම්මා... මාව ඔෆිස් එක්ක යන්න සහන් ආවද?"



"ආව... ආව.. දැන් ඉතින් ඒව පස්සෙ කතා කරමු."

"දැන් අම්මා වෙලාව කීය ද?"

"දැන් හැන්දෑවෙ හයයි තිහයි."

"එහෙනම් සහන් මාව එක්ක යන්න එන්නැති."

වීරසේකර මැතිනිය දුවගේ හිස පිරිමැද්දා විනා කිසිවක් කීවේ නැත. ගමන යොස් පැමිණ මඳ වේලාවකට පසු දුව රෝගාතුර වූ හැටි. ශන්දර උපත ලද තමා අද ඇමතිවරයෙකුගේ අනියම් බිරිඳ ලෙස රහසිගත ජීවිතයක් ගත කරන බව කිසිවෙක් දන්නේ නැත. විසර දහනවයක්ම මේ රහසිගත ජීවිතය ගත කළ හැටි සිහිවෙයි. හැමදෙනාටම රහසින් ඔහු නිවසට එයි. මේ රහසිගත ජීවිතයෙන් තමාට ලැබුණ එකම සම්පත වන්නේ පංචලිය. රහසිගතව එන නිසා සැමියා අවට කිසිවෙක් නොහඳුනයි. කප්පරක් ප්‍රශ්න තිබෙන බව සැබෑවකි. එහෙත් අද තමාට හෙතෙම තැග්ගක් පිරිනමා ඇත. ලංකාවේ සිටියා නම් මෙවන් මොහොතක ඔහුගේ සහාය ලැබෙන බව දනී. හදිසියෙන් දුව රෝගාතුර වීම නිසා කිසිවෙකුගේ සහාය පැතීමට ලැබුණේ නැත. සහන් සිහිවූයේ නොසිතූ ලෙසය.

සහන් මහ රෑයේ පැමිණ ඇය දෑතට ඔසවා රථයෙන් නැඟූ හැටිත්, ඔසවාගෙන රෝහලට ගිය සැටිත් ඇයට සිහිවුණි. බලාපොරොත්තු නොවූ මොහොතක දරුවා ඔසවා ගෙන යාමට අවසර දුන්නත් එය දුවට දැන ගැනීමට ඉඩ නොතැබීමට ඈ සිතුවා ය.

මෙවැනි පුළු දේවල් ප්‍රශ්න ඇති කිරීමට හේතුවන බව ඇය දනී. සහන් උපකාරයක් කළ බව සැබෑවකි. ඔහු කාගේ හෝ රථයක් ධාවනය කරන කුලී රියදුරෙකි.

නිත්‍යානුකූල විවාහයක් නැති වුණත් සමරතුංග තමා කෙරෙහි සහ දුව කෙරෙහි පනවා ඇති බලය ලිහිල් කර නැත. දුව කිසියම් ලෙසක මෙවැනි තැනැත්තෙක් සමඟ සබඳතාවයක් පවත්වන බව

WWW.SINHALAELIBRARY.COM 46

ආරංචි වුවහොත් එය දෙදෙනාගේම ජීවිතවලට ප්‍රශ්න ඇති විය හැකි බව ඇය දන්නා කරුණකි. එනිසා සහන් පංචලිට කළ උපකාර පිළිබඳව හෙළි කළේ නැත.

හැඳ සිටි ඇඳුම ගලවා වෙන ඇඳුමකට මාරුවන තෙක් අම්මා ළඟට වී සිටියා ය. තනිව නැගී සිටීමට තරම්වත් ශක්තියක් ඇයට තිබුණේ නැත.

"දුව.. මම ගෙදරට දුවලා එනකල් තනිව ඉන්ට පුළුවන්ද?"

ඇය හිස වනා පිළිතුරු දුන්නා ය.

"දුවට මොනව හරි ඕනැ නම් මේ බෙල් එක ගහන්ට."

"අම්මා... මගේ අන්ඩවෙයාස් ගේන්ට."

"ඔව්.. මම ඒකටත් එක්ක තමා යන්නෙ. එළියට යන්ට ඕනැ නම් තනිවම ඇඳෙන් බහින්ට එපා. බෙල් එක ගහන්ට. මම නර්ස්ට කියල යන්නම්."

වීරසේකර මිය දුවගේ දෙකම්මුල් සිප බෑගය අතට ගෙන කාමරයෙන් පිටතට ගියාය. අම්මා ගිය පසු කාමරය තුළ පැතිරුණේ නිහඬ බවකි. තමා සිටින්නේ පෞද්ගලික රෝහලක බව ඇය දනී. තමා මෙහි ගෙනාවේ කවුද? ආත්තම්මා කැඳවා ගතහොත් තනිකම මකා ගැනීමට පුළුවන. සහන් නිවස දන්නා නිසා ඔහු යවා ගෙන්වා ගැනීමට පුළුවන.

සහන් තමා කැඳවාගෙන යාමට උදේ නිවසට එන්නට ඇත. තමා රෝගාතුර වී ඇති බව දන්නේ නම් ඇතැම් විට ඔහු මෙහි ඒමට බැරි නැත. කිසිවෙක දොරට තට්ටු කරන හඬින් ඇගේ කල්පනා දාමය බිඳුණි. මඳ වේලාවකට පසු කාමරයට පිවිසි හෙදිය දෙස පංචලි බලා සිටියාය.

"මොනවත් ඕනෑද?" හෙදිය ඇසුවාය.



"මිස්ව ඕ.පී.ඩී. එකට උස්සාගෙන එනකොට ඩියුටි හිටියේ මමයි."

ඇය හිස් බැල්මෙන් යුතුව හෙදිය දෙස බලා සිටියාය.

"ඒ මිස්ව වඩාගෙන ආවේ බෝයි ෆ්‍රෙන්ඩ් ද?"

ඇතැම් ගැහැනුන් ඕපාදූප කතා කිරීමේ හපනුන්ය. තමා රෝහලේ ඇඳේ සිටිනවා හැර සිදු වූ කිසිවක් දන්නේ නැත. තමා රෝහලට ගෙනෙන්ට අම්මා කිසිවෙකුගේ සහාය පතන්ට ඇත. තමා බාහිර රෝගී අංශයට ඔසවාගෙන ආවේ කවුද?

"ඒ බෝයි එළිවෙනකල් හිටපු හින්දා මම හිතුවේ බෝයි ෆ්‍රෙන්ඩ් කියලයි. ඕනෑ කමක් වුණොත් කතා කරන්න. මම යනවා."

ඇය අනුන්ගේ කුණු කන්දල් සොයන හෙදියකි. එවන් ඊයක තමා රෝහලට ඔසවාගෙන ඒමට තරම් හිතවත් කෙනෙක් නැත. කිසිවෙක් දොරට තට්ටු කරනවා ඇසුණි.

"එන්න ඇතුළට..." ඇය පහත් හඬින් කෙඳිරුවා ය.

ඇය සිතා සිටියේ වෛද්‍ය වාර්තා ගැනීමට එන රෝහල් සේවක පිරිසක් කියාය. සහන් දොර තල්ලු කරගෙන කාමරය තුළට පිවිසුනේ ය. ඔහු දුටු සැනින් ඇගේ මුහුණේ වියළි සිනහවක් සටහන් වුණි.

"දැන් කොහොමද?"

"හොඳයි.." ඇය කෙටියෙන් කීවාය.

"කෝ මිසිස් වීරප්සේකර...?"

"අම්මා ගෙදර ගිහින් එන්ට ගියා."

"අපරාදෙ දන්නව නම් එක්කගෙන එන්ට තිබුණා. මොනවත් ඕනෑද?"

"මට අර දොඩම් වීදුරුවෙන් හැන්දක් පොවන්න."

WWW.SINHALAELIBRARY.COM 47

ඔහු ආවරණයෙන් වසා තිබූ හැන්ද යළි වතුරෙන් සෝදා භාජනයේ වූ දොඩම් දියර හැන්දක් පෙව්වේය.

"තව හැන්දක්.."

"වමනේ ගිය නිසා වැඩිපුර බොන්ට එපා කිව්වා."

"කමක් නෑ තිබහයි. තව එකක් දෙන්න."

"හොඳ නැත්නම් එපා. තව ටිකකින් බොමු."

ඇය හිස වනා අනුමත කළාය. ඇය පිළිතුරක් නොදී සහන් දෙස බලා සිටියාය.

"මා නිසා හුඟක් කරදර වුණා නේද? එළිවෙනකල් හොස්පිටල් එකේ හිටියා නේද?"

ඇය හැඬුම් මුසුව ඇසුවාය.

ඔහු පිළිතුරක් නොදී සිටියේය. කෙනෙකුට උදව් කිරීමේ දී ප්‍රතිඵියක් සෙවිය යුතු නැත.

"සහන් නේද මාව ඉස්පිරිතාලෙට උස්සගෙන ආවේ..?"

"කවුද කිව්වේ අම්මද?"

"අම්මලා කෙනෙකුගේ උදව්වක් කවදාවත් අගේ කරන්නෙ නෑ. මට සමාවෙන්න."

"මම මිස්ව උස්සගෙන ආවා කියලා කිව්වේ කවුද?"

"අම්මා නොකිව්වට මට කොහොම හරි ආරංචි වුණානෙ. මම ඇඟට වමනෙ දැම්මා නේදෙ? මට සමාවෙන්න."

"දැන් දෙපාරක් සමාව ඉල්ලුවා. ඒ වචනෙ ඉල්ලා අස්කරගන්න. කෙනෙකුට උදව් කරද්දි මා ලබන්නෙ සතුටක් විතරයි."

තමා දන්නා බොහෝ පිරිමින්ට වඩා සහන් වෙනස්ය. ඔහුගේ කතා බහ හැසිරීම් සාමාන්‍ය තත්ත්වයේ අය මෙන් නොවේ. බස



හැසිරීම වුණත් මෙවැනි වෘත්තියක් කරන තැනැත්තෙකුගේ මෙන් නොවේ. ආත්තම්මා දුන් සහල් මෙන්ම කතරගමට කතා කරගත් ප්‍රමාණයට වඩා දුන් ගාස්තුව අම්මාට දී ඇත. ඔහුගේ තත්ත්වය හරියටම දැනගත්තේ මංජුලට පහර දුන් දවසේය. එදා මෙදාතුර මංජුල තමාට කරදර කරන්නට ආවේ නැත.

"එහෙනම් මම යන්නද?"

"ඇයි හදිස්සිය... තව ටිකක් ඉන්න."

"අම්මා මම එනවට එච්චර කැමැත්තක් නැතිව වගේ."

"අම්මා ඒ තරම් නරක කෙනෙක් නෙමේ. එයාට බලපෑම් ඇති."

"මම යන්න ලෑස්ති වුණේ ඒවට බයේ නෙමේ. මම මේ සිංහල හාලෙ ලුණු කැඳ ටිකක් හදාගෙන එන්නයි යන්නෙ."

"අනේ... ඇයි මා නිසා කරදර වෙන්නෙ."

"අපේ වාහනේ යන කෙනෙක් අසනීප වුණාම එයාට මොන යම් හෝ උපකාරයක් කිරීමේ සදාචාරාත්මක අයිතියක් තියෙනවා."

"ඔච්චර බර වචන කියන්ට එපා. අපිට තේරෙන්නෙ නෑ."

ඇය සිහින් හඬින් සිනාසුනාය. ඔහු ද එම සිනාවට සහාය වුණි. එම ප්‍රිය සල්ලාපයේ යෙදී සිටින විට ඇගේ රෝගී බව සෙමින් පහව ගිය බවක් ඇයට දැනුණි.

"මම ගිහින් කැඳ ටිකක් හදාගෙන එන්නම්."

"කරදරයි නේද?"

"මොන කරදරයක්ද? මම හදාගෙන එන්නම්. මම එනවට අකැමැති නම් අක්කව එවන්නද?"

"අනේ... අනේ.. එපා. ඔයා අරන් එන්න."

WWW.SINHALAELIBRARY.COM 48

මඳ වේලාවක් කතා කරමින් සහන් යන්ට ගියේය. ඔහු හා දෙඩීමෙන් පසු සිතේ වූ වේදනාවන් පහව ගියාක් මෙන් දැනුණි. නොබෝ වේලාවකින් අම්මා ආවේ ඇඳුම් ද රැගෙනය. සහන් පැමිණි බවක් ඇය අම්මාට පැවසුවේ නැත. සමහරවිට එසේ වන්නට ඇත්තේ තාත්තා තමා ආරක්ෂා කිරීමට උපදෙස් සපයා ඇති බැවින් විය යුතුය.

සිදුව ඇති අතීත වැරදිවලට වන්දි ගෙවීමට සිදුව ඇත්තේ දරුවන්ටය. තාත්තාගේ නිත්‍යානුකූල විවාහයේ බිරිඳ ධන කුවේරයෙකුගේ දුවෙක් බව පංචලි දනී. පිරිමි දරුවන් දෙදෙනෙක් හා ගැහැනු දරුවන් තිදෙනෙක් නිත්‍යානුකූල විවාහයේ බිරිඳට සිටී. ඔවුන් ඉගෙනුම ලබන්නේ විදේශ රටවලය. දරුවෙක් සිටියත් කලාකාරිනියක් ලෙස වෙනත් විවාහයක් කර ගත හැකිව තිබුණි. තවමත් ඇය සිටින්නේ තාත්තාගේ සිරකාරියක් ලෙසය. තමාගේ ජීවිතයට වුවද බලපෑම් කරන්නේ ඔහුය. කිසිදාක ප්‍රේම සබඳතාවයක් ඇතිකර ගැනීමට පුළුවන්කමක් නැති බැව් ඇය දනී. අම්මා තමා ආරක්ෂා කරන්නේ අනවශ්‍ය ප්‍රශ්න ඇතිවෙතැයි සිතන හෙයිනි. ස්ව කැමැත්තෙන් එවැනි සබඳතාවයක් පටන් ගතහොත් ප්‍රථමයෙන්ම ජීවිතය විනාශ වන්නේ පිරිමියාගේය. තමාට බලපෑම් කරන මංජුලට මෙම වගකීම තාත්තා විසින් පවරා ඇති බව ඇය දනී. තමා හා මිතුවීමට උනන්දු වූ කීප දෙනෙක්ම අමානුෂික ලෙස පහර කෑ හැටි පංචලි දනී.

අම්මා මැදිරියට පිවිසුනේ සිතුවිලි සයුරේ ගැලී සිටියදීය.

"මෙන්න ඇඳුම් මාරු කර ගන්න."

"ඇඟ හෝදගන්නද අම්මා...?"

"එපා. ඒයේ එළිවෙනකල් වමනෙ කළානෙ රත්තරනේ ඇඟ හෝදන්ට එපා. රෙදි කැල්ලක් පොඟවලා ඇඟ පිහදා ගම්මු. ඉන්න මම පිහදාන්නම්."

ජීවිතයේ වූ සියලුම වටිනා සම්පත් දැන් මට අයිති නෑ.



හැමදේටම ඉන්නේ මේ රෝස මල විතරයි. දවසට හෝඹා ගිය හැටි. හැම වැඩක්ම තනියම කරගන්ට පුළුවන් වන තෙක් ඇය සෝදා පිරිසිදු කළේ තමා විසිනි. ඇඳුම් මුදවා ඇඟ පිස දමා වෙනත් ඇඳුමක් අන්දවා ඇඳේ ඉඳගැනීමට සැලැස්සුවාය. සැහැල්ලු ඇඳුමකින් සැරසුනු පසු තරමක සහනයක් දැනුණි.

"මට සනීප නැහැයි කියලා ආත්තම්මට කිව්වද?"

"ආත්තම්මට කිව්වා. ඒක අහලා අඬන්ට පටන් ගත්තා. එන්ට ඕනැයි කිව්වා."

"ඇයි කිව්වේ.. දැන් එනවා."

මඳ වේලාවකට පසු කිසිවෙක් දොරට තට්ටු කරනවා ඇසුණි. දොර විවෘත කරගෙන එන්නේ කවරෙක්දැයි ඇය දැන සිටියාය.

කාමරයට පිවිසි කාන්තාව පංචලි හඳුනා ගත්තාය.

"ආ... එන්න. දුව මේ ඉන්නෙ දුවල යන වාහනේ අයිතිකාර නෝනා."

"මේ නෝනා අසනීප වෙලා ඉන්නවා කිව්වා. ලුණු කැඳ ටිකක් හදාගෙන ආවා."

"හානේ... මොකට කරදර වුණාද?"

ඇය උණුසුම් භාජනය පිළිගන්වමින් කීවාය. එක්තරා යුගයක දී පත්තර සඟරාවල මුල් පිටු සැරසූ රූප රාජිණිය හඳුනා ගැනීමට අපහසු නැත. ඇමතිවරයෙකුගේ අනියම් බිරිඳක්ව සිටින බව ප්‍රසිද්ධ රහසකි. කසාද බැඳ දරුවන් සිටින බිරිඳක් සිටින බව දැන දැනත් නොසන්ඩාල ජීවිත ගත කරන ගැහැනු පිළිකුල්ය. අද තමා අසරණ වී සිටින්නේ මෙවන් ගැහැනියෙක් නිසාය.

www.sinhalaelibrary.com

# 14

සහන් පාන්දරින්ම පිබිදි රථය සේදුවේය. අක්කා වාහනයට හඳුන්කූරු දුම් අල්ලා වතාවත් කරනු පෙනේ. ඔහු නිවසින් පිටව යාමට පෙර අක්කා මුණ ගැසුනේය.

"ආ... මල්ලී, බතලවත්තෙ නෝනාගෙන් ප්ලාස් එක ඉල්ලා ගෙන එන්න."

"කොහොමද ලෙඩාට...?"

"මීට පස්සෙ මාව මේ වගේ ගමන් යවන්ට එපා."

"ඇයි ඔයාට මොනාවත් කිව්වද?"

"ඒ ලෙඩා වෙලා ඉන්න කෙල්ල නම් හොඳයි. කෙල්ලගෙ අම්මා මහ ජාතියෙ. ගහදන්න අපටයි කොළ කඩා පාන්නෙ."

සහන් පිළිතුරක් දුන්නේ නැත.

"මම දක්ක ගමන් ඇඳින්නා. ඉස්සර චිත්‍රපටිවල හිටියා. ඒ කාලෙ නටපු නාඩගම් නමා ඔය."

"අපිට අනුන්ගෙ කෙහෙල්මල් වැඩක් නෑ අක්කා. උදව් කළානෙ. එච්චරයි. මම යනවා අක්කා."



වෙනදා ගමන අරඹන්නේ බතලවත්තෙනි. ඉදිරිපස අසුන දින කිහිපයක සිට පාළුය. රථයේ සිටින අය තමාට සිනාසෙන බව ඔහු දනී.

හැන්දෑවට රෝහලට ගොස් ඇගේ දුක සැප බැලීමට යාමට වරෙක සිතෙයි. අක්කාගේ සිත රිදෙන්න කිසිවක් කීවා නම් එසේ නොකළ යුතුව තිබුණි. රථයේ ඉදගෙන සිටින හැම මොහොතකම ඔහුට පංචලි සිහිවෙයි. ආඩම්බරකම මැද තනිවුණු පැහැදිලි ලස්සන ගැහැනු කම මනහරය. පිරිමි ජීවිතයක් ලස්සන වන්නේ වාසනාවන්ත ගැහැනියක් ළඟ සිටින විටය. මැයට උපතින්ම හිමි වූ ලස්සන ගැහැනු කමක් ඇත. ජීවිතයේ ප්‍රථම වරට ගැහැනියෙක් දැහට වඩා ගැනීමට ලැබීම කොතරම් වාසනාවක් ද? හැන්ඩ් ෆෝනය නාද වුණි.

"අඳුනගන්ට පුළුවන්ද?"

සිහින් හඬ ඇසුණි.

"ඇයි බැරි."

ඔහු පංචලිගේ හඬට පිළිතුරු දුන්නේය.

"අපි එක්ක තරහද?"

"ඇයි තරහා වෙන්නෙ...?"

"ඇයි මාව බලන්න ආවෙ නැත්තෙ. සහන් එයි කියලා මම මග බලන් හිටියා."

"මම එන්නේ මොටද? අපි අතර ලොකු වෙනසක් තියෙනවා නේද?"

"මට සමාවෙන්න සහන්. මොනව හරි කියන්න බැරි දෙයක් මට තියෙනවා."

"මිස්..."

WWW.SINHALAELIBRARY.COM 50

''ඔය විකාර වචනය නතර කරන්න. මට පංචලි කිව්වම ඇති.''

''මට එහෙම කියන්ට බෑ. ඔයා කවුද.. මම කවුද?''

''අපි ඒක පස්සෙ බලාගමමු. හවස මගේ ටිකට් කපනවා. ඔයා මාව එක්ක යන්න එන්ට ඕනෑ.''

මෙ ආරාධනය ප්‍රතික්ෂේප කිරීමට ඔහුට පුළුවන් වූයේ නැත.

නිවසට ගිය ඔහු විෂාදයකින් සැරසුනේය.

''මල්ලී කොහේද යන්න හදන්නේ...? හවසට බෙල්ලන්විල යන්න තියෙනවා.''

''අර ලේඩාගෙ ටිකට් කපලා. ගෙදරට එක්කා ගෙන යන්න තියෙනවා.''

''ඇයි ඔයා ඒක බාර ගත්තෙ. මට ඒ මහ අම්මණ්ඩිව දැකට පේන්න බෑ. මෙ අපිටනේ රැස් පෙන්වන්න එන්නෙ.''

''ඔයත් කටු අත්ත වගේ පැටලෙන්න යනවනේ.''

''මීට පස්සෙ ඒ කෙල්ල ගන්න යන්න ඕනෑ නෑ. අර කැඳ අරන් ගිය ප්ලාස්ක් එක ගේන්න.''

සහන් රථයට ගොස් අසුන් ගත්තේය. අපේ අක්කා එක්ක ලේසියෙන් ගනෙනකුට බේරෙන්ට බෑ. වචනයක් වරදින්න බෑ. ඉවසීමෙන් කටයුතු කළා නම් පවුල් ජීවිතය පවත්වා ගත හැකිව තිබුණි.

රථය රෝහල ඉදිරිපස නතර කළ ඔහු පංචලි සිටින කාමරයට ගියේය.

''එන්න ඇතුළට.''



ඔහුට පංචලිගේ හඬ ඇසුණි. සැහැල්ලු කලිසමකින් හා සුදු අත් කොට කමිසයකින් සැරසී සිටි ඇය වෙතින් අමුතුම ගාන්ත පෙනුමක් දිස්වුණි.

''අම්මා බිල ගෙවන්ට ගියා.''

''දැන් සනීපයි නේද?''

ඇය හිස වනා පිළිතුරු දුන්නාය.

''ගෙදර ගිහින් ටික දවසක් විවේක ගන්ට වෙයි.''

''මොන විවේකයක් ද? මට වැඩ ගොඩ ගැහිලා. හෙට ඔෆිස් යන්ට ඕනෑ.''

''එහෙම හොඳ නෑ. ටිකක් විවේක අරන් යන්න.''

''අපි පන්සල් යන්නත් ඕනි.''

''ඒ හවසනෙ.''

''ඔයා මට සමාවෙන්න ඕනෑ.''

''අපි අතර සමාව ඉල්ලන්න දෙයක් වුණේ නෑ.''

''අපේ අම්මා කිව්ව දේකින් හිත රිදෙන්න ඇති. අක්කට සමා වෙන්න කියන්න.''

''ඒක එච්චර ගණන් ගන්ට එපා.''

වීරසේකර මැතිනිය මුදල් ගෙවා මැදිරියට ආවාය.

''සහන් කොයි වෙලේද ආවෙ...?''

''මැඩම්, මම ආවේ මෙ දැන්.''

''මම හිතුවේ අපි එක්ක අමනාප වෙලා ආවෙ නෑ කියලා.''

''හයර් එක දාලා ඉවර වෙනකොට රෑ වෙනවා. පහුගිය

WWW.SINHALAELIBRARY.COM 51

දවස්වල හැන්දෑවෙ හයර් කීපයක් ගියා. මළගෙවල්, දානෙ ගෙවල් තිබුණා. ඒකයි එන්ට බැරි වුණේ.''

''මම නෙමේ.. අපේ දුව සහන් එනකල් බලන් හිටියා.''

''සහන් රස්සාවක් කරනවනේ අම්මා.''

''මම මේ බඩු ටික වෑන් එකට ගෙනියන්නම්.''

සහන් පංචලිගේ ඇඳුම් බෑග් යනාදිය ගෙන ගොස් රථයට දැම්මේය.

රථයේ ගමන් කරන ඔවුනතර කතාවක් වූයේ නැත.

''සහන් ලබන වීක් එන්ඩ් එකේ පිට වැඩක් දාගන්ට එපා.''

''ඇයි මැඩම්...?''

''අම්මාව එක්කගෙන එන්න යන්න තියෙනවා.''

''මැඩම්, මට එන්න ලැබෙයිද දන්නෙ නෑ. මම වෙන වෑන් එකක් සෙට් කරලා දෙන්නම්.''

''අපෝ... සහන් නැතිනම් එපා. අම්මයි පණිවිඩේ එවලා තියෙන්නේ.''

''ඇයි ගෙවන ගාන මදි නම් ගාන කියන්න. නේද අම්මා...?''

''ප්‍රශ්නෙ මේකයි. මම මේ වාහනේ වැඩ කළේ කලින් හිටපු ඩ්‍රයිවර් ගිය නිසයි. දැන් ළඟදිම ඩ්‍රයිවර් කෙනෙක් එනවා. එනකොට මම ගමට යනවා.''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''සහන් නාවොත් මාත් මේ වාහනේ යන එක නතර කරනවා.''

පංචලි කීවාය.

''ඔව්... අක්කත් දැන් අපි එක්ක හිත හොඳ නෑනේ.''



වීරසේකර මැතිනිය කීවාය.

රථය බනලවත්ත නිවස අසල නතර කළ පසු පංචලි ඉන් බැස්සාය. සහන් රථයේ තිබූ බඩු නිවස තුළට ගොස් තැබුවේය. පංචලි නිවස තුළට නොගොස් ඉදිරිපස අඳුනක ඉඳගත්තාය.

''එනකොට ආයෙ වැඩට එන්නෙ නැද්ද?''

පංචලි ඇසුවාය.

ඔහු පිළිතුරක් නොදී පහත් කරගත් හිසින් යුතුව සිටියේය.

''හොඳ විශ්වාසවන්ත කෙනෙක් හම්බ වුණොත් විතරයි වෑන් එක දෙන්නේ.''

''හරි.. හරි.. ඒවට කල් තියෙනවනෙ.''

''සහන් අපිව උදව් කරල තියෙනවනෙ දුව. තාත්තට කියලා රස්සාවක් අරන් දෙමු. සහන්ගේ බයෝ ඩේටාස් දාලා ඇප්ලිකේෂන් එකක් දෙන්නකො. මොනවද පාස් කරලා තියෙන්නේ... සා.පෙළ තියෙනවද?''

ඔහු පිළිතුරක් දීමට ඒ මේ අතර ඇඹරෙන හැටි පංචලි දුටුවාය. අක්කා සමග එතරම් කැමති නැති වුණත් සහන්ට අම්මා ආදරය කළාය. සමහරවිට ඔහු සා.පෙළ සමත් නැතිවා වෙන්ට පුළුවන.

''එහෙනම් මැඩම් මම යනවා.''

''එදා සල්ලි දෙන්න බැරි වුණා. මේ හයර් එකත් එක්කම ගන්න.''

වීරසේකර මැතිනිය කීවාය.

''පිස්සුද මැඩම්... මේ වගේ වැඩක් කරලා සල්ලි ගන්නවද? ඒක පස්සෙ බලා ගම්මු.''

ඔහු මුදල් ප්‍රතික්ෂේප කර රථයට නැගී යන්ට ගියේය.

''පුදුම ගතිගුණ තියෙන හොඳ ළමයෙක්.''

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 52

''මම අම්මට කිව්වෙ නෑ. දවසක් මංජුල ඩාහතේ ළඟට ඇවිදින් මට කරදර කළා.''

''හාතේ... මට ඇයි කිව්වෙ නැත්තේ...?''

''ඊට පස්සෙ සහන් ඇවිදින් දුන්නා කට වැහෙන්න.''

''හොඳ ළමයෙක් බව පේනවා. තාත්තට කියලා රස්සාවක් අරන් දෙමු.''

පංචලි කාමරයට ගොස් ඇඳේ වැතිරුණාය.

උපකාරයක් කරන්නේ වෙන දෙයක් බලාපොරොත්තුවෙනි. ඔහුගේ හැසිරීමේ එවන් චේතනාවක් නැත. කන්ට බොන්ට හැම දෙයක්ම තිබුණත් අම්මා හා තමා එක්තරා පුද්ගලයෙකුගේ සිරකාරියන් ලෙස ජීවත්වන බව දෙදෙනාම පිළිගනිති. තාත්තාට අවශ්‍යව ඇත්තේ ඔහු කැමති පුද්ගලයෙක් හා තමා විවාහ වනු දක්මය. අවජාතක දුවෙක් ලෙස ජීවිතයට පිවිසීම බරපතළ ප්‍රශ්නයකි. තමා ඇමතිවරයාගේ අසම්මත පෙම්වතියගේ දුවක් බව සැවොම දනිති. වැදගත් නෑ පරපුරක් තමා බාර ගැනීමට කැමති නොවන බැව් පංචලි දනී. මෙවැනි කදබල අඩුවක් සමඟ ජීවිතය පටන් ගැනීමට පුළුවන් කමක් නැත.



## 15

ආත්තම්මා කොළඹ ඒමට සූදානම් වන්නේ වෛද්‍යවරයා හමුවීමට යාම සඳහාය. ඇසේ කාචය දැමීමට මූලික පරීක්ෂණ කළ යුතු වෙයි. දුව ලෙඩ වීමට පෙර මෙම පොරොත්තු ලේඛනයේ ලියාපදිංචිව සිටීම නිසා දැන් එය මඟහැර යා නොහැක.

''පොඩි දුව... අපි දැන් මේ වැඩේට මොකද කරන්නේ...?''

''අපි විසන් කෙයාර් එකට අත්තම්මව පෙන්නලා සූදානම් වෙලා ඉන්න ඕනෑ.''

''බස් එකේ යන්ට විදිහක් නෑ. මඟදි අම්මට ටොයිලට් යන්ට ඕනෑ වෙනවා. එක්කාගෙන එන්න සහන් යවන්න විදිහක් නෑ නේද?''

''සහන් ඩ්‍රයිවර් කෙනෙක් නෙමේ අම්මා. ඩ්‍රයිවර් කෙනෙක් හම්බ වුණාම වෑන් එක දීලා යනවා කිව්වා. සහන් ඇවිදින් ඉන්නේ අක්කගෙ උදව්වට.''

''ඒ ළමයා නම් විශ්වාසයි. ගෙදරත් දන්න නිසා ප්‍රශ්නයක් නෑ. පොඩ්ඩක් අහලා බලන්න දුව.''

WWW.SINHALAELIBRARY.COM 53

ඇය මේ ඉල්ලීම බාරගත්තේ එතරම් කැමැත්තෙන් නොවේ.

අම්මා ඉල්ලූ සැනින් ඇය ඔහුට ඇමතුමක් ගත්තේ නැත. මෙසේ නිතර කතා කරන්නට යාම නිසා ඔහු වරදවා සිතන්නට බැරි නැත. සිත අසරණකමින් පිරී යාමට හේතුවක් ඇත. එය කිසිවෙක් සමඟ ප්‍රසිද්ධියේ කතා කළ නොහැක. සමාජයට මුහුණ දිය නොහැකි බරපතළ වරදක් තමාට ඇත. ඇය ඇඳෙන් බැස ජනේලය අසලට ගියාය.

නිවස පිහිටා තිබෙන්නේ වත්ත මැදය. තාත්තා ගත කරන්නේ අතිශය රහසිගත ජීවිතයකි. කිසිදාක දවාලක එන්නේ නැත. කුඩා කල නොතේරුනත් කිසිවක් තේරුම් ගැනීමට තරම් වැඩුණාට පසු ඔහු එන්නේ ඇයි දැයි ඇය තේරුම් ගත්තාය.

වරෙක මේ සියල්ල අතහැර දමා ආත්තම්මා ළඟට යාමට සිතුවත් අම්මා තනිකර දමා යාම පහසු කරුණක් නොවේ. තාත්තාගේ නිත්‍යානුකූල බිරිඳක් සිටින බව ඇය දනී. ඇගේ දරුවන් යන්නේ උසස් බාලිකා විද්‍යාලවලටය. ඔහු බිරිඳ සමඟින් විදේශගත සංචාර, උත්සව වැනි අවස්ථාවල ගන්නා ලද ඡායාරූප මාධ්‍ය තුළින් පළ වෙයි. විවාහක බිරිඳගේ දරුවන් කීප අවස්ථාවකම පාසල් වියේදී පංචලිට හමුවී ඇත. එහෙත් කවදාවත් ඔවුනොවුන් හඳුනාගෙන නැත. මේ අනවශ්‍ය උපත නිසා තමා කොතරම් හිත් වේදනාවට පත් වුණිද?

මෑතක පළ වූ පත්තරයක ලිපියක් ඇය කියවා බැලුවාය. බිරිඳ සැමියාගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ විස්තර ලියා තිබුණි. හෙතෙම පන්සල් ඇසුරෙන් ජීවත්වන ආදර්ශමත් පුද්ගලයෙක් බවත් සඳහන්ව තිබුණි. මංගල ඡායාරූපය, දරුවන්ගේ තොරතුරු එම ජාතික පුවත්පතේ විය. එම පත්‍ර පිටුව ඇය සුරක්ෂිතව තබා ගත්තාය. අම්මාට මේවා පෙන්නුවා නම් ඇය තවත් සිත් තැවුලට පත්වනු ඇත.

කෙසේ වෙතත් තාත්තා එන දිනවල ඇය රාත්‍රී ආහාර ගෙන කලින්ම නිදා ගනී. තමා මෙන්ම ආත්තම්මා ද ගෙවන්නේ එකම පිළිකුල් සහගත ජීවිතයකි. දූවට කර ඇති අසාධාරණය නිසා



ආත්තම්මා තාත්තාට මුහුණ දෙන්නේ නැත. තමා මුහුණ දෙන්නේ කළ හැකි දෙයක් නැති හෙයිනි. ඇය එන්නේ ඇමතිතුමා කොළඹ නැතිනම් පමණි. එසේත් නැතිනම් ඇය නතර වන්නේ මාලබේ සිටින නැදෑ ගෙදරකය. කෙසේ වෙතත් ආත්තම්මා වෛද්‍යවරයාට පෙන්වීමට කැඳවාගෙන ආ යුතුය. ඈතින් දිස්වන අඳුරු මාවතේ ඉඳහිට වාහනයක් ගමන් කරනු ඇසේ.

ඇය සහන්ට ඇමතුමක් ගත්තේ ඔහුගේ උපකාරය අත්‍යවශ්‍ය වූ හෙයිනි. ඇමතුම ගත්තේ ගැහැනු කෙනෙකි.

"සහන් ඉන්නවද?"

"සහන් නානවා. පස්සෙ කතා කරන්න."

ඇය හෑන්ඩ් ෆෝනය විසන්ධි කළාය.

"කවුද අක්කා...?"

"මම හිතන්නේ බතලවත්තේ කෙල්ල වෙන්නැති. මේ රෑ මොනවට කතා කරනවද?"

අක්කා අමනාපයෙන් දොර වසා ගත් පසු ඔහු ෆෝනය ගෙන මිදුලට බැස්සේය. අහස පැහැදිලිය. සෞම්‍ය සඳ එළිය බිමට පතිත වී තිබුණි. පංචලි කතා කළේ වුවමනාවකට විය හැක. මිනිසුන්ගේ කාම රාගය නිසා වන්දි ගෙවන්නට සිදුව ඇත්තේ ගැහැනුන්ටය. යළි ෆෝනය නාද වුණි.

"හලෝ... පංචලි ද?"

"ඔව් සහන්. ඔයා කොහේද ගියේ...?"

"නිදාගෙන හිටියේ."

"මම හිටියෙ නිදාගෙන නෙමෙ. අනේ සහන් පොඩි උදව්වක් තියෙනවා."

"මොකක්ද කියන්න."

WWW.SINHALAELIBRARY.COM 54

"අනේ සහන්... අත්තම්මගෙ ඇස් පෙන්වන්ට තියෙනවා. බැරිද ගිහින් ආත්තම්මව එක්කාගෙන එන්න."

"මම හෙට ගෙදර යන්නයි ඉන්නේ."

"නිවාඩු තියෙන නිසා මට මේ උදව්ව කරන්න."

ඔහු මොහොතක් කල්පනා කළේය.

"අනේ මිස්.. මට තනියම යන්ට බෑ. දුර ගමනක් යද්දි කතා කරන්ට කෙනෙක් ඉන්ට ඕනෑ. නැතිනම් නින්ද යනවා."

"ඉතින් කතා කරන්ට කවුරුහරි එවන්නම්."

ඇගේ සිනා හඬ ඇසුණි.

ඔහු මොහොතක් කල්පනා කළේය. පැහැදිලිවම එම මහලු කාන්තාව කෙනෙකුගේ පිහිට පැතිය යුතු තත්ත්වයක පසුවන්නියකි.

"එහෙම පිට කෙනෙක් එවන්ට එපා. වාහනෙත් හොරකම් කර ගනීවි. දවසෙන් එන්ට පුළුවන් නම් එන්නම්."

"පුළුවන් සහන්. අපි ගිහින් එමුද?"

"ඔයාට සනීප නැහැනෙ. එහෙම්නම් මම තනියම ගිහින් එක්කාගෙන එන්නම්."

"එළිවෙනකොට මට සනීප වෙයි. මාත් ඔයා එක්ක එන්නම්."

"අම්මා තනියෙන් එන්න ඉඩ දෙයිද?"

"මම හැමදාම ඔයා එක්කනෙ යන්නෙ. ඉතින් ප්‍රශ්නයක් වෙන එකක් නෑ. ඔයා උදේ පාන්දරින් එන්න."

ඇගෙන් සමුගත් සහන් ඇඳට ගියේය. මෙම උපකාරය කළ යුත්තේ අසනීපයෙන් පසුවන මහලු කාන්තාව වෙනුවෙනි. දුර ගමන්වල යෙදෙනවාට අක්කා වැඩිපුර කැමැත්තක් නොදක්වන්නේ වාහනයේ ක්ෂය වීම පිළිබඳ සැලකිලිමත් වන නිසාය. ඇඳේ ඒ මේ



අත පෙරළෙමින් සිටිය දී ඔහු වෙත නින්ද ගලා ආවේය.

පාන්දර යාමයේ ඔහු පිබිදුනේ හැන්ඩ් ෆෝනය නාද වන හඬිනි.

"ගුඩ් මෝනින්..."

"මෝනින්... ඇයි කතා කළේ...?"

"හානේ... තවම නැගිට්ටෙ නැද්ද? අපි ආත්තම්මා එක්ක යන්ට තියෙනවා."

"මට අද ඉන්ටර්ව්‍යු එකකට යන්න තියෙනවා."

"අනේ සහන්..."

"මම කියන්නම්. මම සේදරට කතා කරලා මිනිහ එවන්නම්. අනික සේදරව ඔයා දන්නවනේ."

"එහෙනම් ඒ ගමන ඇරුනාවෙ. මට බෑ ඒ මිනිහා එක්ක දුර ගමනක් යන්න."

"ඒ මිනිහා ඔයාලව හොඳට අඳුනනවනෙ."

"එන්න විදිහක් නෑ කියලා මම ආත්තම්මට පණිවුඩයක් යවන්නම්."

ඇය එකවරම දුරකථනය විසන්ධි කරන හඬ ඔහුට ඇසුණි.

සහන් පාන්දරින් නැගිට මුහුණ සෝදා සූදානම් වන විට අක්කා තේ කෝප්පයත් සාදාගෙන ආවාය.

"මම කතාව අහගෙන. ආ තේ බොන්න."

"මට මේ උදව්ව කරන්ට වෙලා තියෙනවා. ඒ ආත්තම්මගේ ඇස් දෙක ඔපරේෂන් කරන්න එක්ක එන්න වෙලා තියෙනවා."

"මම උදව් කළාට ගමේ කිසි මිනිහෙක් ඔය අහංකාර ගෙදරට වතුර වීකක් දෙන්නෙ නෑ."

"අපිට අනින් අය ගැන සිතන්න ඕනෑ නෑ. උදව්වක් ඉල්ලුවොත් අපි කරන්ට ඕනෑ."

WWW.SINHALAELIBRARY.COM 55

"මනුෂ්‍යයෙකුට උදව් කරන්ට ඕනෑ බව ඇත්ත. ඒත් මුන් අහංකාර මිනිස්සු. ඔයත් ඉතින් අමුතු කෙනෙක්නෙ. පරිස්සමින් ගිහින් එන්න. බලාගෙන යාල්ල, මාතර දිහාවෙ යන්නෙ. මන්ත්‍ර ශාස්ත්‍ර දන්නවා. ඔයාට මොනවා හරි දෙයි."

ඔහු වෑන් රියට ගොස් එය පණ ගැන්නුවේය.

පංචලි ඇඳුම් පිටින්ම ඇඳේ වැතිරුණේ තරමක අමනාපයකින් යුතුවය. ගමේ කිසිවෙක් සමග සබඳතාවයක් නැත. කිසිවෙක් සමග විශ්වාසයෙන් ඇසුරු කිරීමට නොහැකිවන. මේ වෑන් රිය කැමති කරවා ගත්තේ ද අමාරුවෙනි. ගමන ගියේ ද සහන්ගේ බලවත් ඉල්ලීම නිසාය. ගමනට විරුද්ධවන්ට ඇත්තේ සහන්ගේ අක්කා විය යුතුය.

"අම්මා, ආත්තම්මා ලෑස්තිවෙලා බලන් ඉඳිවි. අපි දැන් මොකද කරන්නේ...?"

"නිමල්සිරිගෙ වාහනේ කතා කරගෙන එන්න කියමුද?"

"ඒකෙන් ගියොත් ආත්තම්මට වාහනේ කල්ලු කරන්ට වෙයි. පාරෙ බස් එකක ආවත් ආත්තම්මා ඒකෙනම් එන එකක් නෑ."

"ඔව්. ඒකනම් ඇත්ත. ඒක ලදරමක්. තාත්තගෙ වාහනවල අම්මා එන්න කැමති නෑ. කිව්ව ගමන් දෙපාර්තමේන්තුවෙන් වාහනයක් අරී."

ප්‍රශ්නයකට මැදිව සිටිය දී නිවස දෙසට එන රථයක හඬ පංචලිට ඇසුණි. ඒ එන්නේ කවරෙක්දැයි ඈ දැනගත්තාය. මෙම ගමනට දුව යැවීමේ තදබල චුවමනාවක් වත්සලාට තිබුණි. දැන් දරුවන් පෙර සේ නොවේ. දුව බොහෝ කාරණා කටයුතු පිළිබඳව දැනුම ලබා ඇත. ජීව විද්‍යාව හදාරද්දී ස්ත්‍රී අවයව ගැන ආර්තව, ගැබ් ගැනීම වැනි දේ ගැන ඇය විද්‍යාත්මකව දැන සිටියාය. පිරිමින් ගේ ලිංගික ඇසුර පිළිබඳව පැහැදිලිව දැන සිටියාය. ඇමැතිතුමා එන දිනවල දුව නිවසේ රැඳී සිටීමට අකැමැති බව වත්සලා දැන සිටියාය. දුව නිවසින් පිට කිරීමට කැමැත්ත දුන්නේ අකැමැත්තෙනි.



"දුව සහන් එක්ක යනව නම් හැබැයි පරිස්සමින්."

"බයවෙන්න එපා. ගිය ගමන් එනවා. සහන් හෙට ගෙදර යනවලු."

"දන්නවනෙ අප්පච්චිගෙ හැටි."

ඇය පිළිතුරක් දුන්නේ නැත. දුව වතුර බෝතලයක් රැගෙන ගොස් මිදුලේ නතර කළ රථයට නගින හැටි ඇය බලා සිටියාය. දුව රැගත් රථය පිටව ගිය පසු ඇය නිවසට වැදී දොර වසා ගත්තාය.

වෘත්තීය රියදුරෙක් වශයෙන් සේවය කරන නිසා මේ ගමන ගැන බියක් නැත. අම්මා සහන් පිළිබඳව පැහැදී සිටීම ද සතුටට හේතුවකි.

ලොකු දුවෙකුගේ මවක් වුවත් තමාට තවම සමරතුංගගෙන් ගැලවීමක් නැත. සමරතුංග විවාහ වී සිටින්නේ ධනවත් කාන්තාවක් සමගිනි. ඔහු ඇගෙන් තෘප්තියක් නොලබන බවට කිසිම සැකයක් නැත. ඔහු තමා සොයා එන්නේ සීතල දිය දහරක් වෙතට එන පිපාසිතයෙක් පරිද්දෙනි. පාන්දර යාමයේ නිවස ඉදිරියේ නතර කළ මොන්ටරෝ රථය ඇය හඳුනා ගත්තාය. ඒ වන විට පාන්දරින්ම ඇඟ සෝදා සුවඳ පැන් ගල්වා වෙනින් සිනිඳු ගවුමකට මාරු වී හමාරය. මෙසේ කරන්නේ කම් සැපත ලබා ගැනීම පිළිබඳව ඇති ආසාව නිසාම නොවේ. ඔහු ගැහැනු ඇඟක් දැක නැති යෞවනයෙක් මෙන් තමා ඉදිරියේ හැසිරෙන හැටි.

පාන්දර යාමයේ නිවසට පිවිසි සමරතුංග වත්සලාගේ අතින් අල්වා ගත්තේය.

"දුව යනවා මම දැක්කා. ඩ්‍රයිවර් විශ්වාසද?"

"අම්මා කියලා එව්වෙන් ඒ ඩ්‍රයිවර් එවන්ට කියලා තමයි. තේ එකක් හදන්නද?"

"සීනි ටිකක් දාන්න. මම මූණ හෝදගෙන එන්නම්."

ඔහු කලිසම ගලවා තුවාය දවටා ගෙන නාන කාමරයට

WWW.SINHALAELIBRARY.COM 56

ගියේය. මේ වත්සලා හමුවීමට එන්නේ ටික දවසකට පසුවය. වත්සලා තරම් ගත සිත සැනසූ වෙනත් ගැහැනියක් නැත. විවාහක බිරිඳගෙන් දරුවන් ලැබුමේ සතුටක් වින්ද නිසා නොවේ. ආර්ථික ප්‍රශ්න නිසා මෙන්ම බිරිඳගේ සහෝදරයා නිසා ඔහුට වසන්තිව විවාහ කර ගැනීමට සිදු වුණි.

දරුවෙක් බිහි කළත් වත්සලාගේ සිරුර වෙනස් වී නැත. වසන්ති දුන් මස් පරුවකයකි. උදරය එල්ලා වැටෙන සේ වැඩී ඇත. ආර්තව හරණය සිදුව ඇති නිසා ලිංගික කටයුතු පිළිබඳ කිසිදු උනන්දුවක් නැත. තේ කෝප්පය පසෙක තැබූ හෙතෙම වත්සලාගේ අතින් අල්වා ගත්තේය.

"දුව කවද්ද එන්නේ...?"

"අදම එනවා."

ඇය පහත් කරගත් හිසින් යුතුව සිහින් හඬින් කෙඳිරුවාය. ඔහු මෙහි එන්නේ උණුසුම් සිරුරෙන් යුතුවය. කලබලයෙන් නිදන ගවුම ගැලවීමට සූදානම් වන ඇමැතිවරයාට ඇය දැන් එපවා සහාය වූවාය.

වසර විසි ගණනක් තිස්සේ පවතින යුද්ධයක් ඇත. ත්‍රස්තවාදීන් මේ රට දෙකඩ කිරීමට වෙර දරති. විරුද්ධ පක්ෂය විවිධ විරෝධතා ගෙන යති. වත්සලා ඉදිරියේ දී ඔහුට කිසිවක් සිහිවන්නේ නැත. අවුරුදු දහඅටක් විස්සක් මේ සුන්දර ගැහැනියන් ඇසුරු කළත් හැමදාම ඇය ඉදිරියේ අලුත් වන බවක් දුනේ. සිහිනිග, කහ අත්තක් එල්ලූ පරිදි මුණින්තලා වී සිටින විට ඇගේ සිරුර පෙනේ. හැමදාම දක්නත් එහි ඇතිවීමක් නැත. ආසක්ත බවින් වැළඳ ගන්නේ ඒ සුන්දර සිරුරේ හැම දේම අමතක වන හෙයිනි. විවේක ඇති අවස්ථාවල ව්‍යායාම වගයෙන් ඇවිදියි. එසේත් නැතිනම් ජිම් එකට ගොස් ව්‍යායාම කරයි. ව්‍යායාමයක් කරන්නට නැති හේතුව නිසා බඩ ගෙඩිය වර්ධනය වීම නදබල ප්‍රශ්නයක් වී ඇත. වයස ගියත් ඇගෙන් ලැබෙන සහාය අගේ කළ යුතුය. වසන්තිට මේ උදාසීන කම ඇත්තේ ඇය වත්සලාට වඩා අවුරුදු පහළොවක් පමණ වැඩිමහල් නිසා විය යුතුය.



## 16

ගමන ආරම්භ කළේ පාන්දර පහටය. පාන්දර කැඳවාගෙන යාමෙන් ඔහුට බලවත් වරදක් සිදු කළේය යන හැඟීම ඇගේ සිතෙන් ඉවත් වූයේ නැත.

"තේ එකක් බොනවද?"

"නෑ.. අවශ්‍ය නෑ. මම ගෙදරින් බීලා ආවේ."

"ඒ වුණාට ඔයාටත් එක්ක ෆ්ලාස් එකට තේ හදන් ආවේ."

"පස්සෙ බොමු."

ඇගේ සිත නොරිදෙන පරිදි කිවේය.

යළි නිහඬ බවක් ඇති වුණි. ඕනෑවට වඩා කතාවට ගියහොත් ප්‍රශ්න ඇතිවෙන්ට පුළුවන. වඩා හොඳ දෙය වන්නේ පැවරූ කාර්යය කිරීමය.

"ගිය ගමන් ආපසු එන්න අමාරු නැද්ද?"

"අමාරු තමයි."

"කොහොමටත් නිවාඩුවක් සෙට් වෙන නිසා ටිකක් විවේක අරන් එමු. ඒක වාහනේටත් හොඳයිනෙ."

WWW.SINHALAELIBRARY.COM 57

සහන් පිළිතුරක් දුන්නේ නැත.

"එතකොට අම්මා තනියමනෙ."

"අම්මටම තනි නෑ. තාත්තව ගෙන්වා ගනී."

සියල්ල සිදුවන හැටි පංචලි දනී. මේ ජීවිතයේ දී තමා ලජ්ජාවට පත්වූ අවස්ථා එමටය. පන්තියේ සිසු සිසුවියන්ට තමාගේ තාත්තා කවුදැයි පැවසීමට පුළුවන් වී නැත. සමරතුංගගේ බිරිඳ හා දරුවන් ගැන පුවත්පත්වල සඳහන් වෙයි. ඇය ප්‍රබල ඇමැතිවරයෙකුගේ දූවෙකි. පියා ජීවතුන් අතර නැති බව ඇය ඇතැම් අවස්ථාවල පවසයි. විශ්වවිද්‍යාලයට පිවිසීමට වරම් ලැබ තිබුණත් ඇයට අවශ්‍ය වූයේ සමරතුංගගේ සහාය නැතිව නැගිට ජීවත් වීමටය. මේ දී කියාව කරන්නේ තවදුරටත් එම තැනැත්තාට බරක් නොවී සිටීමටය. දුර ගමන්වල යෙදෙද්දී තේ පානය කිරීමට වාහන නතර කරන හෝටලයක් අසල ඔහු රථය නතර කළේය.

"තේ බොන්න ඕනෑ කිව්වා නේද?"

ඇය හිසවනා එය අනුමත කළාය.

"යමු තේ බොන්න."

ඔහු රථයෙන් බැස ඇයට බැසීමට දොර විවෘත කළේය.

"මට වොෂ්රූම් යන්ට ඕනෑ."

"ඔහොම ඉස්සරහට ගිහින් වමට හැරෙන්න."

"අනේ සහන් මට තනියම යන්ට බෑ. ඔයත් එන්න."

"හා... හා... යමු."

"ආ.. මේ බෑග් එකයි, ලේන්සුවයි තියා ගන්න."

පංචලි ඇගේ අත් බෑගය හා ලේන්සුව සහන්ට දී ඇතුළට ගියාය. තමාට මෙවන් සමීප ගැහැනු ඇසුරක් කිසිදාක තිබුණේ නැත. ඔහු බිත්තියට පිටදී සිටින විට ඉදිරියෙන්ම එන යුවල හඳුනා ගත්තේය.



"අඩෝ... සහන්.. මේ කොහේද?"

"හලෝ... රුචිර.. චමරි කොහොමද?"

"මෙයාව ඩොක්ටර් කෙනෙකුට පෙන්වන්න කොළඹ ගියා මචං.."

වැසිකිළියට ගිය පංචලි පැමිණ තමා අසල සිටගන්නවා ඔහු දුටුවේ නැත.

"උඹලත් නිකන් ඉඳලා නෑ වගේ."

සහන් සුපුරුදු දඟකාර ලෝකයට පිවිසුනේ විශ්වවිද්‍යාලයේ එකට උගත් මිතුරන් හමු වූ පසුය.

"අපට කරන්න ඉතිරි වෙලා තියෙන්නේ මෙච්චරයි."

"ඒ වැඩේ නම් නියමෙට කරලා තියෙනවා."

"සැහෙන දවසකට පස්සේ වල් කටවල් දෙක එක්වෙලා."

"මෙයාගෙ අවුට් පුට් එකේ ප්‍රශ්නයක්. හා ගිහින් එන්න."

"මහ වල් උෟරෝ ටිකක්. මම එනකල් කිසි දෙයක් කතා කරන්ට එපා."

සය මසක පමණ ගැබිනියක් වූ ඇය පරිස්සමින් ඇතුළට ගියාය. පංචලි මිතුරන් කතාබහේ යෙදෙමින් සිටින හැටි ඈතට වී බලා සිටියාය. සැබෙවින්ම ඔවුන් අමුතුම දඟකාර පිරිසකි. තේ පානය සඳහා සහන් දෙපලට ආරාධනා කළේය.

"මොනවා වුණත් උඹේ තෝරා ගැනීම නම් නියමයි."

රුචිර කීවේ පංචලිටත් ඇසෙන සේය.

"කොහෙන්ද මේ රෝස මල හොයා ගත්තේ...?"

චමලි පංචලිගේ නිකටින් සොලවමින් කීවාය. පංචලි සිනා මුසුණින් යුතුව හිස පහත් කර ගත්තාය.

WWW.SINHALAELIBRARY.COM 58

''හඳුන්වලා දීපං. කෙල්ලෙක් දිහා බලන්නෙ නැහැයි කියපු මිනිහා අන්තිමට ලස්සන මලක් නෙලාගෙන.''

''හඳුන්වලා දෙන්ට ඕනෑ නෑ. මේ ඉන්නෙ පංචලි.''

මේ ප්‍රිය හමුවීම නිසා සහන් අතිශයින් සතුටට පත්ව සිටියේය.

''මචං ඒ සී බස් එකක තියලා ආවෙ. කොට කොටා යන්නෙ. අපි යන්නම්.''

''සහන් ඔයාලා ආපහු එනකොට අපේ ගේ පැත්තෙන් එන්න ඕනෑ. ලන්ච් එකට එන්න.''

චමරි කිව්වාය.

''ටයිට් ෂෙඩ්‍යුල් එකක්. ගිය ගමන් එනවා. දැන් උඹලා ගෙදරනේ යන්නෙ.''

''ඔව් මචං. මෙයාටත් හරි මහන්සියි.''

''යමං මං උඹලව ගිහින් දාගෙන යන්නම්.''

''ඔයාට කරදරයි නේද? අපි කැග්ගම උඹලට වාහනයක් වෙයි. උඹට කෙල්ල එක්ක කතා කරන්ට බැරි වෙයි.''

''අපිට කරදරයක් නෑ අක්කා. ඔයා එන්න.''

''ඔව් මචං ගිහින් බෑග් එක අරන් වරෙන්.''

රුචිර බසයට ගොස් බෑග් දෙක රැගෙන ආවේය.

''යාළුවෝ දෙන්නට හුඟක් කතා කරන්ට දේවල් ඇතිනෙ. මම පස්සට යන්නම්. අයියා ඉස්සරහට එන්න.''

''නෑ.. නෑ.. ඔයාලා දෙන්නා එකට යන්න. මොකද නැතිනම් පස්ස බලන්ට ගිහින් වාහනේ හප්ප ගනී.''

මේ සතුට අනපේක්ෂිත පරිදි සිතට ගලා ආ හැටි. මිතුරා හමු වූ පසුව ඔවුන් කතා කළේ සිනහ සහගත දේවල්ය. මෙවැනි ප්‍රිය ඇසුරක් ඇයට සැහෙන කලෙකින් ලැබී නැත. ඔවුන් සියා ඇයගෙ



අප පෙම්වතුන් බව කියාය. මෙය ඔවුනට පැහැදිලි කර දීමට අවස්ථාවක් නැත. කෙසේ වෙතත් මේ ගමන නිසා හදවතට පිවිසුනේ තේරුම් ගත නොහැකි සතුටකි. තමා කාගේ කවුද? ආදරයෙන් බැඳිලා සිටිනවාද? මේවා හැම දෙයක්ම ඔවුන් කැමති පරිදි තීරණය කර ඇත.

සහන් මිතුරා සහ බිරිඳ ඔවුන්ගේ නිවස දක්වා ඇරලුවේය.

''මචං වතුරත් තියෙන විදිහට බත් කටක් කාලා පලයං.''

''මම වෙනින් දවසක එන්නම්. මට ලෙඩෙක් අරන් අද ඒ ආපහු යන්ට තියෙනවා.''

''මචං කෙල්ලත් එක්කගෙන ආපු පළවෙනි දවසෙම නිකං අරින්ට බෑ. වෙනම කාමරයක් දෙන්නම්. ජොලියක් දාලා පලයං.''

නිවස තුළ සිට රුචිරගේ මව එළියට ආවාය.

''කවුද කියලා බැලුවා. මේ සහන් පුතා නේද? ඇයි වාහනේට වෙලා ගෙදරට එන්නෙ නැද්ද?''

''බෑ අම්මා. මේ හදිසි වැඩකට යන ගමන්.''

''ම්... කවුද මේ ලස්සන කෙල්ලෙක් ඉන්නේ.''

''නංගි එන්න අවුට් පුට් එකේ වැඩ ඇති. හිස් කරගෙන එන්න.''

''මම විනාඩියක් ඇතුළට ගිහින් එන්නම්.''

ඇය මිතුරිය සමඟ නිවස තුළට ගියාය. නිවස පිහිටා තිබුණේ රමණීය භූමි භාගයකය.

''අනේ නංගි අද ඉඳලා යන්ටකො. අපිත් හරි පාළුවෙන් ඉන්නේ.''

''බෑ අක්කා.. දැන් ගේ දන්නවනෙ. වෙනින් දවසක එන්නම්.''

ඇගේ නෙත යොමුව තිබුණේ රුචිර හා බිරිඳගේ මංගල ඡායාරූපය වෙතය.

WWW.SINHALAELIBRARY.COM 59

"ම්... ලස්සන ජෝඩුව. ගෲප් ෆොටෝ නැද්ද?"

"මොන ගෲප් ද? මෙයා ඒවට කැමති නෑ. අනික මනමාලියන්ට අන්දන අයටයි, කැමරා කරන අයටයි හෝල් කාරයින්ට ඕනෑ විදිහට බිස්නස් කරන්න රුචිර කැමති නෑ."

ඇගේ කතාව සත්‍යයකි.

රුචිර හා චමරි උපාධිධාරීන් බව තේරුම් ගියේ දෙදෙනා උපාධි ඇඳුමෙන් සැරසී ගන්නා ලද ඡායාරූප දුකීමෙනි.

"අපි වාගෙ නෙමේ.. එන්න ඔයාගෙ බ්‍රයිටගේ හැටි පෙන්වන්න. අඳුරනවද බලන්න."

උපාධි ඇඳුමෙන් සැරසී ගන්නා ලද සහන්ගේ ඡායාරූපය දෙස ඇය බලා සිටියේ සතුටින් යුතුවය.

ම්... ගුප්ත්වෙට් කෙනෙක්. සද්ද නැතිව ඉන්න හැටි. උපාධිධරයෙක් බව නොදන ගත්තත් ඔහු වටා ගොඩ නැගුණු පෞරුෂයක් ඇති බව ඇයට හැඟී ගොස් තිබුණි. ඔහු කිසිවෙකුට යටත් නොවන ආඩම්බර පෙනුමක් ඇත්තෙකි.

"සද්ද නැතිව හිටියට හෙන බ්‍රයිට්. අපිට වගේ නෙමේ සෙකන්ඩ් අපර් එකක් තියෙනවා."

ඇය සිනාමුසු මුහුණින් සිටියා විනා නොදන්නා බවක් පැවසුවේ නැත. ඇය වතුර වීදුරුවක් පමණක් පානය කර රථයට දුව ගියාය.

"එහෙනම් අපි ගියා." සහන් කීවේය.

"ආවට බොහොම ස්තූතියි." රුචිර කීවේය.

"වෙඩින් එක නොකිව්වත් එනවා." චමරි කීවාය.

ඔවුහු අතවනා සමු ගත්හ.

මේ ගමනේ යෙදීමෙන් පංචලී සහන් පිළිබඳව [illegible] දැනගත්තාය. දෙවියනේ ක්ලාස් එකක් තියෙන ගුප්ත්වෙට් කෙනෙක්.

WWW.SINHALAELIBRARY.COM 60



පහට ගණන් කරන්න බැරිව වාගෙ සද්ද නැතිව ඉන්න හැටි. පිරුණු කළේ වතුර සෙලවෙන්නේ නෑ කියන කතාව ඇත්ත වෙන්න ඕනෑ. ආත්තම්මා ප්‍රුදානම් වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත් තරුණයෙකුට රැකියාවක් සෙවීමටය. මෙම ප්‍රශ්නය රහසක් ලෙසින් තබා ගැනීමට ඇය සිතුවාය. අපි මේ කරන්නේ පව් වැඩක්. ගෞරව කරන්න ඕනෑ කෙනෙකුගෙන් වැඩ ගන්නවා. සහන්ට ගෞරව උපාධියක් තියෙනවා. රථයේ යද්දි වැඩිපුර කතාවක් පැවතුනේ නැත.

රුචිරට නාම රැකියාවක් ලැබී නැත. චමරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලිපිකාරිණියක වශයෙන් සේවය කරයි. තවමත් රැකියාවක් නැති නිසා රුචිර ගොවිතැන් කරයි. මිනිසුන්ට ජීවිතයේ විවිධාකාර වූ ප්‍රශ්න ඇත. මෙහිදී වැදගත්ම දේ වන්නේ එකිනෙකා පිළිබඳව අවබෝධයක් තිබීමය. වර්තමාන තරුණ පරපුර ජීවිතයට මුහුණ දෙන්නේ අඩු සම්පත් ඇතිවය.

සැඟවුණු සතුටක් සිත තුළ සැරිසරනු පෙනේ. ආත්තම්මාගේ නිවසට යන විට හොඳටම දහවල් වී තිබුණි. ආත්තම්මා රෝද පුටුව නැතිව බිත්තිය අල්ලා සිටගෙන සිටිනු පංචලී දුටුවාය. පංචලීගේ සිතේ ඇතිවුණේ සතුටකි.

රථයෙන් බැස නිවස තුළට පිවිසුනු සැණින් ඇය ආත්තම්මාගේ දෑතින් අල්වා ගත්තාය.

"මගේ දුව පාන්දරින්ම ආවද?"

"ඔව් ආත්තම්මා. හරියටම පහට ආවා."

"ඉතින් මෙච්චර පරක්කු වුණේ..?"

"අපි එක්ක සහන්ගේ යාළුවෙකුත් ආවා. එයා බබෙක් හම්බ වෙන්න ඉන්න කෙනෙක්. ඉතින් එයාව ඇරලන්න ගියාම පරක්කු වුණා."

"කොහොමද ළමයෝ..."

''ඉන්නවා නෝනා...''

''මා නිසා මේ ළමයටත් කරදරයි. එන්න ගෙට.''

''යමු'' පංචලි යෝජනා කළාය.

''මම එළියට වෙලා ඉන්නම්.''

''මේ තරහ ගස්සන්නෙ නැතිව ඇතුළට ඇවිදින් ඉඳගන්ට. නැතිනම් අතින් ඇදගෙන යනවා.''

ඇය කතා කළේ හැඟුම්බරවය.

''ළමයෝ... බඩගිනි ඇතිනේ. කෑම කන්ට එමු.''

''දූන් බත් කෑවොත් වාහනේ එලවන්ට බෑ නෝනා.''

''එලවන්න බැරි නම් නටන්න. නොකෑවොත් බලාගෙනයි.''

''තේරුම් ගන්න. කෑව ගමන් නිදාගන්ට ඕනෑ.''

''ඉතින් කාලා නිදාගන්ට. අපි හෙට උදේ පාන්දරින් යමු.''

ඔහු පිළිතුරක් නොදී ඇය අනුව කෑම මේසයට ගියේය.

''ළමයෝ බෙදන්ට කෙනෙක් නෑ. බෙදාගෙන කන්ට.''

මෙම ආරාධනය ප්‍රතික්ෂේප කිරීමට පුළුවන් කමක් නැත. නුදුරින් සිටි පංචලි ඔහුට නුදුරින් සිටියාය.

''දුවත් කෑම කන්න.''

පංචලි අසුන් ගත්තාය. හෙතෙම අමුතු පුද්ගලයෙකි. තම තත්ත්වය අනුන්ට ප්‍රකාශ කරන්නේ නැත. කෑම ගනිද්දි නිකමට වත් පංචලි දෙස බැලුවේ නැත.

''සහන්, මේ ආපු හදිස්සියේ යන්ට ඕනෑ නෑ. අපි උදේ පාන්දරින් යමු.''



## 17

සමරතුංග වත්සලාගේ නිවසට වී සිටියේ සතුටින් යුතුවය. සමරතුංග සිතට සහනයක් ලබා ගැනීමට එන්නේ වත්සලා හමුවීමටය. ජීවිතයේ දී තමාට කොහේදි හෝ වැරදි ඇති බව ඔහු පිළිගනී. ඇගේ සමස්ත ජීවිතයම තමා වෙනුවෙන් කැප කළ ගැහැනියෙකි. මන්ත්‍රීවරයෙක් වීමටත් වසන්තිගේ පියා උදව් කළ බැව් සමරතුංග දනී. ගමේ ජීවත් වූ තමාට ඉදිරියට යාමට ලැබුණේ වසන්තිගේ පියා නිසාය. තමා වසන්ති විවාහ කර ගත්තේ කැමැත්තෙන් නොවේ. විශාල දෑවැද්දක් සහිතව වසන්ති විවාහ කරගත්තේ මේ ගමනට එවන් සහායක් අත්‍යවශ්‍ය වූ හෙයිනි.

වත්සලා තම තරුණ ජීවිතය අනිත් අතට හැරවීමට සමත් වූ හැටි සිහිවෙයි. ඇය මුණගැසුණේ අවුරුදු කුමරියකට ඔටුනු පැළඳවීමට ගිය දිනයේ සිටය. ඒ සුන්දර යොවතිය තම ජීවන ගමන වෙනස් කළේ පුදුම අයුරිනි. අවුරුදු උත්සවයේ බක්මහ රැජිණට තේරුණ රුවැත්තියට චිත්‍රපටයක රඟපෑමට දීමට යෝජිතව තිබුණි.

වත්සලා එක් රැයකින් ජනප්‍රිය වූයේ සමරතුංග නියෝජ්‍ය ඇමතිවරයාගේ සහාය නිසාය. සම්මානනීය නිළියක් බවට පත්වූයේ ද ඔහුගේ සහායෙනි. ඇයට තමාගෙන් වෙන් වීමට ඔහු ඉඩ දුන්නේ

WWW.SINHALAELIBRARY.COM 61

නැත. ඇයගෙන් තොරව ජීවත්වීමට බැරි තත්ත්වයක් තිබුණි. සම්ප්‍රදායික නොවුණත් ඇය තමාගෙන් වෙන් කිරීමට ඔහුට සිතුණේ නැත. නීතියට වඩා එහා ගිය බැඳීමක් ඇය සමඟ තිබුණි. විවාහකයෙක් බව දැනගත්ත ද ඇය තමා හා බැඳුණේ කළ උපකාර අමතක කිරීමට බැරි නිසා විය හැක. වැදගත් පවුලක එකම දියණිය වන වත්සලාව නිවසින් පිටමං කළේ ඇය විසින් මේ කරන ලද වැරැද්ද නිසාය.

අනියම් බිරිඳ ලෙස නොව දෙවන බිරිඳ ලෙස ඇය තමා හා ජීවත්වීම පුදුමය. වෙනම නිවාසයක් ගෙන ඇයට සැපවත් ජීවිතයක් ගෙවීමට ඉඩ සලසා දුන්නේය. මෙහෙකාරියක් සපයා දී ඇයට ජීවත්වීමට ඔහුට ඉඩ දුන්නේය. ලස්සන දූවෙක් බිහි කළ දිනයේ සතුටු වූ හැටි සිහිවෙයි. වසන්ති බිහි කළ දරුවන්ට වඩා වත්සලා බිහි කළ දූව සුරංගනාවියක් මෙන් ලස්සනය. ඇයට සියලුම සැප සම්පත් සැපයුවේ වෙනසක් නැතිවය. ලොකු ළමයෙක් වී වැඩෙන විට ප්‍රසිද්ධියේ සතුටු වීමට නොහැකි වුවත් පෞද්ගලිකව ඔහු සතුටු වූයේය. තමාට බිය පක්ෂපාත භාවයක් දැක්වුවත් මෑතක සිට ඇය මුරණ්ඩු ගතියක් ප්‍රකට කළේය.

පාන්දරින්ම ආවේ වත්සලා සමඟ සතුටින් සිටීම සඳහාය. අනියම් භාර්යාවක් සිටින බව වසන්තිට දැනගන්ට ලැබී ඇත්තේ මේ මෑතකය. උතුරු නැගෙනහිර යුද්ධයේ තරමට පවුලේ යුද්ධයත් ප්‍රබල වී තිබුණි. උදේ සිට හැන්දෑවේ ගොස් එන ගමනකට හැර වෙනත් ගමනක් යාමට වසන්ති සැමියාට ඉඩ දුන්නේ නැත. පවුලේ ප්‍රශ්න උග්‍රව තිබුණත් ඔහු කිසිවිටෙක වත්සලා හා පංචලි අමතක කළේ නැත. සමරතුංග සුපුරුදු ලෙස වත්සලාගේ උණුසුමේ වැතිර සිටියේය. ජීවිතයේ කිසියම් වැරැද්දක් සිදුව ඇති බව දෙදෙනාම පිළිගනිති.

''ඇයි දන් දූව වෙනස්. මට වැඩිය මුහුණ දෙන්නේ නෑ.''

''කියන්න තේරෙන්නෙ නෑ.''



ඇය කෙටියෙන් කීවාය.

''වැඩට යන්නෙත් කැමැත්තෙන් නෙවේ කියලා මට ඔෆිස් එකෙන් කිව්වා. මොකද මේ වෙලා තියෙන්නෙ...? කා එක්කවත් සම්බන්ධයක් තියෙනවද?''

''මම දනුවත්ව නම් එහෙම නෑ.''

''අපි දූවට හොඳ කෙනෙක් බලලා බන්දලා දෙමු. එතකොට හිතේ බරත් ඉවරයි.''

''දහනවය සම්පූර්ණ වුණා විතරයි. තව ටිකක් හිටියට කමක් නෑ. අර මංජුල වාහනය ළඟට ඇවිදින් දූවට කරදර කරනවලු.''

සමරතුංග මඳ වේලාවක් කල්පනා කළේය. මංජුල තමාගේ සියලුම රහස් දන්නා මැරයෙකි. ඔහු අමනාප කර ගැනීමට ද නොපුළුවන. එවැනි තැනැත්තෙකුට මෙවැනි සුරතල් කෙල්ලෙක් විවාහ කර දීමට නොපුළුවන. දේපළ, ඉඩකඩම් මුදල් තිබුණත් ඔහු උගත් පුද්ගලයෙක් නොවේ. ප්‍රභූ ආරක්ෂක සේවයේ නිලධාරියෙක් වන ඔහු කිසිම හිතක් පපුවක් නැති අයෙකි.

''ඒකා මහ මිනීමරුවෙක්.''

''මම දූවටත් කිව්වෙ ඒක තමයි. ඒ ළමයා ඔයා ඉන්න අමාත්‍යාංශයක වැඩ කරන්න කැමති නෑ.''

''ඉතින් මොනවද ඕනෑ කියන්නෙ...?''

''තව ඉගෙන ගන්ට ඕනෑ කියන්නෙ.''

''ලබන සැරේ අපි දිනයිද නැද්ද දන්නෙ නෑ. දේශපාලනයෙ හැටි ඔයා දන්නවනෙ. අපි පරාජය වුණොත් පැන්නත් ගිය පොලිස්කාරයො වගේ.''

''ඔයත් කිසි දෙයක් කියන්නෙ නෑ. කැමති දෙයක් කරගන්නාවෙ.''

WWW.SINHALAELIBRARY.COM 62

''මේ ළමයා අපි ගැන තරහෙන් ඉන්නේ.''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''හොඳ කෙනෙක් හොයලා බන්දලා දුන්නාම ඔය ප්‍රශ්න අමතක වෙලා යයි.''

''වසන්ති මොකද කියන්නේ...?'

''දුවට වියදම් කරන්නෙ කාගෙවත් සල්ලි නෙවෙයි. මගේ සල්ලි. ඔයා ඒ ගැන බයවෙන්න එපා.''

''මට මේ ගේ අරන් දීලා තියෙන බවත් දන්නවද?''

''වසන්ති ඒවා හොයන්නෙ නෑ. ලස්සන දුවෙක් ඉන්න බව නම් කොහොම හරි ආරංචි වෙලා.''

ඔහු යළිත් ලැම තෙර්රා ගත් නිසා කතා කිරීමට නොහැකි වුණි.

දිවා ආහාරය ගත්තේ ආත්තම්මාගේ ඉල්ලීම නිසාය. කාටත් වඩා ඔහු ආත්තම්මාට ගෞරව කරන හැටි පංචලි දුනී.

''ඔය කෑම කෑවා ඇද්ද? ගමේ කෑම රස නැද්ද?''

''අනේ නෑ හෝනා රසයි.''

''චන්ද්‍රාවතී... ඔය මී කිරි ගේන්න.''

මඳ වේලාවකට පසු නිවසේ සහායිකාවක කිරි හට්ටියක් හා පැණි බෝතලයක් රැගෙන ආවාය. පංචලි ඔහුගේ හැම ඉරියව්වක්ම පරීක්ෂාවෙන් බලා සිටියාය. ආත්තම්මාට හා තමාට ගෞරව පෙරදැරිව කතා කරන්නේ ඔහුගේ රහස නොදන්නා බව සිතන නිසාද?

''කිරි නම් හොඳයි.. කොහෙන්ද ගේන්නේ...?''

''කාලා එන්නකො පෙන්වන්න.''

WWW.SINHALAELIBRARY.COM 63



ආත්තම්මා සිනාසුනාය. පසුගිය යුගයේ ආත්තම්මා පසුවූයේ ලෙඩ ගානේය. දුන්නාම් මදක් ඇවිදින්නට පුළුවන. එම ශක්තිය හා විශ්වාසය ලබා දුන්නේ සහන් විසිනි. ආත්තම්මාගේ කිරි ගන්නා මී වැස්සියන් දහතුන් දෙනෙක් ඇත. කිරි දෙවීම, රත්කිරීම, මුට්ටිවලට දැමීම, කිරි මුට්ටි පිළියෙල කරනු ලබන්නේ චන්ද්‍රාවතීගේ සැමියා විසිනි. විමලදාස සූදානම් කරන කිරි ගෙන යාමට ගැනුම්කරුවන් එයි. උදේ පාන්දර කොළඹ කිරි වෙළෙඳ පොළට ගෙනයාමට වෙළෙඳුන් පුහුපුළ වෙති.

ඔහු නිහඬව එළියට බැස්සේය. එම වත්ත අක්කර දහයක් පමණ විශාලය.

''ශෝනා මේ හරක් කාගෙද?'

''මේ හරක් අයිති මට. මී වැස්සියො දහතුන් දෙනෙක් ඉන්නවා.''

වත්තේ වැඩ කරන අයෙක් මී වැස්සියන්ට තණකොළ දමනු ඔහු බලා සිටියේය.

''ඉතින් මැඩම් ගියාම කවුද මේවා බලාගන්නෙ...?''

''මම හිටියත් නැතත් මේ වැඩ කෙරෙනවා. මම මේවා කරන්නෙ අපේ අප්පච්චිලාගෙ කාලෙ ඉඳලයි. මේ මිනිස්සු ජීවත් වෙන්නෙ මෙහෙමයි.''

''අනවශ්‍ය ප්‍රශ්නයක් අහන්නේ. මේ කිරිවලින් ලාභයක් තියෙනවද?''

ආත්තම්මා පිළිතුරක් නොදී සිනාමුසු මුහුණින් යුතුව නිහඬව සිටියාය.

''මට ලාභයක් ගන්ට නෙමේ.. මේ අය ජීවත් කරන්නයි මේක කරන්නෙ.''

"තමුන් කරන නිෂ්පාදනයට ලාභයක් ගන්ට අයිතියක් තමුන්ට තියෙනවා."

"කිව්වට අහන්නෙ නෑ සහන්. මෙකෙ ලාභ ලබන්නේ පිට අයයි."

"මට දැන් ඕවා කරන්න පුළුවන් කමක් නෑ."

සහන් සෙමින් සෙමින් වත්ත කෙළවර දක්වා ගියේය. මෙය සරුසාර ඉඩමකි. ඇගේ කතාව තුළ ව්‍යාපාරයක් රැඳී ඇතැයි ඔහුට සිතුණි.

"ඇයි කල්පනා කළේ...?'

පංචලි ඇසුවාය.

"මුකුත් නෑ."

"මම ඉන්නෙ රස්සාවෙන් අස්වෙන්න."

"ඇයි ඒ...? අමාත්‍යාංශ ලේකම්වරියක් කියන්නේ හොඳ තනතුරක්නේ. මේ වගේ රස්සාවක් හොයා ගන්ට බෑ."

"මේක මට නොගැළපෙන, නුසුදුසු රැකියාවක්. මම ඉන්නෙ මේ රස්සාවෙන් අස්වෙන්නයි."

ඔහු එකවරම පංචලි දෙස ආපසු හැරී බැලුවේය.

"බැරි වෙලාවත් ආණ්ඩුව පෙරළුණොත් මට ගෙදර නවතින්ට වෙනවා."

"මොකද්ද ඉතින් කරන්ට කල්පනා කරන්නෙ...?"

"මම ආත්තම්මත් එක්ක කතා කළා. අපිට බැරිද මේ කිරි බිස්නස් එක හොඳට පවත්වාගෙන යන්න."

"ඔව්.. ඒක හොඳ අදහසක්. තව කිරි එක්කහු කරල අතරමැදියෙක් නැතිව කරන්ට පුළුවන්."



ඔහු ඇයට දිරි දෙමින් කීවේ ය.

"මම ආත්තම්මා එක්ක කතා කළා."

පරිසරය නිහඬ ය. ඈත කුඹුරු සාය හා ඔබ්බෙන් පිහිටි රක්ෂණ වනය සිප හමන සුළං රැළි ඇගේ මුහුණේ වදින හැටි පෙනේ.

"මේක ආවට ගියාට කරන්න බෑ. කිරි එක්කරන්ට ඕනෑ. ඒවා කොළඹට ගේන්න ප්‍රවාහන පහසුකම් තියෙන්ට ඕනෑ. අනික අලෙවි සැල් තියෙන්ට ඕනෑ."

කළමනාකරණ උපාධිධරයෙක් වූ ඔහුට හොඳ සැලසුම් ඇති බැව් ඇය දැන සිටියාය.

"අනිත් එක කිරි විතරක් නෙවේ කිතුල් පැණි, හකුරු, තබල පෙති, සිංහල බෙහෙත් බඩු වගේ දේවල් දමන්ටත් ඕනෑ. වැඩ කරන්න අය ඉන්න ඕනෑ. වැඩේ නම් කරන්ට පුළුවන්. කා එක්කද කරන්ට හිතන් ඉන්නේ...?"

"කැමති නම් මේ බිස්නස් එක සහන් එක්ක කරන්ට කිව්වා."

සහන් එකවරම පංචලි දෙස බැලුවේ ය.

"මාව එච්චර විශ්වාස කරන්ට එපා."

"මට විශ්වාසයි."

"මේ විදිහට කෙනෙක් කෙරෙහි පහදින්ටත් එපා. විශ්වාස කරන්ටත් එපා. ඔයා මම කවුද දන්නවද?"

"මට නම් සහන් ගැන කිසිම විශ්වාසයක් නෑ. ඒත් ආත්තම්මට විශ්වාසයිනෙ."

ඈ සිනාසුනාය.

WWW.SINHALAELIBRARY.COM 64

''මගේ ශක්ති ප්‍රමාණයෙන් මම උදව් කරන්නම්. අපි අවාසනාවන්ත මිනිස්සු. ලැබීම නැති අය.''

''පව් කතා කියන්ට එපා. ඔයා හුඟාක් පින් කරපු වාසනාවන්ත කෙනෙක්.''

පැවසිය යුතු බොහෝ දේ සිතේ ඇත. තමා පසුවන තත්ත්වය දැනගන්ට ඉඩහරිනවා හැර ප්‍රකාශ කිරීමට පුළුවන්කමක් නැත. තමා පියෙක් නැති අවජාතක තරුණියකි. එය ප්‍රසිද්ධ රහසකි. සමහරවිට එය සහන්ට වුවද ආරංචි වී තිබෙන්නට බැරි නැත. කිසිම කෙනෙක් තමාගේ පුතාට දැන දැනම නරක නාමයක් ඇති ගැහැනු දරුවෙක් විවාහ කරදීමට කැමති නොවන බව ඇය දනී. ඇගේ දෙනෙතේ කඳුළු නැඟුණේ නොදැනුවත්වමය. අඬන්න තරම් දෙයක් සිදුව තිබුණේ නැත.

''ඇයි මේ අඬන්නෙ..? නාඩා ඉන්න.''

''අකැමැති නම් ඕනැ නෑ. අපි නිකා ඉමු. යමු ගෙදර.''

''කිසිම දේකට කලබල වෙන්ට එපා. අපි මේ ගැන මොකද්ද කරන්නෙ කියලා බලමු. රූවිරලත් කිරි ගොවියො. මේක කරන්නෙ කොහොමද කියලා මූලික පරීක්ෂණයක් කරලා බලමු.''

ඇය තෙත් වූ දෑසින් යුතුව සහන් දෙස බලා සිටියාය.



## 18

පසුදින ඛනලවත්තේ නිවසට එන විට හොඳටම සවස් වී තිබුණේ රූවිර හමුවීමට ගිය හෙයිනි. රූවිර පැවසුවේ මෙය හොඳ අදහසක් බවය. ක්ෂේත්‍ර අධ්‍යයනයකින් පසු මෙය දියත් කිරීමට ඔහුට උපදෙස් දුන්නේය.

''එහෙනම් මැඩම් මම යනවා.''

''ළමයෝ.. හෙට හැන්දෑවෙ මේ පැත්තෙ එනවද?''

''මම හෙට යන්ටයි හිටියෙ.''

''එහෙම බෑනෙ. අපි අර වැඩේ ගැන ටිකක් කතා කරන්න ඕනැනෙ. දුවලගෙ අම්මත් ඉන්න නිසා කතා කරලා බලමු.''

''ආ... මෙන්න හයර් එක ගන්න.''

වත්සලා දුන් මුදල ඔහු ගත්තේය.

''මේ කිරි මුට්ටි දෙකයි, පැණියි අරගෙන යන්න.''

ආත්තම්මා කීවාය.

''දෙකක් වැඩියි.''



''සල්ලිවලට ගන්න ඒවා නෙවෙයිනෙ. අරන් යන්න.''

ආත්තම්මා කීවාය.

සහන් පිටත්ව යන හැටි පංචලි බලා සිටියාය.

''කොල්ලා හොඳයි. ඒ වුණාට අහංකාරයි.''

වත්සලා කීවාය.

අම්මා පිළිතුරු නොදුන්නේ තමා සමඟ ඇති අමනාපය නිසා යැයි ඇය සිතුවාය.

''දුව.. අප්පච්චි හෙට ඔෆිස් එකට එන්න කිව්වා.''

''මම ඔෆිස් යන්නෙ නෑ.''

''මොනවා ළමයෝ... එච්චර හොඳ රස්සාවක්..''

''මම හෙට ඉඳලා යන්නෙ නෑ කියලා තාත්තට කියන්න.''

''එච්චර හොඳ රස්සාවක් දාලා මොනවා කරන්නද ඉන්නෙ...?''

''මම කිරි කඩයක් දානවා.''

''මොනවා... කිරි කඩයක් දාන්න. මොකද ළමයෝ මේ වෙලා තියෙන්නෙ... අම්මා, මොකද්ද මේ කෙල්ලට හැදිලා තියෙන පිස්සුව...?''

''දුන් පොඩි ළමයි නෙමෙයි දුව. දුන් තීරණයක් ගන්න පුළුවන් වයසෙනෙ ඉන්නෙ.''

''අම්මා මෙච්චර ලොකු රස්සාවක් දාලා. කොච්චර පිළිගැනීමක් තියෙනවද?''

''එහෙ තියෙන කිරි එකතු කරලා කොළඹ කිරි කඩයක් දාන්නයි ඉන්නෙ. වැඩේ වරදක් නෑ. අපිත් උදව් කරමු.''

''කිරි එකතු කරන්ට ඕනෑ. ට්‍රාන්ස්පෝට් කරන්ට ඕනෑ. මෙයා පොඩි කෙල්ලෙක්. අම්මත් වැඩේට ඉන්නවද?''

''මම නෑ... සහන් උදව් කරනවා කිව්වෙ.''



''මම කැමති නෑ. තාත්තගෙන් අහල කරන්ට කියන්න. බොරු කාරයන්ට අහුවුණොත් අතේ තියෙන පණත් ගහරත් ඉවර වෙයි.''

''ඒ ළමයා පෞද්ගලික ලේකම් කෙනෙක් විදියට ඔය වැඩ කරන්නේ අමනාපෙන්. ඡන්දයක් ආවම ආපහු අකුලාගෙන ගෙදර එන්ට ඕනෑ.''

''මේ සැරේ පරාද වෙන එකක් නෑ.''

''ඔය අවස්ථාවාදී දේශපාලනය ගැන මම කතා කරන්නෙ නෑ. වෙලාවට පක්ෂය මාරු කරයි.''

ආත්තම්මා කිව්වෙ උපහාසාත්මක සිනාවක් මුව රඳවාගෙනය.

වත්සලා මව සමඟ කතාවට ගියේ නැත. ඇය පවසන සියල්ල සත්‍යය. වසර විසි ගණනක් ඉක්ම ගියත් ඇය තම ස්ථාවරය වෙනස් කර නැත. බලය නිසා දුව අනියම් භාර්යාවක් ලෙස තබා සිටින හැනැත්තා බෑණා ලෙස පිළිගැනීම ඇය ප්‍රතික්ෂේප කළාය.

''දන්නවනෙ හැටි. කිරි කඩයක් දමන්න යන බව ආරංචි වුණොත් ගෙදරින් පන්නා ගනීවි.''

''ඒවා මම දන්නෙ නෑ. අනුන්ගෙ පිරුවටය වගේ නොගැළපෙන රස්සාවල් කරනවට වඩා තමුන්ගෙ උත්සාහයෙන් යමක් කරන එක හොඳා.''

''තරය ගියොත් ගෙදරින් පන්නා දමාවි.''

සහන් නිවසට පැමිණ මුහුණ සෝදා කෙටි විවේකයක් ගත්තේය.

''වාහනේ වැඩ කරන්න ඩ්‍රයිවර්ස්ලා කීප දෙනෙක් ආවා. රුපියල් පහළොස්දාහක් ඉල්ලනවා. කන්ට, බොන්ට, නතර වෙන්ට පහසුකම් ඉල්ලනවා.''

''ඔව්. එහෙම තමා දුන්.''

WWW.SINHALAELIBRARY.COM 66

''ඉතින් මල්ලි මේ විදිහට හයර් කිරීමේ තේරුමක් නෑ.''

ඔහු එකවරම කිසිවක් පැවසුවේ නැත.

''මම පත්තරේ දැක්කා කෝපරේෂන් එකකට වාහනයක් ඉල්ලලා තිබුණා.''

පංචලිගේ පියා යටතේ ඇති අමාත්‍යාංශයකට කුලී පදනම යටතේ වාහන ඉල්ලා ඇති බව ඔහු දුටුවේය. පංචලි ලවා එය කරවා ගත හැක. එහෙත් ඇය දූත් සූදානම් වන්නේ ඉන් ඉවත් වීමටය.

''අන්තිමට යකඩ ගොඩක් කරලා ගෙනැත් දමයි. ඔය ඉල්ලන්නේ ඡන්ද වැඩවලටයි.''

''ඔව්. සේදර වාහනේ ඉල්ලුවා. මම දන්නෙ නෑ. ඇමතියා බතලවත්තෙ ගෙදරට රිංගනවා. පුළුවන් නම් අර කෙල්ලට කියලා රස්සාවක් හොයා ගන්ට.''

ඔහු පිළිතුරක් නොදී මඳ වේලාවක් සිටියේය. ඇය පංචලිගේ මව පිළිබඳව පැහැදීමක් නැත. අනියම් බිරිඳක් ලෙස ඉන්න බව ප්‍රසිද්ධය.

''අක්කා... අක්කට මතකද රුවීර..?''

''ඇයි මතක නැත්තේ. මෙහෙ ඇවිදින් කාලා බීලා ගිය ළමයනෙ. දැන් මොකද කරන්නෙ...?''

''තවම රස්සාවක් නෑ. එමරී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩ කරන්නෙ.''

''දැන් ඉතින් මොකද කරන්නෙ...?''

''අක්කා රුවීරයි මායි එක් වෙලා කිරි කඩයක් දමන්නටයි ඉන්නෙ.''

''තව පොඩ්ඩක් ඉවසන්න. ඔයාට රස්සාවක් ලැබෙයි. කිරි විකුණන්ට ලජ්ජා නැද්ද?''

''මාස් පතා ඔයාට හයර් එක දෙන්නම්. ටික දවසකට වෑන්එක දෙන්ට බැරිද?''



''ජීවත් වෙන්න ක්‍රමයක් තිබුණා නම් මම හයර් එක ඉල්ලන්නෙ නෑ. ඔයාගෙ කැමැත්තක්.''

''කාට වුණත් අපි ගෙවන්න ඕනෑනෙ.''

''හැබැයි මල්ලි කල්පනාවෙන් වැඩ කරන්ට වෙයි. ඔය කොහේද යන්ට හදන්නෙ...?''

''මම බතලවත්තට ගිහින් එන්නම්.''

''ඒ අහවල් දේකටද? මල්ලියෙ ඔය වැඩේ නම් එච්චර හොඳ වැඩක් නෙමේ. මොටද යන්නෙ...?''

''අක්කා ලොකු නෝනගෙ කිරි වැස්සියො 13 ක් ඉන්නවා. ඒ කිරි අපට දෙනවා කිව්වා.''

''මල්ලී නැති බැරිකම් ඇති. ඒත් අපි වැදගත් මිනිස්සු. ඔය බතලවත්තෙ ඉන්නෙ ඇමතියාගේ හොර ගෑනි. දුව අම්මාටත් වඩා ලස්සනයි. දන්නවනෙ ආඩම්බරකමේ හැටි. මල්ලිගෙ ඇගේ ගහයි.''

''අක්කා අවශ්‍ය දේවල් විතරක් කතා කරන්න. අපිට ඒ අය උදව් කරනවා.''

අක්කා කතා කරන්නේ කිසියම් තේරුමක් ඇතිවය.

වාහනයේ ගමන් කරන සෙසු කාන්තාවන් වුවද පංචලි සමග කිසිම ඇසුරක් නැත. අවජාතක වුවත් ඇය ඇමති දුවෙකි. පිරිමි තම විවාහක බිරිඳට වඩා අනියම් බිරිඳට දක්වන ආදරයේ වෙනසක් නැත. පංචලි හැම විටම වෙර දරන්නේ ස්වාධීනව ජීවත් වීමටය. ජීවිතය විසින් පිරිනමා ඇති මේ අවාසනාවන්ත ඉරණම පිළිබඳව ඇය දහස්වර දුක් වූවාය. ගෑනුන් තම හදවත රිදවන සරදම් කරන හැටි ඇය දනී. තමා ලොවට බිහිවූයේ ජීවත් වීමට ඇති ස්වාභාවික අයිතිය නිසාය. අද මුහුණ දෙන ලජ්ජා සහගත තත්ත්වය දකින විට ඒ යුගයේ දී ගබ්සා කර හෝ තමා මරා දැම්මා නම් හොඳ යැයි සිතූ අවස්ථා එමටය. ගැහැනු ලෙස තමා මුහුණ දෙන අවස්ථාව පිළිබඳව පුළුල් කෝණයකින් බැලිය යුතුය. තමා මේ උපත ලබා ඇත්තේ

WWW.SINHALAELIBRARY.COM 67

පවුලට උස්සන දුවෙක් පිළිබඳව ඇති ආදරය නිසා නොවේ. ඇතැම් විට ගැබ් විනාශ කිරීමට දෙදෙනාම වෙහෙසෙන්ට ඇත. ඉහත ආත්මයේ කළ පවක් ලෙස නින්දා විඳින්නට ඉපදෙන්ට ඇත. ගැහැනුන්ට පරිභව කරන්නේ ගැහැනුන්මය. මෙවන් විපත් සරු භාවයක් ඇති ගැහැනියකට ඕනෑම මොහොතක විය හැක. එහෙත් එවන් වරදකට උපත ලබන දරුවෙක් කිසිසේත් වරදකාරිය විය නොහැක. අද තමාට වන්දි ගෙවන්ට සිදුව ඇත්තේ නොකළ වරදකටය. තමා සිටින්නේ යොවුන් වියේ පසුවන තරුණියකගේ හදවතේ ඉපදෙන සුන්දර අදහස් වලට බොහෝ ඈතිනි. කවදාවත් විවාහයක් වීමට බැරි බව ඇය දනී. තම අඩුලුහුඬුකම් දන්නා මංජුල වැනි පාතාලයේ සාමාජිකයෙක් සමඟ ගොස් ප්‍රශ්න ඇති කර ගැනීමට ඇයට සිතුණේ නැත.

කවදාවත් විවාහ නොවීමට ඇය තීරණය කර තිබුණි. මෙවැනි කටයුත්තක් ඉදිරියේ අම්මා ද අසරණ තත්ත්වයකට පත්වන බව ඇය දැන සිටියාය. වත්තට පිවිසෙන ගේට්ටුව විවෘත කරන නැනැත්තා දුටු ඇගේ සිතට සතුටක් පිවිසුණි. ඔහු රථය ඈතින් නවතා ආවේය.

"එන්න ගෙට."

"නෑ මෙහෙම හොඳයි. කෝ මැඩම්...?"

"ආත්තම්මා ටිකක් නිදා ගන්නා. නැඟිටිනකල් ඉන්න."

"නැන්දැවට බෙහෙත් ගන්න යන්නේ කොහොමද?"

"ත්‍රීවීලර් එකක් කතා කරගෙන යනවා."

"එහෙම නම් ප්‍රශ්නයක් නැහැනෙ. මම යන්නම්."

"එපා.. එපා යන්න එපා. ආත්තම්මට කතා කරන්ට ඕනෑ කිව්වා. කිරි වැඩේ ගැන."

"ඒවා පස්සෙනෙ."

"හරි හරකයි. එහෙමනම් යන්න."



ඇය ක්ෂණිකව නැඟුණු කඳුළු පිස දමා ගනිමින් කීවාය. අනිත් හැමටම වඩා මේ චරිතය තමාට සමීපය. දුර සබඳතාවයක් ලෙස තිබුණේ ඉඳහිට රාත්‍රියක පැමිණ තම දෙකම්මුල් සිප ගන්නා තාත්තා කෙරෙහිය. කිසිම පිරිමියෙකුට වත්තට පිවිසීමට නොහැකි වන සේ ආරක්ෂාව තිබූ හැටි මතකය. මිලේනියම් නිවාස සංකීර්ණයට කිසිම පිටස්තරයෙකුට පිවිසීමට අවසර නැත. අම්මා හා තමා කිසිම මනුස්ස ඇසුරක් නැතිව ගත කළ සිරකාර ජීවිතය සිහිවෙයි. මෙම නිවස හා ඉඩම අම්මාගේ නමට අරන් දුන්නේ මේ මෑතකය. මෙහි ජීවිතය තරමක් ලිහිල්ය. යාන්තමින් හෝ පිරිමි ඇසුරක් ලැබුණේ මෙම වැන් රියේ ගමන් කිරීමට ලැබීමෙන් පසුවය.

—"ඇයි ඉතින් තවත් බලන් ඉන්නේ. යන්න."

ඇය හැඬුම් මුසුව කීවාය. ඔහු සිනා මුසු මුහුණින් යුතුව සිටියා විනා පිළිතුරක් දුන්නේ නැත.

"ඔච්චර කේන්ති ගන්ට එපා."

"අපිට කේන්ති ගියාට කාටවත් ප්‍රශ්නයක් නැහැනෙ."

"දැන් මම තරහා ගන්ට දෙයක් කිව්වද?"

"මම නිකං හිටියට තරහ යන්ට ඕනෑ තරම් දේවල් වෙලා තියෙනවා."

"හරි... හරි... දැන් ඔක්කොම ඉවරයි."

ඔහු සිමෙන්ති බංකුව මත ඉඳගනිමින් කීවේය.

"අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ නිලයක් අතහැරලා කිරි කඩයක් දමන එකට ඇමතිතුමා කැමති වෙයිද?"

"ඇයි එකම දේ නැවත නැවතත් අහන්නෙ. මට මගේ නිදහස ඕනෑ."

"ඒත් පංචලි කෙල්ලෙකුට ස්වාධීන තීරණ ගන්න බාධා තියෙනවා. ගැහැනු ලෙහෙසියෙන් රැවටිලිකාරයන්ට අහුවෙනවා.

WWW.SINHALAELIBRARY.COM 68

ගැහැනියෙකුට වරදක් සිද්ධ වුණොත් ඒක හදා ගන්ට බෑ. ඇමතිතුමා අපිට බලපෑම් කරයි.''

''අහවල් දේද මම දන්නෙ නෑ. තාත්තාගෙන් වරදක් වුණත් සහන්ගෙන් සහනයක් මිස කරදරයක් වෙන්නෙ නෑ කියන එක මට විශ්වාසයි.''

එසේ පවසද්දී ඇගේ මුහුණේ වූ ස්ථාවර පෙනුම දෙස ඔහු බලා සිටියේය.

''ඔයාගේ තීරණය වැරදියි. මම ඔයාව දන්න නෑදෑ හිතවතෙක්, යාළු මිත්‍රයෙක් නෙවේ. මම බොරුකාරයෙක්.''

''පොඩ්ඩක් බොරු කියනවා ඇති. ඒත් ඒක මට ප්‍රශ්නයක් නෙමේ.''

ඇය සිනාසෙමින් කීවාය.

''මම මේ සමාජය ඉදිරියේ නින්දා අපහාස විඳින කෙල්ලෙක්. මේ වාහනයේ යන අය විතරක් නෙවේ, අමාත්‍යාංශයේ අයත් මම කවුද කියලා දන්නවා. මම සමහර දවස්වලට බාත්රූම් එකට ගිහින් අඬනවා.''

මේ අනවශ්‍ය කතාව පටන් ගත්තේ තමා විසිනැයි සහන්ට සිතුණි.

''පංචලී මා ගැන කොයි විදිහටද හිතන්නේ...?''

''මේ වගේ වචනයකට හැඟීම්බර උත්තරයක් කිව්වොත් සහන් මාව වරදවා තේරුම් ගනීවි.''

''අපි හොඳ හිතින් එක කටයුත්තක් පටන් ගන්නයි හිතන්නෙ. පංචලී විඳවන වේදනා දෙවන දෙයක් සිදුවෙනැයි කියන පූර්ව නිගමනයක් ගන්න මේ ඇසුර ප්‍රමාණවත්.''

''අපි දෙන්නා අතර හොඳ ව්‍යාපාරික සබඳතාවයක් විතරක් තිබුණොත් ඇති. මේ බැඳීම ඊට මෙහා දසමයක්වත් වෙනස් වෙන්නෙ නෑ කියලා පොරොන්දු වෙන්නම්.''



## 19

මේ හැමදෙයක්ම හොඳින් සංවිධානය කිරීමට ඔවුහු සාකච්ඡා කර ගත්හ. පන්සලට ගොස් බුදුන් වැඳ බාරයක් වී හොඳ නැකතකින් ආරම්භ කිරීමට ආත්තම්මා පංචලිට උපදෙස් දුන්නාය.

''පන්සල් ගිහින් බුදුන් වැඳලා දේවාලෙට ගිහින් බාරයක් වෙන්න.''

''ආත්තම්මා සහන් දේවාලෙ යන්ට කැමති නෑ.''

''පන්සල් යන්න කැමතියිනෙ. හොඳ කටයුත්තක් කරන කොට හොඳ හිතින් කරන්ට ඕනෑ.''

''දැන් සහන් එයි. අර මතක් කරනකොටම එන්නෙ.''

සහන් රථය නිවස ඉදිරිපස නතර කර ඉන් බැස ආවේය.

''මැඩම් පන්සල් යනවා නේද?''

''මේ ළමයින්ට කරදර නැද්ද?''

''පන්සලට යන එක කරදරයක් ද? යමු.''

සහන් මිලිනා මැණිනියට රථයට පිවිසීමට සහය වෙමින් සිටියේය.

WWW.SINHALAELIBRARY.COM 69

කළුතර බෝධිය වන්දනා කර බෝධි පූජාවක් පවත්වා ආශිර්වාද ලබා ගැනීමට අදහස් කළහ. මෙය පැහැදිලිවම පුණ්‍ය කටයුත්තකි. මාලබේ සිට කළුතර දක්වා වූ ගමන තුළ ආත්තම්මා සිටියේ සතුටින් යුතුවය. ආත්තම්මා සෑහෙන කාලෙකින් මෙවන් පින් කටයුත්තකට සහභාගි වී තිබුණේ නැත. ඇයට මෙම ගමන යා හැකි වූයේ පැහැදිලිවම සහන්ගේ සහාය නිසාය. පංචලි මල් පූජා කිරීමට මල් ගෙනැත් දුන්නාය.

"සහනුත් මල් පූජා කරන්න."

පංචලි මල් පෑවාය.

"මිස් පූජා කරන මල් වට්ටියට මම අත ගැසුවාම ඇති."

"නෑ.. නෑ.. එහෙම බෑ. අපි දෙන්නම එකට පූජා කරන්ට ඕනෑ."

"ඒක පස්සෙ බලාගමු."

පූජා භූමිය තුළ තරමක නොසන්සුන් බවක් ඇති වුණි.

"මොකද මේ කලබල වෙලා."

ඔහු ප්‍රවේශය දෙස බැලුවේය.

"හමුදාවෙ හරි පොලීසියෙ කෙනෙක් හරි ඇවිදින් වගේ."

"නෑ ප්‍රභූ පන්තියෙ කෙනෙක් වගේ."

සහන් වැඩි සැලකිල්ලක් නැතිව කීවේය.

හමුදා නිලධාරීන්ගේ ආරක්ෂාව සහිතව එන වසන්ති දුටු වත්සලා අසරණව බලා සිටියාය.

"ඇමතියගෙ ගෑණියි දරුවොයි ඇවිදින්."

වත්සලා කීවාය.

"අම්මා කොහෙද බලන්නෙ. ආපූ වැඩේ කර ගන්න."



පංචලි අම්මා දෙස බැලුවේ අසතුටින් යුතුවය. ඒ පන්සලට ආවේ තාත්තාගේ නිතානුකූල බිරිඳ බව ඇය දැන සිටියාය. හදිසියෙන් සිත නොසන්සුන් වීම වැළැක්විය නොහැක. නිලධාරීන් ඇමතිවරයාගේ බිරිඳට ආරක්ෂාව සපයනු පංචලි දුටුවාය. සුදු ඇඳුමින් සැරසුණු ඇමතිවරයාගේ දුවරු මල් පහන් පූජා කළහ. ඔවුනට පංචශීලයේ පිහිටුවීම සඳහා ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් ද පැමිණ සිටියහ.

"සහන් අපි එහා පැත්තට යමුද?"

"කැමැත්තක්.. යනවා නම් යමු."

අම්මාට හා ආත්තම්මාට වන්දනා කිරීමට ඉඩ දී ඔවුහු චෛත්‍යරාජයාගේ අනිත් පසට ගියහ. කිසියම් වෙනසක් දුනුණ ද සහන් ඒ පිළිබඳව කිසිවක් විමසුවේ නැත.

"රූචිරත් හිටිය නම් හොඳයි නේද?"

"බලමුකො. ඇයි මේ දුකින් වගේ...?"

"ඔයාට මට දෙයක් කියන්ට තියෙනවා."

"මට මොනවත් කියන්න එපා. එහෙම නොකිව්වා කියලා මගේ කරහක් නෑ."

"නෑ... නෑ.. අවශ්‍ය දෙයක් විතරක් කියන්ට. අන්න කවුද මෙහාට එනවා. සී.අයි.ඩී. එකෙන් වගේ."

"මිස් පොඩ්ඩකට එනවද?"

"ඒ මොටද?"

"ඇමති ආර්යාව එන්ට කිව්වා."

"මම දන්න ඇති ආර්යාවක් නෑ. මට බෑ."

"එහෙම නම් මම ගිහින් කියන්නම්."

WWW.SINHALAELIBRARY.COM-70

''මොකද කිව්වේ..?''

''ඇමතිගෙ නෝනා කතා කරනවලු. මම බැහැයි කිව්වා. අපිට ඒ අය එක්ක කතා කරන්ට දෙයක් නෑ.''

ඔහු ඒ පිළිබඳව කතා කිරීමට ගියේ නැත. ඔව්හු නිහඬව පහන් දල්වන්ට වූහ. මඳ වේලාවකට පසු හමුදා පොලිස් නිලධාරීන් පිරිවරා එන ඇමති භාර්යාව පංචලි හඳුනා ගත්තාය. අම්මාට අභියෝගයක් කර ඇති ගැහැනිය සමඟ කතා කළ යුතු නැත. අද අම්මා හා තමා අසරණ වී ඇත්තේ මේ ධනවත් ගැහැනිය නිසාය. කිහිප වතාවක්ම අම්මාට බැණ වැදුන හැටි ඇය දනී. ඔවුන්ගේ පවුල් ජීවිතයට අම්මා මැදිහත් විණැයි යන චෝදනාව කළ හැටි මතකය. මහා ධනවත් ගැහැනියක වූ ඇය තමාට හා අම්මාට නොයෙකුත් බලපෑම් කළ හැටි ඇය දනී. තමා අමාත්‍යාංශයෙන් පවා ඉවත් වුණේ ඔවුන්ගේ බලපෑම් ඇති වෙතැයි සිතුණු හෙයිනි. දූනට ඇති එකම බලපෑම තාත්තා විසින් ගෙයක් හා ඉඩමක් අරන් දීම පමණි. එයත් ඉල්වූ ඕනෑ විටක බාර දී අම්මා සමඟ ආත්තම්මාගේ ගමට යෑමට ඈ සිතා සිටියාය. ඇමති භාර්යාව තමා අසලට එනු දුටුව ද ඇය ඔවුනට මුහුණ දුන්නේ නැත.

''ඇයි පණිවුඩයක් එවලා ආවෙ නැත්තේ...?''

ඇමති භාර්යාවගේ පැනයට පංචලි පිළිතුරු දුන්නේ නැත. ඇගේ දූවරුන් දෙදෙනා පංචලි අසලට ආවාය.

''අපි එක්ක කතා කරන්ට එපා කියලා කවුරුවත් කිව්වද?''

ඇමති භාර්යාව ඇසුවාය. ඇය පිළිතුරක් නොදී ගිස වැනුවාය.

''අම්මා කතා කරන්ට එපා කිව්වද?''

''අම්මා මුකුත් කියලා නෑ.''

පංචලි කීවාය.

''බඳින්න ඉන්න බෝයි එපා කිව්වද?''



පවුලේ වැඩිමල් සොයුරිය විමසුවාය.

''අපිව බඳින්න කෙනෙක් නෑ.''

පංචලි ඉවතට හැරී කීවාය.

''ඒක පුදුම කතාවක්නෙ. ෆිල්ම්ස්ටාර් වගේ ලස්සන කෙල්ලෙක් බඳින්න කෙනෙක් නෑ කියන එක පිළිගන්නෙ කවුද?''

ඈ මඳ සිනාවෙන් යුතුව කීවාය.

''ගැහැනු ළමයෙක් කසාද බන්දලා දෙන්ට යනකොට අම්මා තාත්තා කවුද කියලා හොයනවා. මට තාත්තා කෙනෙක් නෑ. මම අවජාතක විදිහටයි ඉපදිලා තියෙන්නෙ. අඩු වශයෙන් උප්පැන්න සහතිකේවත් පියෙක් නෑ.''

වසන්ති පැමිණියේ මෙම ගැහැනියට හා ළමයාට රිදෙන සේ යමක් පැවසීමටය. තම ගැහැනු දරුවන් දෙදෙනා පංචලි මෙන් ලස්සන නැත. සැමවිටම පුදුමයට පත් කරමින් ඇය පැවසූ වදනින් ඇය තිගැස්සී සිටියාය.

''කසාද බැඳපු මිනිස්සුන්ගෙ ඇගේ එල්ලෙන්ට කලින් ගැහැනු ඒවා දැන ගන්ට ඕනෑ.''

''අම්මා මේ නංගි මොනවද දන්නේ. එයාට මුකුත් කියන්ට එපා.''

බුද්ධිමත්ව ප්‍රශ්නය දෙස බැලූ පංචලි ඔවුනතරින් මිදුනාය.

''අපි යමු.''

පංචලි සහන්ගේ අත ගෙන මව සිටින තැනට ගියාය. ගැල පසුපස එන ගොනුන් පරිද්දෙන් කළ පවුකම් හඹා එන හැටි.

''අඬන්නෙ නැතිව ඉන්න.''

ඇයට මොනවා හරි පැවසීමට හැකිව තිබුණත් ඔහු එය විමසුවේ නැත. ඇය සහන්ගේ අත තරයේ අල්ලා මව අසලට දුව ගියාය.

WWW.SINHALAELIBRARY.COM 71

"අම්මා අපි යමු."

පංචලි මව අසලට එමින් කීවාය. දුව සහන්ගේ අත අල්ලාගෙන තමා අසලට දුව ආවේ ඇයි දැයි එකවරම තේරුම් ගැනීමට නොහැකි වුණි. තමා ඉදිරියේ රියදුරාගේ අ අල්වා ගැනීමට තරම් ගිහක් ආවේ කොහොමද?සමහරවිට සැමියාගේ නිත්‍යානුකූල බිරිඳ පන්සලේ දී දුවට හමුවන්ට ඇත. ඇය දුවට තර්ජනය කළා වන්ට බැරි නැත.

"ඇයි දුව වැදලා ඉවර ද?"

"මට මෙතන වඳින්ට බෑ. මගෙ හිත හදාගන්ට බෑ. අපි යමු."

"මොකද සහන් වුණේ කියන්න.'මෙයා කවදාවත් මෙච්චර බය වෙලා නෑ."

"මැඩම් ඇමති කෙනෙකුගේ ගෑනි ඇවිදින් මොනවද කිව්වා."

"අපිට මේ ජීවිතේ වෙන කරන්ට දෙයක් නෑ."

ඇය හැඬුම් මුසුව කීවාය.

"මම ගිහින් වාහනේ අරගෙන එන්නම්."

"ඉන්න මාත් එනවා. තනියම යන්ට එපා."

"එහෙක් කියන්නම් පාරෙදී අඬ අඬා එන්න එපා."

ඇය නිහඬව ඔහුගේ අතේ එල්ලී අඬ ආවාය. රථගාල අසලට ගිය ඔහු දොර විවෘත කළේය. දෑතින් මුහුණ වසා ගත් ඇ මඳ වේලාවක් සිටියාය.

"ජීවිතය පිළිබඳව ඔච්චර පසුතැවිලි වෙන්න එපා. එන විදිහට මුහුණ දෙන්න. එතකොට හරියයි."

"මට යමක් කියන්ට තියෙනවා."

"දැන් ඒක කියලා හිතේ බර ඇරගන්ට එපා. ජීවත් වෙන්න



නම් අමුතු ශක්තියක් තියෙන්න ඕනෑ. ජීවත් වෙනවා කියන්නේ ධෛර්ය සම්පන්න වීමයි.

මේ විදිහට ජීවිතය ගැන ශක්තිමත් දැක්මක් ඔහුට තිබුණි. ආදරය දක්වන්නේත් භේදයක් නැතිවයි. ඔහු නිහඬව ඇය සමඟ ආවේය. සහන් සියල්ල රථයට නංවා ගත්තේය.

"සහන්, අම්මට බඩගිනි ඇති. කොහේ හරි හොඳ තැනක නතර කරන්න."

පංචලි කීවාය.

සහන් තරමක් දුර ගොස් මුහුදට නුදුරු තැනක රථය නතර කළේය. ඉන් අනතුරුව සහන් ආත්තම්මට රථයෙන් බැසීමට උදව් කිරීමට ගියේය.

"ඕනෑ නෑ මම ඉන්නම්. ඔය තියෙන දෙයක් මට ගේන්න."

සහන් රථයෙන් බැස සයුර අසලට ගියේය. කතා කළ යුතු දේ බොහෝ ඇත. හැම මොහොතකම පංචලි කෙරෙහි තදබල වේදනාවක් සිතේ ඇති වෙයි. එහෙත් ඒ ගැන විමසා සිතට දුකක් දීමට ඔහුට සිතුණේ නැත. මේ ලතාවකට ගලන සයුර වෙරෙහ බිහිසුණු ලෙස දෙගොඩතලා ජීවිත රැසක් බිලිගත් හැටි දුක්සහගත සිද්ධියක් ලෙස මතකයේ ඇත. මේ ජීවිතවලත් ඇත්තේ ඒ කටුක ජීවිත අත්දැකීමය. පංචලිගේ ජීවිතයත් මෙම භයානක අත්දැකීමේ කොටසකි. හැම පිගානක් අතැතිව එන තැනැත්තිය ඔහු නෙත ගැටුණි.

"එන්න තේ බොන්න."

ඔහු නිහඬව මඳ සිනාවක් පෑවේය.

"අත හෝද ගන්න."

ඇය බෝතලයේ වතුරෙන් ඔහුට අත සේදීමට සහාය වූවාය.

"ඉදිආප්ප මදිනම් ගන්න."

www.sinhalaelibrary.com

WWW.SINHALAELIBRARY.COM 72

"මට මේ ඇති."

"ඇති නෑ තව කන්න ඕනෑ."

"මට බලකරන්ට එපා."

"බලකිරීමක් ගැන නම් දන්නෙ නෑ. කිසිම පිරිමියෙකුට මොන යම් හෝ චෝදනාවක් ඉල්ලීමක් කරන්ට අපිට පුළුවන් කමක් නෑ."

"අපි කිව්වේ?"

"අපි කිව්වේ අම්මටයි මටයි. අපි ඉන්නෙ පිරිමි වර්ගයා කෙරෙහි ඇති වුණු කලකිරීමකින්."

"මිනිසුන් ජීවිතය පිළිබඳව තදබල විශ්වාස කිරීම ඇති කර ගන්නව. එහෙම වුණාම කොන්දේසි විරහිතව බැඳුම්කර ඇති කර ගන්නවා. සිද්ධ වෙලා තියෙන්නෙ මොකද්ද කියලා මට දැනගන්න ඕනෑකමකුත් නෑ. ඒක මට කියන්ට ඕනෑකමක් නෑ."

"ඇත්තම මම කියන්නම්. ඇත්තටම මම ඉන්නෙ දුකෙන්. ඒ නිසා හිතට දුක් දෙන්ට එපා."

මේ සමාජ ජීවිතයේ දී දුක්වන්ට ඇති අවස්ථා වැඩියි. ඒවා විමසා නොසිටීමට ඔහු සිතා ගත්තේය.



# 20

සැමියා විදේශ සංචාරයේ යෙදී එන තෙක් වසන්ති බලා සිටියාය. දරුවන් දෙදෙනා ඉගෙනුම ලබන්නේ ඔක්ස්පර්ඩ් හා කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවලය. ඔවුන් දීර්ඝ නිවාඩුවක් සඳහා ලංකාවට පැමිණ සිටිති. තාත්තා ප්‍රබල කැබිනට් ඇමතිවරයෙක් බව දරුවන් දනිති. දේශපාලනයට පිවිසුනේ වාමාංශිකයෙක් ලෙසය. අවසානයේ මෙම වාමාංශිකයන් නතර වුණේ දක්ෂිණාංශික පක්ෂවලය. සමරතුංග සිය පෞරුෂය හරහා වෙනම බලයක් නිර්මාණය කරගෙන තිබුණි. රටක බලය තීරණය කරන නායකයෙක් බවට හෙතෙම පත්ව සිටියේය. ඉතුන් වර ලංකාවෙන් ගියේ රට තුළ දේශපාලන අස්ථාවර බවක් නිර්මාණය වෙමින් තිබියදීය. දරුවන් දෙදෙනා මෙවර ලංකාවට පැමිණ ඇත.

සමරතුංග විදේශගතව සිටිය දී පවුලේ අයගේ මෙන්ම වත්සලාගේ ද දුක සැප සොයා බැලුවේය. වසන්ති විවාහක බිරිඳ වුවද වත්සලා තරම් තම ජීවිතයට සම්බන්ධ වූ වෙනත් ගැහැනියෙක් නැත. ලිංගික ජීවිතයේ දී තමා ඇයගෙන් තරම් සන්තෝෂ නොවූ බව ඔහු පිළි ගනී. විදේශ සංචාරයේ යෙදෙන අවස්ථාවලදී ඕනෑ තරම් ගැහැනු ඇසුරු කිරීමට පුළුවන. ගැහැනු යනු පාවිච්චිය සඳහා ඇති සෞන්දර්යාත්මක භාණ්ඩයක් පමණි. පාවිච්චි කරන කාලය සඳහා මුදල් ගෙවීමෙන් පසු එම ගනුදෙනුව අවසන්ය. ලංකාවේ

WWW.SINHALAELIBRARY.COM 73

ගැහැනියක සමඟ සබඳතාවයක් පැවැත්වුවහොත් එම බන්ධනය මැරෙන මොහොත දක්වාම පවතියි. දුන් සිදුව ඇත්තේ තරුණ වියේදී සිදු වූ අත් වැරැද්දකි. සිය බලය පවතිද්දී ආශ්‍රයෙන් පසු අතැර දමූ ගැහැනු ඕනෑ තරම් ඇත. නමුත් මෙම ගැහැනිය තම ජීවිතය කණපිටට හැරෙව්වේ ය. ලොව සිටින කොයි ගැහැනිය සමඟ රමණයේ යෙදුණත් වත්සලා තරම් කිසිම ගැහැනියක් සුන්දර ලෙස එම කටයුත්තට දායක වී නැත.

ලංකාවට පැමිණි සැණින් ඔහුට පක්ෂ කාර්යාලයට යාමට සිදු වුණි. විදේශගතව සිටිය දී විකල්ප පුවත්පත් මඟින් තම නමට මඩ ගැසීමට පත්‍රකාරයන් වෙර දරා තිබුණි.

සමරතුංග වඩාත් කෝපයට පත්ව සිටියේ අනියම් බිරිඳ ගැන කැලෑ පත්තර විලාශයෙන් විකල්ප පත්‍රවල වාර්තා තිබීම ගැනය.

නිල නිවාසයට ආවේ කෝපයෙන් යුතුවය. එහෙත් ඒ ගැන විවාහක බිරිඳ කිසිවක් නොපැවසීම පිළිබඳව ඔහු සතුටට පත්වුණි. මොහොතක් ඇඳේ වැතිර සිටි සමරතුංග සැහැල්ලු ඇඳුමකින් සූදානම් වුණි.

"ඔය කොහේද යන්ට හදන්නෙ...?"

වසන්ති සැමියා දෙස නොබලා ඇසුවාය.

"මම පොඩි ගමනක් ගිහින් එන්නම්."

"මොකද්ද යන්න තියෙන හදිස්සිය. ලෝකයා හිනස්සන්නෙ නොවී මෙහෙ ගෙදරට වෙලා ඉන්න.."

ඔහු පිළිතුරක් නොදී සිටියේය.

"ඇඳුමක් ඇඳගෙන පාරෙ යන්න පුළුවන්ද? පත්තරවල ලියලා තියෙන දේවල් දක්කෙ නැද්ද?"

"ඇයි මොකද්ද ප්‍රශ්නෙ. දේශපාලනඥයා හැටියට අපිට ඕනෑ දෙයක් දරන්න පුළුවන්. මම මේ තත්ත්වයට ආවේ මඩ කාලා තමයි."



"දේශපාලනය කරලා මැරිච්ච ජන නායකයෝ ඉන්නවා. ඒ නායකයන්ට ජනතා ප්‍රණාමය ලැබෙනවා. බලු වැඩ කරපු එවුන්ව කවුද ගණන් ගන්නේ...?"

"වසන්ති, දේශපාලනඥයින්ට කවදාවත් හොඳක් අහන්ට වෙන්නෙ නෑ. අපි අපේ සේවය කරනවා විතරයි. සම්මාන බලාපොරොත්තු වෙන්නෙ නෑ."

"හොර ගෑනි ගැන පත්තරවල තියෙන කතා ගැන මොකද කියන්නෙ, ඒවත් බොරුද?"

"වසන්ති... වසන්ති... ඔයත් මේ පත්තර කාරයො වගේ අනුන්ගෙ කුණු හොයනවා."

"කියනවා නෙමේ ඒයෙත් පන්සලේ දී හමු වුණේ. තියෙන පව්කාරකම් එන්න එන්න ලස්සනයි. වයසට යන්නෙ නෑ."

ඔහු පිළිතුරක් දුන්නේ නැත. පැහැදිලිවම එම කතාව සත්‍යයකි. එම සුන්දර බව උපතින්ම හිමි වූවකි. තම ආර්යාව ලෙස ඇය විදේශ සංචාරයකට කැඳවාගෙන යාමට නොහැකි වීම පිළිබඳව හෙතෙම දුකට පත් වුණි. වසන්ති එතරම් හැඩ රුව නැති ගැහැනියක් නිසා ඇය කිසියම් ප්‍රසිද්ධ ගමනකට කැඳවාගෙන ගියේ නැත.

"අම්මටත් වඩා දුව ලස්සනයි."

ඔහු කිසිවක් පැවසුවේ නැත. එහි කිසිම තර්කයක් නැත. පංචලි වත්සලාට වඩා බෙහෙවින් ලස්සන ස්ත්‍රියකි. ගැහැනු අංගවලින් ඇය අනූනය. එහෙත් ඇය නිත්‍යානුකූල නොවූවත් තම දුව වෙයි. කෙනෙකුට යටත් නොවන අහංකාර ගතිගුණ ඇති බව සමරතුංග දනී. ඇය තමා යටතේ වුවද වැඩ කිරීමට අකැමැති පුදුම ගති පැවතුම් ඇත්තියෙකි. තම ලේකම්වරිය ලෙස ගරු සම්මාන සහිතව ජීවත් වීමට හැකිව තිබියදී ඇය එම තනතුර ප්‍රතික්ෂේප කළාය.

"මක්කොටම වඩා අහංකාරයි, ළමයි දෙන්නා එක්ක පන්සල් ගිය දවසෙම අම්මයි දුවයි හම්බ වුණා."

WWW.SINHALAELIBRARY.COM 74

සමරතුංග පිළිතුරක් නොදී සවන් දුන්නේය. වසන්ති තමාගේ මේ සබඳතාවය දන්න බොහෝ කලකි. තමා වත්සලාගෙන් බේරා ගැනීම සඳහා නොයෙක් උපක්‍රම යෙදූ හැටි සමරතුංග දනී. හිත වෙනස් කිරීම සඳහා මාතර කට්ටඩියන් ලවා ගුරුකමක් කළ බව සමරතුංග දනී. ඒ කිසිවකින් ඵලක් වූයේ නැත.

''මොකටද පන්සල් ඇවිත් තියෙන්නේ...?''

''අපිට කියනවයෑ. දුවත් අම්මා පරාදයි. පිරිමි අල්ලගෙන. මායාකාරියො.''

දුන් මෙම ගමන යාමට නොහැකි බැව් ඔහු දනී. සෑහෙන කාලයක් නිවසින් බැහැරව සිටි නිසා කිසියම් දෙයක් අතපසු වී ඇතැයි ඇය සිතනවා විය හැක. ඇය අමනාපයට පත් කරගෙන කිසිවක් කිරීමට නොපුළුවන. තමා පරිහරණය කරන දේපළ ඉඩකඩම්වල හිමිකාරිය වන්නේ ඇයයි. ඇඳුම් මුදවා සරමක් ඇඟ ලා ගත්තේය.

ඇය සමඟ සබඳතාවයක් පැවැත්වූ දිනයක් මතක නැති තරම්ය.

දරුවන් ලැබීමෙන් පසු වසන්තිගේ සිරුර මහතට වඩා ස්ථූල වී ඇත. ඇඳුම් නැතිව සිටින විට දී එල්ලා වැටෙන ගැහැනු ඇඟ කිසිම ආකර්ෂණීය බවක් නැත. හැමදාම ගැහැනු සිරුරක පූර්ණ පයෝධර සහිත ආකර්ෂණීය බව රැඳෙන්නේ නැත. ලිංගික කටයුතු පිළිබඳව ඇති ඕනෑකමක ද පවතින්නේ නැත. කුඩා කල සිටම ගැහැනු ළමුන් හැදුණේ වැඩුණේ වෙනම කාමරවලය.

ගැහැනු ළමුන් වැඩිවියට පත් වූ පසු ලිංගික කටයුතු කෙරෙහි උදාසීනත්වයක් හටගත් හැටි සිහිවෙයි. මේ මනුස්සයා අහවල් තැකතක ඉපදිලා ද දන්නෙ නෑ. පිනක් දහමක් කරන්ට කැමැත්තක් නෑ. ඇගෙ එල්ලෙන්නමයි කල්පනාව.

''මොකද්ද ඔය කරන්ට හදන්නෙ...?''

වසන්ති සැමියාගේ ක්‍රියාකාරකම් දන්නා නිසා ඇසුවාය. ඔහු කිසිත් නොදොඩා වසන්තිගේ ගවුම ගැලෙව්වේය. එයට විරුද්ධ වී ඵලක් නැත.



''අනේ ඇත්තට මොනාවද මේ කරන්න හදන්නෙ. තව ළමයින් නිදි නෑ.''

කොච්චර විරුද්ධකම් පෑවත් ඉන් ඵලක් නොවන බව දනී. පිනක් දහමකට කැමැත්තක් නැත. තමා ගැහැනියක් බව ඇගට දැනෙන්නේ ඔහු ඉදිරියේදීය. අනිවාර්යයෙන් අනුකූලතාවයක් දක්වීමට සිදු වෙයි. තමා සිටිය දී තවත් ගෑනු අඹුවක් සිටින බව ඇය දන්නා කරුණකි. මේ කටයුත්තේ ඉවරයක් නැත. කිසි අනුකම්පාවක් නැතිව තලා පෙලා දමයි.

''ඉස්සර කෙල්ල කාලෙ වගේ මහන්සි වෙන්ට බෑ. ඉක්මනට කරගන්න දෙයක් කරගමු. මට ළමයි ගාවට යන්ට ඕනෑ.''

ඇය උඩුබැල්ලෙන් වැතිර කීවාය.

සහන් පංචලිගේ ආන්තම්මා බතල වත්තේ නිවසට කැඳවාගෙන ගියේය.

''බහින්න මැඩම්...''

''නෑ ළමයෝ මම මෙහෙ නතර වෙන්නෙ නෑ. මාලබේ අපේ නෑ ගෙදරක් තියෙනවා. එහෙට යනවා.''

''අද මෙහෙ නතර වෙන්න ආන්තම්මා.''

පංචලි ඇවිටිලි කළාය.

''ඔව් අම්මා නතර වෙන්න. තවම ලංකාවට ඇවිදින් නෑ.'' වත්සලා කීවාය.

''ලංකාවට ආවත් එකයි නැතත් එකයි. මම එන්නෙ නෑ. ළමයෝ මාව ගිහින් දාලා එමු.''

''මිස් ලොකු නෝනා කැමති නැතිනම් තියාගන්ට බැහෙ. මම ගිහින් ඇරලලා එන්නම්.''

''එහෙනම් ඉන්න මාත් එන්නම්.''

WWW.SINHALAELIBRARY.COM 75

''දුව... එහෙනම් ඔයා ගිහින් අම්මාව ඇරලලා එන්න. සහන්ට පරක්කුද?''

"නෑ මැඩම් ප්‍රශ්නයක් නෑ. මම ඇරලලා එන්නම්. කවුරුවත් ඕනෑ නෑ."

"එහෙම හොඳ නෑ. දුවත් ගිහින් එන්ට."

සහන් මාලගේ සිටින මැතිනියගේ ඥාති දුවගේ නිවසට ඇය හැඳවාගෙන ගියේය. දුවට සිදුව ඇති වරද නිසා ඇය බෙහෙවින් තම්පාවට පත්ව සිටියාය. ඇමතිවරයා තමා මිතුරු කර ගැනීමට නොගත් උත්සාහයක් නැති බව ඇය දනී. ඇය සම්පූර්ණයෙන්ම අනැර දමා සිටියත් මේ අහිංසක ගැහැනු දරුවා නිසා එසේ කිරීම අසීරු වුණි. පියා කවරෙක් වුවත් ඉපදුණු දරුවෙකුට ජීවත් වීමට ඇති අයිතියට සම්බාධක පැනවිය නොහැක. පංචලි ආත්තම්මාගේ සිත දිනා ගත්තේ ඇය කාගේත් පිළිසරණක් නැති ගැහැනු ළමයෙක් වන හෙයිනි. වෙනත් ගැහැනුන්ට නැති හොඳ අපූර්ව දක්ෂතා ඇය සතු විය. ඇය කාටත් යටත් නොවන අහංකාර ගති ඇති තරුණියක් වීම පිළිබඳව ඇය ආඩම්බර වූවාය. රජයේ ඕනෑම තැනක රැකියාවක් කළ හැකි වුවත් ඇය ඒවා ප්‍රතික්ෂේප කිරීමෙන් හෙළි කළ පෞරුෂය ඇය අගේ කළාය. මිය යන්නට ප්‍රථම පංචලිගේ කටයුතු කිරීමට ඇ සිතා සිටියාය.

"සහන් ඔහොම නතර කරන්න."

පංචලි දෙමහල් ගොඩනැගිල්ලක් දක්වමින් කීවාය. සහන් රථය නතර කර ආත්තම්මාට බැසීමට සහාය වුණි.

"එහෙම නම් නෝනා බහින්න."

"ජින් සිද්ධ වෙච්චා ළමයො. බුදුන් වැන්දෙව්වා.."

"අනේ ඒක මොකද්ද නෝනා."

"එහෙම නම් හොඳ දවසක් බලලා වැඩේ පටන් ගමු."

ඔහු පිළිතුරක් නොදී මඳ වෙලාවක් බලා සිටියේය. ඔහු සමුගැනීම සඳහා පහත් වී ඇයට වැන්දේය.

පංචලි ආත්තම්මාගේ අතින් අල්වාගෙන නිවස තුළට කැඳවාගෙන ගියාය.



සහන් රථයට වී පංචලි එනතෙක් බලා සිටියේය. මඳ වෙලාවකට පසු තේ කෝප්පයක් රැගෙන තමා දෙසට එන පංචලි ඔහු නෙත ගැටුණි.

"තේ එකක් බොන්න."

ඔහු එය ප්‍රතික්ෂේප කළේ නැත. මඳ සිනාවෙන් යුතුව ඔහු තේ කෝප්පය අතට ගත්තේය.

"ආත්තම්මා මොකද කිව්වෙ...?"

ඇය දොර අල්වා ඇසුවාය.

"හොඳ වෙලාවක් බලා පටන් ගන්ට කිව්වා. පෞද්ගලික ප්‍රශ්නයක් අහන්ටද?"

"ඔව් අහන්ට."

"රජයේ ආයතනයක හොඳ රස්සාවක් කරන්ට පුළුවන්කම තියෙද්දි ඇයි මේ වගේ දුෂ්කර ජීවිතයක් බාර ගන්ට හදන්නෙ."

"දැන් ඒවා ගැන කතා කරලා වැඩක් නැහැනෙ. මම වැඩ කරන්නෙ මට ඕනෑ විදිහටයි."

"හරි... හරි... මාත් වල් තඩි මෝඩයෙක්. ඕනෑ දේත් අහනවා එපා දේත් අහනවා. සමාවෙන්න."

ඔහු සිනාසෙමින් කීවේය.

"ඕන් ඉතින් කෙනෙකුගෙ හිත රිදවන කතා කියනවා. මාව කවුද කියලා තේරුම් ගන්න. ඒත් අනුකම්පා කරන්ට එපා."

"හරි එහෙනම් අපි යමු."

ත්‍රික්වාටරයකින් සැරසුණු මනා හැඩ රුවින් යුතු යුවතියක් රථය අසලට පැමිණ කෝප්පය අතට ගත්තාය.

"එහෙම නම් පස්සෙ හම්බ වෙමු. ඔපනින් එකට අනිවාර්යයෙන්ම එනවා."

ඔවුහු අත් එකට ගසා සමුගත්හ.

WWW.SINHALAELIBRARY.COM 76

# 21

සහන් නිවසට ගියේ හොඳටම අඳුර වැටුණු පසුවය. ගත වූ කෙටි කාලය බොහෝ සිදුවීම් සිදුව ඇත. පංචලී කෙරෙහි ඔහුගේ සිතේ ඇතිව තිබෙන්නේ දුකකි. ඇගේ ජීවිතයේ මතුව ඇති ප්‍රශ්නවලට ඇය වගකිව යුතු නැත. දෙමාපියන් කරන ලද වරදකට ඇයට බාල්දුවීමට සිදුව ඇත. පැහැදිලිවම පංචලීට නීත්‍යානුකූල පියෙක් නැත. චාරිත්‍ර බද්ධ සමාජයේ ඇයට දුෂ්කරතාවයන්ට මුහුණ දෙන්නට සිදුවන බැව් ඔහු දනී. මෙවැනි සිදුවීම් ගැමි සමාජයේ තදබල ප්‍රශ්න නොවේ. ගැහැනියෙක් අපහාසයට ලක් කිරීමට ඇති එකම සිදුවීම මෙය වේ. මේ ඇසුරු කළ කාලය තුළ ද ඔහු ඇය මැනවින් හඳුනා ගත්තේය. ජීව උත්සාහමයන්. ජීවත් වීමට වෙර දරන පංචලීට උපකාර කිරීමට ඔහු සිතා ගත්තේය. ඇමතිතුමා යටතේ සේවය කිරීම ඇය අසතුටු වූයේ ඇයි දැයි කිව නොහැක. පැහැදිලිවම මෙය ආත්ම ගෞරවය පිළිබඳව ප්‍රශ්නයක් විය හැක. ඇගේ සැබෑ තත්ත්වය කාර්යාලයේ අය දන්නවා විය හැක.

රථය ගරාජයට දමා ගේට්ටුව වසා ඔහු අක්කාගේ නිවසට ගියේය.

"මොකද මෙච්චර රෑ වුණේ...?"



ඔහු පිළිතුරක් නොදී කාමරයට ගියේය. නාන කාමරයට වැදී දිය නාගත් ඔහු කොට කලිසමකින් සැරසී එළියට ආවේය.

"මල්ලි තේ බොන්න."

ඔහු තේ කෝප්පය අතට ගත්තේය.

"අන්න ඔයාට එන්ට කියලා අම්මා පණිවිඩයක් එවලා."

"ඇයි හදිස්සියෙන්."

"ඉන්ටවිව් එකකට යන්ට වෙන්ට ඇති."

"මට ඔය මොඩ ඉන්ටවිව් ගිහින් එපා වෙලා."

"එහෙම කියලා හරියන්නෙ නැහැ. ගිහින් බලන්න."

"එතකොට අක්කගෙ මේ වාහනේ වැඩේ."

"මට වැඩ තිබුණා කියලා ඔයාගෙන් ඩ්‍රයිවර් වැඩේ ගන්න පුළුවන්ද? අම්මා මට බණීවි."

"එතකොට ඔයාට මාසෙට සල්ලි හම්බ වෙන්නෙ කොහොමද?"

"ඒකට මම ක්‍රමයක් හදාගන්නම්. ඔයා යන්න."

ඔහු කෙටි කල්පනාවකට මැදි වුණි. පංචලී ආරම්භ කිරීමට සූදානම් වන ව්‍යාපාරයට උදව් දීමට පොරොන්දු වූ හැටි සිහිවෙයි. උද්ගතව ඇති තත්ත්වය අනුව ඇයට උදව් නොකර බැරිය. එසේ වුවත් අම්මාගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට පුළුවන්කමක් නැත.

ඔහු රාත්‍රී ආහාරය ගෙන ඇඳට ගියේය. දැස් පියා සිටිය දී ඔහුට පංචලී සිහි වුණි. ප්‍රසිද්ධියේ නොපැවසුවත් ඇය උදව් ලැබිය යුතු තත්ත්වයේ සිටින යුවතියකි.

කිරි ව්‍යාපාරය ආරම්භ කිරීම සම්බන්ධව ඇය තීරණයක් ගත්තේ තම සහාය ඇති බව විශ්වාස කළ හෙයිනි. දැන් ඇය අතරමං කිරීමට පුළුවන්කමක් නැත. හැන්ඩ් ෆෝනය නාද වුණි.

WWW.SINHALAELIBRARY.COM 77

''මම මේ කතා කරන්ට හිතුවා විතරයි.''

සහන් පැංචලි කීවේ ය.

''ඇයි හදිස්සියෙන් කතා කරන්ට හිතුවේ. කමක් නෑ. සහන්ට අප නිසා හුඟාක් කරදර වුණා නේද? ආත්තම්මා මටත් වඩා සහන්ට ආදරෙයි.''

ඇගෙන් ඇසිය හැකි පෞද්ගලික ප්‍රශ්න රැසක් තිබුණි. එහෙත් ඒවා එසේ නෑසිය යුතුය.

''ඇයි කතා කළේ...?''

''නිකං කතා කරන්ට හිතුණා. ඔයා හෙට උදේ පාන්දරින්ම එන්ට ඕනෑ.''

''මම මේ කියන්නයි හිටියේ. හෙට එන්ට වෙන එකක් නෑ.''

''අනේ ඇයි..?''

ඈ කම්පා වූවාය.

''අපෙන් මොනවත් වරදක් වුණාද? අක්කා මොනවත් කිව්වද?''

''නෑ නෑ කවුරුවත් මොනවත් කිව්වෙ නෑ. හදිසියෙන් ගෙදර එන්න කියලා අම්මා පණිවිඩයක් එවලා තියෙනවා.''

ඇය එකවර පිළිතුරක් දුන්නේ නැත.

''අම්මා එන්න කිව්වා නම් නොගිහින් බැහැනෙ. ගිහින් ඉක්මනට එන්න.''

''ආපහු එනවා කියලා පොරොන්දු පිට නම් යන්ට බෑ.''

''අනේ ඇයි ඒ? අපෙන් වරදක් වුණාද?''

''වරදක් වුණා නෙමේ. ඒ මනුෂ්‍ය ජීවිතේ හැටි. හදිසි අනතුරකින් ඕනෑම වෙලාවක මිය යන්ට පුළුවන්. [illegible] පිපිරුණොත්..''



''මේ මින්නැති කතා කියන්ට එන්න එපා දන්නවාද? [illegible] නෙමේ බෝම්බයක් පිපිරිලා හරි [illegible]''

''එතකොට මෙක හොඳ කතාවක්ද?''

ඔහු ඇඳෙන් බැස කවුළුව අසලට [illegible]. [illegible] ඇත. සුදු සඳ රැස් පිට්ට පතිත වී ඇති [illegible] පෙනේ. [illegible] FM සේවාවකින් මිදී එන හින්දුස්ථානි ගීතයක හඬ ඇසෙයි. [illegible] දේව බර්මන් ගයන පාරුවීයක හඬ කොතරම් ලයාන්විත ද!

''අහනවා නේද?''

''මගේ හිතේ තියෙන ප්‍රශ්න කාටවත් කියලා වැඩක් නෑ. එහෙම නම් සහන් පරිස්සමින් ගිහින් එන්න.''

''එතකොට අපි කතා කරගන්න වැඩේ.''

''ඒවට වැඩිය ගෙදර යන එක ලොකුයිනෙ.''

''සමහරවිට මට ආපහු එන්ට වෙයිද දන්නෙ නෑ.''

''අනේ.. ඇයි ඒ...? එහෙම කරන්ට එපා. නාවොත් මම ඔයාට බලන්ට ගෙදර එනවා.''

''මම ආපහු එන්නෙ නෑ. අක්කා වාහනේට වෙන ඩ්‍රයිවර් කෙනෙක් අරගෙන.''

''එතකොට අපි නැවත හමුවෙන්නෙ නැද්ද?''

ඇය කතා කළේ හැඬුම් මුසුවය.

ඇගේ හැසිරීම තේරුම් ගැනීමට ඔහුට අපහසු වූයේ නැත. මෙය කිසිසේත් ඉවසිය නොහැකි දෙයකි. ඇය ඇමතිවරයාගේ අනියම් බිරිඳගේ දුව වුවද නිතරම ඔහු එම පිරිසට ආරක්ෂාව සපයයි. අනවශ්‍ය විහිළු කිරීමට ගියහොත් කරදරේ වැටීම සාමාන්‍ය දෙයකි. [illegible] වුවද අවවාද කළේ කිසිවෙක් හා අනවශ්‍ය බැඳීම් ඇති නොකර ගන්නා මෙන් කියාය.

WWW.SINHALAELIBRARY.COM 78

හිමිදිරියෙන් පිබිදුනු ඔහු නිවසට යාමට සූදානම් වී ආවේය.

"ඇයි මේ උදෙන්ම යන්ට හදන්නෙ...? ඉන්න උදේට කෑම කාලා යන්න."

"දැන්ම බඩගිනි නෑ. දවල් වෙලා කනවා. මම හෙට එන්නම්."

"නෑ නෑ එන්ට ඕනෑ නෑ. මගේ වැඩ මම කරගන්නම්."

ඔහු පිළිතුරක් නොදී මඳ වේලාවක් නිහඬව සිටියේය.

"මට ඔක්කොම ආරංචියි. ඔයාව ලොකු අමාරුවක වැටෙන්ටයි යන්නෙ."

"ඔයා මොනවද මේ කියන්නෙ...?"

"මම කට කැඩෙනකල් කිව්වා බහලවත්තෙ කෙල්ලව ආශ්‍රය කරන්ට එපා කියලා. ලසන්නට ගිවියට ඒ ඉන්නෙ ඇමතිවරයාගෙ හොර ගෑනිගෙ දුව. උන් දිහා කිසිම මනුෂ්‍යයෙකුට බලන්ට දෙන්නෙ නෑ. මරල හංගයි."

"අක්කට කියන්න ඕනෑ මොකද්ද කියලා කියන්න."

'ඒ කෙලි ලස්සන තමයි. ඒ වුණාට සම්බන්ධකමක් තියෙනවා නම් නතර කරන්ට."

"කිව්වම අහන්න. මගෙ එහෙම යාළුකමක් නෑ."

"එහෙම නැතිනම් හොඳයි. ඇමතියා දැනගත්තොත් ඔයාව ගහල මරයි. සේදර මට කිව්වා. සේදර ඔක්කොම දන්නවා."

අක්කා තමාට මේ අවවාද දෙන්නේ ආදරය නිසා බව ඔහු දනී.

"අපිට නැති බැරිකම් මුදල් ප්‍රශ්න තියෙන බව ඇත්ත. ඒත් අපි වැදගත් මිනිස්සු. මල්ලිට කටයුත්තක් කරනව නම් හොඳ වැදගත් දෙමාපියන්ගෙ දරුවෙක් වෙන්න ඕනෑ. හොර ගෑනියෙකුගෙ දුවක් අපට මොටද?"



"මාව වරදවා තේරුම් ගන්ට එපා. යාළුවෙන්ට හරි කසාද බඳින්ට හරි ගිත්දා කියනවා නෙමේ. මට නම් පංචලිගෙ වරදක් පේන්නෙ නෑ."

"අවජාතක කමට වැදපු ගෑනියෙකුගෙ ළමයෙක් බඳින්නෙ අහවල් දේකටද? ඔය වැදගත් දෙමව්පියන්ගෙ දරුවෝ ඕනෑ තරම් ඉන්නෙ. මම මල්ලිට හොඳ දෑවැද්දක් එක්ක ලස්සන කෙල්ලෙක් කතා කරන්ටයි ඉන්නෙ."

ඔහු සිනාසෙමින් අක්කාගේ කරට අත දමා ගේට්ටුව අසලට ගොස් පාරට බැස්සේය. අනුරාධපුරයට යන තෙක් ඔහුට වරින්වර පංචලිගෙන් ඇමතුම් ලැබුණි.

ඇය හා පැවැති ඇසුරේ බොහෝ වෙනස්කම් තිබුණි. පරතරය වෙනස් වී දැන් ඇය තමාගේ කිට්ටුවටම පැමිණ ඇති බවක් දැනේ. සාම්ප්‍රදායික විවාහයක් ඇගේ මවට නැත. ඇය බිහිකර ඇත්තේ ස්වභාව ධර්මයේ නීතියට අනුවය. ඇමතියගේ අනියම් බිරිඳගෙ දුව බව රටම දන්නා කරුණකි.

එයට පංචලි කිසිසේත් වැරදි නැත. වැඩිහිටියන්ගේ වරදින් සිදුවන වැරදිවලට කිසිත් නොදන්නා යොවනියකට වන්දි ගෙවීමට සිදුව ඇත. ලේකම්වරියක ලෙස කළ රැකියාව අතැර දමමෙ මුහුණ දුන් පීඩනය නිසා විය යුතුය.

අක්කා කතා කරන්නේ තමාව ආරක්ෂා කරගැනීමට බැව් සහන් දනී. ඒ අක්කා ලෙස තමාට ඇති ආදරය නිසාය. එම ඇමතිවරයා ඡන්ද ව්‍යාපාර ගැන දන්නා කපටි දේශපාලනඥයෙකි. ඔහුට විරුද්ධව නැගී සිටීමට කිසිවෙකුට පුළුවන් කමක් නැත.

WWW.SINHALAELIBRARY.COM 79

# 22

මෙවන් දුකක් කිසිදාක හදවතට දැනී නැත. මෙතෙක් කල් ජීවිතය පිළිබඳ සිහින තිබී නැත. ජීවිතය පිළිකුල් සහගත සිදුවීම් ගොඩකි. ළප්ජාව නිසා ඉවසා දරා සිටියත් මේ මෑතක සිට තමා සිටින්නේ සතුටින් පුනුවය. එයට හේතුව තුමක් දැයි ඇය දනී. ඔහු පිරිමියෙකුට තිබිය යුතු ජවයක් ඇති තරුණයෙකි. අසාධාරණය වෙනුවෙන් නැගී සිටිනා ශක්තිමත් තරුණයෙකි. ඔහු තමාට හා ආත්තම්මාට උපකාර කරන්නේ හැඟීමෙන් පුනුවය. ඉතින් පූජයේ පෙනෙනම සිටියේ තම ඇසුරේ උණුසුම ලබමිනි. තම ව්‍යාපාරය ඇරඹීමට ඔහු සහාය වූ හැටි මහතකි.

ඔහු ගේ ඇසුර නිල වශයෙන් සම්මත නොවූවත් කිට්ටුවෙන් සිටීමෙන් ද ලැබෙද් සතුටකි. අම්මා ගැහැනියෙක් ලෙස පිරිමියෙක් නිසා විඳින අවමාන අවජාත්සේරු විම ඇය දනී. ආත්තම්මා වුවද ඇය ප්‍රතික්ෂේප කර ඇත්තේ එනිසාය. කිසිදාක පිරිමියෙක් හදවතට පිවිසීමට ඉඩ නොතිබ්බේ අම්මා විඳින වේදනාව දන්නා හෙයිනි. එහෙත් තම හදවත ඉදිරියේ සැරිසරණ තිඩිවෙන් ඉන්නා බව ඇයට දැනුණේ සම්දා ඇසුරෙනි. ඉතින් දින සිටියේ හදවත සතුට පුරවාගෙනය.

සහන්! ගමට යන බව ඇසීමෙන් සිතට දුකක් පිවිසුණි. ඔහු



සාමාන්‍ය පුද්ගලයෙක් නොවේ. රියදුරෙක් ලෙස වෑන් රිය එලෙව්වත් උපාධිධාරියෙක් බව දැනගත්තේ මිතුරා ගේ නිවසේදී දකින ලද ඡායාරූපයෙනි. ඔහු කෙරෙහි තදබල ලෙස බැඳුණේ නිහතමානීකම නිසාය. කිසිවිටෙක තමා විශ්වවිද්‍යාල උපාධිධාරියෙක් බව පැවසුවේ නැත. මංජුල වැන්නවුන් ඉදිරියේ ඔහු කොතරම් ශ්‍රේෂ්ඨ මිනිසෙක්ද?

නින්ද පෙනෙන තෙක් මානයක නැත. දෙනෙත් තෙත් වූයේ ඇයි දැයි දනී. සහන්ට රැකියාවක් ලැබුණහොත් ඔහු නැවත මෙහි නොඑන බැව් ඇය දනී. එසේ නොනවතින මෙන් ඉල්ලා සිටීමට තරම් සිතුණේ නැත.

"ඇයි නින්ද යන්නේ නැද්ද?"

අම්මා විමසනු ඇසේ.

ඇය කොට්ටයේ මුහුණ හොවා ගත්තා විනා පිළිතුරක් දුන්නේ නැත.

"දවස තිස්සේ කරන විකාර අමතක කරලා පන්සිල් අරන් නිදා ගන්න."

දෑස් පියා සිටිය ද ඇය වෙත නින්ද ළඟා වූයේ නැත.

සහන් උපාධි පත්වීම සඳහා සම්මුඛ පරීක්ෂණයකට යන දිනයේ අම්මා හිමිදිරියෙන් පිබිදී කිරිබත් පිසුවාය. උපාධියක් තියාගෙන සම්මුඛ පරීක්ෂණවලට ගොස් දුක් විඳිනවාට වඩා පුංචි බණ්ඩා මෙන් කිරි හරක් ඇති කිරීම හොඳය. අම්මා නිවසින් පිටවීම සඳහා නැකතක් සාදා ගෙන පැමිණ තිබුණි.

"තුනුරුවන්ගෙ සරණින් මේ යන ගමන සාර්ථක වේවා කියලා හිතාගෙන යන්ට."

සීලවතී පුතාට කීවාය.

"අම්මා මම මේ යන්නේ බොරු ගමනක්. කවදාවත් පන්දමක් නැතිව රස්සාවක් ලැබෙන්නෙ නෑ."

WWW.SINHALAELIBRARY.COM 80

"එහෙම කියලා හරියන්නෙ නැහෙ මගෙ පුතේ."

"මම ඇප්ලිකේෂන් දාලා තිබුණ නිසයි යන්නෙ."

"ගිහින් අහන ප්‍රශ්නවලට හොඳට උත්තර දෙන්ටකෝ."

"එවරස්ට් කන්දෙ බර අහයි. මහවැලි ගඟේ දිග අහයි. ඒ වගේ මීහරක් ප්‍රශ්නයකින් උපාධිධාරියෙකුගේ දැනුම පරීක්ෂා කරන්ට පුළුවන්ද?"

"ගිය සැරේ වගේ ඉන්ටවීව් බෝඩ් එකේ අය එක්ක රණ්ඩුවට යන්ට එපා පුතේ. ඔය කියන දෙයක් අහගෙන ඉඳලා ඉන්න."

"දේශපාලන හෙන්චයියලාට යටත් වෙන්ට නම් ඇයි ඉඩම උකස් කියලා මට ඉගැන්නුවෙ."

ලැන්ඩ් මාස්ටරයෙන් නගරය වෙත යද්දි ඔහුට පැවලීගේ ඇමතුම ලැබුණි.

"ගුඩ් මෝනින්.."

ඔහුට ඒ සිහින් නාදය ඇසුණි.

"ගුඩ් මෝනින්. මොකද කරන්නේ...?"

"නවම ඇඳේ. කිසි දෙයක් කරන්න හිත නෑ."

"ගෑනු ළමයි ඔය විදිහට පස්ස පැත්තට එළිය වැටෙන කල් ඉන්න හොඳ නෑ. ගමවල ගෑනු නම් එහෙම නෙමේ. කිරි දෝලා, කෑම පිහලා, කුස්සියට ගිහින්."

"මට උණ හැදෙන්ට එනවා වගේ. මුළු ඇඟම සීතල වෙලා."

"මේ දවස්වල වෛරස් උණයක් තියෙනවා. අම්මත් එක්ක ගිහින් බේත් ටිකක් ගන්න."

"බේත් ඕනෑ නෑ. මැරිලා ගියාවෙ."

"කියන දේ අහන්ට. නිවමෝනියාවට එයි."

WWW.SINHALAELIBRARY.COM 81



"ඕනෑ නම් මැරෙයි. කාටවත් පාඩු නැහෙ."

ඇය පවසන්නේ කුමක්දැයි සහන් දනී. ඔහු පිළිතුරක් නොදී මඳ වෙලාවක් සිටියේය.

"අර පටන් ගන්ට ලෑස්ති වුණු කිරි ව්‍යාපාතියට මොකද කරන්නෙ...?"

"ඒක ඔහේ තිබුණාවෙ."

ඇය හැඬුම් මුසුව කතා කරන හඬ ඔහුට ඇසුණි.

"ඒවා ගිය දෙන්. මම කතා කළේ ඔයාට සුබ පතන්නයි."

"මට සුබ පතන්නේ මොටද?"

"සුබ පතන්නෙ රස්සාවක් ලැබෙන්ටයි කියලා."

"අපිට රස්සාවල් ලැබෙන කොට එළිවෙයි. නොලැබුණත් මම එක එකා පස්සෙ යන්නෙ නෑ."

අප්පච්චි ලවා සහන්ට රැකියාවක් ලබා දීමට හැකි වුවත් ඔහුව බාල්දු කිරීමට පුළුවන් කමක් නැත.

"හොඳයි කවද්ද එන්නෙ...?"

"බොහෝ දුරට මා නැවත එන එකක් නෑ."

"කවදාවත්ම."

"එහෙම ම කියන්නෙ නෑ."

"මම මැරිලා ඉන්න බව ආරංචි වුණොත් එනවද?"

"මොනවද මේ එන්නැති කතා කියන්නෙ...?"

"ඇයි අපි මැරෙන්නෙ නැද්ද?"

"එයා මගෙ ආයුෂත් අරන් තවත් බොහෝ කාලයක් ජීවත් වෙන්න ඕනෑ."

තමා කිසිම තේරුමක් නැති අනවශ්‍ය කතාවක් පැවසුවේ යැයි ඔහුට සිතිණි.

"හරි ආපු වෙලාවක හම්බ වෙන්න එන්නම්කෝ."

"ආපු වෙලාවක නෙමේ හෙට මාව හම්බ වෙන්න එන්න ඕනෑ."

"කොහොමද හෙට එන්නෙ. මම ගෙදර ආවෙ ඊයෙ."

"මම හෙට ඔෆිස් යන අන්තිම දවස. කොල්ලුපිටියෙදි හම්බව වෙමු. මේ අපි හමුවෙන අන්තිම දවස වෙන්ට පුළුවන්."

"එහෙමද?"

සහන් ආපසු නිවසට ආවේ නිශ්ඵල කටයුත්තකට කාලය යෙදීම ගැන දුක් වෙමිනි. තම වසරේ ඉගෙන ගත් බොහෝ දෙනෙක් කුඩා ප්‍රමාණයේ නොගැළපෙන කර්මාන්ත කරමින් සිටිති. ඇතැමෙක් නීති පරීක්ෂාව ද, ඇතැමෙක් ගිණුම් කළමනාකරණ පරීක්ෂණ සඳහා සූදානම් වෙති. පාසල් වියේදීම ශිෂ්‍යභට කණ්ඩායම්වල පුහුණුව ලද පිරිස ත්‍රිවිධ හමුදාවට බැඳී ක්‍රියාන්විතයේ සේවය කරති. ඕනෑම මොහොතක ත්‍රිවිධ හමුදාවේ උසස් නිලයකට යාමට පුළුවන. නෑ පරපුර හා සම්බන්ධ හමුදා නිලධාරීන් රැසක් වෙති. දුක් සහගත අත්දැකීම් රැසකට ද මුහුණ දී ඇත.

මෑත අතීතයේ වූ දුක්බරම සිදුවීම වූයේ පොඩි මාමාගේ එකම දුව වන කාංචනාගේ සැමියා ක්‍රියාන්විතයේ දී මිය යාමය. කන්‍යාරාමයේ උගත් ඇය හමුදා නිලධාරියෙක් සමග පෙමින් වෙළී සිට ඇත. ඇය කපිතාන්වරයා සමග විවාහ වී ඇත්තේ නිවසට රහසිනි. විභාගය අවසන්ව ගෙදරට දැන්වීමට සිතා සිටියත් ඇයට එම අවස්ථාව ලැබී නැත. දුව විවාහක කාන්තාවක් බව පොඩි මාමා දැනගෙන ඇත්තේ චන්ද්‍රනගේ අවමඟුල් දිනයේදීය. මරණයෙන් වසර කිපයක් ගතවුවත් තවම ඇය අවිවාහකය. නව නගරයේ පියාගේ ව්‍යාපාර බලාගෙන ජීවත් වන කාංචනාව ඉඳහිට සහන්ට



මුණ ගැසෙයි. මාමා සූදානම් වන්නේ කාංචනා නංගිව විවාහ කර දීමටය. මාමා රජයේ හා විරුද්ධ පක්ෂයේ මැති ඇමතිවරු දන්නා නිසා ඔහු නව නගරයට ගොස් හමුවන මෙන් පැවසුව ද සහන් එහි ගියේ නැත.

මහජන පුස්තකාලයට ගොස් පත්‍රය බලා දිවා ආහාරයට ගෙදර ගියේය.

"කොහොමද ඉන්ටර්විව් එක...?"

දොරට හේත්තු වී සිටි නංගි ඇසුවාය.

"වෙනදා වගේ හොඳට කෙරුණා."

"පුතා පොඩි මාමලගෙ ගෙවල් පැත්තෙ ගියේ නෑ නේද?"

"වෙලාවක් තිබුණේ නෑ අම්මා. මම නොගිය බව කොහොමද දන්නෙ...?"

නිවස තුළ සිටි කාංචනා සෙමින් එළියට ආවාය.

"කොයි වෙලේද ආවෙ...?"

"ඇවිදින් පැයක් විතර ඇති. අප්පච්චි කුඹුරට ගියා."

ඇය පසුපසට අත තබා ගවුම සකස් කර ඔහු අසලින් ඉඳගත්තාය.

"දවසක් ටෙලිවිෂන් එකේ ඉන්නවා දැක්කා."

"චන්ද්‍රනට හමුදාවේ සම්මානයක් තිබුණා. ඒක ගන්ටයි."

සහන් චන්ද්‍රන ගැන වැඩි තොරතුරු කතා කිරීමට ගියේ නැත. ඇය කතා කළේ සහන්ගේ රැකියාව පිළිබඳවය.

"රැකියාව ලැබෙන්නේ දේශපාලනය කරපු අයටයි. ඒක හරි අසාධාරණයි."

WWW.SINHALAELIBRARY.COM 82

''සහන් අයියා බය නැතිව ඉන්ටකො. අප්පච්චි ඒක බලා ගනී.''

''තව දෙන්නෙක් එක්ක අපි කිරි බිස්නස් එකක් කරන්ටයි යන්නෙ.''

''මේ පිස්සු කරන්නෙ නැතිව ඉන්න. බිස්නස් කරන්ට ඕනෑ නම් කොහෙවත් යන්ට ඕනෑ නෑ. අපිත් එක්ක ඉන්න.''

ඔහු පිළිතුරක් නොදී මද වෙලාවක් සිටියේය.

''මම මේ අප්පච්චි එක්ක ඉන්නෙ කැමැත්තෙන් නෙමේ. බල කරන නිසයි. සහන් අයියා අප්පච්චිත් එක්ක සම්බන්ධ වෙලා වැඩ කරන්න.'' කාංචනා කීවාය.

''නෑදෑයෝ එක්ක බිස්නස් කරන්න හොඳ නෑ.''

''පිස්සු විකාර කියන්ට එපා. මම ඉන්නෙ ලෝකෙම එපා වෙලා. අප්පච්චි හැමදාම මාව පොප් එකට එක්කගෙන ගිහින් මට කරන්නෙ කරදරයක්.''

''ඔයාට විතරක් නෙමේ මාමටත් ප්‍රශ්න තියෙනවා. ඒකයි ඔයාට එක්කාගෙන යන්නෙ.''

මෙතෙක් වෙලා සිත දැඩි කරගෙන කතා කරමින් සිටියත් කඳුළු නොසලා සිටීමට බැරි තත්ත්වයක් උද්ගත වී ඇතැයි සිතේ.

''නාඩා ඉන්න.''

''කොහොමද සහන් අයියේ නාඩා ඉන්නෙ. මම මහා අවාසනාවන්ත ගැහැනියෙක්. මගෙන් කිසි දෙයක් ගන්නෙ නැතිව එයාට අයිති ඔක්කොම දේවල් මට දීලයි ගියේ.''

ඇය පවසන්නේ කුමක් දැයි ඔහු දනී.

''මට දැන් ලොකු පඩියක් හම්බ වෙනවා. ඒක ඒ දෙමව්පියන්ට දුන්නම ඒ අය ගන්නෙත් නෑ. මම නොමැරී මැරී මැරී ඉන්නවා.''



''මෙක මේ කෲර යුද්ධයේ ප්‍රතිඵලයක්.''

''මගෙ හදහන විදිහට කසාද බඳින මිනිහා මැරෙන පාප ග්‍රහයෝ ඉන්නව කියලා මම එන්දුනට කිව්වත් එක්ක. ඒත් එයා පිළි ගත්තෙ නෑ. මම මහා කාලකණ්ණි අවාසනාවන්ත ගැහැනියක්.''

''මේ පිස්සු කතා නොකියා ඉන්න. මේ යුද්ධයේ ප්‍රතිඵල සමාජයට දරා ගන්ට අමාරු වෙලයි තියෙන්නෙ.''

''සහන් අයියා එන්න. ඔයා ඉන්න කොට මට අයින් වෙලා ඉන්න පුළුවන්.''

WWW.SINHALAELIBRARY.COM 83

# 23

පංචලි කාර්යාලයේ ලිපි ලේඛන භාර දී කාර්ය මණ්ඩලයෙන් සමුගත්තාය. සේවය කළ කෙටි කාලය තුළ දී ඇය හැම දෙනාගේම සිත දිනාගත් නිලධාරිනියක්ව සිටියාය. පැහැදිලිවම මෙය දේශපාලන පත්වීමකි. දේශපාලන පත්වීම් ලබා එන සේවක සේවිකාදීන් කෙරෙහි සෙසු පිරිසගේ පිළිගැනීමක් නැත. කුමන දේශපාලන පක්ෂයක් බලයට පත් වුවත් ඥාති සංග්‍රහ, පාක්ෂිකයන්ට උපකාර කිරීමේ ආදිය සුලභ දේවල්ය. පාක්ෂිකයන්ට, හිතවතුන්ට නෑයන්ට උපකාර කිරීම වැළැක්විය නොහැක. පංචලි තමා මුහුණ දෙන ප්‍රශ්න නිසා නොසොට්ටුවට පත්ව සිටියාය. පැහැදිලිව තමා ඔහුගේ නිනාඥානුකූල ඉව වුණා නම් මේ රැකියාව අතැර දමන්නේ නැත. ඔහු තමාගේ පියා බව ප්‍රකාශ කළහොත් එය ලජ්ජාවට හේතුවකි. එවන් තැනක සිටිනවාට වඩා පිටව යාම සතුටට හේතුවකි.

"මිස් යන එක ගැන නම් අපිට දුකයි. වෙන මිනිස්ට්‍රියකට යනවද?"

"නෑ මම ගෙදර නවතිනවා."

අමාත්‍යංශ කාර්යාලයේ සැමෝම සුබසාධක සංගම් ශාලාවට රැස්ව සිටි බවක් ඇය දැන සිටියේ නැත. කාර්යාලයේ සියලු



කටයුත්තක් කිරීමට නොහැකිව තිබුණේ පක්ෂ දේශපාලනය නිසයි. ඒ ඒ පක්ෂවලට අයත් වෘත්තීය සමිති වැඩ වර්ජනවලට වෙන වෙනම දායක වෙති. මොන යම් වැදගත් කටයුත්තක දී වුවද මතවාද මුල්වීම නිසා කිසිවක් කරගත නොහැක. ආයතනයේ සැමෝම එකා මෙන් එක්වූ මෙවන් අවස්ථාවක් අමාත්‍යාංශයේ කිසිදාක සිදුව නැත.

"මිස් පොඩ්ඩකට එක්ක යන්නයි ආවෙ.."

"මම එන එකේ තේරුමක් නැහැනෙ. අසංකා මා වෙනුවට වෙන කෙනෙක් එයි. එයා එක්ක කතා කරගන්න."

"නෑ නෑ සහෝදරී අපි එක්ක තේ එකක් බීලා යන්න එන්න ඕනෑ."

විමුක්ති පෙරමුණේ සහෝදරයා ගෞරව පෙරදැරිව ආරාධනා කළේය.

"තිච්චා වගේ සන්තෝසයි. වෙනින් දවසක එන්නම්. මට දුන් ගමනක් යන්ට තියෙනවා."

"මිස් ගැන අපි දන්නවා. අනුන්ට උපකාර කරනවා මිසක් ජරාව කන්නෙ නෑ. තැනක් හදන්න නම් ඔබ තුමී වගේ අය ගිහින් බෑ. ඉන්ට ඕනෑ."

ඇය මොහොතක් කල්පනා කළාය. මෙය හදිසියෙන් යොදාගත් කටයුත්තකි. සහන් තමා හමුවීමට පැමිණියහොත් මඟ හැරෙනු ඇත. එහෙත් මේ හැමදෙනාම පැමිණ සිටින්නේ කැමැත්තෙනි. ඔවුන්ගේ සතුට නැති කිරීමට ද නොපුළුවන.

අමාත්‍යාංශයේ සුබසාධක සංගම් ශාලාවේ අකුරු සිදුරු නැතිව සේවක පිරිස් රැස්ව සිටිනු ඇ දුටුවාය.

"මොකද විනීතා මෙච්චර සෙනඟ පිරිලා."

"මිස්ට ආයුබෝවන් කියන්න."

WWW.SINHALAELIBRARY.COM 84

කටයුත්තක් කිරීමට නොහැකිව තිබුණේ පක්ෂ දේශපාලනය නිසයි. ඒ ඒ පක්ෂවලට අයත් වෘත්තීය සමිති වැඩ වර්ජනවලට වෙන වෙනම දායක වෙති. මොන යම් වැදගත් කටයුත්තක දී වුවද මතවාද මුල්වීම නිසා කිසිවක් කරගත නොහැක. ආයතනයේ සැමෝම එකා මෙන් එක්වූ මෙවන් අවස්ථාවක් අමාත්‍යාංශයේ කිසිදාක සිදුව නැත.

"මිස් පොඩ්ඩකට එක්ක යන්නයි ආවෙ.."

"මම එන එකේ තේරුමක් නැහැනෙ. අසංකා මා වෙනුවට වෙන කෙනෙක් එයි. එයා එක්ක කතා කරගන්න."

"නෑ නෑ සහෝදරී අපි එක්ක තේ එකක් බීලා යන්න එන්න ඕනෑ."

විමුක්ති පෙරමුණේ සහෝදරයා ගෞරව පෙරදැරිව ආරාධනා කළේය.

"බිච්චා වගේ සන්තෝසයි. වෙනින් දවසක එන්නම්. මට දුන් ගමනක් යන්ට තියෙනවා."

"මිස් ගැන අපි දන්නවා. අනුන්ට උපකාර කරනවා මිසක් ජරාව කන්නෙ නෑ. කැනක් හදන්න නම් ඔබ තුමී වගේ අය ගිහින් බෑ. ඉන්ට ඕනෑ."

ඇය මොහොතක් කල්පනා කළාය. මෙය හදිසියෙන් යොදාගත් කටයුත්තකි. සහන් තමා හමුවීමට පැමිණියහොත් මග හැරෙනු ඇත. එහෙත් මේ නැමගෙදනාම පැමිණ සිටින්නේ කැමැත්තෙනි. ඔවුන්ගේ සතුට නැති කිරීමට ද නොපුළුවන.

අමාත්‍යාංශයේ සුබසාධක සංගම් ශාලාවේ අතුරු සිදුරු නැතිව සේවක පිරිස් රැස්ව සිටිනු ඇ දුටුවාය.

"මොකද විනීතා මෙච්චර සෙනඟ පිරිලා."

"මිස්ට ආයුබෝවන් කියන්න."



ඇය වචනයක් ගලපා ගත නොහැකිව සිටියාය.

"යමු ඉස්ටේජ් එකට."

"බෑ.. බෑ.. මම පහළ ඉන්නම්. මොවද මෙච්චර සෙනඟක්."

"ඔබ තුමීට ආචාර කරන්න."

ඇය වේදිකාවට නැග්ගේ අත්පොළසන් මධ්‍යයේය. සේවා කාලය තුළදී තමා අවංකවත් විශ්වාසවන්තවත් සේවය කළා හැර විශේෂ ක්‍රියාවක් කර නැත. ජීවිත කාලය තුළදී කෙනෙකුට අවංකවත් විශ්වාසවන්තවත් ජීවත් වනවා හැර වෙන කිසිවක් කළ නොහැක.

සහන් මැදිවූයේ තදබල ගැටලුවකටය. ගමට එන මෙන් දන්වා එවා තිබුණේ සම්මුඛ පරීක්ෂණයට යාම සඳහා පමණක් නොවන බව හැඟුණේ පොඩී මාමා පැමිණ සිටිනු දැකීමෙනි. කාංචනාගේ ප්‍රශ්නයට තවම විසඳුමක් නැත. දෛවය මිනිසුන්ගේ ජීවිතවලට තීන්දු දෙන හැටි පුදුම සහගතය. මුළු ලොවම අමතක කර ආදරය ඉදිරියේ තදබල තීන්දු ගැනීමට යෞවනයේ දී පෙළඹෙති. කාංචනා විවාහ වී ඇත්තේ කාටත් රහසිනි. හමුදා නිල ඇඳුමෙන් සැරසී සෙසු හමුදා නිලධාරීන් සමඟ මනාලිය කැඳවාගෙන විත් මධුසමය ගත කිරීම වැනි චාරිත්‍ර බද්ධ සිදුවීම් රැසක් ඉතිරිව තිබුණි. ඒවා කිරීමට සූදානම් කර තිබුණේ නිවාඩුවක් ලද පසුවය.

බලාපොරොත්තු ගොන්නක් හිස දරා සිටිය දී ඔහුට ඒ ඛේදජනක ඉරණමට මුහුණ දීමට සිදු වුණි. සිල් තැබූ පෙට්ටියේ සිටියේ කවරෙක් ද යන්නවත් දැන ගැනීමට ඇයට නොලැබුණි.

ඉපදීම හා මරණය පොදු සනාතන ධර්මයක්ය. එසේ පවසා සිත සනසා ගැනීම ලෙහෙසි කටයුත්තක් නොවේ. තමා අත් දුටු දුකින් මිදීමට ඇය අසමත් වූවාය. සටනේදී මියගිය විරුවාට පිරිනැමූ විර සම්මානය පිළිගන්ට ගියේ කාංචනාය. නිත්‍යානුකූල විවාහය ඔහුගේ එම නිලයට හිමි වැටුප හා වෙනත් දීමනා ලැබුණේ කාංචනාටය. දරු ගින්නෙන් සිටින සැමියාගේ දෙමාපියන් එම මුදල ඇගෙන්

www.sinhalaelibrary.com

පැහැර ගැනීමට වෙර නොදරුවාය. කාංචනා තමාට ලැබූ හැම දෙයක්ම ඔහුගේ දෙමාපියන්ට දුන්නාය. ඔහුගේ දෙමාපියන් පවා දුන් පොයන්නේ කාංචනාට විවාහයක් කර දීමටය.

අම්මා වටින් ගොඩින් මේ යෝජනාව ඉදිරිපත් කර තිබුණත් සහන් කිසි ප්‍රතිචාරයක් දක්වූයේ නැත. බාල කාලයේ පටන් එකට ඇසුරු කළ ජීවිතයක් තිබුණි. එකට සෙල්ලම් කඩ දමූ, වැලිබත් ඉව්ව, අටමස්ථානය වඳින්ට ගිය, වැවේ දිය සෙල්ලම් කළ යුගයක් ඔවුනට තිබුණි. වැව් කණ්ඩිය දිගේ පාසල් ගිය ජීවිතයක් තිබුණි. දෙමට මලක් සේ ලස්සන වූ එම ගැහැනු ජීවිතයට එබී බලන්ට ඉඩ නොතැබුවේ කාංචනාගේ වැඩිහිටියන් විසිනි. අද එම ගැහැනිය තමාට පිරිනැමීමට ඔවුන් සූදානම් වෙති. බොහෝ කලකට ඉහත ඇයට සෙනෙහසක් දක්වූ බවක් කිව යුතුය. එදා වූ සිතුවිල්ල එපරිද්දෙන්ම සුන්දර ලෙස කැටි කිරීමට නොපුළුවන. නැන්දාගෙන නොගියත්, එකට ජීවත් නොවුණත් ඇය විවස්තරයකුගේ වැන්දඹු ගැහැනියක්ය යන සිතිවිල්ල සිතින් බැහැර කිරීමට පුළුවන් කමක් නැත. ඇය හා ආදරයක් ගොඩ නගා ගැනීමට පහසු නැත.

ලබා ගැනීමට පුළුවන්ද නැද්ද යන්න වෙනම කතාවකි. තම සිත එක්තරා ගැහැනියෙක් උදුරා ගෙන ඇතැයි සිතේ. තමා මෙහි ආවේ ඇයි?

අක්කාටත් නොදන්වා ආවේ ඇය මෙම ගමනට අමනාප බැවිනි. අක්කාගේ වැන් රියේ වැඩ කළ සේදර දුන් සේවය කරන්නේ ඇමතිතුමා සමගය. ඇමතිගේ සියලු තොරතුරු ඔහු දනී. අද දෙමාපියන් කළ වරදවල්වලට දරුවන්ට වන්දි ගෙවීමට සිදුව ඇත. විවාහය වැනි වැදගත් අවස්ථාවලදී වැඩිහිටියන් පරම්පරාවන් ගැන ද විමසිලිමත් වෙති. පංචලි ඇමතිගේ අනියම් බිරිඳගේ දරුවෙකි. අද ඒ තත්ත්වය ඇගේ ඉදිරි ගමනට බාධාවකි. දුටු දිනයේ සිට සිතට මොනවා හෝ සිදුව ඇතැයි සිතේ. අනුරාධපුරයේ සිට මෙහි ආවේ ඇයි? රථ ගාලේ රැඳී සිටිය දී පැමිණි රියදුරු මිතුරන් සමඟ ඔහු කතා කරමින් සිටියේය.



"කෝ අද වැන් එක නැද්ද?"

"මම ආයෙ වැන් එකේ වැඩ කරන්නෙ නෑ."

"මල්ලිලාට නම් මේක කරකවන්නෙ නැතිව වෙන රස්සාවක් හොයාගන්ට පුළුවන්."

"ටෙලි නාට්‍යයකට හරි චිත්‍රපටයකට හරි යන්ටකො."

එක් අයෙක් සැවොම හිනැස්සවමින් කීවේය.

"පොඩි බිස්නස් එකක් පටන් ගන්නයි ඉන්නෙ."

"මොනවා පටන් ගත්තත් අපිව අමතක කරන්ට එපා. ඕනෑම දේකට අපි එනවා."

"බලමුකො."

ඔහු සිනාසෙමින් කීවේය.

පෙට්ටි කඩය දෙසට යන විට ඈතින් එන පංචලි දුටු නිසා ඔහු නතර වුණි.

"අන්න මල්ලිගෙ යාළු නෝනත් එනවා."

"හුඟාක් වෙලාද ඇවිදින්."

පංචලි සිනාමුසු මුහුණින් ඔහු අසලට එමින් ඇසුවාය.

"ටිකක් වෙලා. මම හිතුවෙ යන්ට ඇති කියලා."

"අමාත්‍යාංශයේ කට්ටිය උත්සවයක් ලෑස්ති කරලා තිබුණා. ඒකට ඉන්ට සිද්ධ වුණා."

රියදුරු පිරිස පෙට්ටි කඩයේ මුදලාලි සූදානම් කළ තේ පානය කරමින් සිටියහ.

"මේ මහත්තයාගේ තේ එක."

ඔහු තේ වීදුරුව අතට ගත්තේය. මෙවැනි පදික වේදිකාවේ අනවසර කඩයකින් ඇයට තේ පානය කිරීමට ආරාධනා කිරීමට ඔහුට සිතුණේ නැත.

WWW.SINHALAELIBRARY.COM 86

''මම තේ එකක් බීලා එන්නම්.''

''එතකොට මට නැද්ද?''

''මම හිතුවෙ ඔයා බොන එකක් නැහැ කියලයි.''

''ඇයි එහෙම හිතුවෙ. ඔයාගෙන් උගුරක් දෙන්න ඒ ඇති.''

''නෑ මිස් අපි ගාණෙ එකක් බොමු.''

''ඔෆිස් එකෙන් බීලයි ආවෙ. මම සහන් ගෙන් උගුරක් බොන්නම්.''

ඇය සියල්ලම සන්තෝෂ වන අයුරින් කීවාය.

මීට ඉහත ඇය හා ගමන් කළේ අක්කාගේ වෑන් රියෙනි. දැන් යන්නේ බසයෙනි. ඇය හා සිටින විට සිතට බොහෝ සමීප බවක් දැනේ. බසයට නැග්ගා විනා කිසිම අරමුණක් තිබුණේ නැත.

''අපි කොහේද යන්නෙ...?''

''මට කිසිම අරමුණක් නෑ. ඔයා කැමති තැනකට යමු.''

''මටත් එහෙමයි. ඔයාට තරම්වත් ජීවිතය පේන්නෙ නෑ.''

ඔබ මගෙන් සඟවා ගත් බොහෝ දේ තියෙනවා යැයි පැවසීමට සිතුණ මුත් ඇය නිහඬව සිටියාය.

''අපි මෙතනින් බහිමු.''

ඔහු කළ යෝජනාවට ඇය විරුද්ධ වූයේ නැත. පටු මාවත කෙළවර වන්නේ මහ සයුරෙනි. සයුරට සමාන්තරව දුම්රිය මග දිස්වෙයි. බලවේග දුම්රියක් ගාල්ල දෙසට දුව යනු පෙනේ.

''මට වෙලාවකට හිතෙනවා කෝච්චියට පැනලා මැරෙන්න.''

ඔහු පිළිතුරක් නොදී නිහඬව දුම්රිය පාරට පිවිසුණේය.

''බලාගෙන වන්නේ දෙපැත්තට කෝච්චි යනවා.''

''මැරෙන්න හිතෙනවා කිව්වෙ.. එන්න පාරට.''



''එහෙම බෑ. ඔයා තව හුඟ කාලයක් ජීවත් වෙන්න ඕනෑ.''

''ජීවිතයේ දුක විඳවමින් බොහෝ කාලයක් ජීවත් වීමේ කිසිම තේරුමක් නෑ. එන්න.''

ඇය මෘදු ලෙස ඔහුගේ අතේ එල්ලුනාය.

තරමක් දුර යනතෙක් ඔවුනතර කතාවක් වූයේ නැත. ඔහු ඇය සමඟ දුම්රිය මාවතෙන් පිටතට පැමිණ වෙරළට බැස්සේය.

''ඇයි මට එන්ට කිව්වෙ...?''

''හේතුවක් නෑ නිකං.''

ඇය අනතුරුව සිනාසුනාය.

අතින් ඇල්ලීමට තරම් හදබල හිතවත් කමක් අප අතර නැත. අක්කා පැවසූ කිසිවක් ඔහුගේ සිතේ රැඳී තිබුණේ නැත.

ඇමතිගේ අනියම් බිරිඳගේ දුවෙක් බව සැවොම දන්නා දෙයකි. එනිසා ඇය මේ ක්‍රියාකාරී සමාජයට සුදුසු නැතැයි කෙනෙකුට පැවසීමට පුළුවන්කමක් නැත.

''ඔයාට එන්ට කීමෙන් කළේ බලවත් වරදක්.''

''අනේ මේ කරදර කරන්නෙ නැතිව එන්න. අම්මා හොයයි. ඉක්මනින් යන්න.''

''අද මගේ ඔෆිස් එකේ අන්තිම දවස නිසා එන්ට රෑ වෙනවා කිව්වා.''

''ඔච්චර හොඳ රස්සාවක් අතෑරලා දුක් විඳින්න හදන්නෙ ඇයි..?''

''අද කෑම පැයේ ඔෆිස් එකේ ස්ථිර ලේකම්වරයාගෙ ඉඳලා පියන් දක්වා ඔක්කොම රැස්වෙලා මට යන්ට එපා කිව්වා.''

WWW.SINHALAELIBRARY.COM 87

''ඉතින් ඒකනේ කියන්නෙ. කවුරුත් යන්න කියන්නෙ නැතිව මොටද අස්වෙන්නෙ...?''

"ප්ලීස්... කරුණාකරලා මට බලපෑම් කරන්ට එපා."

"හරි නෝනා හරි..."

"මට නෝනා කියන්ට එන්නෙපා. මට බඩගිනියි සහන්. අපි කොහේ හරි ගිහින් කෑම කමුද?"

"බත් එකක් අරන් ගෙදර ගිහින් කන්න."

"ඇයි ඒ? ඔයා කන්නෙ නැද්ද?"

"ඔයා ලොකු මැති ඇමතිවරු ආශ්‍රය කරන ලොකු කෙනෙක්. මම මේ කුලී හයරිං වෑන් එකක් එළවන ඩ්‍රැයිවර් කෙනෙක්. අපි මෙහෙම ඉන්නවා ඇමතිතුමාට හෙම ආරංචි වුණොත් මාව මරලා දමාවි."

"ඔයාට මොනවා හරි කිව්වොත් මාත් මොනවා හරි කර ගන්නවා."

"දෙමව්පියන්ගෙ එකම බලාපොරොත්තුව වෙන්නෙ තමුන්ගෙ දරුවන් උගත් ධනවත් අය ආශ්‍රය කරනවා දකින්නයි."

"සහන් මාත් ආශ්‍රය කරන්නෙ උගත් බුද්ධිමත් කෙනෙක් තමා. යමු කොහේ හරි."

"මම අවවාදයක් දෙන්නම්. මේ විදිහට මිනිස්සුන්ට පහදින්ට එපා."

"මම කෙනෙක් විශ්වාස කළොත් මගෙ ජීවිතය වුණත් දෙනවා. මට සහන්ව මගේ ජීවිතයටත් වඩා විශ්වාසයි."

ඈ තෙත් වූ දෑසින් යුතුව කීවාය.



## 24

ගත කළේ කොතරම් ප්‍රීතිමත් දවසක් ද? මෙම දිනය මෙතරම් ඉක්මනින් ළඟා වෙතැයි ඇය කිසිවිටෙක සිතුවේ නැත. අනියම් බිරිඳගේ ගැහැනු දරුවෙකු ලෙස නිතරම තමා හෑල්ලුවට ලක්වන හැටි ඇය දනී. මේ ගැන අම්මාට දොස් පැවරීමේ තේරුමක් නැත. මිනිසුන් අතින් සිදුවන අනපේක්ෂිත වැරදිවල වගකීම බාර ගැනීමට සිදුවන්නේ ද ගැහැනුන්ට ය. ඔවුනට ලැබෙන්නේ පැසසුම්වලට වඩා ගැරහුම් ය. දරුවන්ට අම්මා තාත්තා කියන්නේ සිත සනසන සෙත සලසන දෙවියන්ගේ ආවේශයක්. තාත්තා කියන නෑනැත්තා කෙරෙහි තමාට එවන් ආදරයක් සිතේ ඇතිවන්නේ නැත. රාගික කටයුත්තක් නිසා මෙය සිදුවූවා නම් උපතේදී ම මරා දමා අම්මාට ලජ්ජාවෙන් මුදවන්ට තිබුණා. දැන් සිදුව ඇත්තේ අනුන් කළ වරදකට තමාට වන්දි ගෙවීමට ය.

මේ දේ සිදු වුණේ බලාපොරොත්තු නොවූ මොහොතකය. ජීවිතය පිරී තිබුණේ අමිහිරි අත්දැකීම්වලිනි. තපුරු සතුන් පවා සිය පැටවුන් ආරක්ෂා කරනවා. ඔවුන් දරුවන් පිරිවරා සිටීමට කැමතියි. ඇතින්න තුන්පත් රැන ලෙස සිටිනවා. දරුවන්ට කන්ට දීම පමණක් නොව ස්නේහය දැක්වීමත් ප්‍රධානයි. සිංහයන්, කොටින්, වලසුන් පවා දරු සුරතල් දකිනවා. තම පියා වන සමරතුංග අනියම් බිරිඳ

WWW.SINHALAELIBRARY.COM 88

බැලීමට එන්නේ හොර රහසිනි. කෑම බීම හා පාසල් ගාස්තු ගෙවීවත් පිය සෙනෙහස අහිමිය. එහෙත් ඔහු අම්මාට ආදරය කරන බව දනී. හැම දෙමව්පියෙක්ම සූදානම් වන්නේ තම දරුවාට වැදගත් නෑ පිරිසක් සම්බන්ධ කර දීමටය. කිසිදාක තමාට එවන් තත්ත්වයක් ඇති නොවන බව පංචලි දනී. රියදුරෙක් වශයෙන් ආවත් සහන් එවැන්නෙක් නොවන බව ඇයට තේරුම් ගොස් තිබුණි. එය ඔනෑකමින් වුවක් නොවේ. හැම පුද්ගලයෙක් වටාම රශ්මියක් ඇත. ඔහු සමඟ රථයේ ගමන් කරද්දී සිත තමාට අහිමි වූ හැටි සිහිවෙයි. මේ වගේ ආඩම්බර බැල්මක් සාමාන්‍ය පිරිමියෙකුට පිහිටන්නේ නෑ. මම මේ ඉදිරිපත් වීමේ ඇති සුවිශේෂ ආකර්ෂණයට කැමතියි. මේක එක දවසක වෙච්ච දෙයක් නොවේ. මා නිසා මංජුලට පහර දුන් හැටි, ආත්තම්මලාගේ නිවසට ගිය හැටි, කතරගම ගිය හැටි, දිනෙන් දින ඔහු තම හදවතට පිවිසීමට වරම් ඉල්ලූ හැටි. අපි හිත්වල පරතරයක් නැති තරමට ළංවූ හැටි සිහිවෙයි. මේ අහංකාර තැනැත්තා කවරෙක් ද යන්න හරියට තේරුම් ගත්තේ මිතුරාගේ නිවසේදී සහන්ගේ ඡායාරූපය දැකීමෙන් පසුවය.

උපාධි අඳුමෙන් ගත් ඡායාරූප, රග්බි ක්‍රීඩකයෙකු ලෙස මිතුරා සමඟ පෙනී සිටි ඡායාරූප දුටු දවසේ තම සැකය තහවුරු කිරීමට හැකි වුණි. එහෙත් තමා ඒ බව දන්නා බවක් නොපෙන්වීමට ඇය සිතා ගත්තාය.

මේ හදවත මට දෙයිද කියන්ට බෑ. මම මේ සම්ප්‍රදායික සමාජයට සුදුසු කෙනෙක් නෙමේ. හෝටලයට ආවේ මේ සියල්ල සිතේ ගබඩා කරගෙනය.

"ඇයි මේ වගේ තීරණයක් ගත්තේ...? ඇමැතිතුමාට ආරංචි වුණොත් දෙන්නවම මරලා දමාවි. අපිව නොහඳුනන පිරිසක් පැහැරගෙන යයි."

"මාව මැරුවට කමක් නෑ. ඒත් ඔයාට කිසි දෙයක් කරන්ට දෙන්නෙ නෑ. ඒ වෙනුවෙන් මම ජීවිතේ දෙනවා."

ඇය හැඬුම් මුසුව කීවාය.



"ඇයි මේ අඬන්නෙ...? මම නදබල විදිහට හිතලා කිව්වා නෙමේ. අයිම් වෙරි සොරි."

"නෑ නෑ ඔයා කිසි දෙයක් හිතලා කිව්වෙ නැති බව මම දන්නවා. ඒක තමා සැබෑ ඇත්ත. මම මේ ජීවිතයේ දී කාටවත් කරදර කරන්නෙ නෑ."

"මේ විකාර කතා නොකියා ඉන්ට."

"අනිත් අයට වඩා ඔයා මා ගැන දන්නවා. මා ගැන කොහොමද හිතෙන්නේ...?"

"විශේෂ යමක් හිතෙන්නෙ නෑ."

ඔහු මඳ සිනාවකින් මුව සරසා ගත්තේය.

"ඇත්ත කියන්න මා ගැන මුකුත්ම හිතෙන්නෙ නැද්ද?"

"කිව්වට ආඩම්බර වෙන්න එපා. මා දැක්ක ලස්සනම ගැහැනිය."

"එන්න එපා බොරු කියන්න."

ඇය සෙමින් පහරක් ගැසුවාය.

මේ වගේ දෙයක් කෙළින්ම මූණට පවසාවි යැයි ඇය කිසි විටෙක සිතුවේ නැත. ඒත් මෙවැන්නක් ඔහුගේ සිතේ සැඟව ඇති බව ඇය දැන සිටියාය.

"එහෙනම් මම මා ගැන කියන්නද?"

"මට ඔයා ගැන දැනගන්න නදබල ඕනෑකමක් නෑ."

කෙටි නිහඬ බවක් ඇති වුණි. ඇය ලේන්සුවෙන් දෙනෙතේ රැඳුණු කඳුළු පිසදමා ගත්තාය.

"මම අවජාතක කෙල්ලෙක්. මගේ උප්පැන්නේ පවා තාත්තා කෙනෙක් ගැන කිසිම සටහනක් යොදලා නෑ."

WWW.SINHALAELIBRARY.COM 89

"ජීවත් වෙලා ඉන්න ගැහැනියෙකු අවජාතක භාවය හෝ සුජාත භාවය විම සොයන්න කිසි කෙනෙකුට අයිතියක් නෑ."

"ඒක නෙමේ මම කිව්වෙ සහන්. අපේ තාත්තා අම්මව නීතියෙන් කසාද බැඳලා නෑ. ඒක ප්‍රසිද්ධ රහසක්."

"ඉංග්‍රීසින් ආවට පස්සේ තමා විවාහ නීතිය බලධාරී වුණේ. ඊට කලින් මිනිස්සු විවාහ නොවී ජීවත් වුණා."

"ගැහැනු මිනිස්සු කවුරුත් විශ්වාසයෙන් හා අවබෝධයෙන් කටයුතු කරන තාක් කල් නීතියක් අවශ්‍ය නෑ තමා. තාත්තා අම්මාව වංචා කරලා අනාථ කරලා."

"මට තේරෙනවා මැඩම් අසරණ වෙලා තියෙන හැටි."

"දූන් ඉන්න ගමේ මිනිහෙක් අපි දිහා බලන්නෙ නෑ. හිනාවෙන්නෙ නෑ. අපි ඉන්නෙ අනාථයෝ වගේ."

"බොහෝ ඇමැතිවරු තමුන්ගේ බලය පරිහරණය කරන්නෙ නරක විදිහටයි."

"ඒ නිසා තමයි මම මේ රස්සාව අතහැරියේ. මට ආත්ම ගෞරවයක් තියෙනවා. මට නිදහසක් ඕනෑ."

ඔහු පිළිතුරක් නොදී මඳවේලාවක් නිහඬව සිටියේය. ඇත්තටම ඇගේ කතාව අගය කළ යුතුය. මෙවැනි ශක්තියක් සිතට පිවිසෙන්නේ ඇත්තේ පීඩනය තුළිනි.

"දූන් ඉතින් කෑම කන්න."

"ඔබ කෑම කන්නම්. ඉස්සෙල්ලා කඳුළු පිහදාගන්න."

ඔහු පිඟාන ගෙන ඇගේ පිඟානට කෑම බෙදීමට සූදානම් වෙද්දී ඔහුගේ අතින් අල්වා ගත්තාය.

"එපා මට ඔය විදිහට සලකන්න. මට ඒක දරා ගන්න බැරි වෙයි."



"මම මේ කරන වැඩේ කරන්න ඉඩ දෙන්න."

"බෑ බෑ මමයි ඔයාට බෙදන්න ඕනෑ. ඔයාව මෙහෙම තැනකට එක්කරගෙන ආවේ ඒකයි."

"හරි ඔයා මට කෑම බෙදන්න. මම ඔයාට බෙදන්නම්."

"එපා සහන් මට ඒ වගේ කියන්න. මේ වගේ කතාවක් අහන්න මම සූදානම් නෑ. කවුරු හරි මට මෙහෙම කතා කරයි කියලා හිතුවේ නෑ."

"ඔයා වගේ කෙල්ලෙකුට කොල්ලෝ ඕනෑ තරම් කතා කියයි. ඔයාට මගෙන් වෙන්න ඕනෑ මොනවද? ඒ ඕනෑ දෙයක් කරන්නම්."

"මා දිහා බලන් හිටියොත් ඇති."

ඒ කොතරම් ගැඹුරු කතාවක්ද? සහන් එදින නතර වුණේ මිතුරෙකුගේ නවාතැනකය. මිතුු විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබද්දී හොඳ දක්ෂයෙක් ලෙස ප්‍රසිද්ධව සිටියේය. ශිෂ්‍ය සංවිධානයකට සම්බන්ධව සිටි මිත්‍රයා කලක් දේශපාලන කටයුතු සඳහා රටින් බැහැරව සිටියේය. දැනට එම රාජ්‍ය නොවන සංවිධානය මගින් පළ කරන පත්‍රයේ සංස්කාරක වශයෙන් සේවය කරයි.

මිතුරන් දෙදෙනා හමුවුණේ සෑහෙන කලකට පසුවය.

"එන බව කලින් දැන්නුවා නම් අපිට කොහේ හරි ගිහින් කෑම කන්න තිබුණා."

මිත්‍ර කෑම පාර්සලය දිග හරිමින් කීවේය.

"මේ හොඳටම ඇති. අපි කෑම පස්සේ එලවන්නෙ නැනෙ."

"උඹව මට නිතරම මතක් වෙනවා."

"මටත් මතක් වෙනවා. කිසිම බරපතළකමක් නොතේරුණ ළමා කාලය කොච්චර හොඳද? ටක් ෂොප් එකෙන් වඩේ දෙක

WWW.SINHALAELIBRARY.COM 90

කාලා ප්ලේන්ටිය දෙකට කඩාගෙන බීලා ඩබල් දාලා කබල් බයිසිකලේ ගිය හැටි...''

''හුඟ දෙනෙක් අමතක කළාට උඹව මට අමතක කරන්න බෑ. අපි සාහිත්‍ය සාකච්ඡා කළ හැටි මතකයිනෙ. ඒවගේ කවි නැවත ලිව්වෙ නැද්ද?''

''මුළු ජීවිතයම කවියක්.''

''ඇත්තටම මම කැමති අන්න ඒ වගේ ප්‍රසන්ගේෂන්වලටයි. දැන් උඹ මොකද කරන්නේ...?''

''විශේෂ යමක් නෑ.''

''අපි හැමදෙනාගේම බලාපොරොත්තු ප්‍රාර්ථනා ඔක්කොම විනාශ වෙලා ගියා. නිර්මලී මට ළඟදී හොස්ටල් එකේදි හම්බ වුණා.

ඔහු පිළිතුරක් නොදී නිහඬව සිටියේය. නිර්මලී වෙනත් විවාහයක් කර ගැනීමට ප්‍රථම තමා හමුවීමට පැමිණි හැටි ඔහුට සිහිවුණි. තම දැන් ඇගේ කඳුළෙන් තෙත් වූ හැටි සිහිවෙයි. තමා විවාහ කර ගන්නා මෙන් ආයාචනා කළ හැටි මතකය. සැප සම්පත් විඳින ගැහැනියක්ව එම ජීවිතයෙන් උදුරා ගැනීම අසාධාරණය. ඇය විවාහ වූයේ ධනවත් ව්‍යාපාරිකයෙක් සමඟිනි. තමා ඇය කැඳවාගෙන ආවා නම් දුක් විඳීමට සිදු වෙයි.

''මාව දකලා කෙල්ල ඇඬුවා. උඹ කෝ කියලා ඇහුවා.''

''මම මොනවා කරන්නද? අපි ඉදිරියේ සියලු සැප සම්පත් ඇති 'කේතුමතීනම්' මහා රාජධානියක් ඇතැයි කියලා හිතන්ට බෑ. ඒක මිරිඟුවක් විතරයි.''

''මුදලාලි නිර්මලීට වඩා වැඩිමල්. අතේ ඇඟිලිවල රත්තරන් පුරවලා හිටියා. මොනවා වුණත් උඹ කළේ මහා පව්කාර වැඩක්.''



''මා එක්ක ආවා නම් නිර්මලී දුක් විඳිනවා. බලපන් තවම මට රස්සාවක් නෑ.''

''දැන් නිර්මලී සැප විඳිනවයි කියල ද උඹ හිතන්නේ. ආදරයෙන් බැඳුනා නම් දෙන්නා දුක සැප බෙදා ගන්ට ඕනෑ.''

''මිනිසුන් කියන කේතුමතී නම් රාජ්‍ය තියෙන්නේ ධනය මත නොවේ. මිනිසුන්ගේ හදවත් තුළයි. ඒ ලස්සන කෙල්ල කමකට නැති මිනිහෙක් එක්ක ගිහින් සතුටක් ලබනවද?''

කිසිම රසක් නැති කැම පාර්ලයෙන් කෑවේ කටවල් කීපයකි. ඔහු පයිප්පයෙන් අත සෝදා එළියට ගියේය. අහස කළු වලස් හමක් මෙන් අඳුරෙන් යුතුය. අඩු වශයෙන් එක තරුවක්වත් නැත. තනිවීම හා වෙන්වීම පිළිබඳව ආත්මා ගයන ගීතය ගුවන් විදුලියෙන් නිකුත් වනු ඇසේ.

''දැන් ඉතින් ගිය දේ ගියාවෙ. උඹට ඒකී අයිති නෑ. ඒකයි හේතුව. මොනාද හෙට කරන්නේ...?''

''දවසක් දෙකක් මෙහෙ නතර වෙන්නයි හිතන් ඉන්නේ.''

''ඒකට කමක් නෑ. තැන් තැන්වල රස්තියාදු වෙන්ට ඕනෑ නෑ. මේ පත්තරේට සම්බන්ධ වෙලා වැඩ කරමු. අර ඉස්සර ලිව්ව කතාව පත්තරේට ලියපං.''

ඔහු නිහඬව සිටියේය.

''ඇයි මුකුත් ප්‍රශ්නයක් ද?''

''මම කෙනෙකුට පොරොන්දුවක් දීලා තියෙනවා.''

''කෙල්ලෙකුටද?''

ඔහු සිනාසෙමින් ඇසුවේය.

WWW.SINHALAELIBRARY.COM 91

''රුවිරත් සම්බන්ධයි. තිස්ස ඉඳලා කිරි ගෙනැල්ලා විකුණන්නයි.''

ඔහු මඳ වේලාවක් කල්පනා කළේය.

"ඒ අදහස නම් වැරැද්දක් නෑ. දේශීය කිරි ව්‍යාප්ත කිරීම ජාතික කටයුත්තක් තමයි. ඒත් උඹට තියෙන්නේ වෙනම වැලත්ව එකක්. ඇවිදින් පත්තරේ බාර අරන් කරපං."

මිතුරා ගිය පසු තවත් වේලාවක් එළියට වී සිටියේය. පංචලීගේ ඉල්ලීමට කැමති වූවා විනා එතරම් ව්‍යාපාර දැනුමක් නොතිබුණි. සියල්ල අමතක කිරීමට හෙතෙම දැඩි උත්සාහයක නිරත වුණි.

නිර්මලී පිළිබඳව වූ සිදුවීම අමතක කිරීමට ඔහු ආයාසයෙන් වෙර දැරුවේය. ඔබ මට අයිති නෑ.

දෑස් පියා සිටියදී හැන්ඩ් ෆෝනය නාදවනු ඇසුණි. ඔහු එකවරම ඇගේ කටහඬ හඳුනා ගත්තේය.

"නිදිද?"

"නිදි නෑ. ඇඳට වෙලා ඉන්නවා. ඒක නෙමේ අම්මා බැන්නද?"

"පරක්කු වුණේ ඇයි කියලා ඇහුවා. එච්චරයි. රෑට කෑවෙ මොනවද?"

"යාළුවා බත් එකක් ගෙනැත් දුන්නා."

"මම අද කරදර කළා නේද?"

"ඔව් කරදර කළා. මමයි කරදර කළේ."

"දුන්න ගෙදර යන්නෙ නෑ නේද?"

"මගේ යාළුවා වැඩ කරන පත්තරේ වැඩ කරන්න එන්න කිව්වා. තවම තීරණයක් ගත්තෙ නෑ."

"අනේ ඉතින් ඒකට යන්නකෝ. ඔයාට ගැළපෙන්නෙ ඒ වගේ රස්සාවක් තමයි."



"එතකොට කිරි බිස්නස් එක."

"ඒ ගැන සහන් කරදර වෙන්ට එපා. අපි ඒක බලා ගන්නම්. පිටින් ඉඳලා මට උදව් කළාම ඇති."

"මම පත්තරේට යන්න තවම තීරණය කරලා නෑ."

"නෑ නෑ යන්නම ඕනෑ. මම මගේ වැඩ බලාගන්නම්."

"බලමුකෝ.."

"බලමුකෝ නෙමේ... තොට කොහොම හරි මට හම්බ වෙන්න ඕනෑ. තියනවා.. අම්මා ආවා. තියනවා. ගුඩ් නයිට්. බුදුසරණයි."

ඇය වෙන්වී යන හඬ ඇසුණි.

WWW.SINHALAELIBRARY.COM 92

# 25

වත්සලා දුවගේ හැසිරීම පිළිබඳව නිරීක්ෂණාත්මකව බලා සිටියාය. දුව කෙරෙහි හදවතේ ඇත්තේ අසමාන වේදනාවකි. දෙමව්පියන් සිටින වෙනත් පවුල්වල දරුවන් කොතරම් සතුටින් ජීවත් වෙනවාද? ඔවුනට දෙමව්පියන්ගේ රැකවරණය, ආරක්ෂාව ඇත. පංචලිට පිය සෙනෙහසක් නැත. විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙමින් ඇය දුව ආරක්ෂා කළේ හුදකලා සටනක යෙදෙමිනි.

දේදුන්න වගේ කොච්චර පැහැය තිබුණත් කෙනෙකුගේ ආදරයට හසුනොවී ආඩම්බරව ඉන්න හැටි.

තියෙන්නේ පුදුමාකාර ආඩම්බරයක්. තමාගේ ජාතක පියා ඇමැතිවරයෙක් වුවත් ඔහු යටතේ වැඩ කිරීමට අකැමැතිව සියල්ල අතහැර පැමිණ සිටින හැටි. පරිපාලන කටයුතු පිළිබඳව ඇයට හොඳ දක්ෂතාවයක් ඇත. අමාත්‍යාංශය තුළ ඇය තමාට වඩා ජනප්‍රිය චරිතයක් බව පියා විසින් පැවසූ හැටි වත්සලාට මතකය.

රැකියාව අතහැර සිටියත් ඇය දූන් පසුවන්නේ සතුටින් යුතුවය.

තමාට ජීවිතය අහිමි වීම පිළිබඳව පශ්චාත් පරීක්ෂණයක් කිරීමට අවශ්‍ය නැත. ඇය කිසිදාක විවාහ නොවන බවට ප්‍රකාශ කළ හැටි මතකය. ඇය සමහර විට ඒ තමාට සිදු වූ සිදුවීම නිසා



ගත් තීරණයක් විය හැක. එහෙත් ඇය දූන් පසුවන්නේ සතුටින් යුතුවය.

මේ හැමදෙයක්ම සිදුවූයේ වැන් රියේ සේවය කරන සහන් පැමිණීමෙන් පසුවය. ඔහු හිත හොඳ විශ්වාසවන්ත රියදුරෙක් බව ඇය දන සිටියාය. අම්මා හැඳිබල ලෙස පැහැදී සිටියේ ඔහු කළ උපකාර නිසාය. මෙම තරුණයා නිසා දුවගේ සිත අවුල් වී ඇතැයි වත්සලා සිතුවාය. කිසිදාක එවැනි දෙයක් සිදුවිය නොහැක. රියදුරෙක් හා සබඳතා පැවැත්වීම කිසිසේත් අනුමත කළ නොහැක. මේ බවක් දුවගේ පියාට ආරංචි වුවහොත් පැහැදිලිව ඔහුට විපතක් සිදුවනු ඇත. නෑයාගේ නිවසේ නතරව සිටින අම්මා හමුවීමට ගියේ මේ පුවත දැන්වීම සඳහාය.

වත්සලා මිදුලේ අසුන්ගෙන සිටින මව අසලට ගියාය.

"අම්මට ඇහැ පෙන්වන්නට තියෙන්නේ කවද්ද?"

"දුවට පහසු දවසක යමු. ඇයි තනියම ආවේ කෝ පොඩි දුව...?"

"දුව ගෙදර ඉන්දෙද්දී ආවෙ..."

"දූන් පොඩි දුව අර කිව්ව කිරි වැඩේ පටන් ගන්නද යන්නෙ...?" මව ඇසුවාය.

"අනේ මම දන්නෙ නෑ අම්මා. අමාත්‍යාංශයේ කොච්චර තැනක් තිබුණද? දුව එනකොට සමහර අය ඇඬුවලු. අද වුණත් රස්සාවට යන්න පුළුවන්."

"පොඩි දුව මට ඇවිදින් කිව්වා. ඒ ළමයගෙ කතාව ඇත්ත. දේශපාලන පත්වීමක් ගන්න එක අනුන්ගෙ රෙදි අපුල්ලනවා වගේ. තමුන්ගෙ වැඩක් කර ගන්න එක ඊට හොඳා."

වත්සලා පිළිතුරක් නොදී නිහඬව සිටියාය. දෙමාපියන් දරුවන් පිළිබඳ අනේකවිධ බලාපොරොත්තු තබා ඇත. තමාට තම දුව

WWW.SINHALAELIBRARY.COM 93

වැදගත් ලෙස විවාහ කර දීමට ලැබුණේ නැත. දැන් ඒ ගැන කතා කළ නොහැක.

"ඇයි දුව දුකින් වගේ."

"පොඩි දුවගෙ මොනවාහරි වෙනසක් තියෙන බව අම්මාට තේරෙන්නෙ නැද්දමෙ?"

"මොයි වගේ වෙනසක්ද? ඒ ළමයා දැන් සන්තෝසෙන් ඉන්නවනෙ. තරුණ වයසෙදි නොයෙක් වෙනස්කම් ඇති වෙන්න පුළුවන්."

"ඒක තමා අම්මා මම කියන්නෙ."

"ඇයි ඉතින් ඔය මළවිකාර ඔළුවෙ දාගන්නෙ නැතිව සන්තෝසෙන් හිටියම මොකද?"

"අම්මා එක්ක යාළුයිනෙ. කා එක්ක හරි යාළුකමක් තියෙන බවක් අම්මට කිව්වද?"

"එහෙම දෙයක් තියෙනවා නම් මට කියන්න කියලයි තියෙන්නෙ. ඇයි එහෙම දෙයක් තියෙනවද?"

"අම්මා දුව සහන් එක්ක යාළු ඇති කියලයි මට හිතෙන්නෙ."

ආත්තම්මා පිළිතුරක් නොදී තරමක් වෙලා සිටියාය. පැහැදිලිව සහන් හොඳ හිතමත් තරුණයෙකි. පොඩි දුව බුද්ධිමත් තරුණියකි. තමා යන රටේ වියදුරා සමඟ මිත්‍ර වීමට තරම් ඇය බොළඳ තරුණියක් නොවේ.

"සහන් ගැන මොනවත් කිව්වෙ නැද්ද?"

"සහන් නැවත වාහනය ඩ්‍රයිව් කරන්න එන්නෙ නැහැයි කිව්වා."

"ඇයි දුව එන්නෙ නැති හින්දද?"

ඇය තදබල ප්‍රශ්නයකට මැදිව කීවාය.



"දුව කෙළින්ම පොඩි දුවගෙන් අහන්න. එහෙම අහන්න අයිතියක් තියෙනවනෙ."

"අම්මා ඇමැතිතුමාට ආරංචි වුණොත් ලොකු කරදරයක් වෙයි. ඒ කොළුවාව මරලා දමයි. ඩ්‍රයිවර් කෙනෙක් එක්ක යාළුවෙන්න මේ කෙල්ලට ලජ්ජා නැද්ද?"

"ගැහැනුන්ට ජීවිතයේ කිසිම ප්‍රමිතියක් නෑ."

අම්මාගේ කතාව නිසා සිතේ ඇතිවුණේ වේදනාවකි. ඔහෑ වෙලාවක දොස් කියන එක තමයි වැඩේ.

"ඩ්‍රයිවර් විතරක් නෙමේ අතපය නැති කොටෙක් එක්ක ජීවත් වෙච්ච කතන්දර තියෙනවා. ගැහැනියෙකුට ජීවිතයේ දී ඕනෑම දෙයක් වෙන්ට පුළුවන්."

"මගේ ඔළුව පිස්සු වෙන කතා කියන්ට එපා. අතපය නැති කොටෙක් එක්ක ගිය කතා තියෙන්නේ ඉස්සර."

"එහෙම නම් බය වෙන්න එපා. ඒ ළමයා මෝඩ තීරණ ගන්න කෙනෙක් නෙමේ."

"අම්මා දෙන්නා කිරි බිස්නස් එකක් පටන් ගන්ට යනවා. අම්මත් බුරුල දුන්නා වැඩියි."

"දුව ඒතරම් මෝඩ ළමයෙක් නෙමේ. ඒ ළමයින්ට වැඩ කරන්ට දුන්නා නම් ඉවරයිනෙ."

"නොදන්න කාලෙ අපි කරපු වැඩ හින්දා මට ජීවිත කාලය පුරාම දුක් විඳින්ට සිද්ධ වෙලා තියෙනවා. මම විඳින දුක මේ හිගන්නිට අයිති වෙන්න ඉඩ දෙන්ට බෑ."

ඇය දෙනෙතේ නැඟුණු කඳුළු පිස දමා ගනිමින් කීවාය.

"මේ වගේ බිස්නස් එකක් කරනව නම් කෙනෙකුගේ උදව් ඕනෑ."

WWW.SINHALAELIBRARY.COM 94

"අම්මා මෙයාට මේ වගේ දුක් විඳින රස්සාවක් කරන්ට ඕනෑ නෑ."

"සභාපති කමක් වුණත් කරන්ට පුළුවන් බව ඇත්ත. ඒ ළමයා කැමති නැත්නම් මොනවා කරන්නද? හරි දුන් මට මොකද්ද කරන්න කියන්නේ."

"සහන් එක්ක සම්බන්ධයක් තියෙනවද කියලා කෙළින්ම අහන්න."

"ඉන්නකෝ මම හොඳ වැඩක් කරන්නම්."

තමා විසින් මේ කරන්නේ බලවත් වරදකැයි සහන්ට සිතෙයි. පැහැදිලිවම තමා මේ කරන්නේ සද්භාවයෙන් යුතුවය. නොපැවසුවත් ඇය බරපතළ ගැටලුවකට මැදිව ඇති බව ඔහුට වැටහෙයි. මෙවන් අවස්ථාවක මඟහැර යාමට පුළුවන් කමක් නෑ. තමා මේ ඇයට උපකාරයක් සඳහා පමණක් පැමිණි ගමනක්ද? ත්‍රීවිලරයෙන් බැස එන යුවතිය දුටු සැනින් කොහේදෝ නැති සතුටක් සිතට පිවිසුණි. ඇය නිහඬව රථයෙන් බැස සහන් දෙසට ගියාය.

"මම ටිකක් පරක්කු වුණා."

"ඒකට කමක් නෑ. ඇයි එන්ට කිව්වෙ...?"

"ම්.. දුන්ම ගෙදර යන්නෙ නෑ නේද?"

"කුඹුරු වැඩක් තියෙනවා. යන්ටත් ඕනෑ. එතකොට අර කතා කරගත්ත කිරි වැඩේ කරන්නෙ කොහොමද?"

"ඒකට අපි වෙන වැඩපිළිවෙලක් යොදා ගන්නම්. සහන්ගෙ වැඩ පාළු කරගන්ට එපා."

ඔහු පිළිතුරක් නොදී මඳ වේලාවක් සිටියේය.

"පන්සලේ වැඩට යනවා නේද?"

ඔහු හිස වනා පිළිතුරු දුන්නේය. ඇය නිහඬව අත දිගු කර ත්‍රීවිලරයක් නතර කළාය.



"නගින්න.."

ඈ ඉල්ලා සිටියාය.

"කොහේ යන්නද?"

"ගියාම බලන්නකෝ. බයවෙන්න එපා. මයාව පැහැරගෙන යනවා නෙමේ."

ඇය සිනාසෙමින් කීවාය.

"ඇමැතිතුමාගේ දුවෙක් නිසා බයයි."

"නෑ නෑ මම කාගෙවත් දුවෙක් නෙමේ. මම එක්තරා... නෑ නෑ.. ඒක කියන්ට ඕනෑ නෑ."

"අපි කොහේද යන්නෙ...?"

කුලී රිය කැලණිය පන්සල ඉදිරියේ නතර කරන විට ඔහු ඇගේ අදහස තේරුම් ගත්තේය. පනුයේ ඨ.කියාවට යාමට ප්‍රථම පන්සලට ගොස් බුදුන් වැඳීමට ඔහු සිතා සිටියේ ය. ඇය නිහඬව තෙල් මල් මිලයට ගත්තාය. සහන් නිහඬව ඇය පසුපස ගමන් කළේය.

පූජා භූමියේ සිටින විට සිතට දනෙන්නේ අමුතුම සැනසීමකි. ඇය පූජා භාණ්ඩ සකස් කරනතෙක් ගෙතෙම ඇතට වී බලා සිටියේය. කවදාවත් මෙවන් සැනසිල්ලක් ලැබී නැත. පහන් දල්වූයේ එකටය. ඇය දල්වූ පහන් තිරයෙන් ඔහු පහන දල්වූයේය. ඔහු නැඹු තැනින් ඈ මල් තැබුවාය. මේ හැම දේකම නිශ්චිත අරුතක් නැතත් සතුටට හේතු වූ රහසක් ඇත.

පැන් කළය අතින් ගෙන ඔහු ඇය සමඟින් බෝධියට වත් කළේ සන්සුන් සිතින් යුතුවය. ඇය වැලි මළුවේ ඉඳගෙන තමාටත් අසුන් ගන්නට ආරාධනා කළේ කොතරම් බලාපොරොත්තු ඇතිවද? අප අතර මෙවන් විශ්වාසයක් ගොඩනැගෙන්න කිසිම බැඳීමක් නෑ. එහෙත් මෙතරම් සමීප වෙන්ට හේතුව කුමක්ද?

www.sinhalaelibrary.com
WWW.SINHALAELIBRARY.COM 95

''එන්න.. මා ළඟින් ඉඳගන්න.''

ඈ ආරාධනා කළාය.

ඔහු නිහඬව සුදු වැලි තීරෙ ඉඳගත්තේය. කැලණිය නදිය දෙසින් හමා එන මඳනල රිද්මයකට බෝපත් සෙලවනු පෙනේ.

''ඇයි අපි මේ විදිහට ආවේ...?''

ඔහු පන්සල තුදුරෙන් ගලන නදී තෙර ඉඳගනිමින් ඇසුවේය.

''අපි මේ පැමිණි ගමන පිළිබඳව වැරදි විදිහට හිතන්න එපා.''

ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්වා ගත්තේය.

''එපා මගේ අතින් අල්ලන්න. මම මේ සමාජයට ගැළපෙන කෙනෙක් නෙමේ. කවදාවත් ජීවිතයේ සාර්ථක ගමනක යෙදෙන්නට මට වෙන්නෙ නෑ. හැකිනාක් කල් සිත සතුටින් සිටීම තමා එකම බලාපොරොත්තුව.''

ඇය නැගී සිටිමට උත්සාහ කළාය. ඔහු ඇගේ සිනිඳු සිහින් අත අල්වා ගත්තේය.

''මට තනියම ඉන්ට ඉඩ දෙන්න.''

''හරි... තනියම ඉන්න ඉඩ දෙන්නම්. මොකටද මාව පන්සල් එක්කගෙන ආවේ...?''

ඇය ඔහුගේ අත නොහැරම සිනාසුණාය.

''හෙට පටන් ගන්න රස්සාව සාර්ථක වේවා කියලා බාරයක් වෙන්නයි ආවෙ.''

ඔහු මඳ සිනාවකින් මුව සරසා ගත්තේය. තම ජීවිතයේ දී මෙවන් තරුණියක් හමුවී නැත.

''සහන් නැවත මාව හමුවන්න හිතන්ට එපා.''



ඔහු පුදුමයෙන් යුතුව ඇගේ කතාවට සවන් දුන්නේය.

''ඇයි මේ වගේ කතා කියන්නෙ. මා අතින් මොනවත් වරදක් වුණාද?''

''නෑ නෑ කිසි තරහක් නෑ. ඔයා මේ රස්සාවට ගිහින් හොඳින් දියුණු වෙන්න ඕනෑ.''

''මම දියුණු වෙනවද නැද්ද කියන එක පෞද්ගලික ප්‍රශ්නයක්.''

''තරහ ගන්ට එපා. මාව ආශ්‍රය කළොත් ඔයාට කරදර වෙයි. ඒ නිසා සහෝදරියක් විදිහට සලකන්න.''

''ඒකත් මගේ පෞද්ගලික ප්‍රශ්නයක්. වටෙන් කැරකෙන්නෙ නැතිව කෙළෙන්ට ඕනෑ දේ කියන්න. මම නැවිදින් ඉන්ටද කියන්නේ...?''

''මීට පස්සේ මාව හම්බ වෙන්න එන්න එපා. අපි සහෝදරයෝ විදිහට ආශ්‍රය කරමු.''

''මමත් එහෙම තමයි හිතන් ඉන්නේ. සහෝදරයෙක් විදිහට ඕනෑම දෙයක් කරන්නම්. එහෙම නම් අපි යමු.''

බිම ඉඳගෙන සිටි ඈ සහන්ට අත දිගු කළාය. ඔහු ඇයට නැගී සිටීමට සහාය වූයේය.

WWW.SINHALAELIBRARY.COM 96

## 26

සහන් ටැබ්ලොයිඩ් පත්‍රයේ කටයුතු ආරම්භ කළේය. පැහැදිලිව මෙය වාමාංශික පත්‍රයකි. පත්‍රය මෙතෙක් පවත්වාගෙන ගොස් ඇත්තේ දේශපාලනයට උනන්දුවක් දක්වන අය වෙනුවෙන් පමණි. වඩාත් වැදගත් වන්නේ මෙම අදහස් මෘදු බවින් යුතුව සාමාන්‍ය ජනතාව අතරට ගෙන යාමය.

මුල් සතිය තුළ කළේ පත්‍රය පිළිබඳ අධ්‍යයනයක් කිරීමය. ඔහු අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පත්‍රය ජනප්‍රිය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළේය. පත්‍රයේ කවරයේ ද වෙනසක් කිරීමට ඔහුගේ අදහසක් තිබුණි.

එක් රැයක ඔහුට පංචලිගෙන් ඇමතුමක් ලැබුණි.

''නිදිද?''

පංචලි ඇසුවාය.

''නිදන්න හිතලවත් නෑ. ඔයා නම් සැපසේ නිදනවා ඇති.''

''එපා කතා කරන්ට. මම තරහම තරහයි.''

''හරි වැඩක්නේ මම කළ වරද මොකක්ද? කතා කරන්ට එපා

WWW.SINHALAELIBRARY.COM 97



කිව්වා ඉතින් කතා කළේ නෑ. නැතිනම් කතා කරන්ට ලොකු ඕනෑකමක් තිබුණා.''

''ඒ බොරු. කමක් නෑ... කමක් නෑ.. එපා නිසානේ කතා නොකළේ.''

''ඔන්න ඕක තමයි තරහ. හා කතා කරන්ට එපා කිව්වෙ කවුද?''

''මේ කතා කළේ මගේ ඕනෑකමකට නෙවේ. ආත්තම්මා එන්ට කිව්වා.''

''ආත්තම්මා දකින්ට යන්ට ඕනෑකමකුත් තියෙනවා. ඇයි එන්න කිව්වෙ...?''

''සනීප නෑ කියලා බේත් ගන්ට යන්න ඕනැලු.''

''හා... හොඳා මම එන්නම් කියන්ට.''

''එහෙනම් මම තියන්ටද?''

''එපා තියන්න. මට තව ටිකක් කතා කරන්ට ඕනෑ.''

''ඕනෑ නෑ... මමනේ පණිවිඩය දෙන්න කතා කළේ.''

ඇමතුම විසන්ධි කළේ ඇයි දැයි ඔහු දනී. ඇසුරු නොකරන මෙන් ඉල්ලා සිටියේ සිතේ ඇති කසල බව නිසාය. ඇගේ ගති සුන්දර ගති ඔහු ප්‍රිය කරයි.

වරෙක ඇය කෙරෙහි දුකක් ඇති වෙයි. දෙමාපියන් කරන වැරදි නිසා දඬුවම් විඳින්නට සිදුව ඇත්තේ දරුවන්ටය. අරමුණක් නැති ගමනක යෙදෙන ඇය අමතක කිරීමට පුළුවන් කමක් නැත. ඔහු පංචලිට ඇමතුමක් ගත්තේය.

''ඇයි කරදර කරන්නෙ...? මට මගේ පාඩුවෙ ඉන්ට දෙන්නෙ නැද්ද?''

''කෙනෙක්ට පාඩුවේ ඉන්න දෙන්ටද?''

''කිව්වම අහන්ට අපට කරදර කරන්ට එපා. මම ජීවිතේට බයයි.''

''හැම දෙනාම ජීවිතයට බයයි. මම වරදක් කළා කියලා හිතනවද?''

''නෑ නෑ ඔයා වරදක් කරලා නෑ.''

''අඬනවා නේද? ඕනෑවට වැඩියෙ බර පටවා ගත්තාම හිතට ඔසවාගෙන ඉන්ට බෑ. මට උපකාරයක් ඕනෑ.''

''කියන්න මොනවද ඕනෑ.''

''උපකාර කරනවා නේද?''

''ඔව්. අනිවාර්යයෙන්ම කරනවා. කියන්න.''

''ඒක දැන්ම හදිසියෙන් කියන්ට බෑ. හෙට හම්බ වුණාම කියන්නම්.''

ආත්තම්මා දුවගේ කතාව නිම වන තෙක් බලා සිටියාය.

''දුවගේ වැඩ පාළු කරගන්ට එපා. මම තනියම දොස්තර ගාවට යන්නම්.''

''නෑ ආත්තම්මා මම කිව්වේ නිකං මම බේත් ගන්ට යන්ට එන්නම්.''

''මට අර කොලුවා ගෙනැල්ලා දුන්නාම මම ඒ ළමයත් එක්ක යන්නම්. කිව්වද?''

''සහන් එක්ක තමයි මම කතා කළේ..''

වත්සලා ඥාති සහෝදරියගේ නිවසට ආවේ අම්මාගේ සුව දුක් බැලීමටය. තමා ඇමැති තුමා සමඟ සබඳතා පවත්වන බව දන්න නිසා ප්‍රතිපත්තියක් ලෙස නිවසට නො එයි. ඇය දරු ස්ථාවරයේ කිසිදු වෙනසක් නැත. මොන යම් ප්‍රශ්න තිබුණත් ඔහු තම දුවගේ පියා ලෙස පිළිගැනීමට වත්සලාට සිදුව ඇත. අම්මාගේ



සිත වෙනස් කිරීමට ද පුළුවන් කමක් නැත. අම්මා ගත් තීරණය වෙනස් කරන ගැහැනියක් නොවේ. කෙනෙක් කෙරෙහි පැහැදුනහොත් ජීවිතය වුවත් දෙන වර්ගයේ අමුතුම ගතිගුණ ඇත්තියකි. සහන් මුණගැසුන දිනයේ සිට ඔහු කෙරෙහි අම්මාගේ සිතේ ඇත්තේ අමුතුම පැහැදීමකි. ඔහු ද අම්මා ඇසුරු කරන්නේ ගෞරවාන්විතවය. එහෙත් සහන්ගේ කපටිකම් ඇයට තේරුම් ගොස් හමාරය. ඔහු සූදානම් වන්නේ දුවගේ සිත දිනා ගැනීමටය.

දුව කිසිදාක පිරිමියෙක් සමඟ සබඳතා පවත්වා නැති තරුණියකි. සමාජය දුව සමඟ මිත්‍රවීමට වෙර දැරුවත් එය සඵල නොවූ බව දනී. එසේ වුවත් ඇගේ සිත විසිර ගොස් ඇත. මෙම ප්‍රශ්නයට අම්මා කෙළින් හෝ වක්‍රව සම්බන්ධය.

''මොකද්ද අම්මා පනින රිළවුන්ට ඉණිමං බඳිනවා වගේ වැඩ කරන්නේ...''

මිලිනා දුව දෙස බලා සිටියා විනා එකවර පිළිතුරක් දුන්නේ නැත.

''අර මනුස්සයට ආරංචි වුණොත් දෙන්නාවම මරලා දායි.''

''ඇයි මට දොස් කියන්නේ. පංචලි පොඩි ළමයෙක් නෙමේ. අනික ඒ ළමයට උඹට වඩා හොඳ තරක තේරෙනවා.''

''වරදක් වෙලා තියෙන බව ඇත්ත. මේ විදිහට මගෙ හිත රිද්දන්න එපා අම්මා.''

''දුව විතරක් නෙවේ... මේ දුක ඔයාට කලින් මාත් වින්දා. පංචලි දුව මෝඩ ළමයෙක් නෙමේ.''

''ඒ වුණාට අර කොල්ලා දුවව මුළා කරගෙන වගේ.''

''මම පොඩි දුවගෙන් ඇහුවා.''

''ඒ කිව්වේ...?''

WWW.SINHALAELIBRARY.COM 98

"සම්බන්ධයක් තියෙනවද ඇහුවා."

"ඔව් කිව්වා. ඔය බලන්න.. ඔය බලන්න..."

"ලව් එෆෙයාර් එකක් පවත්වන්න දෙන්නාගේම කැමැත්තක් නැහැල්ලු. ආශ්‍රය කරන්නේ යාළුවෝ විදිහටලු."

"මොනවා අම්මා...?"

ඇය පුදුම වෙමින් කීවාය.

"බුද්ධිමත් තරුණ ගැහැනු පිරිමි ළමයි ඉස්සර වගේ නෙමෙ."

"අම්මා විශ්වාස කරනවද?"

"ඔව් නැතිව. අපි සංගීත විද්‍යාලයේ අපි එක්ක හිටපු පිරිමි ළමයි එක්ක ආශ්‍රය කළේ එහෙමයි."

"අම්මත් ඒ දෙන්නගෙ කපටිකම්වලට අහුවෙලා. ඒ කොලුවා කාර් ඩ්‍රයිවර් කෙනෙක්."

"තුට්ටු දෙකේ වැඩ කරන සල්ලිකාරයන්ට වඩා මේ කොලුවට මම කැමතියි."

අම්මා කවදත් සමරතුංගට විරුද්ධය.

"පිටස්තර අයට දොස් කීමේ තේරුමක් නෑ. ගැහැනු ළමයට හොඳ වයසෙදි හොයලා බලලා කටයුත්තක් කරලා දුන්නා නම් ඉවරයි."

"මට ඕක කියා ගන්ට බෑ අම්මා. ඔයාට නම් ඕනෑ දෙයක් දුවට කියන්ටත් පුළුවන්. අනික මම කියන දේට වඩා අම්මා කියන දේ අහනවා."

"කතා කරලා හොයලා බලලා තියා ගත්තම ඉවරයි."



නියමිත වෙලාවට සහන් කුලී රියකින් ආවේය. කිසිම වෙනසක් දක්වූයේ නැත. වෙනදා ලෙසින් ඔවුන් සුහදව කතා කරන හැටි වත්සලා දුටුවාය.

"තේ එකක් හදලා දෙන්නද?"

"ඕනෑ නෑ අපි යමු."

ඥාති සොයුරිය තේ කෝප්පයක් සාදාගෙන පැමිණ පංචලිට පෑවාය.

"ආ මේ තේ එක. දුව දුන්නොත් ගනී."

ඇය තේ කෝප්පය රැගෙන සහන් ළඟට ගියාය.

"වෙනදා වගේ නෙවේ දූත් ආඩම්බරයි."

"කැමති විදිහට හිතාගන්න."

"මොනවද අහන්ට තියෙනවා කිව්වෙ...?"

"මඟදි කියන්නම්. දූත් යමු."

වෛද්‍යවරයා නියමිත වේලාවට නොපැමිණි නිසා ශාලාවේ සැහෙන තදබදයක් ඇති වුණි.

"ඉතින් කොහොමද පත්තරේ වැඩ හොඳින් කෙරෙනවද?"

"පොඩි වෙනස්කම් කීපයක් කරන්ටයි හිතන් ඉන්නේ."

"ඩොක්ටර් එනකල් අපි අතනින් ඉඳගමු."

හමුවූයේ සෑහෙන දවසකට පසුවය. ඔහු විශේෂයෙන් කතා කළේ ඇගේ කිරි ව්‍යාපාරය ගැනය.

"කිරි අවුට් ලට් එක දාන එක ගැන ඇමැති තුමා කැමතිද?"

"අම්මට බැණලා තිබුණා. මට නම් මුකුත් කිව්වේ නෑ. පටන් ගන්න දවසට ආරාධනා කරන්නම්."

WWW.SINHALAELIBRARY.COM 99

''මට කිසිම උදව්වක් වෙන්න බැරිව ගියා.''

''තමුන්ගෙ වැඩේ කර ගන්න. මොකද්ද මගෙන් කෙරෙන්ට දෙයක් තියෙනවා කිව්වෙ...?''

''කරල දෙයිද කියන්ට බෑ.''

''ඇයි එච්චර අවිශ්වාසයක්. සල්ලිද? පොතේ සල්ලි ටිකක් ඇති. කීයක්ද කියන්නකෝ.. මම අරන් දෙන්නම්.''

''සල්ලි නෙමේ... පත්තරේ ෆෝර්මැට් එක ටිකක් වෙනස් කරන්ට මට අවසර දීලා තියෙනවා.''

''ඔව් ජනප්‍රිය අංග පත්තරයක තියෙන්න ඕනෑ තමයි. ඉතින් මගෙන් කෙරෙන්ට ඕනෑ මොනවද?''

''මම පත්තරේ පිටකවරෙට ඔයාගෙ පින්තූරයක් දාන්ට තීරණය කළා.''

''හානේ...''

ඈ පුදුමයට පත් වෙමින් කීවාය.

''ඔය ලැස්ති වෙන්නෙ මාව පල් කරන්ට නේද?''

''පල් කරනවා නෙවෙයි ඇත්තයි... සත්තයි.''

තරමක වැරැරුම් කමක් මුහුණට පිවිසුණි.

''අනේ මාව එපා. වෙන ලස්සන කෙල්ලෙක් හොයා ගන්න බැරිද?''

''ලස්සනයි කියලා ඔච්චර ආඩම්බර වෙන්න එපා.''

''එපා කියන්න එහෙම.''

ඇය මෘදු ලෙස ඔහුගේ අතට සෙමින් පහරක් ගැසුවාය.

ඔහු ඉල්ලා සිටින ඉල්ලීම කිසිසේත් ප්‍රතික්ෂේප කළ නොහැක.



''වෙන ලස්සන කෙල්ලෙක් හොයා ගන්ට.''

''ඔයා මගේ යාළුවෙක් කිව්වා නේද? මගොමද යාළුවන්ට උදව් කරන්නේ...? හොඳයි මම වෙන කෙල්ලෙක් හොයා ගන්නම්.''

''ඒක තමා මම කිව්වේ ලස්සන කෙල්ලෙක් ඇති කියලා.''

''හරි හරි කතාව නතර කරමු. අන්න ආත්තම්මගෙ නම්බරේ කතා කරනවා. අපි යමු.''

ඔවුහු ශාලාව දෙසට ගියහ.

WWW.SINHALAELIBRARY.COM 100

## 27

රටේ පුවත්පත් නිදහස පිළිබඳව නිරතුරුව සාකච්ඡා වෙයි. පුවත්පත් පාලනය පිළිබඳව රජය මැදිහත් වූ අවස්ථා රැසක් ඇත. රටක ජනතාව නිබඳව සත්‍ය දැන ගැනීමේ පිපාසයෙන් පසුවෙයි. මාධ්‍යකරුවන්ට අද මරණීය තර්ජනවලට මුහුණ දීමට සිදුව ඇත. මෙය ලෝකයේ හැම රටකටම පොදුය. හැම රටකම මාධ්‍යකරුවන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව ඇත. රජයේ මාධ්‍ය ආයතනවලට හැමදේම විවෘතව ප්‍රකාශ කිරීමට නොහැකි බව සැවොම දනිති. පෞද්ගලික මාධ්‍ය ආයතන ඕනෑතරම් බිහිවූවාට කමක් නැත. ඒවා ආරක්ෂා කිරීම ජාතික වගකීමකි.

ඇමැතිතුමා උදේ ජාතික පුවත්පත් උඩින් පල්ලෙන් බැලුවේය. තමා පිළිබඳව හා අමාත්‍යාංශය පිළිබඳව ඇති වාර්තා සපයන්නේ ලේකම්වරිය විසිනි.

ජාතික පුවත්පත්වලට අමතරව පළවන විකල්ප පුවත්පත් අතර මානව හිමිකම් පිළිබඳව කතාවන 'පෙරමග' ටැබ් ලොයිඩ් පත්‍රය ආරම්භයේ සිටම ඇමැතිතුමා මිලට ගත්තේ හෙතෙම මුලදී වාමාංශික ව්‍යාපාරවලට සම්බන්ධව සිටි හෙයිනි. පක්ෂ කීපයකට මාරු වීමත් සමඟ ඇමැතිවරයාගේ ප්‍රතිරූපයට ප්‍රශ්න ඇති වුණි. එදා සිට පත්‍රය මගින් පහර දුන් දේශපාලනඥයන් කීපදෙනෙක්



අතරට සමරතුංග ද වැටී සිටියේය. කොතරම් විරෝධතා තිබුණත් තමාට එරෙහි වාර්තා සපයන මාධ්‍යවේදීන්ගෙන් මිදී සිටීමට ඔහු උපක්‍රම යෙදුවේය.

මුදල් යෙදීමෙන්, මැර බලයෙන් මාධ්‍ය මර්දනය කිරීමට නොහැකි බව හැඟී ගියේ 'පෙරමග' හා ගැටීමෙනි. මෑතක සිට පත්‍රයේ තදබල වෙනසක් සිදුව ඇති බවක් හැඟේ. සමරතුංග තමා පිළිබඳව පත්‍රයේ පළ වූ වාර්තා පිළිබඳව කෝපයට පත්ව සිටියේය.

අමු අමුවේ පළ කළ කැලෑ පත්‍රය පිළිබඳව ඡන්දදායකයන් ගෙන් දුරකථන ඇමතුම් ගලා ආවේය.

''සාන්ති...'' සමරතුංග පුවෘත්ති ලේකම්වරිය කැඳෙව්වේය.

''මොනවද මා ගැන ලියලා තියෙන්නෙ. කෝ පත්තරය පෙන්නමු බලන්න.''

''සර් පෙරමග පත්තරේ අලුත් විදිහට ගහලා. සර්.. මේ සැරේ ලස්සන කෙල්ලෙක් ඉන්නවා.''

''මොනවා හිතලද දන්නෙ නෑ කෙල්ලෝ දමන්නෙ. කෝ දෙමු. නැත්නම් ඔවුන් කැලෑ පත්තර කාරයෝ.''

සමරතුංග. පත්‍රය අතට ගත්තේ වෙනස බැලීම සඳහාය.

''සර් දකලා පුරුදු ලස්සන කෙල්ලෙක්.''

ඇමැතිවරයා තම ලේකම්වරිය දුන් පත්‍රය අතට ගෙන බැලුවේය. ඔහුට එකරවම දෙනෙත් අදහා ගත නොහැකිව ඡායාරූපය දෙස බලා සිටියේය. තම බාල දුව වත්සලාව හඳුනා ගැනීමට ගතවූයේ නිමේෂයකි. වත්සලාට තමා අතින් බලවත් වරදක් ඇති බැව් ඔහු පිළිගනී. එහෙත් තම දරුවාට හා වත්සලාට දුකක් දී නැත. වසන්ති හා විවාහ වීමට සිදුවූයේ ආර්ථික හේතු මතය. එහෙත් ඔහු ඇගේ ජීවිතයට කිසිම අඩුවක් තැබුවේ නැත. වෙනම ගෙයක් අරන් දී දරුවා ලැබුණු පසු ඇගේ ඉගෙනීමේ කටයුතුවලට ද වියදම් කළේ අනෙක් දරුවන්ට කරන පරිද්දෙනි. බාලිකා විද්‍යාලයට

WWW.SINHALAELIBRARY.COM 101

යැව්වේය. ඇයට ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුව ඇති බව ඔහු දැන සිටියේ ය. කුමන දුෂ්කරතා තිබුණත් ඇය දකින විට අසීමිත සතුටක් ඇති වෙයි. කුමන ප්‍රශ්න තිබුණත් වැඩි කලක් යන්ට ප්‍රථම හොඳ විවාහයක් කරදීමට ඔහු සිතා සිටියේය.

යොවුන් වියේ වත්සලාට තිබුණේ පංචලිට සමාන රූ සපුවකි. තවමත් ඇගේ රුව වෙනස් වී නැත. ඒ දිනවල පුවත්පත්වල පිටු ඇගේ රුවින් සැරසුණු හැටි මතකය. පැහැදිලිවම ඒ ආකර්ෂණීය වාසනා ගුණය දුවට ද ගිමිය.

ඒ යුගවල නිර්මාණශීලී කලාකරුවන් බිහිව සිටි හැටි මතකය. විදේශාධාර මත රාජ්‍ය නොවන සංවිධාන මගින් ප්‍රකාශයට පත් කරන වැඹිලොයිඩ් පත්තරවල සැබෑ ජන මතයක් නැත. තමාට විරුද්ධ මඩ ප්‍රචාර ගෙන යන පුවත්පත ද විදේශාධාර මත යැපෙන්නකි. මෙම පත්‍රයට දුවගේ ඡායාරූපයේ ගියේ කොහොමද?

"මේ ගේල් නිසාම පත්‍රය විකිණෙයි සර්."

"ඔව්... ඔව්... ඇතුළ බැලුවෙ නැද්ද?"

"බැනලා නෑ... තවකතා තියෙනවා."

තරුණිය පත්‍රය තබා කාර්යාලයෙන් පිටව ගියාය. පත්‍රය අතට ගත් සැණින් වසන්තිගෙන් ඇමතුමක් ලැබුණි.

"කොහේද ඉන්නේ...?"

"ඔෆිස් එක ඇතුළෙ."

"අද පෙරමග පත්තරේ දැක්කද?"

"මට ඔය කැලෑ පත්තර බලන්න වෙලාවක් නෑ. ඇයි...?"

"අන්න දෝණියන්දෑ මේ සැරේ පිටකවරෙ ඉන්නවා."

"මොන දෝණියන්ද ද?"

"ඇයි හොර ගෑණිගෙ දුව. ඔන්න පත්තර කාරයෝ කතන්දරයක් පටන් අරන්."



"වසන්ති, මගේ වැඩක් කර ගන්න දෙනවද නැද්ද? මට වැඩ තියෙනවා."

පත්‍රය දුටු සැණින් පංචලිගේ මුවගට සිනාවක් නැඟුණි. ඉකුත් දින හමු වූ මොහොතේ පිටකවරයක් ගැන කතා කළා මතකය. එහෙත් මෙතරම් ඉක්මනින් එය සිදු වෙතැයි සිතුවේ නැත. තමාට රහසින් ඡායාරූපයක් ගත්තේ කොහොමද? ඡායාරූපය ශිල්පීය තාක්ෂණයෙන් හා කලාත්මක බවින් හොඳ තත්ත්වයක තිබුණි. මට හොරෙන් පින්තූරයක් අරන්. හෙතෙම තමාට හොරෙන් තමාගේ ඔබාගේ දේවල් සොරාගෙන ඇතැයි සිතේ.

කරන්නම් හොඳ වැඩක්. ඔහුට ඇමතුමක් ගත්තේ කිප වතාවක් උත්සාහ කිරීමෙන් පසුවය.

"හලෝ... කතෘතුමා ද?"

ඇය කටහඬ වෙනස් කර කතා කළාය.

"මේ වගේ විකල්ප පත්‍රයකට ගැහැනු රූපයක් දැම්මේ ඇයි...?"

"පත්තරේ අන්තර්ගතයේ පිරිමි තමයි ඉන්නෙ. ඉතින් ගැහැනියක් යොදා ගත්තාම වරද මොකක්ද?"

"මෙක සිනි බෝල පැණි පත්තරයක් නෙමේ. පුරවැසි අයිතීන්, මානව හිමිකම් ගැන වගකීමෙන් කතා කරන විකල්ප පත්තරයක්."

"අන්තර්ගතයේ කිසිම වෙනසක් නෑ. අපි ඒක වගකීමෙන් කියන දෙයක්."

"අලුත් කර්තෘවරයා ටිකක් රොමැන්ටික් පැත්තට බර කෙනෙක් වගේ. පිටකවරෙ ඉන්නෙ ගේල් ෆ්‍රෙන්ඩ් ද දන්නෙ නෑ."

ටිකක් දුර කතා කරගෙන යද්දී ඔහු කටහඬ හඳුනා ගත්තේය. එහෙත් ඒ බවක් ඇයට හැඟෙව්වේ නැත.

"ඒ පිටකවරෙ ඉන්නෙ කතුවරයාගේ පෙම්වතිය නේද?"

WWW.SINHALAELIBRARY.COM 102

''ඒ වගේ ලස්සන වාසනාවන්ත කෙල්ලෙක් පෙම්වතිය කරගන්ට කතුරුවයාට පින නෑ.''

ඇයට එකවරම සහන් රිසිවරය තබන හඬ ඇසුණි. දෙවියනේ කොච්චර හිත හද කරගෙන හිටියත් මට ආදරේ විත්තිය මම දන්නවා. මායි පින් කරලා නැත්තේ. මේ ආදරේ කියා ගන්ට බැරිවයි මෙහෙම කරන්නේ. අපි යාළුවෝ විදිහට ආශ්‍රය කරමුයි කිව්වෙ ඒකයි. ඒත් මට ඒක ඇත්තට කරන්ට පුළුවන් දෙයක් නෙමේ.

අම්මාගේ කටහඬ ඇසී ඇය දෙනෙතේ නැගුණු කඳුළු පිස දමා ගත්තාය.

''දුව... මොකද කරන්නෙ...?''

''මම මේ කාමරේ. ඇයි අම්මා...?''

''අර අප්පච්චිට ඇවැක් කරන පත්තරේ පිටකවරෙට දුවගෙ පින්තූරේ දමලලු.''

''කවුද කිව්වෙ...?''

''අප්පච්චි කෝල් එකක් දුන්නා. අපේ කතාව ඒකේ පටන් ගන්ට යනවලු.''

''අපිට ඒ නිදහස නතර කරන්ට බැනෙ අම්මා.''

''ආ.. දුවට මේ පත්තරේ හම්බ වෙලා තියෙන්නෙ..''

ඇය පත්‍රය අතට ගෙන දුවගේ ඡායාරූපය දෙස බලා සිටියාය.

''මොනවා වුණත් ලස්සනට පින්තූරෙ අරන් තියෙනවා. කොහේදිද ගත්තෙ...?''

ඇය පිළිතුරු නොදී සිටියාය. ඡායාරූපය ගත්තේ කොහේදී දුයි ඇය දන සිටියේ නැත. තමාට නොදන්වා සහන් මෙම ඡායාරූපය ගන්ට ඇත. පැහැදිලිව මෙය සැලසුම්සහගත ලෙස [illegible] ඡායාරූපයකි. මෙම ඡායාරූපය ගන්ට ඇත්තේ කතරගම ගමනේ දී

WWW.SINHALAELIBRARY.COM 103



විය යුතුය. ඒ හැර ඔහු අත කැමරාවක් තිබූ දිනයක් මතක නැත. ඊකත් හෙම නෙමේ හරිම කට්ටයි. මටත් නොදන්වා ඡායාරූපයක් අරන්. ඒත් දොසක් කියන්නේ කොහොමද?

''අප්පච්චි පත්තරේට විරුද්ධව නඩු කියනවා කිව්වා.''

''ඒ මොටද? මගේ පින්තූරෙ පත්තරේ ගියාට මගේ විරුද්ධ කමක් නෑ.''

''අප්පච්චි තරහා වෙයි. ඒ ගැන ප්‍රකාශයක් ගන්ට තාත්තලාගේ පේපර්හෞස් එකේ රිපෝටර් කෙනෙක් එවනවා කිව්වා.''

''අම්මා, ඒ පත්තරේ මගේ පිටකවරෙ ගිය එකට මම විරුද්ධ වෙන්නෙ නෑ.''

''දුව... අප්පච්චිට විරුද්ධව වැඩ කරන්ට එපා. දන්නවනේ හැටි.''

''අම්මා, අම්මාගෙ පින්තූරෙ පත්තරවල පිටකවරවල දැම්මා නේද?''

''ඔව් දැම්මා. කලා පත්තරවල, සිනමා පත්තරවල දැම්මා.''

''එහෙමනම් මගේ පින්තූරෙ පත්තරේ ගියාට කවුරුවත් විරුද්ධ වෙන්න ඕනෑ නෑ.''

''දුව... දන්නවනේ අප්පච්චිගෙ හැටි. හිනාවෙලා වගේ හිටියට මුළු ජීවිත කාලය පුරාම මම හිටියේ බයෙන්. ඒ වගේම දුකින්.''

''මම නම් බයෙන් ඉන්නෙත් නෑ. දුකෙන් ඉන්නෙත් නෑ. අම්මා මොකක්ද මේ ගෙවන නිවට ජීවිතය. වරදක් සිද්ධ වෙලා තියෙනව බව ඇත්ත. ඇයි අපි ස්වාධීනව ජීවත් වෙන්නෙ නැත්තෙ...?''

වත්සලා පිළිතුරක් නොදී බිම බලා ගත්තාය.

www.sinhalaelibrary.com

දුවගේ කතාව සත්‍යයකි. කිසිම නිත්‍යානුකූල අයිතියක් නැති කෙනෙකුට මෙසේ යටත්ව සිටින්නේ කුමකටද?

"ඔය කොහේද යන්න හදන්නේ...?"

"මම අටේ කණුවට ගිහින් එන්නම්."

"අම්මව හම්බ වෙන්නද?"

"ඔව්. ආත්තම්මා හමුවෙලා එන්නම්."

"අනේ දුව.. යන්නේ තනියමද?"

"ඔව් අම්මා. අපිට ගේ ඇතුළට වෙලා ඉඳලා බෑ. මට හිගා කන්න බෑ. අපි දියුණු වෙන්න බලමු. මම යනවා."

දුව බෑගය කරේ දමාගෙන නිවසින් පිටව යන හැටි ඈ බලා සිටියාය.



# 28

මිලිනා මහත්මිය බලා සිටියේ පොඩි දුව එන තෙක්ය. නැවත වෛද්‍ය සායනයට යාමට නියමිතව තිබුණේ මසකට පසුවය. කවුරුන් හෝ ලවා කොටුවේ බස් නැවතුම් පොළට ගියහොත් ගමට යාමට පුළුවන. තමාට තරමක් හෝ උදව්වට සිටියේ සහන් ළමයාය. ඔහු පිටස්තරයෙකි. ඊටත් වඩා දන් රැකියාවක් කරන නිසා තමා වෙනුවෙන් වෙහෙසීමට ඔහුට නොපුළුවන.

තමා පිළිබඳ වැඩි අවධානයක් දුවට යෙදවීමට පුළුවන් කමක් නැත. ඇය නපුරු මිනිසෙකුගේ අනියම් බිරිඳ ලෙස සිටී. කල්පනාවේ ගැලී සිටිය දී පොඩි දුව කාමරයට පිවිසෙනු දකීමෙන් සිතට ඇතිවූයේ සතුටකි.

"එන්න මගෙ දුව. මම මේ දුව ගැන කල්පනා කළා විතරයි."

"ඇයි ආත්තම්මා මා ගැන කල්පනා කළේ...?"

"කල්පනා නොකර බැහැනේ රත්තරනේ. මාව මැරුණම වළ දාන්නවත් ඉන්නේ මගෙ දුවනේ."

"ආත්තම්මා මගේ ආයුෂත් අරන් තව බොහෝ කාලයක් ඉන්න ඕනෑ."

www.sinhalaelibrary.com

ඇය කර රැඳි බුරුම බෑගය පසෙක තබමින් කීවාය.

''අනේ දුව... මට පණ තිබුණට මම මැරිලා හුඟාක් කල්. මම ජීවිතේ දී බලාපොරොත්තු වුණු සතුට කවදාවත් ලැබුණේ නෑ.

ආත්තම්මා පවසන්නේ සත්‍යයකි. ඇය මෙම දුක දරන්නේ මහලු ගැහැනියක් වූ පසුවය. යමක් තේරුම් ගත හැකි වියේ සිට තමාට මෙම දුක දරන්නට සිදුව ඇත. ඒ දුරු දුක හොඳටම ප්‍රමාණවත්ය. තමා හා අම්මා බල අධිකාරයකට යටත්ව සිටිනු දූනේ. එම තත්ත්වයෙන් මිදීමට දුන් කාලය පැමිණ ඇත.

''මම ඒ ගෙදරින් වෙන් වෙන්න තීරණය කරලයි තියෙන්නෙ.''

මිලිනා පිළිතුරක් දුන්නේ නැත. මෙවන් තීරණයක් ගැනීමට විවෘත අයිතියක් එම දරුවාට ඇත. මිනිසුන් හැමදාම තද කරගෙන පීඩාවට පත් කළ නොහැක. මෙම සිරගෙදරින් වෙන්ව යාමට ගත් උත්සාහය අගේ කළ යුතුය.

''ඒ තීරණයට මම කැමතියි.''

''කුමාරිහාමිගේ දරුවෝ පිටරටවල විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නවා. විදේශ චාරිකාවල කුමාරිහාමිත් එක්ක යනවා. දළදා මාලිගාවට, පාර්ලිමේන්තු උත්සවවලට යනවා. අම්මා මෙහෙ දුක් විඳිනවා.''

''මම අමි මී හරකිට කීපවලියෙ කිව්වා. දුව ඔහේ දෙන දෙයක් කාගෙන ඉන්නවා.''

''මම තවත් බලාගෙන ඉන්න එකේ තේරුමක් නෑ ආත්තම්මා. මම අර කිරි අවුට්ලට් එක පටන් ගන්නවා. ආණ්ඩුව පරාද වුණොත් අපි මහපාරේ.''

''තනියම කරන්ට එපා. සහන් ළමයාගේ උදව්වත් ගන්න.''

''ඔව් ආත්තම්මා. මේ හැම දෙයක්ම කරලා දුන්නේ සහන් තමයි. ඒත් සහන්ට දුන් මට උදව් කරන්ට බෑ.''



''ඇයි අම්මා විරුද්ධ හින්දද? මොකක්ද එකක් ඇවිදින් කියලා ගියා.''

අම්මා සිතා සිටින්නේ සහන් හුඟක් නැනැත්තෙක් කියාය. වර්තමාන උගතුන් මුහුණ දෙන රැකියා විරහිත ප්‍රශ්නය ඔහුට ද බලපා ඇත. පිරුණු කලේ දිය නොසැලේ යන කතාව සත්‍යයකි. ඔහුගේ කතාවෙන් ප්‍රකට කලේ බුද්ධිමත් බවෙකි. තමාගේ තත්ත්වය කිසිවෙකුට නොදන්වා අහිංසකයෙක් මෙන් හැසිරෙන හැටි. කතරගම ගමනේ දී ඔහු කවරෙක් ද යන්න සහතික වශයෙන් ඈ දැනගත්තාය.

''අම්මාගේ කතා අහලා ඒ කොලුවා තරහා කරගන්ට එපා.''

''අම්මා නෙමෙ දෙවියො කිව්වත් මම සහන් එක්ක තරහා වෙන්නෙ නෑ.''

ආත්තම්මා කතා කරමින් ඇඳ මත තිබූ පංචලිගේ බෑගයේ තිබූ පත්‍රය අතට ගත්තාය. මේසය මත තිබූ උපැස් යුවල පැළඳගත් ඈ පත්‍රය දෙස බැලුවාය. ඡායාරූපය හඳුනා ගත් ඈ සිනාමුසු මුහුණින් එදෙස බැලුවාය.

''හෝ.. කවුද බොලේ මේ ඉන්නෙ...?''

ඇය පිළිතුරක් දුන්නේ නැත.

''හරි ලස්සනයි දුව... කවුද ගත්තෙ...?''

''මම දන්නෙ නෑ ආත්තම්මා.''

''මෙක ඇමතිට පහර ගහන පත්තරයක් නේද? කොහොමද ඒ වගේ පත්තරේටක දුවගෙ පින්තූරෙ ගියේ...?''

''අනේ මම දන්නෙ නෑ...''

ඈ සිනාසෙමින් කීවාය.

''මෙ පත්තරේ මීට කලින් මම දැකලා තියෙනවා. ඒත් මේ වගේ ලස්සන පින්තූරයක් දාලා තියෙනවා දැක්ක පළවෙනි වතාව. කවුද තර්නා..?''

WWW.SINHALAELIBRARY.COM 105

"ආත්තම්මා මේ පත්තරේ කර්තෘ සහන්."

"මොනවා දුව සහන්. ඉගෙන ගත්තෙ නැති කෙනෙකුට පත්තරේක වැඩ කරන්ට බෑ."

"ආත්තම්මා තාත්තගෙ ජීවිත කතාව වෙන නම්වලින් පත්තරේ පටන් අරන්."

"කවුද කතන්දරේ ලියන්නෙ...?"

"කතන්දරේ ලියන්නෙ සහන්."

මිලිනා මැතිනිය මඳ වේලාවක් කල්පනා කළාය. දුටු දිනයේම තමා කොලුවා පිළිබඳව තැබූ තක්සේරුව නිවැරදි යැයි සිතේ. පුද්ගලයකුගේ පෞරුෂය මොන යම් හේතුවක් නිසාවත් සැඟවිය නොහැක.

"නොකිව්වට සාමාන්‍ය කෙනෙක් නෙමේ කියලා මම හිතුවා."

ඇය සිනාවකින් මුව සරසා ගත්තාය.

"මට ඒ ළමයට හම්බ වෙන්න ඕනෑ. මාව ගෙදරට ඇරලලා එන්ට පුළුවන්ද අහන්ට."

"ආත්තම්මා ඔයාම අහන්ට. මම ටිකක් බොරුවට තරහා වෙලා ඉන්න ඕනෑ."

ආත්තම්මා සිනාසුනාය.

සහරාවේ නව සංස්කරණයේ පිටපත් සියල්ල අලෙවි වුණි. දේශපාලන මණ්ඩලයේ ඇතැම් මූලධර්මවාදීන් මේ වෙනසට කැමති වූයේ නැත. ප්‍රතිසංස්කරණවාදීන් පුවත්පතේ නව නැඹුමට අනුමැතිය දුන්හ. කෙසේ වුවත් පත්‍රයේ අන්තර්ගතය සංවාදයට තුඩු දුනි.

මදුරාසියේ සංචාරයක යෙදුණ මිත්‍ර ලංකාවට ආවේ සති තුනකට පසුවය.

"දාපං අත." මිත්‍ර සහන්ගේ අත ගනිමින් කීවේය.



"මචං.. උඹ මගේ විශ්වාසය රැක්කා. බේතකට පත්තරයක් නැහැල්ලු."

ඔහු මිතුරාගේ ස්තුතිය පිළිගත්තේය.

"උඹ මේ ඇමතියගේ විස්තරේ මෙච්චර හොඳට දන්නේ කොහොමද? සිද්ධිය පාර්ලිමේන්තුවටත් ගිහින්."

"මට තර්ජන ආවා. දවස පුරාම ටෙලිෆෝන් එකට ඉවරයක් නෑ."

"ඒවට බයවෙන්න එපා. බුරන බල්ලෝ එච්චර හපන්නෙ නෑ. ප්‍රශ්නයක් අහන්ටද?"

"ඔව්. හොඳා අහන්ට."

"මචං පත්තරේ පිටකවරෙට මෙච්චර ලස්සන කෙල්ලෙක් හොයා ගත්තෙ කොහොමද?"

ඔහු පිළිතුරක් නොදී නාදවන හැන්ඩ් ෆෝනය අතට ගත්තේය. කතා කිරීමට සූදානම් වන්නිය ඔහු හඳුනා ගත්තේය.

"කොහොමද?"

"විවේක වෙලාවක කතා කරන්ටයි හිටියෙ. ඔයා නිසා මට ලොකු තැනක් ලැබුණා."

"මටත් ලොකු තැනක් ලැබිලා තියෙන්නෙ. මට පාරෙ යන්ට බෑ."

ඇගේ සිනා හඬ ඇසුණි.

"මෙහෙම කතා කරලා බෑ. මට ඔයාව හම්බ වෙන්ට ඕනෑ. විස්තර හම්බ වුණාම කියන්නම්."

"මම කතා කළේ වෙන දේකට. පුවත්පත් කතුවරෙයකුට මෙහෙම යෝජනාවක් කරන එක වැරදියි."

WWW.SINHALAELIBRARY.COM 106

''මේ පිස්සු විකාර කියන්ට එපා. මොන දේ කළත් මට මුල මතකයි. මම ඔයාලට පියදුරුකම කළ කෙනෙක්. ඒ ගෞරවය තියෙනවා.

''ඒක තමයි අපි කරපු ලොකුම වරද. මිනිසුන් ජීවිතයේ දී අනන්ත වූ වැරදි කරනවා.''

''මොකද කතා කළේ කියන්න.''

''මම නෙමේ කතා කළේ ඔයාගෙ යාළුවා ආත්තම්මා.''

ඈ ගීතවන්ට සිනාසෙමින් කීවාය.

''වෙන කා එක්කවත් යන්ට කැමති නෑ. ආත්තම්මට ගෙදර යන්න විදිහක් නැහැල්ලු.''

''නව වැඩ ටිකක් තියෙනවා. දවසක් දෙකක් ඉන්න බැරිද අහන්න. හැබැයි මට තනියම යන්ට බෑ.''

''තනියම නෙවේ ආත්තම්මා යනවනේ..''

ඇගේ ගීතවත් සිනා හඬ ඇසුණි.

ඇමැතිවරයාට හොඳටම තරහා ගොස් තිබුණි.

''කෝ දුව...?''

ඇමැති වත්සලාගෙන් ඇසුවේය.

''අම්මා හම්බ වෙන්ට ගියා.''

''කවුද දුවගේ පින්තූරෙ පත්තරකාරයන්ට දුන්නේ...?''

''ඒක මම දන්නෙ නෑ.''

''ඔයා දන්නෙ නැතිනම් මම ද දන්නෙ. පත්තරේ මගේ ජීවිත කතාව ලියන්ට පටන් අරන්. කවුද ඕවා කිව්වෙ.''

''මම කොහොමද අනේ ඕවා දන්නෙ.''



''ඔයා නෙමේ නම් මග අම්මණ්ඩි කියන්ට ඇති. මම හොඳ මිනිහෙක් නෙමේ. මාව රිද්දන්න ආවොත් එකෙක් තියන්නෙ නෑ.''

''ඕන් අම්මට හෙම මොනවත් කියනව නෙමේ. මම කරපු අපරාධයට වෙන කෙනෙක් නම් මා එක්ක කතා කරන්නෙ නෑ.''

''මම අමතක කළා ද? කන්ට බොන්න දුන්නෙ නැද්ද? ඉන්න තැනක් දුන්නෙ නැද්ද?''

''කන්න බොන්න දුන්නොත් ඔක්කොම හරියයි. සත්තුත් කනවා බොනවා.'' ඈ නැඹුම් මුහුව කීවාය.

''වත්සලා වරදක් වුණේ නැහැයි කියලා කියනවා නෙමේ. දුන් ඉතින් ඒවා කියලා වැඩක් නෑ. මේ ළමයා හිතුවක්කාර වෙලා.''

ඇය පිළිතුරක් නොදී සිටියාය. දුව වෙනින් ඈ පැහැදිලි වෙනසක් දුටුවාය. ඇය කතා කරන්නේ වෙනදා විදිහට නොවේ. ඊට ඉහත යමක් කිරීමට තමාගේ උපදෙසක් පතයි. තමා තීරණයක් ගත නොහැකි නොවටිනා ගැහැනියක් ලෙස සිතුවේ ඇයි? රැකියාවෙන් ඉවත් වුණේ තමාගෙන් නොඅසාය. දුන් ව්‍යාපාරයක් කිරීමට සූදානම් වෙයි. ඇගේ හැසිරීමේ වෙනසක් ඇති වූයේ මේ වැන් රියේ යාම පටන් ගත් පසුවය. සහන් සමග හිතවත් කමක් නැතැයි කිව්වත් එය පිළිගත නොහැක.

''මම කන්ට බොන්ට දුන්නෙ නැද්ද? ඉගැන්නුවෙ නැද්ද? මේ ළමයට මොනවද වෙලා තියෙන්නෙ. මම කියන දේ ඇහුවෙ නැත්නම් දරුවා කියලා බලන්නෙ නෑ.''

''තාත්තලා දූරු කවුරුත් එකයි. මුරණ්ඩුයි. හිතුවක්කාර කමක් කරගන්ට බැරි නෑ. ළමයට මොනවත් හෙම කියනවා නෙමේ.''

''ඒවා කරන්නෙ කොහොමද? මගේ විරුද්ධකාරයන් ගහන පත්තරේකට පින්තූරෙ දීලා තියෙන්නෙ කැමැත්තෙන්. මේ වගේ ලස්සන පින්තූරයක් හොරෙන් ගන්ට බෑ. මෙයා කැමැත්තෙන් ගිහින්.''

''මාධ්‍ය නිදහසක් ගැන තියෙනවානෙ. ඔයා මේකට මුකුත්

WWW.SINHALAELIBRARY.COM 107

කරන්ට එපා. අගමැතිකම හිතක තියෙනවා නම් රණ්ඩුවට යන්ට එපා.''

''ඒ නිසයි මම ඉවසගෙන ඉන්නෙ. නැතිනම් මේ වැඩේ තහඩු නැති සුදු වැන් රියකට බාර දෙනවා. නැතිනම් නොහඳුනන තුවක්කු කාරයෙකුට දෙනවා.''

''මට ආදරයක් තියෙනවා නම් රණ්ඩුවට පැටලෙන්ට එපා. දරුවා මාවත් දාලා යයි.''

''මොනවා... කෙල්ලගෙ එහෙම අදහසකුත් තියෙනවද?''

සමරතුංග ඇමැති පුදුමයට පත්වෙමින් ඇසුවේය.

ඇය මඳ වේලාවක් නිහඬව සිටියාය. මොනවා හෝ හිතුවක්කාර කමක් ළඟදීම කිරීමට වෙර දරනු පෙනෙයි. කුඩා දරියක කාලේ නම් කටේ බයට නතර කිරීමට පුළුවන. දැන් පෙර මෙන් අවවාද කළ නොහැක. තමාගේ වැරදි තිබිය දී දුවට අවවාද කළ නොහැක.

''මහත්තයා ළමයා එක්ක හැප්පෙන්ට යනවා හෙම නෙමේ. ඉවසන්ට. විරුද්ධ පක්ෂ අයට විතර නෙමේ ආණ්ඩු පක්ෂයේ අයත් නම කපන්ට හදන බව තේරෙන්නෙ නැද්ද?''

වත්සලා තම බිරිඳට වඩා බුද්ධිමත්ය. කුමාරිහාමි සල්ලිකාර මෝඩ ගෑනියෙකි. තමා මේ තත්ත්වයට ආවේ ඇය නිසාය.



# 29

සහන් කොළඹ නතර වී සිටින බව අක්කාට ආරංචි වූයේ කලින් සේවය කළ රියදුරා වන සේදරගෙනි. ඔහු නිවසට ආවේ බැරෑරුම් ප්‍රශ්නයක් රැගෙනය.

''හා එන්න සේදර. හරි ගියාම දැන් අපිව මතකත් නෑ නේද?''

''මම එහෙම ජාතියේ මුල අමතක කරන කෙනෙක් නෙමේ. ඒකනේ මේ ආවෙ.''

ඔහු ඉදිරිපස පුටුවක ඉඳ තොරතුරු කතා කළේය.

''බතලවත්තේ මිස් වෙනුවට කෙනෙක් අල්ලා දෙන්නයි ආවෙ.''

''ඒකට මට ලේක් හවුස් එකේ ගැනු ළමයෙක් හම්බ වුණා. දැන් ගාන හරි. මොකක්ද ඔය අතේ තියෙන පත්තරේ.''

''මේක පෙන්වන්නත් එක්කලා තමයි ආවෙ. බලමු අඳුනනවද කියලා.''

පුවත්පත අතට ගෙන ඇ මඳ වේලාවක් එදෙස බලා සිටියාය.

''හානේ... මේ බතලවත්තෙ කෙල්ල නේද? පුදුම ලස්සනක්.''

ඇ අවංකවම කීවාය.

WWW.SINHALAELIBRARY.COM 108

''කොහොමත් අම්මගෙ ලස්සන දුවට තියෙනවනෙ.''

''අම්මා චිත්‍රපටවලත් හිටියනේ. ඇයි ඉස්සර කලා පත්තරවල හිටියෙ.''

''ඔව්. අපේ කාලේ හෙන ප්‍රසිද්ධයිනෙ.

''මේ පාහරයා ඒ ගෑනිගෙ ජීවිතේ නැති කළා. ගෑනු දුර දිග බලන්නේ නැතිව වැඩ කරනවා. එතකොටත් ඇමතියා බැඳලා.''

''වැඩ වැරදුනාම ඒ මත්තෙම නගින්ට තමා වෙන්නෙ.''

''අපි ගෑනියෙක් එක්ක කතා කළොත් අපේ ගෑනු මැරෙන්ට හදනවා. ගෑනු දෙන්නෙක් ඉන්න බව මුළු රටම දන්නවා. ඔක්කොම සල්ලිවලට යටයි.''

''මේ කෙල්ල නින්දා මම බයේ හිටියෙ. මල්ලි ගමේ ගිය නින්දා හොඳා. නැතිනම් අම්මගෙන් බැණුම් අහන්ට වෙන්නෙ මටයි.''

''තෝනෙ මට මේක කියලත් බෑ නොකියත් බෑ. සහන් මහත්තයා දන් ඉන්නෙ කොළඹ.''

''මොනවා සේදර. මම ඒ බවක් දැනගෙන හිටියෙ නෑනෙ.''

''මේ පත්තරේ කර්තෘ විදිහට වැඩ කරන්නෙ සහන් මහත්තයා.''

ඈ අදහාගත නොහැකිව දෑස් අයා බලා සිටියාය.

''මම හිතුවා හරි. එහෙනම් වැඩේ දුර දිග ගිහින්.''

''මම නම් ඒවා දන්නෙ නෑ. මිස් මෙයා මිනීමරන වැඩක් කරලා. ඇමතිගෙ මිනිස්සු කොයි වෙලේ වැඩක් දෙයිද දන්නෙ නෑ.''

''සේදර දන්න හඳුනන නිසා පිටකවරෙට ගන්න ඇති. ඒ හැරෙන්න වෙන දෙයක් නැතිව ඇති.''

''හොර ගෑනිගෙ දුවෙක් එක්ක කොහොමටවත් යන්න ඕනෑ නෑ. මම කිව්වේ ඒක නෙවේ.''



ඔහු කතා කළේ වගකීමෙන් යුතුවය.

''සහන් මහත්තයා ඇමතිතුමාගේ ජීවිත කතාව නවකතාවක් විදිහට පත්තරේට ලියලා.''

''මොනවා.. අපේ මල්ලි..''

''පත්තරේ ගෙනාවෙ තෝනට දෙන්නයි. කියවලා බලමු.''

''මම පත්තරය බලන්නම්. මොනවද ලියලා තියෙන්නෙ...?''

''මේවා කොහෙන් හොයාගෙන ද දන්නෙ නෑ. ඇමති තුමාගේ වැලඹිය තැන් ඉඳලා පටන් අරන් ලියලා. මේක වහාම නතර කරන්න කියමු. නැතිනම් මරලා දමයි.''

''අනේ සේදර මල්ලිට කරදරයක් වෙයිද?''

''තෝනේ හොඳම වැඩේ තමයි ඔය පත්තරේ වැඩට යාම නතර කරන එක. ඒක නොකළොත් මල්ලිගෙ ජීවිතේ නැති වෙයි. මොකද මේ ඇමතියා මහා දුර්ජනයෙක්. මැරයෙක්.''

සේදර ගිය පසු ඇය යළි පත්‍රය බැලුවාය. මෙය විකල්ප පුවත්පතකි. සැමියා සිටිය දී ඔහු මෙම පත්‍රය මිලදී ගත්තේය. වාමාංශික විකල්ප පුවත්පතක් වන මෙය ජනතාවට සත්‍ය හෙළි කරන පුවත්පතකි. මෙම පුවත්පතට සම්බන්ධ මාධ්‍යවේදීන්ට රජය විවිධ අවස්ථාවල දී දඬුවම් කළ බව ඇය දනී. මේ අහිංසකයා නිකන් අමාරුවේ වැටෙනවා.

ඕනකොටම වඩා අවජාතක කෙල්ලට හිත ගිහින් වගේ. සියලුම වැඩ නතර කළ ඇය සහන් හමුවීමට පත්‍ර කාර්යාලය සොයාගෙන ගියාය.

ඇමතිවරයාගේ ජීවිත කතාව ඒ ආකාරයෙන් නම් ගම් සහිතව පළ නොකළත් සැවොම කතාව හඳුනාගෙන තිබුණි. පැහැදිලිවම මෙය නිර්මාණ ක්‍රියාවක් ලෙස සෙසු මාධ්‍යකරුවන් පිළිගත්හ. මින් වඩාත් සතුටට පත්ව සිටියේ මිත්‍රය.

WWW.SINHALAELIBRARY.COM 109

"මචං මට උඹ හින්දා හෙන තැත. ඉස්සර උඹව සතේකට ගණන් ගත්තේ නැති උන් දැන් උඹේ හොඳ කියනවා."

ඔහු කිසිත් නොදොඩා නිහඬව සිටියේය. පත්‍රයේ ආරම්භ කළ කතාව නිසා මරණ තර්ජන ආවේය. කතාව නතර නොකළොත් මරා දමන බවට දුරකථන ඇමතුම් ලැබුණි. ඔහු ඒ පිළිබඳව මිත්‍රට දැන්වූයේ නැත. මෙතරම් දක්ෂකමක් වෙනත් ආධුනික ලේඛකයෙකුට හෝ ප්‍රවීණයකුට කරන්නට පුළුවන් වී නැත. මැතිසබයේ පවා එම පුවත සාකච්ඡාවට බඳුන් වී ඇත.

"මේ වගේ ලේඛකයෙක් හොයාගත්තේ කොහොමද කියලා අහනවා. ඒ විතරක් නෙවේ පිටකවරේ හිටපු කෙල්ල කවුද අහනවා."

"කෙල්ලටත් ප්‍රශ්න ඇවිදින් මිත්‍ර."

"පුදුම ලස්සන කෙල්ලක්. හරිම නැචුරල්. මම පත්තරේ පිංතූර එකක් ගහන්ට කිව්වා. බෝඩිමට යන්නේ නැද්ද?"

"මචං උඹ පලයං. මම තව ටිකක් පරක්කු වෙලා එන්නම්."

මිතුරා ගිය පසු ඔහු කෝප්පයේ ඉතුරුව තිබූ කහට ටික මුවේ හලා ගත්තේය. ඇමති පිළිබඳව කාර්යාලයේ එක් රැස් කර තිබූ තොරතුරු ඔහු කියවා බැලුවේය. මිත්‍ර ඉතා සැලසුම්සහගතව කලක් කරුණු රැස්කර තිබුණි. වඩාත් සිත් බැඳගන්නා අයුරින් ඇමැතිවරයා පිළිබඳ කතාව ලිවීමට හැකි වූයේ ඔහු පිළිබඳව වෙනත් තොරතුරු මැතිනියගෙන් ලබා ගැනීමට හැකි වූ හෙයිනි.

"සහන් සර්ව හම්බ වෙන්න කවුද නෝනා කෙනෙක් ඇවිදින්."

"මොකටද දන්නෙ නෑ. එන්ට කියන්න."

මැදිරියට පිවිසෙන අක්කා දුටු සහන් පුදුමයට පත්වුණි.

"අක්කේ..."

"එපා මට අක්කෙ කියන්න."



ඇය තරහෙන් කීවාය.

"ඕන්.. ඕන්.. තරහා ගිහින්."

"මේ මේ මාව කේන්ති කරන්නට එපා. තමුන්ගෙ එක කුසේ උපන් අක්කාට බොරු වංචා කරනවා."

"නෑ අක්කා නෑ... මම එන්ටයි හිටියේ. වෙලාවක් නෑ."

"ඒ තරමටම අක්කව බලන්ට එන්ට වෙලාවක් නෑ."

"අක්කා ඔයාට මතක ද මිත්‍ර. සෙන්ට්‍රල් එකේ මා එක්ක හිටියෙ."

"ඇයි මට මතක නැත්තෙ.."

"අක්කා මට මිත්‍රව හම්බ වුණා. විස්තර අහලා මට පත්තරේට එන්න කිව්වා."

"ඇයි මී හරකො මේක පත්තරයක්ද? මිත්‍රගෙ තාත්තලා ඒ කාලෙත් සමසමාජ, කොමියුනිස්ට් කාරයො. ඒකයි මිත්‍ර ඔය පත්තරේට ගියේ. ඔයාට ඕවා හොඳ නෑ. වෙන ජාතික පත්තරේකට යන්ට."

"අක්කේ මම මේ පත්තරේට කැමතියි."

"මල්ලියේ මේක පත්තරයක් නෙමේ කැලෑ පත්තරයක්. ලේක් හවුස්, ටයිම්ස්, ලක්බිම, දිවයින, රිවිර වගේ පත්තරයකට යන්න."

ඔහු නිහඬව සිටියේය.

"මල්ලි, ඔයා ඔය කරන්නේ භයානක වැඩක්. මොකටද ඔයා අර සමරතුංග ඇමැතිගෙ කතාව පත්තරේට ලිව්වෙ...?"

"රටේ මිනිස්සුන්ට ඇත්ත ලිවීම තමයි පත්තරකාරයෙකුගෙ යුතුකම."

"ඔය යුතුකම් කරන්ට ඕනෑ නෑ. ඔයා වහාම මේ පත්තරෙන් අයින් වෙන්ට ඕනෑ."

WWW.SINHALAELIBRARY.COM 110

ඔහු පිළිතුරක් දිගත නොහැකිව නිහඬව සිටියේය.

"ඊටත් හපන් මොටද බහලවත්තේ කෙල්ලව පිටකවරෙට දැම්මෙ."

ඔහු පිළිතුරක් නොදී සිටියේය.

"ඔයාව කොළඹ ගෙනැල්ලා කරදරේ දැම්මයි කියලා මට අම්මගෙන් බැණුම් අහන්ට වෙයි. ඔය අවජාතක කෙල්ල ඇගේ එල්ලෙන්න හදයි. ඔයා හෙම ඕවට අහුවෙන්ට එපා."

"ඔයාට පිස්සුද අක්කා. පිටකවරෙට පින්තූරයක් ගත්තා විතරයි."

"මේ මට බොරු කරන්ට එන්ට එපා. මටත් දැන් මේ ගෙන්දගම් පොළොව හුරුයි. ඔය කෙල්ල මිනිහෙකුට දෙන්ට බෑ. අන්තිමට ඔයාගෙ ඇගේ ගහයි."

"කිව්ව දේ අහන්ට. ඒ මිස් එක්ක මගේ සම්බන්ධයක් නෑ."

"මල්ලියෙ කොළඹට වෙලා මේ බොරුවට පෙට්‍රල් පුච්චන්න එපා. අර කාංචනා නංගිව බැඳලා මාමගෙ දේපළ ටික බලාගෙන හිටියම ඉවරයි."

ඔහු පිළිතුරක් දුන්නේ නැත. මාමා සතුව නවනගරේ තොග කඩය, පත්‍ර ඒජන්සිය, හාල් මෝල වශයෙන් මහා ධනස්කන්ධයක් ඇත. සැමෝම බලා සිටින්නේ මේ විවාහය කර දීමටය.

"අම්මා මට මල්ලිත් එක්කලම එන්න කිව්වා. කාංචනාගෙයි ඔයාගෙයි මංගල්ලෙ ඉවර කරන්ට ඕනෑ කිව්වා."

"මට මේ දවස් ටිකේ වැඩ තියෙනවා."

අක්කා ගියේ අමනාපයෙනි. ඇය ගිය නොබෝ වේලාවකින් ඇමතුමක් ලැබුණි.

"දැන් හරි ආඩම්බරයි."

"ඇත්තමයි මම මේ කතා කරන්ටයි හිටියෙ."



"අපායෙ යන බොරු කියන්ට එපා සහන්. ඔයා දැන් හරි ආඩම්බරයි."

"මම මොකටද ආඩම්බර වෙන්නෙ...?"

"හරි... හරි මම තේරුම් අරන් ඉවරයි. මම මේ කතා කළේ මගේ වැඩකට නෙමේ. ආත්තම්මගෙ වැඩකට."

"මම පත්තරේ වාහනයක් ඉල්ලගෙන එන්නම්. හැබැයි ඉක්මනට යන්ට ඕනෑ."

"මම එන්නෙ නෑ. ඔයා ආත්තම්මව ගිහින් ඇරලන්න."

"ඒක ඔයාගේ කැමැත්තක්."

එකවරම ඇයට සහන් ටෙලිෆෝනය තියන හඬ ඇසුණි. වරෙක ඔහු කෙරෙහි ආදරයක් ද තවත් වරෙක තරහක් ද ඇතිවෙයි.

"කොහොමද දුව... ගමන හරිද? කරදර වෙන්න එපා ඔයාලා වැඩ තියෙන අයනෙ. මම පිටකොටුවට ගිහින් බස් එකක යන්නම්."

"නෑ නෑ ආත්තම්මව අපිට එහෙම අරින්ට බෑ. සහන් පත්තර ඔෆිස් එකේ වාහනයක් අරන් එනවා කිව්වා. අපි ඩීසල් ගහමු."

ඔවුන් කතා කරමින් සිටිය දී වත්සලා ආවාය.

"ඇයි අම්මා හදිසියෙන්ම ආවේ...?"

වත්සලා පිළිතුරක් නොදී සිටියාය.

"ලොකු දුව ආව එක හොඳා. මම මේ හෙට ගමට යන්ට කියලා."

"අම්මට මම හෙට යන්න වාහනයක් කතා කරලා දෙන්නම්."

"අපරාදෙ වියදම් කරන්ට එපා. සහන් ඩීසල් ගහගෙන යන්න පත්තරේ වාහනයක් ගේන්නම් කිව්වා."

"නොගැලපෙන එවුන් ආශ්‍රය කරනවට මේවා අපිට හොඳ පාඩම්.

WWW.SINHALAELIBRARY.COM 111

"මොකක්ද ඒ කොල්ලුවගෙ වරද..?"

මිලිනා මැතිනිය අමනාපයෙන් කිව්වාය.

"සහන්ගෙ අක්කා ඇවිදින් අපි මල්ලිව අල්ල ගන්න හදනවා කියලා මට බැන්නා."

පංචලි පිළිතුරක් දීමට නොහැකිව බලා සිටියාය.

"මහ කටකාර කයිවාරුකාර ගෑනියෙක්. මල්ලි විශ්වවිද්‍යාලෙ කාරයෙක්ලු. අනුරාධපුරේ මාමගෙ දුව කසාද බන්දලා දෙන්න යනවලු. කැකිරාවේ, තිරප්පනේ හාල් මෝල් තියෙනවලු."

"ඉතින් ඇත්ත වෙන්න ඇති. අපිට මොකද?"

"ඩ්‍රයිවර් කෙනෙකුට අපේ දුව ඇගේ ගහන්න යනවා වගේ කතාව."

"ලොකු දුව මොනම දේකටවත් කලබල වෙන්න එපා. අපි මේ මඟුල් කුලා කරන්ට කතා කරනවා නෙමේ."

"හොඳයි එන්නෙ නැතෑ. මම එතකොට බලා ගත්තම්. අපි හිර ගනුදෙනු කරන්න ඉන්නවා කියලා හිතුවද දන්නෙ නෑ. මහත්තයා දන්නවා නම් මවුන්ව තියන එකක් නෑ."

"දැන් මම මේ කතා කරගන්න ගමන යන්නම්. මිනිස්සු තරහා කර ගන්ට එපා. හතර වගේ මනුස්ස ආශ්‍රයක් නෑ. මිනිහෙක් මළත් උදව්වට එන්නෙ නෑ."

වත්සලා දෙනෙතේ නැඟුණු කඳුළු ඉවතට හැරී පිස දමා ගත්තාය. ආවේ කටකාර ගෑහැනියෙකි. ඇය පැවසූ කතාව මවට පැවසිය නොහැක. අවජාතක දුවෙක් මල්ලිගේ ඇඟේ ගැසීමට සූදානම් වන බව ඇය පැවසුවාය. හිතට දුකක් වේදනාවක් දුනුණේ ඉන් පසුවය.

"මහත්තයා මගේ දුවව හොඳ කෙනෙකුට දෙනවා කිව්වා."



# 30

පතුය සතුව එතරම් සම්පත් නැත. සහිපතා පළවන පත්‍රයක් නිසා කර්තෘ මණ්ඩලයට වාහනයක් ඇත. මිතුගේ විශේෂ අවසරය මත වැන් රිය ලබාගත හැකි වුණි. පත්‍රයේ සිට එද්දී අවශ්‍ය ඉන්ධන ගසා ගත්තේය.

රාත්‍රී අහර ගත්තේ මිත්‍ර සමගිනි.

"මචං උඹ ටිකක් නෙමේ හොඳටම පරෙස්සම් වෙන්ට ඕනෑ කාලයක් මේක."

"අක්කා දෝස්මුරේ දම්මා. පත්තරෙන් අයින් වෙන්නලු. මම බෑ කිව්වා."

"අපි පෞද්ගලිකව කාටවත් පහර ගහන්නේ නැහැනෙ. ඊට පස්සෙ වෙන චරිතයක් ගැන ලියනවා."

"ඔව්. ඇස්. ඒ. වික්‍රමසිංහ, ඇන්. ඇම්. පෙරේරා, බණ්ඩාරනායක, මහත්මා ගාන්ධි, චරිතාපදාන ලියලා තියෙන්නෙ."

"මට මේ වගේ දෙයක් කියන්න අයිතියක් නෑ. උඹට මේ අකුරැස්සේ ගමන නොගිහින් ඉන්ට බැරිද? මේ ගමනේ කිසියම් යටි අදහසක් තියෙනවද?"

WWW.SINHALAELIBRARY.COM 112

''ඉස්සෙල්ලම කියන්නම්. යටි අදහසක් තියෙනවා කියලා උඹ හිතන්නෙ පිටකවරෙ ඉන්න කෙල්ල එක්ක මගේ සම්බන්ධයක් ඇති කියලා නේද?''

''ඒක උඹේ බලාපොරොත්තුව, කැමැත්ත නම් අපිත් අත උස්සනවා. ඒකි කුමාරිකාවක් ද, කන්‍යාවියක් ද, වෛශ්‍යාවක් ද කියන එකේ මට කිසිම ප්‍රශ්නයක් නෑ. උඹ කැමති නම් මාත් කැමතියි. එච්චරයි.''

''අපේ ඇසුර ආදරයක් දක්වා ගෙන ගිය එකක් නෙවේ. උඹ මගේ හොඳ යාළුවෙක් වගේම පංචලිත් මගේ හොඳ යෙහෙළියක්.''

''රයිට්... එහෙම නම් කමක් නෑ. නෑ... මම හිතුවේ මෙහෙමයි. මේ සම්බන්දෙ තවත් එහා ගිහින් කසාද බැඳලා දරුවෝ හදලා හොඳ ජීවිතයක් ගත කරාවි කියන එක තමා මම හිතුවෙ. මම ඒකට කැමතියි.''

''උඹ නම් මාර බඩුවක් තමයි. උඹ වාමාංශික විකල්ප පත්‍ර කාරයෙක් නෙවේ සිහින විකුණන්නෙක්.''

ඔහු සිනාසෙමින් කීවේය.

''නෑ මචං මේක අභියෝගයක්. පැහැදිලිවම මේ වගේ කෙනෙක් තමා උඹට ගැළපෙන්නෙ.''

ඔහු නව ඉදිආප්පයක් පිඟානට දමා ගත්තේය.

''මට මාමගෙ දුව කාංචනාව බන්දලා දෙන්නයි යන්නෙ.''

''මචං. පැහැදිලිවම ඒ ළමයට උදව් කිරීමේ යුතුකමක් තියෙනවා. අනික නිකන් තැන් තැන්වල දුක් විඳින්ට ඕනෑ නෑ. මම දන්නවනෙ තියෙන දේපළ.''

''කාංචනායි මායි ආශ්‍රය කළේ වෙනත් විදිහටයි. මිනිහ මළා කියලා නංගි විදිහට ආශ්‍රය කරපු නංගි කෙනෙක්ව ගෑනියෙක් කරගන්ට පුළුවන්ද මචං. ඒක මහා ජරා යෝජනාවක්.''



''එහෙම නම් පංචලි එක්ක දිග කන්ට බැරි අවජාතක කෙල්ලෙක් හින්දද?''

''අවජාතක කියන එක මනුස්සයෙකුට කියන්ට බෑ. උඹ නම් මාර පිස්සු ප්‍රශ්න අහන්නෙ.''

''නෑ මට මේවා අහන්ට ඕනෑකම තිබුණා. හරි උඹට උදේට යන්ට තියෙනවෙන. නිදා ගනින්.''

දත් මැද මුහුණ සෝදා සරම හැඳ නිදා ගැනීමට සූදානම් වෙද්දී දුරකථන ඇමතුම ලැබුණි.

''කතා කළාට කමක් නැද්ද?''

''වෙනදත් අහලද කතා කරන්නෙ.''

සහන් ඇසුවේය.

''දැන් වෙනද වගේ නෙමෙයිනේ. වෙනස්.''

එකවරම ඇය හඬන හඬ ඇසුණි.

''ඇඬුවොත් මම කතා කරන්නෙ නෑ. ෆෝන් එක ඕෆ් කරනවා.''

''නෑ.. නෑ.. අඬන්නෙ නෑ.''

''අපි හෙට උදේ පාන්දරින් යනවනෙ. හෙට උදෙන්ම නැගිටලා මට කතා කරන්න.''

''අපි හෙට ගමන කැන්සල් කරමු.''

''මේ පිස්සු කතා නොකර ගිහින් නිදා ගන්න.''

''මම හෙට එන්නෙ නෑ. තනියම යන්ට වෙයි.''

''නැත්තම් මම එවෙලෙට බලා ගන්නම්.''

WWW.SINHALAELIBRARY.COM 113

''මොනවා කරන්නද?''

"ඇදගෙන යනවා. උස්සගෙන යනවා."

"මම දන්නවා චණ්ඩියා බව."

ඇගේ සිනා හඬ ඇසුණි.

"මම නැවිදින් ඉන්නම් සහන්."

"ඇයි මේ විදිහට වෙනස් වුණේ. මා එක්ක යන්න එපා කියලා කවුරුවත් කිව්වද?"

ඇය පිළිතුරක් නොදී සිටියාය.

"හරි, හිතට ප්‍රශ්න ඇති කරගන්ට එපා. ඔක්කොම අමතක කරලා නිදා ගන්න. මම ආත්තම්මව ඇරලලා එන්නම්. එක අතකට අපි දෙන්න තනියම යන එක හොඳ නෑ."

ඔහු ඇගෙන් සමුගත්තේය. මොනවා හරි දෙයක් සිදුව ඇති බව ඔහු තේරුම් ගත්තේය. කඩිනමින් ඇඳට ගියේ විකක් නිදා ගැනීම සඳහාය.

සහන් පාන්දර පිබිදුනේ ඔර්ලෝසුවේ හඬිනි. ආත්තම්මා කැඳවාගෙන යාමට වූ පොරොන්දුව එකවර සිහි වුණි. මුහුණ සෝදාගත් ඔහු තේ උගුරක්වත් නැතිව ගමන ඇරඹුවේ ඉක්මනින් ආපසු ඒමට ඇති බැවිනි. රථය පණ ගන්වා ගත් ඔහු ආත්තම්මාගේ නෑයාගේ ගෙදරට ගියේය. රථයෙන් බැස නිවසට ගියේ පංචලි දැකීමේ අටියෙනි. ඇය හා බැඳි මොකක් හෝ ප්‍රශ්නයක් ඇත. පත්‍රයේ පිටකවරයට පෙනී සිටීම නිසා මෙම ප්‍රශ්නය ඇතිවූවා විය හැක. එසේ නැතිනම් ඇමතිවරයා ගේ ජීවිත කතාව ඇසුරෙන් නිර්මාණය කළ කතාව නිසා ඇතිවූවා විය හැක.

"දුව... මේ සහන්ට තේ එකක් ගේන්න."

"ඕන්නෑ මැඩම්."

"ඕන්නැති වෙන්නෙ කොහොමද? තේ එක ගේන්න."



නිවස හිමි කාන්තාවගේ දියණිය කඩිනමින් තේ රැගෙන ආවාය.

පංචලි පෙනෙන්ට නොසිටීම සැහෙන ප්‍රශ්නයකි. එහෙත් ඒ පිළිබඳව විමසීමට හැකියාවක් නැත. තේ කෝප්පය තැබූ ඔහු වටපිට බැලුවේය.

"නාලනි දුව.. එහෙනම් මම යනවා."

"නැත්දා... මම ක්ලිනික් ඩේ එකට මතක් කරන්නම්."

ඇය වැඳ ආචාර කරමින් කීවාය.

"සහන් ළමයෝ යමු."

සහන් බෑග් දෙක රැගෙන රථය දෙසට ගියේය. එකවරම හදවතට පිවිසුණේ දැඩි වේදනාවකි. ගාල්ල, මාතර පත්තර ඩීලිවරි යන ආරියපාලට කීවා නම් මේ කටයුත්ත කළ හැකිව තිබුණි. කොතරම් නැතැයි කීවත් මිනු පැවසුවාක් මෙන් පංචලි තම සිත තුළ ජීවත් වන බවක් දැනේ. ඇමතිවරයාගේ අනියම් බිරිඳගේ දුව යන ප්‍රශ්නය තමාට කිසිම බලපෑමක් නැත.

"සහන්.."

"ඇයි මැඩම්."

"වෙනද යන කොට මෙහෙම නෙමේ.. මොනවා හරි කියනවනෙ."

"මිනිස්සු හැමදාම එකම විදිහට ඉන්න හොඳ නෑ කියන එක මම ඊයේ රෑ තේරුම් ගත්තා."

ඔහු සිත් බිඳුණු හඬින් කීවේය.

"සමරතුංග ඇමති තුමා ගැන පත්තරයට ලිව්වෙ ද්වේශ සහගතව නේද?"

"ඇමතිතුමා ගැන මගේ හිතේ පෞද්ගලික අමනාපයක් නෑ.

WWW.SINHALAELIBRARY.COM 114

වාන්තීය දේශපාලනය කරනකොට කවුරුන් එහෙම තමා. මම කළේ පත්‍රය විසින් මට පවරපු දෙයක්."

"ඒ කිව්වේ...?"

"මේක විකල්ප පත්‍රයක්. පක්ෂ විපක්ෂ භේදයක් නැතිව මැති ඇමැතිවරුන්ගේ විස්තර මේ කාර්යාලයේ එක් රැස් කරලා තියෙනවා. මුඹ කළේ ලිව්ව එක විතරයි."

"මගෙන් ඇහුව නම් තව විස්තර දෙනවනෙ. මේ මිනිහා නිසා මා තරම් දුක් වින්ද, තවත් දුක් විඳින කෙනෙක් නෑ සහන්."

ඔහු පිළිතුරක් නොදී මඳ වේලාවක් සිටියේය.

"රස්සාවට අදාළව මේක ලිව්වත් මේක ලිවීමෙන් මම කළේ බරපතළ වරදක්. මේක මා නොලිය යුතුව තිබුණා."

ඔහු කම්පාවෙමින් කීවේය.

"නෑ සහන් කළේ හොඳ දෙයක්. අද මේ රටේ සල්ලිකාරයින්ට එක ගැහැනියෙකුට වැඩිය ඉන්නවා. ඒ වගේ ජරා මිනිසුන් ගැන රටට හෙළි කරන්ට ඕනෑ. මේ නිසා මා පෞද්ගලිකව දුක් විඳින අම්මා කෙනෙක්."

"මා මේ ලිපිය ලිවීමෙන් පංචලි මිස් ගේ හිතට වේදනාවක් ඇතිවෙන්ට ඇති. මාත් දුරදිග බලලා වැඩ කරන කෙනෙක් නෙමේ. මටත් පත්තරේට පින්තූරේ නොදා ඉන්ට තිබුණා."

"නෑ නෑ ඒ ගැන දුක්වෙන්ට එපා. දුව කැමතියි."

"මැඩම් කොහොමද ඒක දන්නේ. මේ ගමන නාවේ මා එක්ක තරහා වෙලා."

සාකච්ඡාව නතර වුණි. ඔහු සිටින්නේ දුකින් බව මිලිනා මැතිනිය දැනගත්තාය. වැන් රියේ පසුපස අසුනේ නිදාගෙන කරාවට සවන් දෙන පංචලිගේ සිතේ ඔහු කෙරෙහි ඇතිවන්නේ දැඩි ගෞරවයකි. තාත්තා පිළිබඳව මෙම කතාවේ පෞද්ගලික



පළිගැනීමක් සිතේ ඇති නිසා යැයි ඇය සිතා සිටියාය. ඔහු කවදත් බාල වැඩ නොකරන්නෙකි. මිතුරු මිතුරියන් මෙන් ඇසුරු කරමුයි පැවසීමෙන් තමා කළේ බලවත් වරදකැයි සිතෙන්නේ දැන්ය. කිසියම් පුද්ගලයෙකුට තමා කැමති ගැහැනිය වෙනුවෙන් මිනැම කැප කිරීමක් කිරීමට පුළුවන. ආදරයට සුජාත අවජාත බව සලකන්නේ නැත.

තම ආදරය කෙළින්ම පැවසුවා නම් ඔහු කවදාවත් ගමේ ගැහැනියක් විවාහ කර ගැනීමට කැමති වන්නේ නැත. දැන් ඔහුට විවාහ කර දීමට සූදානම් කර ඇත්තේ නව නගරයේ ව්‍යාපාර හිමි පරපුරක ගැහැනියකි. මෙතෙක් කල් ඇසුරේදී අප ආදරයක් ගැන කතා කර නැත. ඔහුට වෙන ගැහැනියෙක් අක්කලා විවාහ කර දෙන්නට යන්නේ ය යන කතාව ඇයට දරාගත නොහැකි වුණි. සුපුරුදු රථ ගාලේ රථය නතර කළේ තේ පානය සඳහාය.

"මැඩම් තේ බොමු."

මිලිනා මැතිනිය රථයේ වැතිර සිටින පොඩි දුව දෙස බැලුවාය. ඇය ද මේ දඟකාර වැඩවලට කැමතිය.

"ආත්තම්මා යන්න. මම පස්සෙ එන්නම්."

පංචලි ශබ්ද නොනඟින අයුරින් හස්ත සංඥාවෙන් ආත්තම්මාට කීවාය. මිලිනා මැතිනිය රථයෙන් බැස ආපනශාලාව වෙත ගියාය.

"මැඩම් මොනවද කන්නෙ...? සීනිත් තියෙන නිසා කුරක්කන් පිට්ටුවක් කමු."

"ආ... ඔව්. කෑමට පෙර පෙත්තක් බොන්න තියෙනවා සහන්. මගෙ බෑග් එක ගේන්ට බැරිව ගියා."

"මට අද බඩගිනි නෑ. මැඩම් කන්ට. හිත හරි නෑ. යන ගමන් කන්න මම බනිස් ගෙඩියක් ගන්නම්."

"වෙනදා උදේට බත් පිඟානක් කනවා නේද?"

WWW.SINHALAELIBRARY.COM 115

ඔහු නිහඬව බෙහෙත් බෑගය ගෙනෙන්ට ගියේය. නෝනාව ඩිලිවරි පියසේන අත එව්වා නම් හොඳ යැයි සිතෙන්නේ දැන්ය. ඉකුත්වර එද්දී ගී ගැයූ හැටි ඔහුට සිහිවුණි. අල්කා යග්නි, කවිතා ජයරාම්ගේ ගීත ගැයීමට පංචලි මැනවින් දත සිටියාය. මේ මොකක්ද වුණේ...? පාරට නොගොස් හෝටලයේ බිත්තියට හේත්තු වී සිටියේය. ඉකුත්වර පැමිණි ගමනේ දී අප අතර කොතරම් බැඳීමක් තිබුණාද? කාන්තා කාමරයට යද්දී ඇගේ ලේන්සුව හා අත්බෑගය තමා අතට දුන් හැටි සිහිවුණි. ගිය කාර්යය අවසන් කර ඒමේදී ලේන්සුව තබාගෙන බෑගය පමණක් දුන්නේ අමතක වූ පරිද්දෙනි. ඒ ලේන්සුව මැණික්කක් මෙන් සුරැකිව තබා ගත්තේ ඇයි? මුහුණ, ගෙල, තොල්පෙති ස්පර්ශ කළ ගැහැනු සුවඳ තමාට එක් දෙයක් සිහිපත් කරවයි.

අපි යාළුවෝ මෙන් ඇසුරු කරමුයි කළ යෝජනාවට මම හා කිව්වේ ඇයි...? මම අලි පල් මෝඩයෙක්. එහෙම බෑ.. මම ආදරෙයි කියලා කියන්ට බැරි නිවටයෙක්. ගැහැනු එළිපිට ආදරෙයි කියන්නෙ නෑ. ඒ හැසිරීමේ ඇත්තේ නිර්ව්‍යාජ ආදරයක්. පිරිමියෙක් තමා ඒ වගකීම ගන්න ඕනෑ.

වැහි අඳුර ලොව වටකරගෙන ඇත. හමන සුළඟ සිසිල්ය. දෙවියනේ අද පංචලි සිටියා නම්... මෙම ගමනට පංචලි මැදි කරගන්ට සිතුවේ ඇය පිළිබඳව තම හදවතේ වූ අපේක්ෂාවන් ප්‍රකාශ කිරීමට. අම්මලා, මාමලා කාංචනාව යෝජනා කළත් නංගි වාගේ හිටපු කෙනාව ගැහැනිය කර ගන්නේ කොහොමද? ආදරේ කියන භාවමය සිද්ධිය කාටවත් අතින් අල්ලලා පෙන්වන්ට බෑ.

වැස්ස වැටෙන නිසා රථයට යාගත නොහැකිව ඔහු බලා සිටියේය. වැස්සෙන් බේරෙන්ට හෝටලය දෙසට දුව එන පිරිස අතර සිටි තැනැත්තිය දුටු සහන් එය අදහාගත නොහැකිව බලා සිටියේය. දෙවියනේ... මේ කවුද...? හදවතට පිවිසි සතුට දරාගත නොහැකිව ආවරණය යට සිට හිස පිස දමා ගන්නා පංචලි දෙස බලා සිටියේය. මෙතෙක් හදවතේ වූ දුක් දෝමනස්සයන් සියල්ල වැහි අඳුර මෙන් පහව ගියේය.



සහන් පසුපසින් ගොස් ඇය අසල සිට ගත්තේය. ඔහු සිය පිරිමි ලේන්සුව ගෙන ඇගේ හිස පිස දැම්මේය. එක්වරම ආපසු හැරුණ පංචලිගේ මුහුණේ දඟකාර සිනාවක් නැත්පත්ව තිබුණි.

"ඕන්නෑ හිනාවෙන්න."

ඔහු අමනාපයෙන් කීවේය.

"ඉතින් මම ආවනෙ."

ඇය ඔහුගේ දෑත් අල්වා ගෙන කීවාය.

"මේ වගේ වේදනාවක් හිතකට දෙන්න දුකක් හිතුණේ නැද්ද?"

ඇය පිළිතුරක් නොදී බලා සිටියාය.

"බොහෝ දේ ආයාසයෙන් වුණත් දරන්න පුළුවන්. ඒත් පංචලි නැතිවීම මට දරාගන්න පුළුවන් වුණේ නෑ."

"ඉතින් මම ආවනෙ. මම ළඟ ඉන්නවනෙ. හිනාවෙලා මා දිහා බලන්න."

ඇය සහන්ගේ දෑත් ළයට තදකර ගනිමින් කීවාය.

WWW.SINHALAELIBRARY.COM 116

# 31

ගෙවී ගිය දේවල් ගැන කතා කළ යුතු නැත. තමා ඉපදුනේ ප්‍රශ්න රැසක් සමගිනි. ඒ කිසිවක් කිසිමාකාරයකින් විසඳිය නොහැක. අවජාතක තින්දාවෙන් අප තිදෙනාටම මිදිය නොහැක. අම්මාට කිසිදාක නීත්‍යානුකූල විවාහයක් ලැබෙන්නේ නැත. ආච්චි අම්මා හා තමා එකම සිදුවීමක් නිසා දුකට පත් වූවන්ය. කිසිදාක වැදගත් පවුලකට තමා විවාහ කර දීමට නොහැකි බව පංචලි දනී. එහෙත් තමාට කිසිදාක එවන් අයිතියක් නැත. සහන් මුණගැසුණේ සිත අයාලේ ගොස් තිබූ මොහොතකය. ඔහු හැර වෙන කිසිවෙක් හදවතට පිවිසීමට අවසර පතා නැත.

බොහෝ දුෂ්කර කාල පරිච්ඡේදයක් ගෙවද්දී මුණගැසුණු සහන් සිසිල් පැන් පොදක් වැන්න.

සහන් අනුරාධපුරේ මාමාගේ දුව සමගින් විවාහ වන බව දැනගත් දිනයේ සිත ව්‍යාකූල වූ හැටි සිහිවෙයි. ඔහුට නොදන්වා රටයේ ආවේ ඇත්තටම දුකින් යුතුවය. සහන් ආත්තම්මා සමග වූ පිළිසඳර කොතරම් හැඟිම්බරද? ආත්තම්මා ඔහු හා කතාවේ යෙදුනේ සත්‍ය හෙළිදරව් කිරීමට පැමිණිල්ල පක්ෂයෙන් කතා කළ නීතිඥවරියක ලෙසිනි.

මෙය කොතරම් හැඟුම්බර අවස්ථාවක් වුණාද? ශී හැඩියව



ආත්තම්මා සහභාගි වූවාය. අවසානයේ ගීතයෙන් ගීතය ගැයීමට තිදෙනාම එක්වූහ. සියලු ප්‍රශ්න අමතක කර වෙනස් ලොවකට පිවිසීමට ඔවුහු සමත් වූහ.

"අපි යන ගමන් රුචිරලගෙ ගෙදරටත් ගොඩවෙලා යමු. මොනව හරි දෙයක් ගන්ට ඕනෑ."

"ඔව් නේද? අපි එදත් ගියේ හිස්අතින්."

සල්පිල පිහිටා තිබුණේ පාර අනික් පසෙය.

"මොනවද ගන්ට ඕනෑ. මට තේරෙන්නෙ නෑ. යමුද?"

"මටත් වැඩි තේරුමක් නෑ. ආත්තම්මා මොනවද ගන්නෙ..?"

"පලතුරු මොනවා හරි ගන්න."

පාර හරහා පනින්ට ප්‍රථම ආරක්ෂාව වෙනුවෙන් ඇගේ අතින් අල්ලා ගත්තේය. එය ව්‍යාපාර රැසක් ඇති මධ්‍යස්ථානයකි. ඇය ඔහුගේ අත නොහැර සිටියාය. පුවත්පත්, සඟරා අංශයේ සිටි තැනැත්තාගේ නෙත යොමුව තිබුණේ පංචලි වෙතය. ඡායාරූපය සහිත පුවත්පතක් එල්ලා තිබෙනු පංචලි දුටුවේ නැත. ඇය සහන් පලතුරු ගන්නා තෙක් එදෙස බලා සිටියාය.

"මිස්, පොඩ්ඩක් මේ සර්ට කතා කරන්ට ඕනෑ කියනවා."

පනු කවුන්ටරයේ තැනැත්තා කීවේය. ඈ සිනාමුසු මුහුණින් යුතුව සිටියාය.

"මොකක් ගැනද?" ඇය විනීතව ඇසුවාය.

"පෙරමග අපේ වාමාංශික නායකයෝ ආරම්භ කරපු පත්‍රයක්. මේ පත්‍රයේ පිටකවරෙ ඉන්නෙ මිස් නේද?"

"ඔව්." ඇය මඳ සිනාවෙන් යුතුව කීවාය.

"ඉස්සර දැකැත්තයි මිටියයි දාලා වැඩ කරන ජනතාව නියෝජනය වන පත්තරේ සම්පූර්ණ ආකෘතියම වෙනස්."

"පත්තරේ අභ්‍යන්තරයේ අඩුවක් තියෙනවද?"

"නෑ බොහොම අපූරුවට පත්තරේ හදලා තියෙනවා. කවුද මේ පත්තරේ කරන්නෙ. අපේ පරණ සහෝදරයෝ ඉන්නවද?"

"මම නම් විස්තර කියන්ට දන්නෙ නෑ. අන්න අර පලකුරු ගන්න මහත්තයාගෙන් අහන්න. එයා තමා කර්තෘ."

ඇය සහන් දක්වමින් කීවාය. එම මැදිවියේ තැනැත්තා පත්‍රයේ පාඨකයෙකි. ඔහු සහන්ට අතට අත දී පිළිගෙන ඉන් අනතුරුව එහි සිටි අනිත් අයට ද සහන් හඳුන්වා දුන්නේය.

"ඇත්තටම යුගයත් එක්ක හැමදේම වෙනස් වෙනවා නම් පත්‍රයත් වෙනස් වුණාට කමක් නෑ."

"අන්තර්ගතයේ වෙනසක් නෑ."

"ඔව්. නමින් නොලිව්වට ලියලා තියෙන්නෙ සමරතුංග ගැනනෙ. ඒ ජඩයා ගැන අපෙන් ඇහුවා නම් කියනවා."

"ඔය කරණම් ගැහුවට ඉස්සර වාමාංශිකයෙක්. සමූපකාරේ වැඩ කළේ."

"සල්ලිකාර ගෑනියෙක් බැන්දා. ගැහුවා ගැහුවා කෝටිපතියෙක් වුණා."

මේ පවසන්නේ කා ගැන දැයි පංචලි දනී.

"විස්තර මගෙන් අහමු. හක්මණ සංගීත ටීචර් කෙනෙකුගේ ලස්සන දුවෙක් අනාථ කරලා ළමයෙකුත් ඉන්නවා. කෙල්ලගෙ තාත්තා ගිහින් අමාරුවට මළා. ඒවත් දමලා ලියමු මහත්තයෝ. මුන් නිරුවත් කරන්ට ඕනෑ."

"බොහොම ස්තුතියි. හදිසි ගමනක් යන්ට තියෙනවා. අපි යනවා."

පංචලි සහන්ගේ අත තරයේ අල්වාගෙන එළියට ආවාය. ඔහු ඇගේ කඳුළු පිරි දෙනෙත දුටුවේය.

"නෑඩා ඉන්න. ආත්තම්මට තේරෙයි."



ගමන ආරම්භ වුණි. ගමනේ සතුට නැති වූවාක් සේ ඔහුට දැනුණි.

"ඒ ගැන හිතන්ට එපා."

"මට දුක් මේවා ගාණක් නෑ සහන්. මම මුළු ජීවිත කාලය පුරාම ලජ්ජාවට පත්වෙච්ච කෙනෙක්."

"ඔයා ලැජ්ජා වෙන්නෙ මොකටද? ලජ්ජා වෙන්න ඕනෑ වෙනත් අය."

රුවීරගේ නිවස වෙත ළඟා වන විට ඔවුහු ප්‍රශ්න අමතක කළහ.

"අද ජෝඩුවම එයි කියලා රුවීර කිව්වා."

රුවීරගේ බිරිඳ පංචලිගේ අතින් අල්ලා ගනිමින් සිනාසුණාය.

සහන් මිලිනා මැතිනියගේ අතින් අල්ලාගෙන නිවසට කැඳවාගෙන ආවේය. මිතුරන් දෙදෙනාට කතා කළ යුතු බොහෝ දේ තිබුණි. බිරිඳ සූදානම් කළ සිසිල් බීම පානයෙන් පසු ඔවුහු යාමට සූදානම් වූහ.

"එහෙනම් රුවීර අපි යනවා."

"පිස්සුද විනාඩි දහයක් හිටපන්."

"බෑ මචං... අපි හෙට එන්නම්."

"හෙට අනිවාර්යයෙන්ම එන්න ඕනෑ. කිරි සප්ලයර්ස්ලා මෙහාට එනවා."

"තියෙන විදිහට කෑම කටක් කාලා යමු."

රුවීරගේ අම්මා යෝජනා කළාය.

"ඔයා නංගිවයි අම්මවයි ඇතුළට එක්ක යන්න."

පංචලි ආත්තම්මා කැටිව නිවස තුළට ගියාය. සහන් කවරෙක් ද යන්න ආත්තම්මාට පෙන්වීමට මෙය හොඳ වෙලාවකැයි ඇයට

WWW.SINHALAELIBRARY.COM 118

සිතුණි. අඩු වශයෙන් සහන් තමා කවරෙක් ද යන්න තමාටවත් හෙළිකර නැත.

"ආත්තම්මා ඔයාට බඩුවක් පෙන්වන්නද?"

ඇය හිස සැලුවාය.

"හැබැයි ආත්තම්මා ඔයා මේක දන්න බවක් අඟවන්න එපා. හරිද?"

ඇය පහත් හඬින් කීවාය.

"හරි... හරි... මොකක්ද ඔච්චර හංගන රහස...?"

ඇය ආත්තම්මා සමඟ යාබද කාමරයට ගියාය. ඇය රුචිරගේ හා බිරිඳගේ මංගල ඡායාරූපය බැලුවාය.

"දෙන්නම උපාධිකාරයොද?"

"ඔව් ආත්තම්මා. අනික් පින්තූරෙ උපාධි කෝට් එක දාගෙන ඉන්නෙ කවුද බලන්න."

ආත්තම්මා සහන්ගේ ඡායාරූපය දෙස බලා සිටියාය.

"දුව.. දුව.. මේ අපේ සහන් නේද?"

"ඔව් ආත්තම්මා. සහන් ග්‍රැජුවේට් කෙනෙක්. ඒ විතරක් නෙමේ සෙකන්ඩ් අපර් එකක් තියෙනවා."

බොක්සිං ග්ලව්ස් පැළඳ ප්‍රභාකර ඉරියව්වකින් සිටින ඡායාරූපයක් හා කරාටේ ඇඳුමෙන් ගන්නා ලද ඡායාරූපයක් ද ඒ අතර විය.

"අපි ඉක්මනට එළියට යමු."

ඇය ආතම්මාගේ අතගෙන කාමරයෙන් පිටතට ආවාය.

"මම ගිය සැරේ ආපු වෙලාවේ දක්කෙ."

ඇය දුල්වූ දෑසින් යුතුව පහත් හඬින් කීවාය.

"මිනිහෙක් දිහා දක්ක ගමන් කියන්ට පුළුවන්. හොඳට ඉගෙන



ගත්ත කෙනෙකුට මිසක් පත්තරයක වැඩ කරන්ට බෑ. සහන් හොඳ ළමයෙක්."

"සහන් හොඳට ඉගෙන ගත්ත කෙනෙක් විත්තිය මම දන්නවා ආත්තම්මා. ඒත් මම අහන්නෙ නෑ. අම්මා සහන්ව බාල්දු කරලයි කතා කරන්නෙ."

"එයාට කොහොමටත් මනුස්සයෙකුගෙ හොඳ නරක හොයන්ට බෑනෙ. ඒකනෙ අමාරුවෙ වැටුණෙ."

"ආත්තම්මා කවදද හරි රහස එළිවෙන්නෙ නැතෑ. එතකල් අපි සද්ද නැතිව ඉමු."

"අන්න හොඳා. අපිත් හොඳ වැඩක් කරමු."

පැහැදිලිවම මෙය සතුටුවිය හැකි පණිවුඩයකි. යමක් පිළිබඳව තීරණයක් ගැනීමට හොඳ පසුබිමක් තිබිය යුතුය. පොඩි දුවගේ සිතේ සැඟවුණු දෙයක් ඇති බව මිලිනා මැතිනිය තේරුම් ගත්තේ කලකට ඉහතය. දුවගේ සිත තේරුම් ගැනීමට ඇයට කිසි අපහසුවක් තිබුණේ නැත. මෙවැනි තේජවන්ත පිරිමියෙක් කුමන ක්‍රියාවක් කළත් ගැහැනියකගේ ගෞරවය විශ්වාසය රැකගන්නා බව ඇය දැන සිටියාය. තමා මිය යන්නට ප්‍රථම දුව පෝරුවේ නංවා විවාහ කර දීමේ දැඩි ආශාවක් සිතේ තිබුණි. මෙහි ප්‍රධාන ගැටලුව වන්නේ මංගල යෝජනාවක් මගින් කිරීමට නොහැකි කමය.

"තියෙන විදිහට කෑම ටිකක් කමු."

රුචිරගේ මව වතුර වීදුරුවක් පිරිනැමුවාය.

"කරදර වුණා නේද? එන්න දුව. දැන් චන්ද්‍රවති අපි එනකල් කෑම උයන් බලන් ඇති."

"ඒවා රැට කන්ට බැරිවයැ."

"පරක්කු වුණා. කෑම කටක් කාලා යමු."

දිවා ආහාරය ගැනීමෙන් පසු ඔවුහු අකුරැස්ස බලා පිටත් වූහ.

වැසි වැටීම නිසා පරිසරය ප්‍රබෝධමත් වී තිබුණි. ආත්තම්මා නිවසට යැවූ ඈ සහන් ළඟට ගියාය.

''යමු ඇතුළට.'' පංචලි ආරාධනා කළාය.

''මම වාහනේට වෙලා ඉන්නම්.''

''වාහනේට වෙලා ඉන්ට ඕනෑ නෑ. එහෙනම් අපි යමු.''

''ඔව්. ඒක හොඳා. අපි යමු.''

''හෙට කිරි ගොවියෝ රුවිරලගෙ දිහාවට රැස් වෙනවා කිව්වා නේද?''

ඔහු හිසවනා එය අනුමත කළේය.

''හා යමු ඇතුළට. නාවෝත් ඇදගෙන යනවා.''

ඔහු ඇය අනුව නිවස තුළට ගියේය.

සීයාගේ කන්තෝරු කාමරය ඇත්තේ පිටතිනි. සිංහල ආයුර්වේද වෛද්‍යවරයෙක් වූ සීයා ලෙඩුන් බැලුවේ මෙහි සිටය. දැන් එය අමුත්තන් සඳහා වෙන්ව තිබේ.

''මේක සහන්ගේ කාමරය.''

ඔහු කාමරයට පිවිස ඇඳේ ඉඳගත්තේය. එය තමා වෙනුවෙන් කල් ඇතිව සකස් කර ඇති බව ඔහුට සිතුණි.

ඇඳුම් මාරු කරගත් ඔහු වත්ත පහළ ළිඳට ගොස් දිය නෑවේය. දිය නාගෙන පැමිණි නොබෝ වේලාවකින් පංචලි රසකැවිල්ලක් සමඟ තේ කෝප්පයක් රැගෙන ආවාය.

''වතුර සීතලද?''

''වැව් වතුරට වඩා ළිඳේ වතුර සීතලයි.''

''මාත් නෑවා.''

''නැන්දෑවෙ නාන්ට හොඳද? ඔඩිකොලොන් [illegible] ගන්ට.''



ඔහු ඇගේ හිස පිරිමදිමින් කීවේය.

''මෙ දුම්මා..''

ඇය ඔහුගේ නැහැයට හිස ළං කළාය. ඔහු නිහඬව තේ පානය කළේය.

ඔවුහු බොහෝ වේලාවක් කාමරයට වී කතා කරමින් පසුවූහ. කෙමෙන් අඳුර ළඟා වන්ට වුණි.

රාත්‍රී ආහාරය ගත් සහන් නිවසින් පිටතට බැස්සේය. වෙනදා මෙන් නොව සිතට සැහැල්ලුවක් ගලා එනු දනේ. මිලිනා මැතිනිය කවදත් තමාට සැලකුවේ ආදරයෙනි. වත්ත සීමාවේ කුඹුරු යාය වෙයි. ඉන් ඔබ්බෙන් රක්ෂිත වනය පිහිටා ඇත. වනය සිප හමන සුළඟ සිසිල්ය. වත්ත ඉහත්තාව දෙසින් වන සතුන් කෑ ගසන හඬ නිහඬ රැයේ ඇසෙයි.

අඳුරේ කිසිවෙක් තමා දෙසට සෙමින් පියවර මනින හැටි සහන් දුටුවේය. හරියට රෑ සුරංගනාවියක් වගේ. සුදු නිදන ගවුමකින් සැරසුණු දිව්‍යාංගනාවක් තමා අසලින් ඉඳගන්නවා ඔහු දුටුවේය.

''කම්මැලිද?''

''කම්මැලියක් දනේනට විදිහක් නෑ. ආත්තම්මා මොනවද කියන්නෙ. ඔයා එක්ක කතා කරනවට දොස් කිව්වද?''

''අනේ සහන්. ආත්තම්මා අපිට මක්කොටම වඩා ආදරෙයි.''

''ඕතන ඉන්න අමාරුයි. එන්න මා ළඟට.''

ඔවුනතර තරමක නිහඬ බවක් ඇති වුණි.

''මම ඔයාව මෙහෙ එක්කාගෙන ඒමෙන් කළේ වරදක්.''

''ඇයි එහෙම කිව්වේ..?''

''නැන්දගෙ දුව බලන්න ගමේ යන්න නේද හිටියෙ.''

ඔහු එසැණෙකම ආපසු හැරී පංචලි දෙස බැලුවේය. නිහඬ රැයේ ඇය ඉකිබිඳිමින් හඬන හඬ සහන්ට ඇසුණි.

WWW.SINHALAELIBRARY.COM 120

# 32

රාත්‍රිය නිහඬය. ඇඳට ආවේ පංචලි සමඟ බොහෝ වේලාවක් කතා කර සිටීමෙන් පසුවය. මේ කතාව සිතේ වූ ප්‍රශ්න විසඳා ගැනීමට හොඳ අවස්ථාවක් වුණි. ඇය සිතන්නේ තමා මාමාගේ දුව වන කාංචනා විවාහ කර ගැනීමට සූදානම් වන බවය.

''දැවැද්දට කුඹුරු, වී මෝල්. මුදලින් දැවැද්ද හම්බ වෙනවා කිව්වා.''

''හරියට මේවා දනගන්නෙ කොහොමද? කවුද කිව්වෙ..?''

ඔහු සිනාසෙමින් ඇසුවේය.

''කවුරු කිව්වත් වැඩක් නැහෙ සහන්. කතාව ඇත්තනෙ. මේ බිස්නස් එක කවදාහරි ඔයාටයි කිව්වා.''

''මාමා සල්ලිකාරයා. එයාට බිස්නස් තියෙන බව ඇත්ත. මේවා කවුද කිව්වෙ කියන්න.''

''මේවා අපේ අම්මට කියලා තියෙන්නෙ සහන්ගෙ අක්කා.''

''මම නිකමට හිතුවා අපේ අක්කා ඔවගේ වැඩ තමයි කරන්නෙ. ඒ වගේ යෝජනාවක් හුඟ කල් ඉඳන් ඇවිදින් තියෙනවා. ඒත් ඉතින් මම ඒවට කැමති නෑ.''



''අනේ පව්නෙ සහන්. ඊටත් වඩා ලස්සන දේ එපයි කියන්ට එපා.''

''මේ ඔයාගෙ වැඩක් බලාගන්ට. මට අවවාද දෙන්ට එපා.''

''මාව ආශ්‍රයට එවන්ට එපා කියලා අක්කා අම්මට කිව්වලු.''

''එයාට බෑ මට බලපෑම් කරන්ට. මට ඕනෑ දේ මම කරනවා. ඔයාට බැන්නා නම් මා වෙනුවෙන් සමාවෙන්න.''

''බැන්නා නෙවේ ඇත්ත කියලා. මම තාත්තා නැති අවජාතක කෙනෙක් කියලා මුළු රටම දන්නවා.''

''මම කැමති නැත්තේ ඕවට තමා. සුජාත භාවය කියන්නේ වෙනත් පිස්සු කතාවක්.''

''පිස්සු කතාවක් නෙමේ... ඒක ඇත්ත කතාවක් කියලා මාත් කියනවා. මට තාත්තා කෙනෙක් නෑ. අම්මා නෑ. මම මේ ලෝකේ තනිවෙච්ච කෙනෙක්.''

ඈ දෑතින් මුහුණ වසා ගනිමින් කීවාය. ඔහු මෘදු ලෙස ඇගේ අතින් අල්ලා ගත්තේය.

''මම තනි නොවෙනවා වගේම ඔයත් කවදාවත් තනිවෙන්නෙ නෑ.''

''ඒ කොහොමද රත්තරනේ... මිනිස්සු කොච්චර දියුණු වුණත් තමුන්ගෙ දුවට පුතාට අවජාතක දුවෙක් පුතෙක් බන්දලා දෙන්න කැමතිද?''

''මේ ලෝකෙ කවුරු නොහිටියත් පංචලිට මම ඉන්නවා. ඒ පොරොන්දුව මදිද?''

ඇය හඬමින් ඔහුගේ ළයෙහි හිස හොවා ගත්තාය.

''අද්දියගෙන්... ඒක කොච්චර වගකීමෙන් දුන්න පොරොන්දුවක්ද?

WWW.SINHALAELIBRARY.COM 121

"ඔයාට කවදාහරි ලජ්ජා වෙන්ට වෙයි."

"මෙච්චර ලස්සන කෙල්ලෙක් මා ළඟ ඉන්නවා දැක්කාම අනිත් අය මට ඊර්ෂ්‍යා කරයි."

"මම දන්නවා සහන් කොයි වගේ කෙනෙක්ද කියලා. ඔයා මා ඉන්න තත්ත්වයට අනුකම්පා කරනවා විතරයි."

"මාව ඒ මිම්මෙන් මනින්ට එපා. කොහේවත් ඉන්න කෙල්ලෙකුට අනුකම්පා කරන්ට මට කිසි ඕනෑකමක් නෑ. මට බය මා වගේ කෙනෙකුට මේ සම්පත නොලැබෙයිද කියලයි."

ආත්තම්මා මල් පුදා අවසන් වන තෙක් පංචලී බලා සිටියාය. මම එච්චර අවාසනාවන්ත කෙනෙක් නෙමෙ. මට මේ ජීවිතය කවුරුවත් දුන්නේ නෑ. දෛවය කියන එක විශ්වාස නොකළත් ඒ වගේ දෙයක් තියෙනවා. මංජුල වැනි පාතාලයේ මැරයෙකුගෙන් බේරුණේ සහන් නිසාය. ඔහු පිළිබඳව ඇත්තේ දූෂිත තරක ආරංචිය. ඔහු හා බැඳෙන්නට වුණා නම් පැහැදිලිවම තමා අනාථ වන බව ඇය දනී.

බුදුන් වැඳ ඥාතීන්ට පින් දීම දිනපතා කරන්නකි. ඒ පින් දෙන්නා අම්මා නිසා සිත් කැවුලට පත්ව මියගිය සීයාට විය යුතුය. වන්දනා කර පැමිණි ඈ මිනිබිරියගේ අතින් අල්ලා ගත්තාය.

"ඇයි මගෙ දුව..?"

ඈ හිස අතගාමින් ඇසුවාය.

"ආත්තම්මා... සහන් මගෙන් දෙයක් අහනවා."

ඇය ඒ පිළිබඳව සැලකිලිමත් වූ බවක් ප්‍රදර්ශනය කළේ නැත.

"අහන්නකෝ... ආත්තම්මා... මම තවම හා කිව්වෙ නෑ."

"අමුතුවෙන් හා කියන්ට දෙයක් නැතෙ මගෙ පුතේ."



"ඒත් ආත්තම්මා මම වගේ කෙනෙකුට සහන්ගෙ අම්මලා කැමති වෙයිද?"

"රත්තරනේ.. ඔයා එච්චර අවාසනාවන්ත කෙනෙක් නෙමෙ. බයවෙන්න එපා. ගිහින් නිදා ගන්න. හැම දෙයක්ම හොඳින් සිද්ධ වෙයි."

සතුට දරාගත නොහැක. හදවතට සීමා වූ දෙයක් කෑ ගසා පැවසීමට සිතෙයි. හදවත නිබඳවම හඬා වැලපුන හැටි ඇයට සිහිවෙයි. එහෙත් අද තමා පසුවන්නේ අසමාන සතුටින් යුතුවය. ඇය සෙමින් සහන් නිදන කාමරයට ගියාය. දිගු ගමනක යෙදීම නිසා ඇති වූ වෙහෙස නිසා හෙමෙම තද නින්දක වැටී සිටියේය. ගෙන ගිය රෙද්ද පොරවා මදුරු දැල දමූ ඇය නිදන කාමරයට පිවිස ඇඳේ වැතිරුණාය.

සිතට බැරෑරුම් ප්‍රශ්න රැසක් පිවිස ඇත. ඒවා එකිනෙක ගෙන විශ්ලේෂණය කිරීමට නොපුළුවන. මොන යම් හෝ දැඩි තීරණ ගත්තත් ගැහැනියකට තනිව ජීවත් විය නොහැක. ගැහැනු ඉපදෙන්නේ තනිව ජීවත් වෙන්න නොවේ. ගැහැනියෙක්ව ඉපදෙන විට ලැබෙන අඟපසඟවල හිමිකරුවන් පිරිමින්ය. ඒවා පිටස්තරයන් විසින් පැවරුමක් නොව ස්වභාව ධර්මයට යටත්ව පිරිනැමුණු ඒවාය.

පාන්දර පිබිදී සූදානම්ව තේ කෝප්පය රැගෙන තනිකඩ පිරිමියෙකුගේ කාමරයට ගියේ පෙරහුරුවක් ලෙසය. ඔබට තේ එකක් හදා දෙන්න, රසට කෑම උයන්න ඒ විතරක් නෙමෙ අපට පැවරෙන තවත් සුන්දර දේවල් ගොඩක් තියෙනවා.

පියකරු වූ උදෑසන යාබද මල් පඳුරේ පිපුණු මල් සුවඳ කාමරයට ගලා ආවේය. තේ කෝප්පය පසෙක තැබූ ඔහු ඇය මෘදු ලෙස අල්ලා ගත්තේය. අප අතර කිසිම සංවාදයක් නැත. තනිකර අඳුරත් නැත. එළියත් නැත. තදේට ළයට තද කරගත්තාම ගොඩලු මසෙක් මගේ සැමියාට වුණා. අපි නිරතුරු හමුවුණා නමයි. පිරිමියෙකුගේ උරපතුවක මුහුණ තබාගෙන ඉන්න ලැබේ යැයි කවදාවත් හිතුවේ

WWW.SINHALAELIBRARY.COM 122

නෑ. ඔබ වෙත ඇත්තේ අන්ධ ආදරයක් නොවේ. ශල්‍යාගාරයේ දී මගේ හදවත කපා කොට විච්ඡේද කරල බැලුවොත් හැම ලේ බිංදුවක්ම ඔබට ආදරෙයි කියාවි. ප්‍රථම දක්මෙන් ආදරයක් ඇතිවෙනවා කියන කතාව බොරුවක්, බොළඳ කතාවක් කියලයි හිතුවෙ. දිනා ගන්ට පුළුවන් රාජ්‍යයක් ද කියන එක මා දන සිටියේ නෑ. කොතරම් හැඟුම්බර නිමේෂයක් ද?

මේ මොහොත එන තෙක් කොච්චර කල් බලා සිටියාද? මගේ තොල්පෙති හිමිකර ගත්තේ බලහත්කාරයෙන් නොවේ. එම අයිතියට සම්බාධක පනවන්ට බෑ. රළු දෙතොල් හිමිකරගන්ට මටත් 'පරවශතා' අයිතියක් තියෙනවා. කඳුළෙන් ඒ උරහිස් තෙම්මේ තදබල ඕනෑකමක් තිබුණි. මා මේ සෙනෙහසේ ගැලී සිටීමට කැමතිය.

"ඇයි මේ...? ඇයි මේ...? මගෙන් වරදක් වුණාද?"

"ඔව්. ඔයා මට ඕනෑවටත් වඩා ආදරය කරනවා. ඒ ආදරයේ දිග පළල මට කියා දෙන්න."

තේරුමක් නැති බොළඳ ප්‍රශ්න නගද්දී දනෙන්නේ සතුටක්. ආදරයට සම්භව්‍ය මට්ටමක් නෑ. තදබල ගැඹුරක් නෑ.

"ආන්තම්මට කිව්වද?"

"ඔව් කිව්වා."

"මං වගේ කෙනෙකුට දුව දෙන්න කැමති නෑ කියන්ට ඇති. ඕන්.. ඕන්.. අඬනවා."

"අඬන්නෙ දුකට නෙමේ.. දරාගන්ට බැරි සතුටක් තියෙනවා. මේක අහලා ආත්තම්මත් ඇඬුවා. ඇත්තටම මම කොච්චර වාසනාවන්තියක්ද?"

ඔහු ඇගේ උණුසුමෙන් මිදී ජනේලය අසලට ගියේය. උදා සුළං රැළි කාමරයට පිවිසෙයි. කව හෝරා කිහිපයකින් පහන් වනු ඇත. අප මේ දිවි ගෙවන්නේ සියලු සැප සම්පත් පිරි හැම දෙයකින්ම පරිපූර්ණ වූ 'සේතුමතී' නම් වූ සිහින රාජ්‍යයක නොවේ. සිහින



ජීවිතයට වඩා යථාර්ථය කටුකය. පැහැදිලිවම මේ සමාජය තුළ ගැහැනු ගත කරන්නේ කටුක ජීවිතයකි.

විවාහය තුළින් සුන්දර වූ සතුටක් ලබා ගැනීමට සිතීමේ කිසියම් වරදක් නැත. මිය යනතෙක්ම අප ලබන්නේ කටුක අත්දකීම්ය. ගැහැනියකගේ ජීවිතය සාර්ථක වන්නේ ඇයට ලැබෙන සැමියා මතය. මිහිපිට 'සේතුමතී' නම් රාජධානිය සැබෑ ජීවිතයේ දී ලබාගත හැක. පසුපසින් පැමිණි පංචලි ඔහුගේ උරේ හිස හොවා ගත්තාය.

"ඇයි එකපාරටම නිහඬ වුණේ...?"

"අම්මා මට කැමති වෙයිද?"

"අම්මට තියෙන්නේ වැරදි වැටහීමක්. ඒ වගකීම ආත්තම්මා බාර ගනීවි."

ඇය මුහුණ පිටේ හොවාගෙනම කීවාය.

"රත්තරනේ... මගේ ජීවිතය පදනමක් නැතිව හදපු ගොඩනැගිල්ලක් වගේ. ඇලවෙන්න පුළුවන්, ගිලා හැලෙන්ට පුළුවන්, කඩා වැටෙන්නත් පුළුවන්. එතකොට ඔයා මොකද කරන්නෙ...?"

"මම මොනවා කරයි කියලද හිතන්නේ...?"

"ඒක තමා මට හිතන්ට බැරි. දුක්ක දා ඉඳලම හිතුවේ ඒකයි."

"හරි අපි ජීවත් වෙමු. අපි ප්‍රශ්න එනකල් ඉමු."

"අපි දෙන්නට නැවත මේ විදිහට මේ ආකාරයෙන් ජීවිතයේ දී මුණ නොගැසෙන්ට ඉඩ තියෙනවා."

"ඔව් ඉතින් මොකද කියන්නෙ. මාව සදාකාලිකව මතක් වෙන්න යමක් කරන්න දන්නෙම බෑ. ඒත් මෙන්න මේ වගේ දෙයක් කරන්ට පුළුවන්."

WWW.SINHALAELIBRARY.COM 123

ඔහු එකවරම ඇගේ අතින් තරයේ සිහින් තොල්පෙති හිමි කරගත්තේය.

"ආත්තම්මා... ආත්තම්මා.."

මුව නිදහස් කරගත් සැණින් ඇය කෙඳිරුවාය. ආත්තම්මා එනු දුටු ඈ ඉවත් වූවාය.

"මැඩම්, මම ගිහින් එන්නම්."

"එහෙම කතා කරලා මට ලජ්ජා කරන්ට එපා. සහන් මගෙ මුනුබුරා."

ඔහු පහත් වී දෙපතුල් අල්ලා ආත්තම්මාට වැන්දේය.

"මම ගෙදර ගිහින් අම්මවයි අක්කවයි එක්කගෙන එනවා."

ඇය පිළිතුරක් නොදී සිටියාය.

"සහන් අපේ අම්මා.."

"ප්‍රශ්න තියෙන්ට පුළුවන්. ඒත් අනුමත කරන්ට හෝ අම්මා ඉන්ට ඕනෑ."

සහන්ගේ කතාව ආත්තම්මා ඕනෑකමින් අසා සිටියාය. ඔහු කොතරම් බුද්ධිමත් තැනැත්තෙක් ද යන්න තේරුම් ගියේ ඔහුගේ කතාව අනුවය.

"අපිට තියෙන ප්‍රශ්න සහන්ට අමුතුවෙන් කියන්න ඕනෑ නෑ."

"මේකෙ වරද පංචලිගෙ අම්මට විතරක් පවරන එක වැරදියි. ගැහැනු දරුවෙක් බිලිගන්න බොහෝ දෙනෙක් බලාගෙන ඉන්න බව අනිත් අයත් දැනගන්ට ඕනෑ."

සහන්ගේ කතාවෙන් ආත්තම්මා නිරුත්තර වූවාය. සිද්ධිය දන්නා සැවොම දොස් නගන්නේ අම්මාටය. අම්මා ද සිතා සිටියේ තමා වරදකාරියෙක් කියාය. මිනිසුන්ට ජීවිතේදී වරදින්න පුළුවන්.



වඩා වැදගත් දේ වන්නේ වරදක් වූවා නම් එය නිවැරදි කරගෙන සමාජයට පිවිසීමයි.

"එහෙමනම් පුතා, අම්මලා එන්න කලින් අපිට කීදෙනෙක් එනවද දන්වන්න ඕනෑ. මම එදාට දූලගෙ අම්මට එන්ට කියන්නම්."

"කීදෙනෙ එනවද කියන්න...?"

පංචලි ඇසුවාය.

"අම්මයි අක්කයි නංගියි මහමාලයයි."

සැවොම එකවර සිනාසුණහ.

රථය ඉදිරියට ඇදී යයි. පංචලිගේ හදවත සතුටින් පිරී ඇත.

"හමුවෙච්ච පළවෙනි දවස මතකද?"

"ඔය ලැස්තිවෙන්නෙ මගේ හිත රිදවන්නයි. අනේ මුකුත් නම් කියන්ට එපා."

"මා ඒ ආඩම්බරකමට කැමතියි. ඒකයි කියන්ට හැදුවෙ."

"මාත් ඒ කැමති වුණේ පිරිමි ජවයටයි. ඒ ආඩම්බරකාරයාට මා කැමති වුණා. අනේ සහන්, නැන්දාගේ දුවගෙ ප්‍රශ්නෙ තියෙද්දි අම්මලා මට කැමති වෙයිද? කවුරු කැමති වුණත් අක්කා නම් මට කැමති වෙන එකක් නෑ."

"මුද හත්ගව්වක් තියෙද්දි පීනන්ට හදන්ට එපා. ඇමතිතුමා මාව හොයනවා කියලා ආරංචියි. ලෙහෙසියෙන් අපට එක්වෙන්ට ලැබෙන එකක් නෑ."

"ඔයාට මොනවා හරි කළොත් කාටවත් මාව පණපිටින් දකින්ට ලැබෙන එකක් නෑ."

WWW.SINHALAELIBRARY.COM 124

ඇය තෙත් වූ දෑසින් යුතුව ඔහුගේ අත අල්ලා ගත්තේය.

www.sinhalaelibrary.com

# 33

අම්මා තමාට අකුරැස්සට එන්ට කීවේ ඇයි දැයි වත්සලා දන සිටියේ නැත. ගමට ගොස් පැමිණි දිනයේ සිට දුව සිටියේ දැඩි කල්පනාවෙන් යුතුව බව වත්සලා දනී. රැකියාවකට යාමට උනන්දුවක් නැත. මේ හැමටම හේතුව් ඇත්තේ සහන් බවට කිසිම තර්කයක් නැත.

"එන්න කෑම කන්න."

ඇය දුවගේ හිස පිරිමදිමින් කීවාය.

"මම පස්සෙ කන්නම්." ඇය පහත් හඬින් කීවාය.

"මොකද දරුවෝ මේ වෙලා තියෙන්නේ...?"

ඇය හිස වැනුවා විනා පිළිතුරක් දුන්නේ නැත.

වත්සලා පසුවන්නේ සිත් තැවුලෙන් යුතුවය. ප්‍රශ්න නොතිබුණා නොවේ. ජීවිතය ඉදිරියේ තමා තරම් කඳුළුසැලූ අන් කිසිවෙක් නැත. එහෙත් මෙතරම් බැරෑරුම් බවක් දුනුණේ නැත. ජීවිතය තුළ විශාල සැලසුම් තිබුණේ නැත. ගෙවී ගිය ජීවිතය නැවත සාදා ගැනීමට නොපුළුවන. කළ හැකි එකම දෙය වන්නේ දුවට යහපත් ජීවිතයක් සකස් කරදීමය. එහෙත් ඇය සූදානම් වන්නේ



දුකේ ගැලී සිටීමටය. වත්සලා දුව පිළිබඳව හොඳ පරීක්ෂාවෙන් සිටියාය. මේ කෙල්ලට මොනවත් කරදරයක් වෙයිද? දැන් ජීවිතය පිළිබඳ වූ කිසිම වටිනකමක් වත්සලාට නැත. ඇය මේ තීරණය ගත්තේ සතුටින් යුතුවය. තුණ කන පණුවෙක් මෙන් තවත් මේ ජීවිතයේ ගැලී සිටීමෙන් ඵලක් නැත. දැන් ඉතින් කළ යුතුව ඇත්තේ මෙම සසරින් මිදීමට උපාය මාර්ගයක් සෙවීමය.

අම්මා හමුවීමට ගමට යාමට නොහැකි වූයේ දුව ලෙඩගානේ පසුවූ හෙයිනි. දුව තමාටත් වඩා සමීපව ඇසුරු කරන්නේ තම අම්මාවය. දුව රියදුරෙකුට විවාහ කර දෙන්නේ කොහොමද? කිසිම සැකයක් නැතිව සමරතුංග තමාව මරා දමනු ඇත.

නිදා ගැනීමට ගිය නොබෝ වේලාවකින් ඇයට මවගෙන් ඇමතුමක් ලැබුණි.

"ඇයි අම්මා...?"

දුවට නෑසෙන සේ පහත් හඬින් ඇසුවාය.

"කෝ දරුවා නිදිද?"

"නිදි."

ඇය හැඬුම් මුසුව කීවාය.

"වත්සලා දරුවා ගැන කල්පනාවෙන් ඉන්ට වෙයි. තමුන්ටත් තරුණ වයසක් තිබුණ බව අමතක කරන්න එපා."

"අම්මා අර වැන්කාරියගෙ මල්ලිට මගේ දුව දෙන්න කියල ද කියන්නේ. ඉඩ ඇරියොත් අර මනුස්සයා මුන් දෙන්නව මරලා දමාවී. ඒකයි මම බයෙන් ඉන්නේ."

"මගේ කෙල්ල එච්චර මෝඩ නෑ. අනික රැකියාවකින් මිනිහෙක් මනින්න එපා."

"අම්මා මට අකුරැස්සට එන්ට බෑ. දුව එක්කගෙන එන්ටත් බෑ. දුව අම්මා එක්ක යාළුනේ. ටික දවසකට මෙහෙ එන්ට බැරි නම්

WWW.SINHALAELIBRARY.COM 125

මාලඹේට එන්ට. මම වාහනයක් එවන්නම්. මට වැඩකට යන්ට තියෙනවා.''

අම්මාගේ කතාව නිසා ඇය බියට පත්වූවාය. වත්සලාගේ සිතේ දුකක් ඇති වූයේ දුවට රෝගයක් ඇතැයි සිතූ හෙයිනි.

''එන්න තේ බොන්න.''

''මට එපා අම්මා. ප්ලීස් මට මගේ පාඩුවේ ඉන්න දෙන්න.''

''මගෙ දුවට මොනවද ඕනෑ කියන්න.''

''මට මුකුත් එපා. මට මගේ පාඩුවේ ඉන්ට දෙන්න.''

දැන්ම තමා ගෙන ඇති තීරණය දුවට දැන්විය යුතු නැත. පසු දින කළ යුත්ත රාත්‍රියේම තීරණය කළාය. කිසිවෙකුට නොදන්වා ඇය නිවසින් පිටවූවාය. දුව සහන් සමඟ ආදරයක් නැතැයි පැවසුව ද එය කිසිසේත් විශ්වාස කළ නොහැක. වැන් ගෙදර ගැනී කටකාරියකි. ඒ විකට බොරු කප්පරක් කිව්වා. මල්ලිට අනුරාධපුරේ මාමගෙ දුව විවාහ කර දීමට යන කතාව කීවේ ආඩම්බරයෙනි. දුව ලෙඩ වුණේ මේ කතාව ඇයට පැවසූ දින සිටය. දැන් දන්නා ගමන් මළවිකාර කියවයි. නිවස ඉදිරිපස තිබූ වැන් රිය හඳුනා ගත් ඇ රථයෙන් බැස්සාය. ගේට්ටුව දෙපස රතු බෝගන්විලා පෝච්චි දෙකක් විය. මිදුලේ ඇති බට් අඹ ගස යට අවුරුදු දහයක පමණ පිරිමි දරුවෙක් ක්‍රීඩා කරමින් සිටිනු දුටු වත්සලා ඔහුට කතා කළාය.

''පුතා අම්මා ඉන්නවද?''

ආපසු හැරී නිවස තුළට දුව ගිය දරුවා මඳවේලාවකට පසු ආවේය.

''අම්මා නානවා... ඇවිදින් ඉඳගන්ට කිව්වා.''

වත්සලා මඳවේලාවක් කල්පනා කර නිවස තුළට ගියාය. එය කුඩා විසිත්ත කාමරයකි. සාලය මැද ඔතන ලද අටපිරිසක් තිබුණි. බිත්තියේ එල්වන ලද ජපන් කැලැන්ඩරයක කබුකි නාට්‍ය



ශිල්පිනියකගේ ඡායාරූපයක් තිබුණි. කැබිනෙට්ටුව මත සමන්තිගේ තරුණි වියේ ඡායාරූපයක් හා කුඩා පිරිමි දරුවෙකුගේ ඡායාරූපයක් හා උපාධි ඇඳුමෙන් සැරසුණු තරුණයෙකුගේ ඡායාරූපයක් තිබුණි. ඡායාරූපයේ සිටි තරුණයා දක පුරුදු බවක් තිබුණි. මේ කටකාර ගැහැනිය සමඟ කතා කිරීමටවත් සිතේ සතුටක් නැත. එහෙත් දුව වෙනුවෙන් මේ යුතුකම කළ යුතුව ඇත.

සමන්ති සන්සුන් ගමනින් නිවස තුළ සිට එන හැටි වසන්ති දුටුවාය. දැන් ඉතින් මල්ලිගේ පම්පෝරිය කියවයි.

''ආ නෝනද? මම හිතුවේ වැන් එක බලන්ට ආපු කෙනෙක් කියලයි.''

වත්සලා නිහඬව වේවැල් පුටුවක ඉඳගත්තාය.

''කෝ සහන් නැද්ද?''

''මල්ලි දැන් පත්තරේ වැඩ කරනවනෙ. මෙහෙ නෑ.''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''මම මේ වත්සලා නෝනව හම්බ වෙන්න ගෙදරට යන්නයි කියල හිතන් හිටියෙ.''

''ඇයි මුකුත් වුවමනාවක්ද?''

''මම එදා නෝනා හම්බ වෙන්න ගිහින් කතා කළේ බොහොම කැත විදිහටයි. ඒකට මට සමාවෙන්න.''

ඇය විනීතව කීවාය.

වත්සලා පුටුවෙන් නැගිට ස්ටූලය මත වූ සහන්ගේ ඡායාරූපය දෙස බලා සිටියාය.

''මා ගැන අමුතුවෙන් කියන්න දෙයක් නෑ. මුළු රටම ඒක දන්නවා. ගෑනුන්ට ජීවිතය වරදින්ට වෙලාවක් ගත වෙන්නෙ නෑ. ඒකට වන්දි ගෙවන්ට වෙලා තියෙන්නෙ දුවටයි.''

WWW.SINHALAELIBRARY.COM 126

''ඒ වැරදි ගැහැනු බාරගන්ට හොඳ නෑ. මට දන් ඔය ජරා පිරිමි පෙන්වන්ට බෑ. නෝනා දුව හින්දා දුක් වෙනවා වගේම මාත් මගේ මේ හිගන්නා හින්දා දුක් විඳිනවා. දන් ජපන් ගෑනියෙක් එක්ක පවුල් කනවලු. දරුවා නැතිනම් මම මොනවාහරි බීලා මැරිලා.''

''හා... හා... ඒක පාප කර්මයක්. අද මගෙ දුව ලජ්ජාවට, හැල්ලුවට පත්වෙලා. ඉස්කෝලෙට ගියාම තාත්තා කෙනෙක් නෑ. යාළුවෝ මිත්‍රයො විදිහට තාත්තා කවුද කියලා කියන්ට විදිහක් නෑ. උප්පැන්න සහතිකයක් නෑ. මේ හැමදේකම වැරදිකාරි මමයි.''

වත්සලා පහන් වී දෑතින් මුහුණ වසා ගත්තාය.

''අඩන්ට එපා.. අඩන්ට එපා.''

සමන්ති වත්සලාගේ හිස පිරිමැද්දේ දුකින් යුතුවය.

''දන් හැදෙන ළමයි අපි වගේ මෝඩ නෑ. මට වෙච්ච විපැත්තිය දුවගේ හිතට තදින්ම වැදිලා තිබුණා. දුව කවදාවත් කසාද බඳින්නෙ නෑ කියලා මගේ අම්මාට කියලා තිබුණා.''

''ඒක හරි කතාවක්නේ...''

''පාරට ගියොත්, උත්සවයකට ගියොත් දුවට බේරිල්ලක් නෑ. මෙයාව යාළු කරගන්න කොල්ලෝ පොර කනවා. ඒත් කා එක්කවත් යාළු වුණේ නෑ. මම තිට්ගේ බයෙන්.''

ඔවුනතර කෙටි නිහඬ බවක් ඇති වුණි.

''මේ හැමදෙයක්ම ඇති වුණේ සහන් හම්බ වුණාට පස්සෙයි. දුව මට කිව්වා සහන්ව ආශ්‍රය කරන්නේ යාළුවෙක් විදිහටයි කියලා. මාත් ඒක විශ්වාස කළා.''

''ඒක බොරු. මාත් අපේ කෙනාගෙන් ඇහුවා. එයත් කිව්වේ ඔය ටිකම තමයි. මාමගෙ දුවට කෝටි ගාණක දේපළ තියෙනවා. එකම දුව. මෙයාට මේ අමුතුවෙන් රස්සාවක් කරන්ට ඕනෑ නෑ. ඒත් කැමති නෑ.''



''දුව පුදුම ළමයෙක්. කාමරේට වෙලා අඬ අඬා ඉන්නවා. මොනවා හරි වෙයි කියලා මට බයත් හිතෙනවා.''

''වාහනෙන් වැඩ කරන්ට ආවේ ඩ්‍රයිවර් නැති නිසයි. මල්ලිට ගෞරව උපාධියක් තියෙනවා. තව ස්පෝට්ස් තියෙනවා. එයා රස්සාවල් ඉල්ලගෙන දේශපාලනඥයෝ පස්සෙගියෙ නෑ.''

''අනේ මට සමාවෙන්න. මම හිතුවේ ඩ්‍රයිවර් කෙනෙක් කියලයි. මම මේ ගමන ආවේ බැගෑපත් ඉල්ලීමක් කරන්නයි.''

''කියන්න.. කියන්න... මොනවද අපෙන් කෙරෙන්න ඕනෑ.''

''සහන් නැති වුණොත් මේ කෙල්ල ජීවත් වෙන එකක් නෑ.''

''මල්ලිත් වෙන විවාහයක් කර ගන්න එකක් නෑ. වෙන කපටියෙක් නම් දේපළවලට මාමගෙ දුව බඳිනවා.''

''මම අම්මා කිව්වොත් මේ දරුවන්ට ලජ්ජා වෙයි. ඒ නිසා දුවයි සහන්වයි එක්කරන්න. මගෙ තියෙන දේයි, අම්මගෙ ඉඩකඩම් ඔක්කොමයි දෙන්නෙ පංචලිටයි.''

''මූණට නොකිව්වත් අපේ මල්ලි නෝනගෙ දුවට කැමතියි. සල්ලි දේපළ බලාගෙන නෙමෙයි.''

''ඒ වුණත් මේවා අපේ යුතුකම්නෙ. මම සැප වින්දා, ලජ්ජා වින්දා, දුක් වින්දා. මම කරදරවලින් මිදිලා හිත හදාගන්නයි හිතන් ඉන්නෙ. මංගල කටයුත්තට වුණත් මම ඉන්න එකක් නෑ. සමන්ති දරුවන්ගෙ කටයුතු ටික හොඳින් කරන්න ඕනෑ. ඕනෑම දෙයකට අම්මාව හම්බ වෙන්න.''

දෑත් එක්කොට ආචාර කළ වත්සලා මහ මඟට බැස්සාය.

සියල්ල මෙතරම් හොඳින් නිම වේ යැයි පංචලි සිතුවේ නැත. ආත්තම්මා මැදිහත් නුනා නම් කිසිදාක තම ආදරය ජය ගැනීමට ලැබෙන්නේ නැත. අම්මා කිසිදාක තම ආදරය තේරුම් ගන්නේ නැත. සහන් පිළිබඳව ඇය දරුවේ වැරදි මතයකි. ඇය

WWW.SINHALAELIBRARY.COM 127

කරන්නේ වංශය කබල් ගාන විදිහේ වැඩකි. සහන් බුද්ධිමතෙකි. ආදරය උත්තම දෙයකි. එය හා සැසඳීමට ලොව තවත් දෙයක් නැත. ඒ උතුම් ආදරය දිනාගත හැකිවූයේ ආත්තම්මා නිසාය.

තම සිතේ අම්මා ගැන අමනාපයක් නැත. එහෙත් ඇය තම සබඳතාවයට අකැමැති බව පංචලි දනී. ප්‍රධාන හේතුව වන්නේ ඔහු වියදුරෙක් බවට වැරදි වැටහීමක් ඇති කරගෙන සිටීමය. තවම අම්මා නොඑන්නේ සහන්ට මුහුණදීමට ඇති අකැමැත්ත නිසා විය හැක. තමාගේ හැම වැඩකටම ඉදිරිපත් වුණේ අම්මාය. අනුරාධපුරේ සහන්ගේ නෑදෑ පිරිස එන දවසේ අම්මා එය මගහැරියේ බොරු ලෙඩක් ගැනීමෙනි. අකුරැස්සට පැමිණි පිරිස ගියේ විවාහයට අනුමත දීමෙනි. මුලදී සහන්ගේ අක්කා තමාට විරුද්ධ වූ හැටි ඇයට මතකය. මේ මෑතක සිට ඇය වෙනස්ය. අවජාතක කෙල්ලෙක් මල්ලිට විවාහ කර දීමට කැමති වූයේ කිමද?

සියලු ප්‍රශ්න විසඳෙමින් තිබියදී නැවත නිවසට යාමට ඇයට සිතුණේ නැත. අම්මා සමඟ ගෙවන ජීවිතය පිළිකුල් සහගත එකක් විය.

''මගෙ දුව මෙහාටම වෙලා ඉන්න. එතකොට ඔය අනවශ්‍ය කතා මතුවෙන එකක් නෑ.''

''එතකොට අම්මා...?''

''අම්මා නිවුනු දෙන්. අම්මත් දුව වෙන්වෙලා ඉන්නවට කැමතියි. ඒ නිසා අපි මේ මංගල්ලෙ වාමෙට කරමු.''

අම්මට මාව අමතක කරන්ට පුළුවන්ද? මගේ වැදගත් අවස්ථාවට අම්මා නාන්නා දෙන්නම නෑ. මේ නිවසට නාන්නා නොඑන්නේ ආත්තම්මා අමනාපව සිටින හෙයිනි. විවාහ නොවුණත් නාන්නාගේ බලයෙන් මිදී සිටීමට ඇයට පුළුවන් කමක් නැත. සහන් ආවේ ප්‍රශ්නවලින් බරිතව සිටින අවස්ථාවකය.

''මහන්සිද?''



ඇය මෘදු ලෙස සහන්ගේ අතින් අල්වාගෙන කීවාය.

''මහන්සි ගතියක් තිබුණා. දුක්කම නැතිව ගියා.''

ඇයට කරේ හිස හොවා ගැනීමට අවසර දෙමින් කීවේය. ඔහු සෙමින් දෑතට ඔසවා ගත්තේය.

''කොළඹ යමු. මට ඔයා නැතිව කිසි දෙයක් කරන්ට බෑ.''

''මටත් ඉන්ට බැරිවයි ඉන්නෙ. මාව එක්ක යන්න.''

ඔහු පිළිතුරක් නොදී සාලයේ ඒ මේ අත ඇවිද්දේය. මංගල්‍යය අත ළඟ තිබියදී ආත්තම්මා අම්මා හමුවීමට ගියේ ඇයි?

''ආදරය පරාද කරන්ට බෑ. මොන දේකින්වත් ඔයාට දුකක් දෙන්ට බෑ.''

ඔහු ඇගේ හිස අතගෑවාය.

''රත්තරනේ ඔයා නොහම්බුනා නම් මම තීරණය ගන්නේ වෙනත් විදිහටයි.''

''දුන් සන්සුන් වෙන්න. කොහොමහරි ආත්තම්මා අම්මව එක්කගෙන එයි.''

''වෙඩින් එක තියෙද්දි ආත්තම්මා මෙච්චර පරක්කු වෙන්නෙ නෑ. මොකක් හරි හේතුවක් ඇති.''

''මම හිතන් හිටියෙ කොහොම හරි අම්මාව වෙඩින් එකට ගෙන්වා ගන්නයි. ජීවිතේ අපි හිතන දේවල් ඒ අයුරින්ම ඉටුවෙන්නෙ නෑ. ඉවසන්න.''

''මා තරම් හඩපු, ඉවසපු ගැහැනියෙක් නෑ රත්තරනේ. මා හිනාවුණේ ඔයා හම්බ වුණාට පස්සෙයි.''

''හා.. හා.. නාඩා ඉන්න.''

WWW.SINHALAELIBRARY.COM 128

# 34

මංගල උත්සවය ඉතා චාම් එකක් වුණි. ආත්තම්මාට අවශ්‍ය වූයේ නිවසේ උත්සවය ගැනීමටය. දැන් ආත්තම්මාගේ ලෙඩ රෝග කිසිවක් නැත. එහෙත් ඇය මොනවා හෝ දෙයක් තමාගෙන් සඟවන බවක් හැඟේ. මොන විදිහේ ප්‍රශ්න තිබුණත් තමා මනමාලියක් වන දින දැකීමට අම්මා පැමිණෙනැයි ඇය සිතුවාය. තමා අම්මා හා තාත්තා දෙදෙනාම නැති අවාසනාවන්තියකැයි පංචලිට සිතේ.

ආත්තම්මා පංචලිට කිසිම අඩුවක් කළේ නැත. තමා වත්සලා වෙනුවෙන් එක් කළ රන් ආභරණ කිසිවක් ඇයට නුදුන්නේ නොමඟ ගිය හෙයිනි. දේපළ ඉඩකඩම්වලින් බිම් අඟලක්වත් දුන්නේ නැත. දැන් මේ රන් රිදී ආභරණ එකම හිමිකාරිය වන්නේ පංචලිය.

විවාහ දිනය සඳහා ආත්තම්මා සූදානම් වනු ඇසේ. පිළිගැනීමේ ගීතය රචනා කර ලියා බාල ලියන් ලවා පුරුදු කළේ ආත්තම්මා විසිනි. ඒ දිනය සමීප වෙද්දී ඇගේ හදවත සසලව ගියාය. එය කුමන හේතුවක් නිසා සිදුවී දැයි ඇයට දැනුණේ නැත. අවසන් දිනයේ හෝ අම්මා පැමිණෙනැයි යන හැඟීම ඇගේ සිතේ තිබුණි.

"ආත්තම්මා, අම්මා වෙඩින් එක දවසටවත් එන්නේ නැද්ද?"



"අම්මා එන එකක් නෑ."

ඇය සන්සුන්ව පිළිතුරු දුන්නාය.

"තාත්තා කොහොම එපා කිව්වත් අම්මා අද එන වින්තිය මම දන්නවා. ඇත්ත කියන්න, අම්මට මොනවත් කරදරයක්ද? අසනීයක්ද?"

"අම්මට එන්ට වෙන්නෙ නෑ. අපි මංගල්‍යය ඉවර වුණාම සහන් පුතත් එක්ක යමු."

කලබලකාරී රාත්‍රියක් නිසා ඇයට ආත්තම්මා හා කතා කිරීමට ලැබුණේ නැත. උදේට මනමාලියට ඇන්දවීමට එන නිසා ඇයට ඇඳට යාමට සිදු වුණි. ඇඳේ වැතිර ගත්තත් ඇය වෙත නින්ද ළඟා වූයේ නැත. කිසිම හේතුවක් නැතිව හැඬුණේ ඇයි දැයි තේරුම් ගත නොහැක. අම්මාට ජීවිතය වැරදුනේ කුමන හේතුවක් නිසා වුවත් ඇය තමාට බෙහෙවින් ආදරය කළ හැටි සිහිවෙයි. මැතක් වනතෙක් තමා සිටියේ ඇගේ උණුසුමේය. මොන දේ කළත් දුවෙකුට අම්මා තරම් වටිනා සම්පතක් තවත් නැත. දුව විවාහ කර දෙන දවසේ ආදරය දක්වන්න නොපැමිණෙන අම්මා කවුද?

"දුව නැගිටින්ට... ඇඳුම් අන්දවන කට්ටිය ඇවිදින්."

ඇය ඇඳෙන් නැගිට සූදානම් වීමට ප්‍රථම ආත්තම්මාගේ ගෙල බදා ගත්තාය.

"නාඩා ඉන්න.. මූණ කැතවෙයි."

"අම්මා කෝ...?"

"අම්මාව අපි හම්බ වෙන්ට යමු. මම විස්තර පස්සෙ කියන්නම්. අපි ලෑස්ති වෙමු."

මඳ වේලාවකට පසු කාමරයට පිවිසි තැනැත්තා දෙස ඇ පුදුමයෙන් යුතුව බලා සිටියාය. මෙය කිසිසේත් සිදුවිය නොහැකි දෙයකි. අම්මාට සිදු වූ බරපතළ වරද නිසා තාත්තාට ආත්තම්මා

WWW.SINHALAELIBRARY.COM 129

තදබල ලෙස වෛර කළ හැටි පංචලි දනී. තම කාමරයට පිවිසුණු තාන්නා දෙස පංචලි පුදුමයෙන් බලා සිටියාය. සමරතුංග ආදරයෙන් සිය දුව තුරුල් කර ගත්තේය.

"කෝ අම්මා..? මගේ අම්මත් ආවද?"

පිළිතුරක් නොදුන් සමරතුංග ආත්තම්මා දෙස බැලුවේය.

"අපි ඒ විස්තර පස්සෙ කතා කරමුකො දුව. මේ බලන්න කවුද කියලා. ඔයාගෙ අක්කලා ඇවිදින්."

සමරතුංග සිය ගැහැනු දරුවන් දක්වමින් කීවේය.

තාන්නාගේ විවාහක බිරිඳ ඉදිරියට පැමිණ පංචලිගේ දෙකම්මුල් සිප ගෙලේ මාලයක් පැළඳුවාය. සොයුරියන් දෙදෙනා පංචලි වැළඳ ආචාර කළහ.

"අම්මා මේ බලන්න කොච්චර ලස්සනද කියලා."

"මට නම් තෑගි නෑ. ඔනෑ නම් කිස් එකක් දෙන්නම්."

හිතට සතුටක් පිවිසුණත් පැහැදිලිව එය අර්ධ සතුටකි.

තාන්නා තම නිත්‍යානුකූල බිරිඳ මෙහි කැඳවාගෙන ආවේ කුමකටද? පවතින වාතාවරණය අනුව මේ පිළිබඳව ආත්තම්මා සමඟ කතා කිරීමට පුළුවන් කමක් නැත.

"අඬන්ට එපා. මූණ කැතවෙයි."

වසන්ති පංචලිගේ හිස පිරිමදිමින් කීවාය.

මනාල පිරිස වත්තට එන බව දනගත්තේ රබන්දොඩා පත්තු කරන හඬ ඇසීමෙනි. ඉන් පසු ඉස්තෝප්පුව දෙසින් පිළිගැනීමේ ගීතය ඇසුණි. ආත්තම්මාගේ පද රචනයෙන් හා ඇගේ සංගීතයෙන් ඔපවත් වූ ගීතය මිහිරිය. තමා අසල අක්කලා දෙදෙනා සිටීම ශක්තියක් වුණි. මේ සතුටේ විචිධත්වයක් ඇත. තාන්නාගේ පැමිණීම පිළිබඳව කවුරුත් කතාබස් කරනු ඇසේ. එය ශක්තියකි. නිවස මැද



සාදා තිබුණ මංගල පෝරුවට පංචලි කැඳවාගෙන ගියේ සමරතුංග විසිනි. අතපැන් වත් කරද්දී, ජයමංගල ගීත ගයද්දී දනුණ සතුට ඇයට අදහාගත නොහැකි වුණි. කලෙක සමරතුංග ඇමති සිය පියා වීම පිළිබඳව තමා අනන්තවත් දුක් වූ හැටි සිහිවෙයි. ගෙතෙම තමා අනාථ කර නැතැයි පංචලිට වරෙක සිතෙයි. කුමන අඩුපාඩුකම් තිබුණත් තාන්නා පැමිණීමෙන් සියල්ල නැතිවී ගොස් තිබුණි. එහෙත් දුවැන්ත අඩුවක් සිත වෙළා ගෙන ඇත. ඒ හැමටම වඩා පුදුම වූයේ සහන්ගේ අක්කා තමාට දැක්වූ ආදරයයි.

මංගල උත්සවය අවසන්ව මනාල යුවල සැමටම ආචාර කළහ.

"මගෙ ආත්තම්මෙ..."

පංචලි ආත්තම්මාගේ ගෙල බදා හැඬුවාය. අඬන්ට ඕනෑ තරම් හේතු තිබුණත් ඈ ඒ සියල්ල ඉවසා දරා සිටියාය.

"හරි... හරි... තෙරුවන් සරණයි. අපි දුව බලන්ට එනවනෙ."

"ආත්තම්මා පොරොන්දු වුණා නේද අම්මා එක්කගෙන එනවා කියලා."

"ආත්තම්මා ඔයාව එක්කාගෙන යනවා කිව්වා නේද? බයවෙන්න එපා."

සහන් ඇය අස්වැසුවේය.

හැමදෙනාගේම ආසිරි මැද මංගල ගමනට එක් වුවත් මහා තදබල අඩුවක් සිතේ ඇතිවිය. මුළු ජීවිත කාලය පුරාවටම තම තනිවට සිටි අම්මා අද නැත. තාත්තෙක් නැති අඩුව පිළිබඳව පසු කලෙක දනුණත් ඒ දුවැන්ත හිඩැස වැසුණේ අම්මා ගෙනි. නිදා ගැනීමට පෙර දෙපා වැන්ද, ජීවිතයේ හොඳ නරක කියා දුන්න ඒ මවු දෙවගන අද නැත. මා හැර ගොස්ද? විපතක් වෙලාද? විපතක් කර ගත්තද? රෝගී වෙලාද? අම්මා පිළිබඳව මට නොදන්වා සිටීමට තරම් තදබල හේතුව කුමක්ද? තුල ගෙදරින් දුවෙක් පිටවන දවස

WWW.SINHALAELIBRARY.COM 130

සාදා තිබුණ මංගල පෝරුවට පංචලි කැඳවාගෙන ගියේ සමරතුංග විසිනි. අතපැන් වත් කරද්දී, ජයමංගල ගීත ගයද්දී දුනුණ සතුට ඇයට අදහාගත නොහැකි වුණි. කලෙක සමරතුංග ඇමති සිය පියා වීම පිළිබඳව තමා අනන්තවත් දුක් වූ හැටි සිහිවෙයි. ගෙතෙම තමා අනාථ කර නැතැයි පංචලිට වරෙක සිතෙයි. කුමන අඩුපාඩුකම් තිබුණත් තාත්තා පැමිණීමෙත් සියල්ල නැතිවී ගොස් තිබුණි. එහෙත් දුවැන්ත අඩුවක් සිත වෙළා ගෙන ඇත. මේ හැමටම වඩා පුදුම වූයේ සහන්ගේ අක්කා තමාට දක්වූ ආදරයයි.

මංගල උත්සවය අවසන්ව මනාල යුවල සැමටම ආචාර කළහ.

"මගෙ ආත්තම්මෙ..."

පංචලි ආත්තම්මාගේ ගෙල බදා හැඬුවාය. අඬන්ට මිනෑ තරම් හේතු තිබුණත් ඇ ඒ සියල්ල ඉවසා දරා සිටියාය.

"හරි... හරි... තෙරුවන් සරණයි. අපි දුව බලන්ට එනවනෙ."

"ආත්තම්මා පොරොන්දු වුණා නේද අම්මා එක්කගෙන එනවා කියලා."

"ආත්තම්මා ඔයාව එක්කාගෙන යනවා කිව්වා නේද? බයවෙන්න එපා."

සහන් ඇය අස්වැසුවේය.

හැමදෙනාගේම ආසිරි මැද මංගල ගමනට එක් වුවත් මහා තදබල අඩුවක් සිතේ ඇතිවිය. මුළු ජීවිත කාලය පුරාවටම තම තනිවට සිටි අම්මා අද නැත. තාත්තෙක් නැති අඩුව පිළිබඳව පසු කලෙක දුනුණත් ඒ දුවැන්ත හිඩැස වැසුණේ අම්මා ගෙනි. නිදා ගැනීමට පෙර දෙපා වැන්ද, ජීවිතයේ හොඳ නරක කියා දුන්න ඒ මවු දෙවගන අද නැත. මා හැර ගොස්ද? විපතක් වෙලාද? විපතක් කර ගත්තද? රෝගී වෙලාද? අම්මා පිළිබඳව මට නොදන්වා සිටීමට තරම් තදබල හේතුව කුමක්ද? කුල ගෙදරින් දුවෙක් පිටවන දවස



තරම් තවත් ලස්සන වටිනා දවසක් අම්මා කෙනෙකුට නැත. ගැහැනියෙක් වෙලා ඉපදීමේ අනුඵලය එයයි. ඒ නිරාමිස සතුටේ කොටස්කාරියක් වෙන්නට අම්මා නාවේ ඇයි? ඇය තෙත් වූ දෑසින් යුතුව සහන්ගේ හිරුවත් ළයෙහි හිස තැබුවාය. දුක් සිටින්නේ දෙදෙනෙක් ලෙස නොවේ.

ගත කළ ජීවිතයේ හැටියට මෙවන් සුන්දර දවසක් තමාට හිමිවේ යැයි පංචලි කිසිදාක සිතුවේ නැත. තම ජීවිතයට මෙවන් වෙනසක් ලැබුණේ සහන් හමු වූ පසුය. ජීවිතවල ප්‍රශ්න නැතිවම නොවේ. කිසිදාක තමාට මෙවන් වාසනාවන්ත ජීවිතයක් ලැබෙතැයි සිසිවෙක් නොසිතන්ට ඇත.

ඔබ තමා මට මේ ජීවිතය ලබා දුන්නේ. හිතේ ප්‍රශ්න තියෙන බව ඇත්ත. ඒත් ඔබේ සතුට මට අහිමි කරන්ට බෑ.

මධුසමය ගත කිරීමට යාම සඳහා සංචාරක හෝටලය සූදානම් කළේ මිත්‍ර විසිනි. මේ කොතරම් ප්‍රීතිමත් දවසක්ද? ඇය යළි සහන්ගේ ළය මත හිස තබා ගත්තාය.

"ඇයි තාත්තා දුන්න තෑගි එපා කිව්වෙ...?"

ඔහු මඳවේලාවක් නිහඬව සිටියේය.

"උත්තරයක් ඕනෑ. සල්ලි, ඉඩකඩම්, එච්චර තෑගි එපා කිව්වෙ ඇයි...?"

"අමාරුවෙන් ලැබුණු මේ තෑග්ග මට ඔක්කොටම වඩා වටිනවා. මේ මට හොඳටම ඇති."

ඔහු ඇය දෑතට ඔසවා ගනිමින් කීවේය.

"මට එච්චරටම ආදරේද?"

"තියෙන ආදරේ මට කියන්න බෑ."

"රත්තරනේ... මම එච්චර වාසනාවන්තද?"

"ඔයාට වඩා මම වාසනාවන්තයි. ඒත් මම හිතුවෙ නෑ."

WWW.SINHALAELIBRARY.COM 131

''මොකක්ද මම හිතුවෙ නෑ කියලා නැවැත්තුවෙ...?''

''දුක්ක මුල් දවසෙම අහංකාරකමට මූණ දික්කරගෙන හිටි හැටි දුක්කම මා ළඟට එයි කියලා හිතුවෙ නෑ.''

ඇය වාක්‍ය අවසන් වීමට ඉඩ නොදී සහන්ගේ මුව වැසුවාය.

''මට සමාවෙන්න. ඒ වචනෙ ආයෙත් කියන්නෙපා.''

ඇය තෙත වූ දෑසින් යුතුව කීවාය.

මැය නිර්මාණය වී ඇත්තේ තමා වෙනුවෙනි. සිප ගත නොහැකි කිසි තැනක් මේ කුසුමේ නැත.

''මාත් තරහා නොවී හිටියට ඕනෑ තරම් ආඩම්බරකම් පෙන්නලා තියෙනවා.''

''ගිය දේවල් ගියා. දුන් ඉතින් මෙන්න මෙහෙම මෙන්න මෙහෙම කරන්න ළඟටම ගන්නකෙ. රිදෙනවද?''

''දුන් මාව මට අයිති නෑ. මම සහන්ගෙ. මේ ජීවිතේ මගේ කරගන්න කොච්චර හැඩුවද? අම්මා ඒ දේ තේරුම් ගත්තා.''

යළි ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''ඇයි මේ නිහඬ වුණේ...?''

''අම්මා හොඳ දුවෙක් හැදුවා' කියන එක සාක්ෂි ඇතිව පෙන්වන්න අම්මා නෑනෙ. ඇයි මේ... ඇයි මේ අම්මා ගැන කියන කොට ඇඳෙන් නැගිටලා යන්නෙ...?''

ඔහු ඇඳෙන් බැස වීදුරු ජනේලය අසල සිට ගත්තේය. හෝටලයේ කාමරයේ සිට බලන විට නුදුරින් දිස්වන මහ සයුර දිස් වෙයි. ඈත දියඹේ නැංගුරම්ලා ඇති නෞකා පෙනෙයි. මේ නෞකාවල සිටින නැවියන් මේ තුන්වෙනි යාමයේ නිදනවා විය හැක. පසුපසින් පැමිණි පංචලි උර බදා ගන්නා ස්පර්ශය දැනුණි. ඔහු එකවරම ආපසු හැරී ඇය සිය ළයට හේත්තු කර ගත්තේය.



''අපි හෙට අම්මා හමුවෙන්ට යමු. හැබැයි අඩන්නෙ හෙම නෑ. අඩන්නෙ නෑ නේද?''

ඇය හිස වනා එය අනුමත කළාය.

ගැහැනියක් ලෙස ජීවිතයේ වඩාත් පැහැදිලි වෙනස්කම් දුටුවේ අද ය. දුවක් ලෙස මෙතෙක් ආරක්ෂා කරගන්න දේ පොදු එකඟතාවය ලෙස මම නොව අපි වුණේ ඉකුත් දින රැයේ ය. දෙදෙනා පොදු එකඟතාවයෙන් සුන්දර අත්දැකීමක් ලැබීමට තමා ඔහුට සහාය වූ අතර අපූර්ව වූ සතුටක් ලද හැටි මතකය. පසු දින පිබිදුනේ සහන්ගේ උණුහුමේදීය. අම්මා ළඟ හෝ ආත්තම්මා ළඟ නැතිව පිරිමියෙක් ළඟට එමට සිදුවුණේ කිමද? තමා දුන් වෙන කෙනෙකුට අයිති බව දුනුණේ පිරිමියෙක් තම ඇඟට උඩින් අතක් දමා නිදා ගැනීමට නිර්භයව සිටි හෙයිනි. ඇඳෙන් බැස මුහුණ සෝදා ගත් ඇය සැමියා සඳහා තේ සූදානම් කළාය. දුන් ඇගේ එකම බලාපොරොත්තුව වන්නේ අම්මා හමුවීමය.

උදේ පාන්දරින්ම අම්මා බැලීම සඳහා ආත්තම්මා පැමිණ සිටියාය. සුදු වතින් සැරසී සිටි ආත්තම්මාගේ මුහුණේ වෙනදා නැති ශාන්ත පෙනුමක් තිබුණි. සම්ප්‍රදායික දෙවෙනි ගමනේ දී අඳින රත්න වර්ණ ඇඳුම වෙනුවට ඇය සූදානම් වූයේ සුදු වතිනි.

හිමිදිරියෙන්ම පන්සල් යාමට සිතුවේ ඇයි? ප්‍රථමයෙන්ම ආත්තම්මාගේ දෙපා වැඳ නැගී සිටියාය. ආත්තම්මා පංචලිගේ දෙකොපුල් සිප ගත්තේ ආදරයෙන් යුතුවය.

''අපි පන්සල් ගිහින් ආත්තම්මගේ අම්ම බලන්ට යනවද?''

ඔවුනතර නිහඬ බවක් ඇති වුණි.

''පුතා.. පංචලි දුවට කතාව කිව්වද?''

''නෑ ආත්තම්මා... ඔයාම කියන්න.''

පංචලිගේ සිතේ සැකයක් ඉපදී බොහෝ කලෙකි. තමාගෙන්

WWW.SINHALAELIBRARY.COM 132

වසන් කරන කුමන හෝ රහසක් ඇති බව ඇය දැන සිටියාය. මට නොකියන රහස මොකක්ද?

''කිවයුතුව තිබුණ දෙයක් දුවගෙන් වසන් කළේ හේතුවක් ඇතිවයි. අම්මාගේ ජීවිතය ගැන දුවට අමුතුවෙන් කියන්ට ඕනෑකමක් නැහෙ.''

''ඔව්. අම්මා මහා දුකක් හිතේ දරා හිටපු ගැහැනියෙක්.''

''අම්මා සතුටෙන් හිටියේ මා ළඟදී විතරයි කියලා මේ ළඟදීත් කිව්වා.''

''ඒක එහෙමම තමා. දුවෙක් මවක් ළඟ ඉන්දෙද්දී ලබනවා වගේ සතුටක් කිසි විටෙක ලබන්ට බෑ.''

ආත්තම්මා සිය කතාවට පිවිසීමට පූර්විකාවක් සපයා ගත්තාය.

''මේ බෞද්ධ ඉතිහාසයේ සසුන්ගත වෙච්ච ඛේමා, උත්පලවන්නා, සුභා වගේ මහා තෙරණියන් වහන්සේලා ඉන්නවා. අම්මත් ඒ අතරට එක් වුණා.''

''මොනවා... අම්මා මෙහෙණියක් වුණා.''

''ඔව් පංචලි අපි කාටත් නොකියා අම්මා මෙහෙණියක් වෙලා.''

සහන් පංචලිගේ හිස පිරිමදිමින් කීවාය. පිළිතුරක් දිගත නොහැකිව මඳවේලාවක් සිටියාය. අම්මා මෙය හදිසියෙන් ගත් තීරණයක් නොවන්නට පුළුවන. ගිහි ගෙය අතැර යාමේ සැලසුමක් කලෙක සිට ඇගේ සිතේ තිබූ බව සිහිවන්නේ දැන්ය. අම්මා සමීප හිතවත්කම් පැවැත්වූ ආරණ්‍යවාසී මහානායකයන් වහන්සේලා හා භාවනා මධ්‍යස්ථානවල භික්ෂුණීන් වහන්සේලා ගැන පංචලි දනී.

කවදත් හිතුවක්කාර තීරණ ගන්න කෙනෙක්. අන්තිම මොහොතේ ඇවිදින් මට වැඳලා දුව බාර දීලා එයා සතු සියලුම දේවල් දුවගෙ නමට ලියලා දීලයි මේ ගමන ගියේ.''



ඒ පිළිබඳව තවත් කතා කළ යුතු කිසිවක් නැත. අම්මා ඇය සතු චංචල නිශ්චල දේපළ පමණක් නොව ආදරයෙන් රැක බලා ගත් එකම දුව වන තමාවත් අතැර දමා ගියේ තාවකාලික නොවූ පරම සුවය වෙනුවෙනි. එය අප සිතන පතන 'කේතුමතී' නම් වූ සිහන රාජ්‍යයට වඩා උතුම්ය. අද තමා ගියහොත් එය අම්මාගේ සමාධිය බිඳ වැටීමට හේතු වනු ඇත. පැහැදිලිව එය පාපකර්මයකි.

''දුව කැමති නම් අපිට දානෙ වෙලාවෙදි අම්මව බලන්ට පුළුවන්.''

''එපා ආත්තම්මා. මම ගියොත් අම්මගෙ හිතට දුකක් ඇති වෙයි. අම්ම යන ගමනට බාධාවක් වෙයි. එතකොට මටත් පවක් සිද්ධ වෙයි.''

''ඔව් ආත්තම්මා. පංචලිගෙ කතාවට මාත් එකඟයි. අම්මා මේ සියල්ල අතැරලා ගියේ මේ දුකින් මිදෙන ගමනට නම් අපි ඒකට බාධා කරන්ට හොඳ නෑ.''

මිලිනා වීරසේකර මැතිනිය දරුවන් දෙදෙනා දෙස බලා සිටියේ හැඟීමෙන් යුතුවය. මේ දරුවන් කොතරම් බුද්ධිමත්ද?

''එහෙමනම් වෙනත් දවසක අම්මව බලන්ට යන්න. දැන් ඔය දෙන්නා ලෑස්ති වෙලා ඉන්න ගමන යන්ට සූදානම් වෙන්ට.''

ආත්තම්මා කාමරයෙන් පිටව යන තෙක් බලා සිටි පංචලි සහන්ගේ උරේ හිස හොවා ගත්තේ තෙත් වූ දෑසින් යුතුවය.

නිමි

WWW.SINHALAELIBRARY.COM 133

''හැම දෙනාගේම ආසිරිමැද
මංගල ගමනට එක් වුවත්
සිතේ මහා තදබල අඩුවක්
ඇතිබව පංචලිට දැනෙයි.

ගෙවූ ජීවිතයේ තම දෙනත
මෙන් සිටි අම්මා අද නැත.

නිදු ගැනීමට පෙර දෙපා-
වැන්ද, ජීවිතය පිළිබඳ අත්
පොත කියාදුන් මව් දෙවගන
අද නැත.''

COVER DESIGN - Danushka Mallawaarachchi



මල්ලවආරච්චි ප්‍රකාශකයෝ
200, කොස්වත්ත, තලංගම.
දුරකථනය : 2788186

ISBN 978-955-8460-33-7

www.sinhalaelibrary
WWW.SINHALAELIBRARY.COM 134